

## යුක්තිය, සත්‍යය + සංහිඳියාව සඳහාවූ ගෝලීය මුලිපිරීම

# ඉගෙන ගන්නා ප්‍රජාවක් ගොඩනැගීම:

## සන්ක්‍රාන්තික යුත්කිය පිළිබඳ සමස්ථ හා තිරසාර ප්‍රවේශයක් සඳහාවූ පාඩම්

# යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ගෝලීය මුලපිරීම් සන්ධානය පිළිබඳ

ලොව පුරා අතීතයේදී ඉතා බරපතල ලෙස මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදුවී ඇති රටවල යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ වැඩි වශයෙන් ඉල්ලීම් මතුවෙමින් පවතී. මෙම අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය (ICSC) 2014 අගෝස්තු මාසයේදී යුක්තිය, සත්‍යය හා සංහිඳියාව සඳහාවූ ගෝලීය මුලපිරීම (GIJTR) ආරම්භ කළේය. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්ත්තමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා කම්කරු කාර්යාංශයේ සහාය ඇතිව මෙම මුලිපිරීම දියත් කරන ලදී. මෙම මුලපිරීමේ අරමුණ වන්නේ ගැටුම් අතීතයක් සහිත රටවල්වල හෝ  සන්ක්‍රාන්ති අවධියේ සිටින රටවල්වල පවතින නව අභියෝග ආමන්ත්‍රණය කිරීම වේ. එවැනි රටවල්වල අතීතයේදී බරපතල ලෙස මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදුවී තිබේ; හෝ දැනට එවැනි උල්ලංඝනයවීම් සිදුවෙමින් පවතී.

යුක්තිය, සත්‍යය හා සංහිඳියාව සඳහාවූ ගෝලීය මුලපිරීම (GIJTR) සන්ධානයට පහසුකම් සලසන අතර, එම සන්ධානය පහත සඳහන් හවුල්කාර සංවිධාන 9 කින් සමන්විත වේ:

- එක්සත් ඇමෙරිකානු ජනපදයේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය (ප්‍රධාන හවුල්කාර ආයතනය);
- එක්සත් ඇමෙරිකානු ජනපදයේ ඇමෙරිකානු නීතීඥ සංගමයේ නීතියේ පාලනය සඳහාවූ මුලපිරීම (ABA ROLI) ;
- ඉන්දුනීසියාවේ ආසියා යුක්තිය හා අයිතිවාසිකම් පිළිබඳ සංවිධානය (AJAR) ;
- ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය (CSVR), දකුණු අප්‍රිකාව;
- කාම්බෝජය ලේඛණගත කිරීමේ මධ්‍යස්ථානය (DC-Cam), කාම්බෝජියාව
- නීතියේ නිසි ක්‍රියාවලිය සඳහාවූ පදනම (DPLF), එක්සත් ඇමෙරිකානු ජනපදය;
- ගෞතමාලා විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම - (FAFG), ගෞතමාලා
- මානුෂීය නීති මධ්‍යස්ථානය (HLC), සර්බියා; හා
- පොදු ජාත්‍යන්තර නීති හා ප්‍රතිපත්ති කණ්ඩායම (PILPG), එක්සත් ඇමෙරිකානු ජනපදය

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය GIJTR හවුල්කාර ආයතනවල විවිධ නිපුණතා ක්ෂේත්‍ර ප්‍රයෝජනයට ගැනීමට අමතරව, සන්ධානයේ වැඩ කටයුතු ශක්තිමත් හා පුළුල් කිරීම සඳහා රටවල් 55 ක ක්‍රියාත්මක වෙන 230 ක් පමණ සාමාජික සංවිධානවල දැනුම හා දීර්ඝ කාලීන ප්‍රජා සම්බන්ධතාද ප්‍රයෝජනයට ගනී.

GIJTR සන්ධානයේ සාමාජික සංවිධාන හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධාන ජාලයේ සාමාජිකයන් සමඟ එකතුවී ක්ෂණික ප්‍රතිචාර දක්වන ඉහළ බලපෑමක් ඇති කළ හැකි පුළුල් පරාසයේ වැඩසටහන් සංවිධානය කර, ක්‍රියාත්මක කරයි. බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම් සඳහා අපරාධ යුක්තිය ලබාදීමේදී පැරණි තත්ත්වය නැවත ස්ථාපිත කිරීම හා දඬුවම් ලබාදීමේ යන ප්‍රවේශයන් පාවිච්චි කරමින් මෙම වැඩසටහන් සංවර්ධනය කරනු ලැබේ. මෙම සන්ධානය යුක්තිය, සත්‍යය හා වගවීම පිළිබඳ බහු ක්ෂේත්‍ර ප්‍රශෙයක් පිළිපදී. සමස්ථයක් වශයෙන් සන්ධානයේ හවුල්කාර සංවිධාන පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි නිපුණතාවයක් ලබාගෙන සිටිති:

- සත්‍යය පැවසීම, සදානුස්මරණය හා ඓතිහාසික මතකය හා සංහිඳියාව පිළිබඳ අනෙකුත් ක්‍රියාවලීන්;
- සන්ක්‍රාන්තික යුක්ති අරමුණු සඳහා මානව හිමිකම් උල්ලංඝනයවීම් ලේඛණගත කිරීම;



ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම (fAFG) අතුරුදහන්වූ පුද්ගලයන් හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් එවැනි ඉරණමකට මුහුණ දුන් වටපිටාවන් හා ඔවුන් සිටින ස්ථාන හඳුනා ගැනීමටත්, එම පුද්ගලයන් හඳුනා ගැනීම සඳහාත් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් විමර්ශන පවත්වයි. වින්දිතයන්ට හා ඔවුන්ගේ පවුල්වලට සත්‍යය ලබාදීම සඳහාත්, යුක්තිය සොයා ගැනීමට උදව් කිරීම සඳහාත්, සහන ලබාදීම සඳහාත් නීතියේ ආධිපත්‍ය ශක්තිමත් කිරීම සඳහාත් මෙය සිදුකරනු ලැබේ.

Photo credit: FAFG

- අතුරුදහන්වූ හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි විශ්ලේෂණය හා අනෙකුත් උත්සාහයන්;
- යුක්තිය ලබා ගැනීම, මනෝ සමාජයීය සහාය ලබා ගැනීම හා දැඩි කම්පන තත්ත්වයන් අවම කිරීමේ ක්‍රියාකාරකම් ලබා ගැනීම සඳහාවූ වින්දිතයන්ගේ අයිතීන්ද ඇතුළුව වින්දියන් වෙනුවෙන් හඬ නැගීම;
- සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් ප්‍රවර්ධනය කිරීම හා ඒවා සමඟ කටයුතු කිරීම සඳහා සිවිල් සමාජ ක්‍රියාධරයන් හා සංවිධානවලට තාක්ෂණික සහාය ලබාදීම හා එම පාර්ශ්වකරුවන්ගේ ධාරිතාව ගොඩනැගීම;
- පෙර තත්ත්වය නැවත ස්ථාපිත කිරීමේ යුක්තිය පිළිබඳ මූලපිරීම්; හා
- මෙම ක්‍රියාවලීන් හා අනෙකුත් සියලුම සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාව තහවුරු කිරීම හා ඒකාබද්ධ කිරීම.

සන්ධානයේ හා හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර ස්ථානයන්හි සන්ධාන ජාලය සතුව තිබෙන අත්දැකීම්, දැනුම හා කුසලතාවල විවිධත්වය සැලකිල්ලට ගෙන, GIJTR සන්ධානයේ වැඩසටහන් පශ්චාත් ගැටුම් රටවල්වලට හා දැඩි පීඩාකාරී පාලනයන්වලින් මිදී එන රටවල්වලට උචිත ආකාරයෙන් සන්ක්‍රාන්තික යුක්ති අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා අපූරු අවස්ථාවක් ලබා දෙයි. ඒවාගේම ප්‍රාදේශීය ජනතාවගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමටත් ප්‍රජා හවුල්කරුවන්ගේ ධාරිතාව වැඩිදියුණු කිරීමටත්, කටයුතු කරනු ලැබේ.



කාම්බෝජයේ වීල් රින්ග් ගම්මානයේ පොතක් කියවන ළමයින්.

දැඩි දිළිඳුකමට එරෙහි අරගලයේදී සම්පත් බෙදා දීම මෙවලමක් වේ. කාම්බෝජයේ ග්‍රාමීය ප්‍රදේශවල මුද්‍රිත ද්‍රවයන් බෙදා හැරීම ඉතා පහළ මට්ටමක පවතින හෙයින්  දැනුම හා ඥානය පුළුල් කිරීම ඉතා දුෂ්කර වේ. ජනතාවට වැඩි තොරතුරු හා හොඳ අධ්‍යාපනයක් ලබාදීම මගින් ඔවුන්ටම තමන්ගේ දැඩි ද්‍රරිද්‍රතා තත්ත්වයෙන් මිදීමට අවස්ථාව ලබාදිය හැකිය.

# පටුන

පෙරවදන ........................................................................................................................ 8

*ආචාර්ය රිවා කන්ටෝවිට්ස්*

හැඳින්වීම ........................................................................................................................ 23

ක්‍රමවේදය ........................................................................................................................ 23

පරිච්ඡේදය 1 :

දකුණු සූඩානයේ මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම ......................................... 25

*ටිෆානි සොමාඩොසි හා බ්‍රිජට් රුර්ෆෝඩ්, පොදු ජාත්‍යන්තර නීතිය හා ප්‍රතිපත්ති කණ්ඩායම*

පරිච්ඡේදය 2 :

මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට ලක්වී සිටින සිරියාවේ පුද්ගලයන් - අරමුදල් ඇගයීම ........................................................................................................43

*සුෆියා බිරේ, ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය*

පරිච්ඡේදය 3 :

ශ්‍රී ලංකාවේ සත්‍යය, යුක්තිය හා සංහිඳියාව සඳහා ප්‍රාදේශීය ප්‍රජාවගේ ධාරිතාව ගොඩනැගීම .............................................................................60

*එරෙෂ්නි නායුඩු - සිල්වර්මෑන්,*
*හෑද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය*
*මාර්ටි මේර් ටුන්හිම්,*
*ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම*

පරිච්ඡේදය 4 :

මැද පෙරදිග හා උතුරු අප්‍රිකා කලාපයේ සන්ක්‍රාන්තික යුක්ති අධ්‍යයන ආයතනය ........................ 83
*සාරා බිරෙඩිෂෝ හා ෆාති සහාර්,*
*හෑද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය*

පරිච්ඡේදය 5 :

සිවිල් සමාජයේ ලේඛණගත කිරීම් කටයුතු හා අපරාධ සඳහා වගවීම ............................................ 101
*ක්‍රිස්ටෝපර් ඩීරින් හා යුක් වෑන්ග්,*
කාම්බෝජය ලේඛණගත කිරීමේ මධ්‍යස්ථානය

**සිද්ධි අධ්‍යයනය: කාම්බෝජයේ ලේඛණගත කිරීම සඳහාවූ ලේඛණගත කිරීමේ මධ්‍යස්ථානය**
*ක්‍රිස්ටෝපර් ඩීරින් හා යුක් චෑන්ග්,*
කාම්බෝජය ලේඛණගත කිරීමේ මධ්‍යස්ථානය

**සිද්ධි අධ්‍යයනය: පෙර යුගෝස්ලෝවියාවේ මානුෂීය නීති මධ්‍යස්ථානයේ ලේඛණගත කිරීමේ කටයුතු**
*මිලිකා කොස්ටික්,*
*මානුෂීය නීති මධ්‍යස්ථානය*

**සිද්ධි අධ්‍යයනය: ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනමේ ලේඛණගත කිරීමේ කටයුතු**
*මාර්ටි මේර් ටුන්හීම්,*
*ෆ්‍රීඩ් පික්රේලි හා ජෝ මේරි බර්ට්*
*ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම*

පරිච්ඡේදය 6 :

**කෙළොම්බියාවේ අතුරුදහන්වූ හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්: ඇගයීමේ වාර්තාවේ සාරාංශය ........................................................................................................ 125**
*ඩාරියෝ කොල්මනාරිස් මිලාන්,*
*හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය*

පරිච්ඡේදය 7 :

සන්ධානයේ වැඩසටහන් ඇගයීම් කිරීම තුළින් ලබා ගත් පාඩම් ............................................... 143

යුක්තිය, යුක්තිය, සත්‍යය හා සංහිඳියා සඳහාවූ ගෝලීය මුලපිරීම (GIJTR)

# පෙරවදන

පහත පරිච්ඡේදයන් සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් පිළිබඳ නවෝත්පාදන ප්‍රවේශයකින් උගත් පාඩම් පිළිබඳ කතා කරයි. සංවිධානවල සංසදයක් දඬුවමින් මිදී සිටීමේ තත්ත්වයට අභියෝග එල්ල කිරීම සඳහාත් සත්‍යය හෙළි කර ගැනීම සඳහාත්, බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ සහන සැලසීම සඳහා අතීතයේ සිදුව ඇති එවැනි තත්ත්වයන් නැවත ඇතිවීම වැළැක්වීම සඳහාත් වැඩසටහන් නිර්මාණය කර, ක්‍රියාත්මක කිරීම මෙම නවෝත්පාදන ප්‍රවේශය වේ. මෙම වැඩසටහන් ජාතික හා ප්‍රාදේශීය පසුබිම්වලට අදාළව නිර්මාණය කරන අතර, ඒවා පදනම් කර ගැනීම සඳහා විවිධ පරාසයේ යුක්ති මෙවලම් පාවිච්චි කරනු ලැබේ.

යුක්තිය, සත්‍යය සංහිඳියාව පිළිබඳ ගෝලීය මුලපිරීමේ සන්ධානය (GIJTR Consortium) පිළිබඳ සංකල්පය, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා කම්කරු සබඳතා කාර්යාංශයේ මම සේවයේ කරපු කළ කාලයේ පිළිසිඳ ගන්නා ලදී. මෙම සංකල්පය ගැටුම්වලින් පීඩාවට පත්වී සිටින රටවල්වල මානව හිමිකම් හා යුක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් නිර්මාණය කර, ඒ සඳහා මූල්‍යාධාර ලබාදීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම සන්ධානය පහත සඳහන් කරුණු දෙක සඳහාවූ ප්‍රතිචාරයක් විය.

පළමුව, සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන්වලට මූල්‍යාධාර ලබාදීම සඳහාවූ අපගේ අත්දැකීම් හා එය මගින් පොළඹවන ලද පර්යේෂණ, සන්ක්‍රාන්තික යුක්තිය සඳහාව ජාත්‍යන්තර අරමුදල් සපයන්නන්ගේ මූල්‍යාධාර වැඩි වශයෙන් ජාත්‍යන්තර අධිකරණ හා අපරාධ නඩු පැවරීම් සඳහා සහයෝගය ලබාදෙන බව හෙළි කළේය. යුක්තිය හා වගවීම යන කරුණුවලට විවිධ ආකාරයෙන් සහයෝගය ලබාදිය හැකිය - නඩු පැවරීම්, අනුස්මරණ කටයුතු සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම, දැඩි කම්පන තත්ත්වයන් සුවපත් කිරීම, මනෝ සමාජයීය සහයෝගය ලබාදීම, සත්‍යය පැවසීම යන කරුණු හරහා මෙය සිදුකළ හැකිය. එක් එක් පසුබිම්වලට අදාළ උචිත ක්‍රියාවලීන් යුක්තිය, සත්‍යය, සහන සැලසීම හා පැරණි තත්ත්වය නැවත ස්ථාපිත කිරීම යළි ඇති නොවීම තහවුරුවක් ලබා ගැනීමේ අයිතියද කිරීමද ඇතුළුව සන්ක්‍රාන්තික යුක්තියේ මූලික සංකල්ප අතර සමබරතාවයක් පවත්වා ගෙන යා යුතුය. එවැනි උපාය මාර්ගයන් ප්‍රචණ්ඩ ක්‍රියාවලීන් පීඩාවට පත්වී සිටින පුද්ගලයන්ගේ මෙහෙයවීම යටතේ සිදුකළ යුතු අතර, ඔවුන්ගේ සහභාගිත්වය ලබා ගැනීම හරහා තීරණය කර ගත යුතුය. අපරාධවලට ඒවා සිදුකළ පුද්ගලයින් වගවීමට ලක් කිරීම වින්දිතයන්ට ඉතා වැදගත් කරුණක් වන අතර, එම මෙවලම බොහෝ අභියෝගවලටද මුහුණ දෙයි: එය දැඩි ලෙස සම්පත් අවශ්‍ය වන ක්‍රියාවලීන් හා සම්බන්ධ වන අතර, එයට සමහර අවස්ථාවල දශක ගණනාවක් කාලය ගත වේ. සමහර අවස්ථාවල මෙම අපයෝජනයන් සිදුකළ පුද්ගලයන්ගේ ජීවිත කාලයට වඩා වැඩි කාලයක් එයට අවශ්‍ය වේ. තවද එය අපරාධය සිදුකළ සුළු පිරිසක් කෙරෙහි අවධානය යොමු කරන අතර, ගැටුමෙන් පීඩාවට පත්වී සිටින සමස්ථ සමාජයන් කෙරෙහි අවධානය යොමු නොකරයි. ප්‍රචණ්ඩත්ව චක්‍ර වැළැක්වීමේ කොන්දේසියක පුළුල් ක්‍රියාවලීන් එකක් ලෙස වින්දිතයන්ට අපරාධවලට වගවීම අවශ්‍ය වේ. තිරසාර සාමය ගොඩනැගීමටද මෙය අවශ්‍ය වේ. සමාජයේ පුළුල් අවශ්‍යතා ඉටුකිරීමට අමතරව වින්දිතයන්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වයක් ලබදෙන විවිධ ක්‍රියාවලීන් සහයෝගය ලබාදීම මූල්‍යාධාර ලබාදෙන පාර්ශ්වයන්ගේ යුතුකමක් වේ.

දෙවනුව, සන්ක්‍රාන්තික යුක්තියට සහයෝගය ලබාදීම සඳහාවූ "පද්ධති පදනම් කර ගත් ප්‍රවේශයක්" ප්‍රයෝජනවත් වේ. සමාජ විද්‍යාවන්වල හා ජාත්‍යන්තර සංවර්ධනයේ සමහර ක්ෂේත්‍රවල වැඩි වශයෙන් ජනප්‍රියව පවතින පද්ධති පදනම් කර ගත් චින්තනය පද්ධතියක් එකිනෙකට සම්බන්ධ එකිනෙක මත රඳා පවතින අංගයන්ගේ සංකීර්ණ දැලක් සමන්විත වන අතර, එම සම්බන්ධතා පරීක්ෂණයට ලක් කරන බවත් අනුමාන කරයි. පද්ධතියේ සමහර අංගයන් කෙරෙහි බලපෑම් කිරීමටත්, ඒවා වැඩිදියුණු කිරීමටත් දරණු ලබන උත්සාහයන් අනිවාර්යයෙන්ම අනෙකුත් කොටස්වල හා අනෙකුත් මට්ටම්වල

ප්‍රතිචාරයන් නිර්මාණය කරයි. මෙහිදී පද්ධතිය නිශ්චිත පශ්චාත් ගැටුම් සමාජයක් වන අතර, එහි මට්ටම් වන්නේ පුද්ගලයන්, ප්‍රජාවන්, සිවිල් සමාජය, ප්‍රාදේශීය, කලාපීය හා ජාතික රජය හා ආයතනයන් වේ. මේ සියලුම අංගයන් එකිනෙක සමග සම්බන්ධවී පවතී. සන්ක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක් විවේචනයට පක්වී තිබෙන කරුණක් වන්නේ අදාළ පසුබිමට සංවේදී නොවන නිර්දේශ ඇතුළු යාන්ත්‍රණයන්වේ. එවැනි යාන්ත්‍රණයක් වෙනුවට වැඩසටහන් දෘෂ්ඨී කෝණයෙන් ගත හැකි ප්‍රවේශයක් වන්නේ නිශ්චිත මෙවලම්ලට නොව ක්‍රියාධරයන්ට සහයෝගය දැක්වීමයි. ව්‍යාපාර, තිරසාර ජාලයන් හා අවසානයේ පශ්චාත් ගැටුම් පරිසරයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය සාමූහික බලපෑම නිර්මාණය කිරීමට උපකාරී වන අන්තර් සබඳතාවයන්ට මුල්‍යාධාර ලබාදිය යුතුයි. පශ්චාත් ගැටුම් පසුබිම් ශක්තිමත් කිරීමට සාමූහික බලපෑම අවශ්‍ය වේ. මෙම ප්‍රවේශය නාලිකා සන්නිවේදන මාර්ග හා සබඳතා නිර්මාණය කරන අතර, ඒවා හරහා වින්දිතයන් හා ගැටුමින් පීඩාවට පත්වී සිටින ප්‍රජාවන් තමන්ගේ අවශ්‍යතා ඉදිරිපත් කිරීමට හා සාමූහික වේදිකා හා න්‍යාය පත්‍රයන් ගොඩනැගීමට අවස්ථාව ලැබේ. මෙම දෘෂ්ඨිකෝණයන් ඉන්පසුව දේශීය හා ජාතික අධිකරණ පද්ධතීන්වල පිළිබිඹු වේ. මෙම ප්‍රතිපෝෂණ ලබාදීමේ ක්‍රමය සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් හා මෙවලම්වල අරමුණ හා ක්‍රියාව මනා ලෙස අවබෝධ කර ගැනීමට වින්දිතයන්ට හැකියාවක් ලබාදෙයි. තවද, වින්දිතයන්ට හා ගැටුමෙන් පීඩාවට පත්වූ ප්‍රජාවන්ට අඛණ්ඩ, ඍජු සහයෝගය ලබාදීමට යාන්ත්‍රණයක් උත්සාහයක් දැරිය යුතු බව අවධාරණය කරයි. වින්දිතයන් හා ගැටුමෙන් පීඩාවට පත්වී සිටින ප්‍රජාවන් බොහෝ අවස්ථාවල අගනුවරවලින් පිට ජීවත්වන අතර, ඔවුන් ඉතා කොන්වූ හා දුර්වල ජන කණ්ඩායමක් වශයෙන් සිටිති. මෙම ව්‍යාපාරවල ඔවුන්ගේ සහභාගිත්වය හා අයිතිය තහවුරු කිරීමට මෙය අවශ්‍ය වේ.

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයේ මූලිකත්වයෙන් කටයුතු කරන ලෝකයේ සෑම කලාපයන් සමගම දැඩි සබඳතා පවත්වන සංවිධාන 9 කින් සමන්විත මෙම (GIJTR Consortium) සන්ධානය රටවල් දෙකක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන මූලික උත්සාහයක් වශයෙන් 2014 වසරේදී ආරම්භ කරන ලදී. ආරම්භයේ සිට මෙම සන්ධානය රටවල් 17 ක සිවිල් සමාජ සංවිධාන 255 ක් සමග කටයුතු කර ඇත. තවද එය ප්‍රාදේශීය ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීම හරහා ප්‍රජාව මගින් දියත් කරන ලද සන්ක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති 58 කට සහයෝගය ලබාදී ඇති අතර, සිවිල් සමාජයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන ලේඛණගත කිරීමේ ව්‍යාපෘතිවල කොටසක් වශයෙන් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ 1100 කට වැඩි සාක්ෂි රැස්කර කර ඇත. සන්ධානයේ වැඩසටහන් මූලික ප්‍රවේශයක් සහිතව ක්‍රියාත්මක වන අතර, උගත් පාඩම් බොහෝමයක් එම වැඩසටහන් විසින් ලබාදෙනු ලැබේ. එම පාඩම් ක්‍රියාත්මක කිරීමේ සන්ධානයේ හවුල්කරුවන් මෙම දෘෂ්ඨිකෝණයෙන්



2017 අප්‍රේල් මස මේසන්ඩ් එස්කරල්ව්ස් කෞතුගාරය නරඹන පිරිසක්. හෘද සාකක්ෂි පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයේ ආරම්භක සංවිධානයක් වන මෙම කෞතුගාරය පුද්ගලික නිවසක හා වහල් වෙළඳාමේ එම නිවසේ සම්බන්ධතාවය පිළිබඳ පුද්ගලික කතන්දර පවසයි. 1962 වසරේ ස්ථාපිත කිරීමේ සිට මෙම ඓතිහාසික ස්ථානයට පාසල් ළමුන් සිට නෙල්සන් මැන්ඩෙලා, ජෝර්න් පෝල් පාප් වහන්සේ, බැරැක් ඔබාමා ඇතුළු දහස් ගණන් නරඹන්නන් පැමිණ ඇත.

## විෂයාන්තර, පද්ධති පදනම් කර ගත් ප්‍රවේශය

මෙම විෂයාන්තර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා සන්ධානය විසින් නිශ්චිත මඟපෙන්වීම් සංවර්ධනය කරන ලදී; උදාහරණයක් වශයෙන් සෑම ව්‍යාපෘතියකම අවම වශයෙන් හවුල්කාර ආයතන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එක්වී ක්‍රියා කිරීම අවශ්‍ය වේ. මෙම වැඩසටහන් සෑම පසුබිමකම තුළම හැකි ප්‍රමාණයට පද්ධති පදනම් කර ගත් ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරයි. එය රජයන්, සිවිල් සමාජය, ප්‍රාදේශීය ප්‍රජාවන් හා වින්දිතයන් පුළුල් පරාසයක සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක සම්බන්ධ කරයි. ඊට අමතරව අරමුදල් ලබාදෙන රජයන් තුළ විවිධ ක්‍රියාධරයන් විසින් අත්‍යවශ්‍ය යැයි සලකනු ලබන හෝ සලකනු නොලබන ප්‍රධාන සෑම වැඩසටහනක්ම සංරචකයන් ඇතුලත් වේ. දැඩි කම්පනය පිළිබඳ පුහුණුව මනෝ සමාජයීය සහාය ලබාදීම හා ප්‍රජාව ලඳනම් කර ගත් ක්‍රියාවලීන් වැනි දේවල් මෙයට ඇතුළත් වේ; අනුස්මරණ කටයුතු, සංස්කෘතිය සංරක්‍ෂණය කිරීම ප්‍රජා ලේඛණ ආරක්‍ෂණයද මෙයට ඇතුළත් වේ. නිශ්චිත රටවල් කෙරෙහි අවධානය යොමු කරන නිලධාරීන් සාමාන්‍යයෙන් යම් ප්‍රමුඛතා අනුව කටයුතු කරති. උදාහරණයක් වශයෙන් සාක්ෂි රැස් කිරීමේ අරමුණ සඳහා හෝ සිවිල් සමාජය රජය හා ආයතනික ක්‍රියාධරයන් හරහා තාක්‍ෂණික සහයෝග ලබාදීමේ අරමුණින් ලේඛණගත කිරීම මෙහි සඳහන් කළ හැකිය. සන්ධානයේ මොඩලය මෙම වැදගත් සංරචකයන් ආමන්ත්‍රණය කිරීම සහතික කරන අතර, කාර්යාල නිලධාරීන්ට හෝ තානාපති කාර්යාල නිලධාරීන්ට එතරම් හුරුවක් නොමැති වැඩසටහන් සංරචකයන් ඇතුළත් කරන ප්‍රවේශයක්ද භාවිතයට ගැනේ. නමුත් එවැනි සංරචකයන් වින්දිතයන් සාර්ථක ලෙස සම්බන්ධ කර ගැනීම සඳහා පුළුල් සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන් සඳහා අත්‍යවශ්‍ය වේ.

නවෝත්පාදනය

DRL අප කණ්ඩායමට සංසදය වැනි ස්ථාවර යාන්ත්‍රණයක් තිබීම ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට හා වැඩසටහන්වල සංශෝධනයන් සිදුකිරීමට හැකියාව ලබාදෙයි. වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය වන සෑම අවස්ථාවක අරමුදල් ලබා ගැනීම සඳහා යෝජනාවක් විවෘතව ඉදිරිපත් කිරීමේ මාස 9 ක කාල වකවානුවක් හරහා නොයා මෙය සිදුකළ හැකිය. මෙම නම්‍යශීලීභාවය හා ඉක්මනින් සම්පත් රැස්කර ගැනීමේ ධාරිතාවය දේශපාලන වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමට අපට හැකියාව ලබාදෙයි. තවද තානාපති කාර්යාලවලින් ලැබෙන ඉල්ලීම් හා හවුල්කාර ආයතනවලින් ලැබෙන ප්‍රතිපෝෂණ සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාවද අපට ලැබේ. සන්ධානයේ අරමුණ වන්නේ ක්ෂේත්‍රයේ සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් සඳහාවූ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමත්, සන්ක්‍රාන්තික යුක්තිය හා ගැටමු ප්‍රතිචාර ක්ෂේත්‍ර තවදුරටත් වැඩිදියුණු කිරීමත් වේ. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා DRL කණ්ඩායමට යම් වැඩසටහන් සැලසුම් කරන ලෙස සන්ධානයෙන් හා හවුල්කාර සංවිධානවලින් ඉල්ලා සිටිය හැකිය. හවුල්කාර සංවිධානද DRL වෙත නවෝත්පාදන වැඩසටහන් සංකල්ප ඉදිරිපත් කළ හැකිය. දෙපැත්තට සිදුවන මෙම ගනුදෙනුව ප්‍රාදේශීය පසුබිම් පිළිබඳ ගැඹුරු දැනුමක් හා රැස්කරන ලද අත්දැකීම් සම්භාරයක් සහිත සංවිධාන ගැටුම් හා පශ්චාත් ගැටුම් පවතින රටවල්වල තිබෙන සංකීර්ණ ප්‍රශ්න සඳහා නව වැඩසටහන් මගින් නව ප්‍රවේශයන් ඉදිරිපත් කිරීමේ හැකියාව සතුව තිබෙන බව අපගේ විශ්වාසය පිළිබිඹු කරයි. අරමුදල් සපයන ප්‍රජාවට තමන්ගේ අදහස්වලට සහයෝගය ලබා ගැනීම සඳහා ව්‍යුහගත කරන ලද ක්‍රම මගින් ක්‍රියා කළ හැකිය.



දකුණු අප්‍රිකාවේ සන්ධානයේ හවුල්කාර සංවිධානයක් වන ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද දැඩි කම්පනය හා ස්වයං රැකවරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක්. ප්‍රචණ්ඩත්වය වළක්වන මෙම වැඩමුළුව 2017 මැයි මාසයේ GIJTR සන්ධානයේ අනුග්‍රහයෙන් ගයනා රටේ පවත්වන ලදී.

## ඉගෙන ගැනීම

(GIJTR) සන්ධානයේ ව්‍යුහය, ගැටුම් හා පශ්චාත් පසුබිම්වල සාර්ථක සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් පිළිබඳ ඉගෙන ගැනීමට නව අවස්ථාවන් ලබාදෙයි. සන්ධානයේ හවුල්කරුවන්ගේ හා හෘද සාක්ෂියය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධනයේ රටවල් 55 ක ක්‍රියාත්මක වන සාමාජික සංඛ්‍යාව 230 ක නිපුණතාවය ප්‍රයෝජනයට ගනිමින් සිදුවන සංවිධාන හා සහභාගිවන්නන් අතර සිදුවන අදහස් හුවමාරු සන්ධානයේ බොහෝ වැඩසටහන් පෝෂණය කරනු ලැබේ. උදාහරණයක් වශයෙන් කම්බෝජියාවේ හවුල්කාර සංවිධාන හා හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධාන ජාලයේ සාමාජික සංවිධාන දකුණු සුඩානයේ ලේඛණගත කටයුතුවල යෙදී සිටින පුද්ගලයන්ට අනුග්‍රහය දක්වා ඇත. මෙම ඉගෙනුම් ක්‍රියාකාරකම් ඉදිරි පර්ච්ඡේදවල විස්තරාත්මකව පෙන්වාදී ඇත. ඊට අමතරව සන්ධානය ලොව පුරා ප්‍රධාන වශයෙන් ගැටුම්වලින් පීඩාවාවට පත්වී තිබූ බොහෝ රටවල්වල වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එය මෙම ප්‍රකාශනයේ පිළිබිඹු වන චින්තනය සඳහා ඉතා වැදගත් අවස්ථාවක් ලබාදී ඇත. අවසානයේදී සන්ධානය නිතිපතා සියලුම සාමාජිකයන් කැඳවන අතර, සාමාජික සංවිධාන තමන්ගේ තනි ව්‍යාපෘති කණ්ඩායම්වලින් පිටතට පැමිණ වාර්ෂික රැස්වීමකට සහභාගී වෙති. මම වාර්ෂික සමුළු එක හවුල්කාර සංවිධානයක් විසින් තමන්ගේ රටේ පවත්වනු ලබයි. මේ සියලුම ක්‍රියාකාරකම් නිශ්චිත වැඩසටහන්වල බලපෑම අවබෝධ කර ගැනීමේ උත්සාහයටත් සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන්වලට ප්‍රවේශවීම සඳහාවූ මෙම නව මොඩලයේ සාර්ථකත්වය අවබෝධ කර ගැනීමටත් ඒවාගේම මෙම ක්‍රියාකාරකම්වලට අගයක් ලබාදී ඒ සඳහා තමන්ගේ සම්පත් වෙන් කිරීම සඳහා අරමුදල් සපයන්නන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් දිරිගැන්වීමටත් ඉවහල් වේ.

## ක්‍රියාවලිය හා ඒකාබද්ධ ක්‍රියාකාරකම්

මෙම මොඩලයට ආවේණිකවූ ක්‍රියාවලීන් - ක්‍රියාධරයන් කැඳවීම, විශ්වාසය ගොඩනැගීම සංකීර්ණ වටපිටාවන්වල විවිධ දෘෂ්ඨී කෝණයන් හා ප්‍රමුඛතාවයන් සහිත සම්බන්ධීකරණය කරන ලද ප්‍රවේශයක් ඇති කර ගැනීම වැනි ක්‍රියාවලීන් - වැඩි කාලයක් ගතවන ක්‍රියාවලීන් වන අතර, බොහේ අවස්ථාවල දැඩි වේදනාකාරී ක්‍රියාවලීන්ද වේ. දකුණු සුඩානය, ශ්‍රී ලංකාව වැනි රටවල්වල ක්‍රියාත්මක කරන ලද මෙහි සාකච්ඡා කර ඇති බොහේ වැඩසටහන්වල ප්‍රධාන සාර්ථකත්වයන් ගැටුම්වලින් පීඩාවට පත්වී සිටින ප්‍රජාවන්, වින්දිතයන් හා ආයතනික ක්‍රියාධරයන් කේන්ද්‍ර කරගෙන එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හේතුවක්වී ඇත. තවද විවිධ පාර්ශ්වකරුවන් අතර එම වැඩසටහන් විශ්වාසය හා සම්මුතියද ගොඩ නඟා ඇත. විවිධ හේතු නිසා- සමහර හේතු ගැඹුරින් ව්‍යුහගත හේන් වන අතර, අනෙකුත් ඒවා අධික වැඩ හා සම්බන්ධ හේතු වේ නිසා- අරමුදල් සපයන අය ප්‍රතිඵල හා නිශ්චිත අරමුණුකෙරෙහි අවධානය යොමු කළ හැකිය. අරමුදල් ලබා ගන්නා අය මෙම අරමුණු ඉටුකර ගන්නා ආකාරය පිළිබඳ වීි වශයෙන් අවධානය යොමු කිරීමට අවශ්‍ය වන්නේ නැත. මෙවැනි ස්වභාවයක් සහිත සන්ධානයක් සමඟ සිදුකරන වැඩ එවැනි අරමුණු හා ප්‍රතිඵලයන් ලඟාකර ගැනීම පිළිබඳ මීය යුතුය; කෙසේවෙතත්, සමස්ථ නම්‍යශීලි හා සියලුදෙනාම ඇතුළත් කර ගන්නා ක්‍රියාවලීන්ට හැකියාවක් ලබාදීම ඒ ආකාරයෙන්ම වැදගත් වේ. එවැනි වැඩසටහන් ප්‍රවේශයන් බොහේ දුරට තිරසාර වන අතර, සාර්ථක ප්‍රවේශයන්ද වේ. ගැටුම්වලින් පීඩාවට පත්වී ඉතා දුර්වල තත්ත්වයක සිටින පසුබිම්වල එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මෙම ක්‍රියාවලීන් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇගයීමට ලක්කර අරමුදල් සපයන්නන් විසින් ඒවාට සහයෝගය ලබාදිය යුතුයි. එවැනි ක්‍රියාකාරකම් මේ සඳහා අවශ්‍ය කාලය කුසලතා හා විෂයයාන්තාර සංකීර්ණ හා සාමූහික ප්‍රවේශයන් සාධාරණීයකරණය කරයි.

සන්ධානයේ හවුල්කාර සංවිධාන අවධානම් ගැනීමට තිබෙන ඔවුන්ගේ කැමැත්ත හා නව ක්‍රමවේදයන්වල සම්බන්ධ වීම හා සමහර අවස්ථාවල සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් පිළිබඳ සාමූහික ප්‍රවේශයන් ඇතිකර ගැනීමේ දුෂ්කර කාර්යයේ යෙදීම පිළිබඳ ඔවුන් පිළිගැනීමට ලක්විය යුතුය. විශේෂයෙන් හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයේ නායකත්වය හා එහි ප්‍රවේශය විශේෂයෙන් ඇගයීමට ලක්විය යුතුය. මෙම ප්‍රකාශනය සාර්ථක සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් පිළිබඳ තවදුරටත් සාකච්ඡාවක් දිරිගැන්යේ යැයි අපි විශ්වාස කරමු. විවිධ ක්ෂේත්‍රයන්වල හා ලෝකේ සෑම ප්‍රදේශයකම දශක ගණනාවක ඒකාබද්ධ නිපුණතාවය පදනම් කරගත් මෙවැනි වැඩසටහන් ගැටුමෙන් පීඩාවට පත්වී සිටින වින්දිතයන්ට හා සමාජයන්ට සාමය උදාකර ගැනීමට උපකාරී වනු ඇත.

# හැඳින්වීම

සන්ක්‍රාන්තික යුක්තිය දඬුවම් මිදී සිටීමේ තත්ත්වය අවසන් කිරීම, බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම්වල වින්දිතයන්ට සහන සැලසීම, නීතියේ ආධිපත්‍ය යළි ස්ථාපිත කිරීම යන අරමුණු සහිතව ක්‍රියාත්මක කරන පියවරයන් හා ක්‍රියාවලීන්වල සමූහයක් වේ. විශේෂයෙන් 1990 ගණනන්වල සිට මෙය පිළිබඳ පොත්පත් හා භාවිතයන් සම්භාරයක් පවතින නමුත් සන්ක්‍රාන්තික යුක්තියේ සාර්ථක වන්නේ කුමක්ද? අසාර්ථක වන්නේ කුමක්ද? යන්න පිළිබඳව ප්‍රායෝගික පර්යේෂණ නොමැති තත්ත්වයක් පවතී. කෙසේවෙතත් එවැනි සාක්ෂි රැස්කිරීමට "යුක්තිය" "සත්‍යය" හා "සංහිඳියාව" යන මූලික සංකල්පවල තිබෙන වෙනස්වූ අවබෝධයන් හේතුවෙන් බාධාවන් පවතී. ලොව පුරා මෑත කාලයේ ගැටුම් උත්සන්නවී පවතින පසුබිමක් තුළ වගවීම බලාපොරොත්තු වන පියවරයන් උපරිම ආකාරයෙන් සාර්ථක කර ගැනීම ඉතා වැදගත් වේ. සන්ක්‍රාන්තික යුක්තිය, අනෙකුත් පියවරයන් අතර, අයිතිවාසිකම් හා ගෞරවය උල්ලංඝනයවූ තත්ත්වයන් වෙනස් කර ගැනීම සඳහා වින්දිතයන් බලසතු කළ යුතුව ඇත. ඒ අනුව, සන්ක්‍රාන්තික යුක්තිය පහළ සිට ඉහළට යන නිශ්චිත පසුබිමට අදාළව ක්‍රියාත්මක වන උත්සාහයක් විය යුතුය. එය පීඩාවට පත්වී සිටින ජනතාවගේ අවශ්‍යතා, බලය හා අනාගතය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. සියලු දෙනාටම එකම ප්‍රමාණයේ විසඳුමක් නොමැති නිසා අපරාධ යුක්තිය හෝ සත්‍යය පැවසීමේ දෘෂ්ඨිකෝණවලින් පමණක් නොව, බහුවිධ දෘෂ්ඨිකෝණවලින් මුක්තියට ප්‍රහාර එල්ල කිරීමේ සමස්ථ ප්‍රවේශයක් සහිතව සන්ක්‍රාන්තික යුක්තිය ක්‍රියාත්මක විය යුතුය. මෙම සමස්ථ ප්‍රවේශය අපරාධ පිළිබඳ වගවීම, සත්‍යය, සදානුස්මරණය, ව්‍යුහාත්මක සංශෝධන හා සංහිඳියාව යන කරුණුවලට අදාළ විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ පියවරයන් ක්‍රියාවලීන් හා උපාය මාර්ගයන් ක්‍රියාත්මක කළ යුතුය.

### සාර්ථක සන්ක්‍රාන්තික යුක්තියක් ළඟා කර ගැනීම

අවාසනාවකට මෙන් එහි නිත්‍යානුකූලභාවය හා සාර්ථකත්වය කෙරෙහි බලපාන විවිධ අභියෝග පරාජය නොකර, සන්ක්‍රාන්තික යුක්තිය සාර්ථක කර ගත නොහැකිය. මෙහි තිබෙන බාධක ව්‍යුහාත්මක උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීමට අසාර්ථක වීම, මැදිහත්වීම්වල ජාත්‍යන්තරකරණය, සියලු දෙනාම ඇතුළත් කර ගැනීමට අපොහොසත්වීම යහපරිචයන් ක්‍රියාත්මක නොකිරීම යන කරුණු ඇතුළත් වේ. මෙම බාධක ජය ගැනීම බොහෝ දුෂ්කර කාර්යයක් වේ. එයට හේතුව සන්ක්‍රාන්තික යුක්තිය පිළිබඳ ඇගයීම් පදනම් කරගත් සාක්ෂි නොමැතිවීම වේ. වැඩසටහන් ක්‍රමානුකූලව වැඩිදියුණු කිරීම මෙය අපහසු කරයි. හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයේ මූලිකත්වයෙන් යුත් යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ගෝලීය මුලපිරීම් (GIJTR) සන්ධානය පවතින මෙම අභියෝගවලට විසඳුම් සැලසුම් කිරීමට ඒවා ඇගයීම් කිරීම් සඳහා 2014 වසරේ ස්ථාපිත කරන ලදී.

### සන්ක්‍රාන්තික යුක්තිය ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කළ යුතුය

ගැටුම්වලට හැකියාව ලබාදී, ඒවා සිදුකරන ව්‍යුහයන් පිළිබඳ ප්‍රශ්න ආමන්ත්‍රණය නොකර පුද්ගලයන් දඬුවම්වලින් මිදී සිටින තත්ත්වය අවසන් කිරීමට හැකියාවක් නොමැත. ඇත්ත වශයෙන්ම, පශ්චාත් ගැටුම් වගවීම යන කරුණු ව්‍යුහාත්මක හා ක්‍රමානුකූල ප්‍රචණ්ඩත්වය හා වෙනස් කොට සැලකීම ආමන්ත්‍රණය කිරීමට සාම්ප්‍රදායික සන්ක්‍රාන්තික යුක්ති පියවරයන්වලට නොහැකි තත්ත්වය හේතුවෙන් බාධා ඇතිවී තිබේ. එය වෙනුවට සාමාන්‍ය සන්ක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් "අතිවිශේෂ" ශාරීරික ප්‍රචණ්ඩත්වය කෙරෙහි අවධානය යොමු කරති. ඒවා මුල් බැසගෙන තිබෙන අසමානකම් හා සමාජයෙන් කොන් කරන තත්ත්වයන් සැලකිල්ලට නොගනී. "සාමාන්‍ය" ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය

නොසලකා හැරීම, මූලික හේතූන්ට ආමන්ත්‍රණය කර, බිම් මට්ටමේ ප්‍රජාවට ප්‍රමුඛතාවය ලබාදෙන තත්ත්වය නැති කරයි. උදාහරණයක් වශයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාව ගැටලු පිළිබඳ සන්ක්‍රාන්තික යුක්ති පියවරයන් ලිංගික ප්‍රචණ්ඩත්වය කෙරෙහි වැඩි වැදගත්කමක් ලබාදෙති. ලිංගික ප්‍රචණ්ඩත්වයද ඇතුළුවද, උල්ලංඝනයවීම්වලට බොහෝ අවස්ථාවල මූලික හේතූන් වන ස්ත්‍රී පුරුෂ සමාජභාව ගතිකත්වය නොසලකා හැරීම හා ගැටුම්වලදී කාන්තාවන් මුහුණදෙන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ලිංගික නොවන අනෙකුත් ක්‍රමයන් නොසලකා හැරීම මෙහි සඳහන් කළ හැකිය.

සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්වල හැකියාව හා අදාළත්වය වැඩි කර ගැනීම සඳහා එම ප්‍රයත්නයන් මූලික උල්ලංඝනයවීමේ සමඟ පාදන හේතූන් ගවේෂණය කළ යුතු අතර, සමහර ජන කණ්ඩායම් මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට පහසුවෙන් ගොදුරු විය හැකි තත්ත්වය අවබෝධ කරගෙන, ආමන්ත්‍රණය කිරීම මගින් සියලුම ආකාරයේ දඬුවම්වලින් මිදෙන තත්ත්වයන් අවසන් කළ යුතුය.

මෙම ආකාරයෙන් සන්ක්‍රාන්තික යුක්තිය බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම්වල රෝග ලක්ෂණවලට නොව හේතුවලට පිළියම් යෙදිය හැකිය. සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීම්වල ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ අදහස් හා සහභාගිත්වය අර්ථාන්විතව ගබා ගැනීම ගැටුමෙන් පීඩාවට පත්වී සිටින සමාජයක විවිධ ආකාරයෙන් ජනතාව ආන්තිකරණයවී ඇති ආකාරය හඳුනා ගැනීමද වැදගත් ක්‍රමයක් වේ. කෙසේවෙතත් බොහෝ ප්‍රයත්නයන් ජාත්‍යන්තර කරණයන්වීම බොහෝ දුරට දේශීය ජනතාවගේ සහභාගිත්වය වළක්වයි.



ගෞතමාලාවේ කොමාල්ෂා ප්‍රදේශයේ පිහිටි කලින් හමුදා කඳවුරක් ලෙස පවත්වා ගෙන ගිය ස්ථානයේ 2016 ඔක්තෝබර් මාසයේ GIJTR සන්ධානයේ සාමාජිකයන් මායා ගෝත්‍රික ප්‍රජාවගේ චාරිත්‍රයක් ඉටුකරන මෙම කඳවුර ගෞතමාලාවේ පිහිටා තිබෙන අතර, එම ස්ථානයේ සිට FAFB කණ්ඩායම විසින් වින්දිතයන් 220 දෙනෙකුගේ ශරීර කොටස් සොයා ගන්නා ලදී.

## සන්ක්‍රාන්තික යුක්තිය බිම් මට්ටමේ ප්‍රජාවට අයිති විය යුතු අතර එය සියලු දෙනාම ඇතුළත් කර ගත යුතුය.

දෙවෙනි ලෝක සංග්‍රාමයේ සිට සන්ක්‍රාන්තික යුක්තිය විශේෂයෙන් අපරාධ නඩු පැවරීම් හා සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවල භාවිතය වටා බහුල වශයෙන් වර්ධනයවී ඇති අතර, වැඩි වශයෙන්ම ජාත්‍යන්තරකරණය වී තිබේ. සන්ක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රය ජාත්‍යන්තරකරණයවීම හා විශේෂඥ දැනුමකින් සහිත වීම හේතුවෙන් ජාත්‍යන්තර ක්‍රියාධරයන් එහි වැඩි බලපෑමක් කළ හැකි තත්ත්වයක් නිර්මාණයවී තිබේ. විශේෂයෙන් සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්වලට මුලපිරීමේදී ඔවුන්ට එවැනි බලපෑමක් කළ හැකිය. මෙම ක්ෂේත්‍රයේ ඉහළ පැලැන්තිය ජාත්‍යන්තර වෘත්තීයවේදීන් හා මූල්‍යාධාර සපයන්නන් වැනි අය බලගුවීම තුළ ප්‍රාදේශීය ක්‍රියාධරයන් හා වින්දිතයන් වැනි පාර්ශ්වයන්ගේ අදහස් නොසලකා හරින තත්ත්වයක් නිර්මාණයවී තිබේ. මෙම ජාත්‍යන්තරකරණය, ජාත්‍යන්තර ප්‍රජාවගේ න්‍යාය පත්‍රයෙන් බාහිරව සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවට තිබෙන අවස්ථා හා දේශපාලන අවකාශයන් අහිමි කර තිබේ. මෙවැනි ක්‍රියාකාරකම් සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් වැඩි වශයෙන් මූල්‍යාධාර සපයනු ලැබේ.

බොහෝ ජාත්‍යන්තර ව්‍යාපෘති මෙන් නොව ප්‍රාදේශීය ප්‍රජාවට අයත් මෙවැනි ප්‍රයත්නයන් ප්‍රාදේශීය අවශ්‍යතාවයන් පදනම් කර ගෙන තිබෙන අතර, ඒවාට ප්‍රතිචාරද දක්වලු ලැබේ. ඔවුන්ගේ ජීවිත අත්දැකීම් මත ක්‍රියාත්මක වන වැඩසටහන්ද මෙයට ඇතුළත් වේ. ඊට අමතරව ප්‍රාදේශීය ප්‍රජාවට අයත් සන්ක්‍රාන්තික යුක්තියට දඬුවමින් මිදී සිටීමේ තත්ත්වය ප්‍රාදේශීය හා ජාතික පසුබිම තුළ තබා ගැනීමට හැකියාවක් තිබේ. එමනිසා එහි කාර්යක්‍ෂමභාවය හා බලපෑම වැඩිකර ගැනීම සඳහා සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන් පුළුල් වශයෙන් සියලු දෙනාම ඇතුළත් කර ගන්නා ප්‍රයත්නයන් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු වේ. සිවිල් සමාජයේ අදහස් විමසා, ඔවුන්ගේ බලාපොරොත්තු කළමණාකරනය කිරීම පමනක් ප්‍රමාණවත් නොවේ. එය වෙනුවට මෙවැනි වැඩසටහන් සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කරන අදියරයන් දක්වා සෑම අදියරයකදීම වින්දිතයන් හා පීඩාවට පත්වූ ප්‍රජාවන් ඒවාට සම්බන්ධ විය යුතුය. සහභාගිත්ව ප්‍රවේශයන් පුළුල් පරාසයේ අවශ්‍යතාවයන් හඳුනා ගන්නා අතර, ප්‍රවේශයන් එම අවශ්‍යතා නියත වශයෙන්ම ඉටුකරන සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් මොනවාදැයි තීරණය කර ගැනීමටද එම ප්‍රවේශයන් උපකාරී වේ. සියලු දෙනාම සහභාගි කරවා ගැනීම ඉතා විස්තරාත්මක සටහනක් සහතික කරන අතර, මෙය සන්ක්‍රාන්තික යුක්ති කාල වකවානුව තුළදී හා පසුව විශේෂයෙන් පුද්ගලයන් කොන් කිරීම ගැටුමට ප්‍රධාන හේතු වශයෙන් පවතින පසුබිම්වල අවශ්‍ය වේ. ඇත්ත වශයෙන්ම වින්දිතයන්ගේ සහභාගිත්ව මට්ටම් හා ඵලදායි ආකාරයෙන් සහභාගිවීම යන කරුණු ඕනෑම සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක සාර්ථකත්වයේ මිණුම් දඬු 2 ක් වේ.

ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මුලපිරීම් විශේෂයෙන් - වින්දිතයන්ගේ මූලිකත්වයෙන් සිදුකරන ලද ක්‍රියාකාරකම්- බොහෝ අවස්ථාවල බාහිර පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන විසඳුම්වලට වඩා සාර්ථකවී ඇති බව ඉතිහාසයේ පෙන්වාදී ඇත. සාම්ප්‍රදායික සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් මුහුණපාන අභියෝග සඳහා ප්‍රාදේශීය ප්‍රජාවට නවෝත්පාදන විසඳුම් ලබාදීමට තිබෙන හැකියාව මෙයට එක් හේතුවක් වේ. අපරාධ සඳහා නඩු පැවරීම් හා සත්‍යය සෙවීමේ කොමිසම් සභා වැනි ක්‍රියාවලීන් මෙයට ඇතුළත් වේ. මෙම ප්‍රයත්නයන් හේතුවෙන් රටට හා ප්‍රජාවන්ට විශාල ප්‍රතිලාභයන් ලැබෙන අතර, ඒවා ප්‍රාදේශීය ප්‍රජාව අයිතිය යටතේ ඒවා ක්‍රියාත්මක වේ. වැඩසටහන්වල තිරසාරභාවයට ප්‍රාදේශීය ප්‍රජාවගේ අයිතිය පිළිබඳ හැඟීම ඉතා වැදගත් වේ.

## සන්ක්‍රාන්තික යුක්තිය නිශ්චිත පසුබිමට අදාළ විය යුතුය

අදාළ පසුබිම අනුව ක්‍රියාත්මකවීම සන්ක්‍රාන්තික යුක්තියට ඉතා වැදගත් වන අතර, ප්‍රාදේශීය ප්‍රජාව මෙම ක්‍රියාවලිය සඳහාවූ අයිතිය ලබා ගන්නා විට ඔවුන් මේසයට පසුබිමට අදාළ නිපුණතාවය රැගෙන එයි. මෙය සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් තුළට ප්‍රාදේශීය පසුබිම, අවශ්‍යතා හා වගවීම පිළිබඳ අවබෝධයන් ඇතුළත් කර ගැනීමට ඉඩ සලසයි. විශේෂයෙන් යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ අදහස් නිශ්චිත පසුබිමට අදාළ වන අතර, ඒවා ලඟා කර ගැනීම සඳහා සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන් ප්‍රාදේශීය හා ජාත්‍යන්තර අවබෝධයන් සමඟ කටයුතු කරන අතරම, වගවීම පිළිබඳ ප්‍රජාවන්ගේ අගයන් හා සංකල්පයන් ඇතුළත් කර ගත යුතුය. එමනිසා ජාතික පසුබිමට අමතරව ප්‍රජා පසුබිම්ද මෙහිදී සැලකිල්ලට ගත යුතුව ඇත. එයට හේතුව බොහෝ අවස්ථාවල රජයේ සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් (ඒවා ක්‍රිත්මක වන අවස්ථාවල) හා ව්‍යුහාත්මක මුක්තිය අවසන් කිරීම වැනි පීඩාවට පත්වූ ජන කණ්ඩායම්වල අවශ්‍යතා අතර සම්බන්ධතාවයක් නොපවතී. මෙය විවිධ ප්‍රාදේශීය මට්ටම්වල වගවීම හා පසුබිම අතර පවතින සම්බන්ධය පිළිගැනීමට ලක්විය යුතුය; කෙසේවෙතත් සන්ක්‍රාන්තික යුක්තිය බොහෝ අවස්ථාවල මේ අංගයන් දෙක විසන්ධි කරයි. නිදසුනක් වශයෙන් භූගෝලීය හා අධිකරණ බල ප්‍රදේශ සීමාවන් හේතුවෙන් සාම්ප්‍රදායික නඩු පැවරීම් හා සත්‍යය සෙවීමේ කොමිසම් සභා මගින් ඉතා වැදගත් පසුබිමට අදාළ වැදගත් තොරතුරු ඉවත් කිරීමට සිදුවේ. මෙයින් සිදුවන ඍණාත්මක බලපෑම්, සන්ක්‍රාන්තික යුක්තිය පසුබිමට අදාළ තත්ත්වයක් නිර්මාණය කරයි. තවද ව්‍යුහාත්මක දඬුවමින් මිදී සිටින තත්ත්වයන් හා ගැටුමට පාදක වූ මූලික හේතූන් ආමන්ත්‍රණය කිරීමටද එය අසමත් වේ.

සන්ක්‍රාන්තික යුක්තිය ජාත්‍යන්තරකරණය වීම හා අදාළ පසුබිමෙන් ඉවත්ව ක්‍රියාත්මකවීම යන කරුණු දෙකම, "යහ පරිචයන් " වැනි තාක්ෂණික දේවල් සංවර්ධනය කිරීම හරහා එය ප්‍රමිතිකරණයට ලක්වීමේ ප්‍රයත්නයන් නිර්මාණය කර ඇත. මෙම යහ පරිචයන් ප්‍රාදේශීය නවෝත්පාදනය හා අදහස් පසෙකලා ජාත්‍යන්තර විශේෂඥයන් විසින් නිර්මාණය කරනු ලැබේ. ඊට අමතරව, අපරාධ සඳහා නඩු පැවරීම හා සත්‍යය සෙවීමේ කොමිසම් සභා පිළිබඳ- එම යාන්ත්‍රණවල බලපෑම් පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි නොමැති වුවත්, - ජාත්‍යන්තර වශයෙන් අවධාරණය කිරීම හා විශේෂඥ නිර්දේශ මත රඳා පැවතීම යන කරුණු, අනෙකුත් දීර්ඝකාලීන, සමස්ථ හා දඬුවමින් මිදීමේ නිදහසට එරෙහිව සාධක අභිබවා යා හැකිය. විවිධ රටවල් හා පසුබිම්වල සිදුකරන ලද සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන් සංසඳනය කිරීම ඒවා දැනට පවතින නිශ්චිත පසුබිමට අදාළ කර ගන්නේ නම්, ඉතාම ප්‍රයෝනවත් මග පෙන්වීමක් වනු ඇත. තවද ජාත්‍යන්තර පිටස්තරයන් නිර්දේශ ඉදිරිපත් නොකළ යුතුය; නමුත්, ඔවුන් සමස්ථ සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් සැලසුම් කර, ක්‍රියාත්මක කිරීමට අදාළ මෙවලම් හා තාක්ෂණික කරුණු පිළිබඳ වින්දිතයන්ද ඇතුළු ප්‍රාදේශීය ප්‍රජාවන්ට අධ්‍යාපනයක් ලබාදිය හැකිය. දැනුම බෙදා හදා ගැනීම පිළිබඳ මෙම ප්‍රවේශය අර්ථාන්විත ප්‍රාදේශීය මට්ටමේ සහභාගිත්ව ප්‍රයත්නයන් හා නාවෝත්පාදනයන්ට හැකියාව ලබා දෙයි.

## සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් ඇගයීමට ලක්විය යුතුය

දීර්ඝකාලීන ක්‍රියාවලියක් වන සන්ක්‍රාන්තික යුක්තිය ඇගයීම, ප්‍රචණ්ඩත්වය හා අස්ථාවරභාවය හේතුවෙන් බොහෝ අවස්ථාවල බාධාවන්ට මුහුණ දිය හැකිය. එම අවස්ථාවල එසේ ඇගයීම් සිදුකිරීම දැඩි අපහසු විය හැකිය. කෙසේවෙතත්, අභියෝග හා ඉදිරියේ තිබෙන අවස්ථා පිළිබඳ විචාරශීලීව සිතා බැලීමෙන් තොරව මෙම ක්ෂේත්‍රය වර්ධනය විය නොහැකිය. නිශ්චිත පියවරයන්වල බලපෑම පෙන්වා දෙන හෝ ඒවා අභියෝගයට ලක් කරන සාක්ෂි නොමැති තත්ත්වයක් පවතී. එමනිසා සන්ක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රය විවිධ යාන්ත්‍රණයන්වල- විශේෂයෙන් නඩු පැවරීම් හා සත්‍යය සෙවීමේ කොමිසම් සභා වැනි යාන්ත්‍රණයන්වල- හැකියාවන් පිළිබඳ සනාථ නොකළ ආදේශවලට ඉඩ විවෘත

කළ හැකිය. බොහෝ අවස්ථාවල මෙයට පක්ෂව ක්‍රියා කරන පුද්ගලයන් තමන්ගේ ප්‍රියතම ක්‍රියාවලියේ ප්‍රතිලාභයන් සාක්ෂිවලින් තොරව හුවා දක්වති. තවද, එහි අඩුපාඩුකම් ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවත් ඔවුන් තර්ක කරති. මෙය ධනාත්මක ලක්ෂණ පෙන්වා දෙන අතර, ඍණාත්මක ලක්ෂණ නොසලකා හරී. පිරිවිය යුතු වගවීම් පිළිබඳ හිඩැස් හඳුනා ගැනීම මෙය වළක්වයි. තවද, මෙය විවිධ සුවිශේෂී ක්‍රියාවලීන්වල ප්‍රතිලාභ ලඟාකර ගැනීම සඳහා සමස්ථ ප්‍රවේශයකට හඬ නැගීම වෙනුවට සමහර පියවරයන්වල ප්‍රතිලාභයන් පමණක් වැඩි වශයෙන් අවධාරණය කරයි.

සන්ක්‍රාන්තික යුක්ති පියවරයන්වල සාර්ථකත්වය පිළිබඳ ගැඹුරින් සිතා බැලීම සඳහා යුක්තිය, සත්‍යය හා සංහිඳියාවද ඇතුළුව වචන පිළිබඳ එක්තරා මට්ටමක සම්මුතියක් අවශ්‍ය කරයි. එසේ නොවන විට ඒවා මැනිය නොහැකි දර්ශක විය හැකිය. ඇත්ත වශයෙන් යුක්තිය, සත්‍යය හා සංහිඳියාව යන සංකල්පයන් මතභේදයට තුඩුදෙන සංකල්පයන් වශයෙන් පවතී. සමහර විට අද යුගයේ ඒවා හුදු වචන පමණක්ම වන තත්ත්වයක් පවතී. ඒවා පිළිබඳ පවතින අවබෝධයන් ප්‍රජාවන්, ජනතාව හා කාල වකවානු අතර වෙනස් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පීඩාවට පත්වූ ප්‍රජාවන්ගේ නිර්වචනයන් පාවිච්චි කරන ප්‍රවේශයන්, සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් සාමාන්‍ය ජනතාව බලාපොරොත්තු වන යුක්තිය, සත්‍යය හා සංහිඳියාව වැනි අරමුණු ලඟා කර ගැනීම තහවුරු කරයි. ඉලක්ක පාර්ශ්ව කණ්ඩායම්වලට සම්බන්ධයක් නැති විශේෂඥ සංකල්ප හා ජාත්‍යන්තර සංකල්ප වෙනුවට මෙය අවශ්‍ය වේ.

## සමස්ථ සන්ක්‍රාන්තික යුක්ති ඉගෙනුම් ප්‍රජාවක් ගොඩනැගීම

සන්ක්‍රාන්තික යුක්තිය පිළිබඳ වත්මන් ජාත්‍යන්තර සංකල්පය ක්‍රමවේදයන්ට වඩා ප්‍රතිඵලයන් කෙරෙහි අවධාරනය කරන, අරමුණු පදනම් කරගත් සංකල්පයක් වේ. මෙහිදී ප්‍රාදේශීය නවෝත්පාදනයට වඩා ප්‍රමිතියට වැදගත් ස්ථානයක් දෙනු ලැබේ. කෙසේවෙතත්, සන්ක්‍රාන්තික යුක්තියේ පුළුල් අරමුණු වන යුක්තිය, සත්‍යය හා සංහිඳියාව එක පියවරයකින් හෝ උපාය මාර්ගයකින් ලඟා කර ගත නොහැකිය. ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමස්ථ ප්‍රවේශයක් පාවිච්චි කිරීමට අමතරව යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංකල්පයන් පිළිබඳ වාද විවාද පවත්වා එකගත්වයට පැමිණිය යුතුය. තවද එම සංකල්පයන්ට පසුබිම් පිළිබඳ තමන් සතුව තිබෙන අබෝධයන් අනුව ප්‍රජාවන් විසින් නිර්වචනය කළ යුතුව ඇත. සන්ක්‍රාන්තික යුක්තිය පිළිබඳ (GIJTR) ප්‍රවේශය- එනම් සමස්ථ, විෂයයාන්තර, ප්‍රාදේශීය ප්‍රජාවට අයත් හා නිශ්චිත පසුබිමට අදාළ ප්‍රවේශය- ප්‍රාදේශීය අවශ්‍යතා කේන්ද්‍ර කරගෙන තිබෙන අතර, යුක්තිය හා සත්‍යය ආමන්ත්‍රණය කිරීමටත්, ඒවාගේම සංහිඳියාව පෝෂණය කිරීමටත් ප්‍රාදේශීය ප්‍රජාවගේ මුලපිරීම්වලට සහයෝගය ලබා දෙයි. බිම් මට්ටමේ වැඩ කිරීම මගින් සන්ක්‍රාන්තික යුක්තිය හා යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ තම අදහස් අන් අය මත පැටවීමෙන් වැළකී සිටී.

ධනාත්මක වෙනස්කම් ඇති කරන නිශ්චිත අංගයන් හඳුනා ගැනීම සඳහා ප්‍රතිඵල පදනම් කර ගත් අධීක්ෂණ හා ඇගයීමේ ක්‍රමවේදයක් (GIJTR) සන්ධානය විසින් පිළිපදිනු ලැබේ. ඒ අනුව නවෝත්පාදන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහාත්, උගත් පාඩම් බෙදා හදා ගැනීම සඳහා, මෙම අත් පොත ලෝකයේ කලාප 5 ක සන්ධානයේ වැඩසටහන්වල සාර්ථකත්වයන් හා එම වැඩසටහන් මුහුණ දෙන අභියෝගයන් ගුණාත්මකව ඇගයීමට ලක් කරයි. එම කලාප 5 වන්නේ දකුණු සුඩානය, සිරියාව, ශ්‍රී ලංකාව, මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය හා කොළොම්බියාව වේ. මෙම ඇගයීම සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීම්වල බලපෑම අවබෝධ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ලබාදීමට දායකත්වයක් ලබාදෙනු ඇතැයි සන්ධානය විශ්වාස කරයි. සමහර පියවරයන්, ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන්ට වඩා වැඩි වශයෙන් සාර්ථක වූයේ ඇයි දැයි යන්නද මෙයට ඇතුළත් වේ. මෙය රජයන් සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන් ආරම්භ කිරීමට හෝ දැනට පවතින වැටසටහන්වලට සහයෝගය


දැක්වීමට උනන්දුවක් දක්වන සිවිල් සමාජය, ක්‍රියාධරයන්, අනෙකුත් මුල්‍යාධාර සපයන්නන් යන පාර්ශ්වයන්ට මූලික දැනුමක් ලබාදිය හැකිය.



ගයනාවේ 2017 මැයි මස GIJTR සන්ධානය හවුල්කරුවන් විසින් පවත්වන ලද ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩමුළුවක්.

දකුණු සූඩානයේ ප්‍රාදේශීය ප්‍රජාවට අයත් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමකට (**පරිච්ඡේදය** 1) සන්ධානය විෂයයාන්තර සහයෝගය ලබා දුන්නේය. ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් එය සන්ධානයක් ගොඩනැගූ අතර, අපරාධවලට වගවීම, සත්‍යය, සදානුස්මරණය හා සංහිඳියා මුලපිරීම් ඇතුළුව පුළුල් පරාසයේ මානව හිමිකම් උල්ලංඝනයවීම් ලේඛණගත කිරීම සඳහා ඔවුන් සූදානම් කළේය. මෙම ව්‍යාපෘතියෙන් ලබා ගත් පාඩම්, ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් ලේඛණගත කිරීම අවශ්‍යවන අනෙකුත් බහු ජනවාර්ගික හා අඛණ්ඩව සිදුවන ගැටුම්වලට අදාළ වේ. සේවා ලබාදීම වැඩිදියුණු කර ගැනීම සඳහා සිරියාවේ වින්දිතයන් හා සේවා ලබා දෙන්නන් සමඟ අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් සිදුකිරීමට විෂයයාන්තර හා බහු ක්ෂේත්‍ර ප්‍රවේශයක් ක්‍රියාත්මක කළේය ((**පරිච්ඡේදය** 2). සේවා ලබා දෙන්නන් අතර පුද්ගලයන් යොමු කිරීමේ හා සිරියානු වැසියන්ට හානිපූරණ ලබාදීමේ ජාලයක් සඳහාවූ අත්තිවාරමක් ස්ථාපිත කිරීම සඳහා මනෝ සමාජයීය, වෛද්‍ය, නීති හා මානව අයිතිවාසිකම් ලේඛණගත කිරීමේ අවශ්‍යතාවය ඇගයීම සඳහා ප්‍රාදේශීය හවුල්කරුවන් සමඟ සම්බන්ධවී කටයුතු කළේය. මෙම ඇගයීම සක්‍රියව ඉහළ ප්‍රමාණයේ ගැටුම් සිදුවන තත්ත්වයක් පිළිබඳව අවශ්‍යතා ඇගයීමක් සිදුකිරීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජය සමඟ සාමූහිකව කටයුතු කිරීම පිළිබඳ පාඩම් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය හා රජයේ ක්‍රියාධරයන් සමඟ සිදුකරන ලද අවශ්‍යතා ඇගයීම් හා ධාරිතා ගොඩනැගීමේ වැඩමුළු සඳහා සියලු දෙනාම ඇතුළත් කර ගන්නා ක්‍රමවේදය භාවිතා කළේය(**පරිච්ඡේදය** 3). ප්‍රාදේශීය ප්‍රජාවට අයත් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් - විවිධ ජනවාර්ගික කණ්ඩායම්, ආගම් හා කලාපවලට අයත් නියෝජිතවරුන් සම්බන්ධ කරන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. - සන්ක්‍රාන්තික යුක්ති හා සංහිඳියා ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීම සඳහා එහි පාඩම් මානව හිමිකම් උල්ලංඝනයවීම් හා දණ්ඩණ මුක්තිය හා රජය පිළිබඳ අවිශ්වාසය පවතින පශ්චාත් ගැටුම් රටවල් ඉලක්ක කර ගනී. අවසාන වශයෙන්, මැදපෙරදිග උතුරු අප්‍රිකා කලාපයේ සන්ධානය කලාපීය දැනුම බෙදා හදා ගැනීමේ ජාලයක් ප්‍රවර්ධනය කළ අතර කුඩා ප්‍රමාණයේ අරමුදල් සැපයීම මගින් ප්‍රාදේශීය නවෝත්පාදනවලට සහයෝගය ලබා දුන්නේය (**පරිච්ඡේදය** 4). සන්ක්‍රාන්තික මූලධර්මය හා භාවිතය පිළිබඳ බිම් මට්ටමේ ක්‍රියාධරයන් පුහුණු කිරීම සඳහා ස්ථාපිත කරන ලද අධ්‍යයන පර්ෂදය හේතුවෙන් මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු කලාප මට්ටමේ ජාලයක් බිහිවිය. සන්ක්‍රාන්තික යුක්ති වැඩසටහන්වලට දායකත්වයක් ලබාදීමට ඒවා සංවර්ධනය කිරීමට ප්‍රජා සහභාගිත්වය සවිබල ගැන්වීම සඳහා මෙම පුහුණුව ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය හා එහි පාඩම් නැවුම් ඒවා වන අතර, ගැටුම් කලාපයක ප්‍රාදේශීය පාර්ශ්වකරුවන්ගේ ධාරිතාව ගොඩනැගීම සඳහා සමස්ථ විෂයයාන්තර ක්‍රමවේදයන් පාවිච්චි කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

උගත් පාඩම් සහිත ඉදාරාපති කරන ඇගයීම් පරිච්ඡේදයන් 4 ට අමතරව, සංසදය විස්තරාත්මක පරිච්ඡේද 2 ක තවදුරටත් නිර්දේශ ඉදිරිපත් කරයි. ඉහත සඳහන් කළ තත්ත්වයන්ද ඇතුළුව අපරාධ නඩු පැවරීම්වල මානව හිමිකම් ලේඛණගත කිරීම වැඩි වශයෙන් පාවිච්චි කරනු ලබන පසුබිමක් තුළ මෙම අත්පොත කාම්බෝජය, පෙර යුගෝස්ලෝවියාව, ගෞතමාලාව යන රටවල්වල සිවිල් සමාජ සංවිධානවල ලේඛණගත කිරීමේ කටයුතු විස්තර කරන අතර, අපරාධ සඳහා වගවීම පිළිබඳ එම ලේඛණවල දායකත්වයද පැහැදිලි කරයි(**පරිච්ඡේදය 5**). ලේඛණගත කිරීමේ කටයුතු අපක්ෂපාතීව විෂය මූලිකව හා ආයතනගතව සිදුවිය යුතු බවත්, කරුණු දක්වන පුද්ගලයන් තොරතුරු දැනගෙන අවසර ලබාදීම හා දැඩි සනාථ කිරීමේ ක්‍රියා පිළිවෙත් මත රඳා එය පැවතිය යුතු බවත් අදාළ ප්‍රාදේශීය සිවිල් සංවිධාන 3 නිර්දේශ කරති. වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීමේ වැදගත්කම, ඔවුන්ගේ අවශ්‍යතා හා අභිලාශයන් සැලකිල්ලට ගැනීම හා ලේඛණ හා සාක්ෂි සහිතව වෙනස්කම් ඇති කිරීම යන කරුණුවල වැදගත්කම ඔවුන්ගේ පාඩම් පෙන්වා දෙයි. අවසානයේදී, මෙම අත්පොත කොලොම්බියාවේ සිදුකරන ලද විස්තරාත්මකව අවශ්‍යතා ඇගයීමක සාරාංශයද ඉදිරිපත් කරයි. ඉතා සංකීර්ණ තත්ත්වයක සීමිත සම්පත් සහිතව, ප්‍රාදේශීය අවශ්‍යතා සොයා ගැනීමේ හැකියාව පෙන්වාදීම සඳහාවූ සිද්ධි අධ්‍යයනයක් ලෙස මෙය ඉදිරිපත් කරනු ලැබේ (**පරිච්ඡේදය 6**). සන්ධානය මෙම ඇගයීම 2016 ජූනි- අගෝස්තු මස කාල වකවානුවේදී සාම සාකච්ඡා සිදුවෙන පසුබිම තුළ සිදුකළ අතර, රජයේ මූලිකත්වයෙන් සිදුකරන සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියේ අවශ්‍යතා හා බලාපොරොත්තු අවබෝධ කර ගැනීමට උත්සාහයක් දැරීය.




මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ 2016 ජූලි මාසයේ පවත්වන ලද ඡායාරූප ප්‍රදර්ශනයන් නරඹන කාන්තවක් - මෙය GIJTR සන්ධානය විසින් සහයෝගය ලබාදෙන ලද ප්‍රජා අධිවාචන ව්‍යාපෘතියක් වේ.

සන්ධානයේ විවිධ වූ ව්‍යාපෘතීන් සමස්ථ විෂයයාන්තර බහු ක්ෂේත්‍ර ප්‍රවේශයන් කෙරෙහි අවධානය යොමු කළ අතර, එම ව්‍යාපෘතීන් මගින් ප්‍රාදේශීය අවශ්‍යතා හා නවෝත්පාදනයන්ට ප්‍රමුඛත්වය ලබාදෙන ලදී. දණ්ඩණ මුක්තිය අවසන් කිරීමේ සමාම්ප්‍රදායික පියවරයන් මුහුණදෙන අභියෝග ජය ගැනීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවට අයත් සියලු දෙනාම ඇතුළත් කර ගත් පසුබිමට අදාළ වන සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් ක්‍රියාත්මක කරන ලදී. මෙම අත්පොත එහි අවසානයේ සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමේදී සාධකයන් වශයෙන් සැලකිල්ලට ගත යුතු විවිධ පාඩම් ගොනු කිරීම සඳහා උත්සාහයක් දරයි. නමුත් කිසිම ක්ෂණික විසඳුමක් නොමැති බව මෙහි සඳහන් කළ යුතුය. මෙවැනි ආකාරයේ දැනුම හුවමාරු කර ගැනීමේ හා ඉගෙන ගැනීමේ ක්‍රියාවලීන් දණ්ඩන මුක්තියට එරෙහි අරගලය වැඩිදියුණු කිරීමේ හැකියාව සතුව තිබේ. විශේෂයෙන් එය ගෝලීය වශයෙන් ඉගෙන ගන්නා ප්‍රජාවකට දායකත්වයක් ලබාදෙයි. එවැනි ඉගෙන ගන්නා ප්‍රජාවකට ගැටුමින් දැඩි ලෙස පීඩාවට පත්වී සිටින පුද්ගලයින් තමන්ගේ අනාගතය ගැන තීරණ ගෙන, තමන්ගේ දෛනික ජීවිතයේ සන්ක්‍රාන්තික යුක්තියේ පැහැදිළි ප්‍රතිලාභ භුක්ති විඳීම තහවුරු කළ හැකිය.

### පරිශීලනය කරන ලද පොත්පත්:


- Hugo Van Der Merwe et al. Eds., ASSESSING THE IMPACT OF TRANSITIONAL JUSTICE: CHALLENGES FOR EMPIRICAL RESEARCH (2009).
- Vasuki Nesiah, *Transitional Justice Practice: Looking Back, Moving Forward,* IMPUNITY WATCH (May 2016).
- Simon Robins, *Mapping a Future for Transitional Justice by Learning from Its Past*, 9 INTERNATIONAL JOURNAL OF TRANSITIONAL JUSTICE 181 (2015).
- Juan E. Méndez, *Victims As Protagonists In Transitional Justice*, 10 INTERNATIONAL JOURNAL OF TRANSITIONAL JUSTICE 1 (2016).
- Paul Gready & Simon Robins, *From Transitional to Transformative Justice: A New Agenda for Practice*, 8 INTERNATIONAL JOURNAL OF TRANSITIONAL JUSTICE 339 (2014).
- David Mendeloff, *Truth-Seeking, Truth-Telling, and Postconflict Peacebuilding: Curb the Enthusiasm?*, 6 INTERNATIONAL STUDIES REVIEW 355 (2004).



ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වයට මුහුණදී, ජීවත්ව සිටින කාන්තාවන් 22 දෙදෙනෙක් සඳහා GIJTR සන්ධානයේ මූලිකත්වයෙන් 2017 අගෝස්තු මාසයේ පවත්වන ලද ශරීරය සිතියම්ගත කිරීමේ වැඩමුළුවක්.

# ක්‍රමවේදය

දකුණු සුඩානය, සිරියාව, ශ්‍රී ලංකාව, මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය යන ප්‍රදේශ පිළිබඳ ඇගයීම් සිදුකිරීම සඳහා පරිච්ඡේද 4 ක් වෙන්කර ඇත. මෙය මූලික හවුල්කාර ආයතනවල යුක්තිය, සත්‍යය හා සංහිඳියාව සඳහාවූ ගෝලීය මුලපිරීමේ සන්ධානය විසින් පවත්වන ලද ව්‍යාපෘති පිළිබඳ ස්වයං ඇගයීම් පදනම් කරගෙන ඇත. ඒවා සමස්ථයක් වශයෙන් හා තනි ක්‍රියාකාරකම් වශයෙන් ව්‍යාපෘතිය පිළිබඳ කරන ලද ගුණාත්මක ඇගයීම් වන අතර, සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සහභාගිවන්නන් හා හවුල්කරුවන්ගෙන්ද සන්ධානයේ හවුල්කරුවන්ගේ අභ්‍යන්තර ඇගයීම්වලින් ලබා ගත් ප්‍රතිපෝෂණද පදනම් කරගෙන සිදුකර ඇත. මෙම ඇගයීම ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය සඳහාවූ සංවිධානයෙන් (OECD) ලබා ගත් සංවිධානයේ සංවර්ධන සහායක කමිටුවෙන් ( DAC), කමිටුවෙන් ලබා ගත් නිර්ණායකය ප්‍රයෝජනයට ගනී. ගැටුම් හා දුර්වල තත්ත්වයන් පවතින පසුබිම්වල සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් ඇගයීමේ මඟ පෙන්වීම අනුව සිදුකර ඇත. මෙම නිර්ණායකයන් වන්නේ:

- අදාළත්වය. මෙම නිර්ණායකය ව්‍යාපෘතිය කෙතරම් දුරට ප්‍රාදේශීය පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වා ඇතැයිද යන කරුණ ඇගයීමට ලක් කරයි.
- කාර්ය සාධනීය තත්ත්වය. මෙම ව්‍යාපෘතිය කෙතරම් දුරට එහි අරමුණු හා ඉලක්කයන් සාර්ථක කර ඇද්ද, එසේ නැත්නම් සාර්ථක කළ හැකිද යන කරුණ ඇගයීමට ලක් කරයි.
- බලපෑම. මෙම නිර්ණායකය ව්‍යාපෘතියේ පුළුල්, ඍජු හා වක්‍ර බලපෑම් ඇගයීමට ලක් කරයි.
- තිරසාරභාවය. මෙම නිර්ණායකය ව්‍යාපෘතියේ ප්‍රතිලාභ කෙතරම් දුරට දීර්ඝ කාලීනව පැවතිය හැකිදැයි යන්න කරුණ ඇගයීමට ලක් කරයි.
- කාර්යක්ෂමතාවය. මෙම නිර්ණායකය ව්‍යාපෘතියේ ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂම ආකාරයෙන් පාවිච්චි කර ඇති ඇගයීමට ලක් කරයි.
- තර්කානුකූල ගැලපීම. මෙම නිර්ණායකය ව්‍යාපෘති ක්‍රියාකාරකම් කෙතරම් දුරට එවැනි යොමුවන් නැති අනෙකුත් ව්‍යාපෘති සමඟ ගැලපෙන්නේ දැයි යන කරුණ ඇගයීමට ලක් කරයි.
- සම්බන්ධීකරණය. මෙම නිර්ණායකය මෙම ව්‍යාපෘතිය මෙවැනි ඉලක්ක සහිත අනෙකුත් සමාන ව්‍යාපෘති සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇති ආකාරය ඇගයීමට ලක් කරයි.

ඇගයීම හා මෙහි සඳහන් කර ඇති පාඩම් නවෝත්පාදන සන්ක්‍රාන්තික යුක්ති විසඳුම්වලට දායකත්වයක් ලබාදෙනු ඇතැයි සන්ධානය විශ්වාස කරයි. මේ ආකාරයෙන් දශක දෙකකට පෙර සංවර්ධනය කරන ලද දැනට ක්‍රියාත්මක වන මොඩලයන් තවදුරටත් වැඩිදියුණු කිරීමටත්, වත්මන් වින්දිතයන්ගේ පුළුල් අවශ්‍යතා මනා ලෙස ආමන්ත්‍රණය කිරීමත්, ඒවාට සහන සැලසීමටත් වගවීමේ තිබෙන පරතරයක් පිරවීමටත් බලාපොරොත්තු වේ.



දකුණු සූඩානයේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවරේ සිවිල් වැසියන් ආරක්‍ෂා කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටි පාසලක්. මෙම පාසල ජුබා ප්‍රදේශයේ පිහිටා තිබෙන අතර, මෙහි සියලුම වයස් කණ්ඩායම්වලට අයත් ළමයින් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය, සමාජ විද්‍යාව හා ඉතිහාසය වැනි විෂයන් ඉගෙන ගනී.අන්තර් ජාතික සහයෝගය සඳහාවූ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනයේ තොරතුරු අනුව, දකුණු සූඩානය ලෝකයේ පාසල් අධ්‍යාපනයෙන් අතරමගදී ඉවත්වන ළමයින්ගේ ඉහළම ප්‍රතිශතය වාර්තා කරන රට දකුණු සූඩානය වේ.

# පරිච්ඡේදය 1 :

## දකුණු සූඩාන් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම

### දකුණු සූඩානයේ තත්ත්වය




දකුණු සූඩානයේ සිවිල් යුද්ධයෙන් පීඩාවට පත්වී ජීවත්ව සිටින පුද්ගලයෙක් විසින් අඳින ලද ශරීර සිතියමේ කොටසක්. මෙය 2016 නොවැම්බර් මාසයේ උගන්ඩාවේ GIJTR සන්ධානය විසින් පවත්වන ලද වැඩමුළුකදී අඳින ලද චිත්‍රයකි.

2011 ජුනි 09 වෙනිදා පවත්වන ලද ජනමත විචාරණයකදී බෙදා වෙන්වීමට පක්‍ෂව වැඩි ඡන්ද ලැබීමෙන් අනතුරුව  දකුණු සූඩානයෙන් නිදහස ලබාගෙන ලෝකයේ නවතම රාජ්‍ය වශයෙන් බිහිවිය. 2013 දෙසැම්බර් මාසයේ ජනාධිපති සල්වා කීර් හා ඔහුගේ උප ජනාධිපති රේක් මචාර් අතර ප්‍රශ්න ඇතිවූ අතර, එය ප්‍රචණ්ඩත්වයක් ලෙස වර්ධනය විය. මෙම ප්‍රචණ්ඩත්වය ඉතා ඉක්මනින් ජෝබා ප්‍රදේශය පුරාම පැතිර තිය අතර, දකුණු සූඩානයේ දැනට සිදුවෙමින් පවතින අභ්‍යන්තර සන්නද්ධ අරගලය විසින් ආරම්භ විය. දේශපාලන සන්ධාන හා ජනවර්ගය යන කරුණු දෙකම මෙම ගැටුම පොළඹවන සාධක වේ. (ඩින්කා ගෝත්‍රයට අයත්) කීර් ජනාධිපතිවරයාගේ ආධාරකරුවන් සූඩාන් ජනතා විමුක්ති ව්‍යාපාරයට/සූඩාන් ජනතා විමුක්ති හමුදාවට (SPLM/SPLA) සම්බන්ධ වන අතර, (නුවේර් ගෝත්‍රිකයෙකු වන) මචාර් උප ජනාධිපතිවරයාගේ ආධාරකරුවන් විරුද්ධ පාර්ශ්වයේ සිටින ජනතා විමුක්ති හමුදාවට (SPLM-IO) සම්බන්ධවී සිටී. ඓතිහාසික වශයෙන් මෙම ගැටුම දේශපාලනික හේතු නිසා මතුවී තිබෙන නමුත් මෑතකදී ජනවර්ග ඉලක්ක කරගෙන සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවී තිබේ. එය වෛරය ඇති කරන කතා පැවැත්වීම, ප්‍රචණ්ඩත්වය සඳහා ජනතාව උසිගැන්වීම හා ශාරීරික ප්‍රහාර වැනි දේවල් හරහා සිදුවෙමින් පවතී. මෙම සියලුම කරුණු දකුණු සූඩානය සමූල ඝාතනයක අවදානමකට ලක්කර ඇත. ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හා ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කර ඇති අතර, 2017 පෙබරවාරි මාසය වන විට එරටේ මිලියන 1.5 ක් ජනතාව සරණාගතයන්  බවට පත්වී සිටි අතර, තවත් 1.8 ක් අවතැන්වී සිටියහ. මෙම අයගෙන් වැඩි දෙනෙක් කාන්තාවන් හා ළමයින් වේ.

ගැටුමට අදාළ පාර්ශ්වකරුවන් සාම ගිවිසුමක අත්සන් තැබූ අතර, සූඩාන් ජනරජයේ ගැටුම විසඳීම සඳහාවූ එම ගිවිසුම 2015 අගෝස්තු මාසයේ අත්සන් කරන ලදී. එම ගිවිසුම අනුව ජාතික සමගි සඳහාවූ සන්ක්‍රාන්තික රජය සත්‍යය, සංහිඳියාව හා සුවපත් කිරීමේ කොමිෂන් සභාව හා වන්දි හා හානිපූරණ අධිකාරිය ස්ථාපිත කළ යුතුව තිබිණි. තවද එය දකුණු සූඩානය සඳහාවූ මිශ්‍ර අධිකරණය ස්ථාපිත කිරීම සඳහාවූ ප්‍රාථමික වගකීම අප්‍රිකානු සංගමයේ කොමිසමට ලබාදෙයි. කෙසේවෙතත්, 2017 ජූලි මාසය වන විට මෙහි කිසිම පියවරක් ක්‍රියාත්මක කර නොතිබිණි. රජයේ ප්‍රශ්න සහගත පසුබැසීමේ පසුබිම තුළ දකුණු සූඩානයේ සන්ක්‍රාන්තික යුක්තිය වැඩි වශයෙන් අවිනිශ්චිත තත්ත්වයක පවතී.

## මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුල පිරීම සන්ධානය ලබාගෙන දෙන සහයෝගය

යුක්තිය, සත්‍යය හා සංහිඳියාව සඳහාවූ ගෝලීය මුලපිරීමේ සන්ධානයේ සිදුවී ඇති හවුල්කාර සංවිධාන 4 (GIJTR Coiortium)- හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය (ICSC), ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය (CSVR), මානුෂීය නීති මධ්‍යස්ථානය (HLC) හා පොදු ජාත්‍යන්තර නීතිය හා ප්‍රතිපත්ති කණ්ඩායම (PILPG)- විවිධ ආකාරයෙන් සිදුවී ඇති මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ලේඛණගත කිරීම සඳහාවූ දකුණු සූඩාන් සිවිල් සමාජ සංවිධාන ධාරිතාව වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම (HRDI) ස්ථාපිත කිරීම හා එයට සහයෝගය ලබාදීමද මෙයට ඇතුළත් විය. මානව හිමිකම් ලේඛණගත කිරීම සඳහාවූ මුලිපිරීම (HRDI) දකුණු සූඩාන් සිවිල් සමාජ සංවිධාන කිහිපයක මූලිකත්වයෙන් ක්‍රියාත්මකවූ සන්ධානයක් වන අතර, එය මානව හිමිකම් උල්ලංඝනයකිරීම් පිළිබඳ තොරතුරු ලේඛණගත කළේය. මෙම මුලිපිරීම සංහිඳියාව හා සත්‍යය පැවසීමේ ක්‍රියාකාරකම් හා මනෝ සමාජයීය පුහුණු වැඩසටහන් වැනි අතිරේක මැදිහත්වීම්ද සිදුකළේය.

දකුණු සූඩානයේ පවතින තත්ත්වයේ ගතික ස්වභාවය හේතුවෙන් සන්ධානයේ හවුල්කාර සංවිධාන වැඩසටහනට අවශ්‍ය වෙනස්කම්ද බලාපොරොත්තු වෙමින් අනුගත වීමේ ප්‍රවේශයක් ක්‍රියාත්මක කළහ. ව්‍යාපෘති ආරම්භවීමට පෙර සන්ධානය එම රටේ සන්ක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්ට උපරිම ආකාරයෙන් සහයෝගය ලබාදෙන ආකාරය තීරණය කර ගැනීම සඳහා දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධාන සමඟ අවශ්‍යතා ඇගයීමක් සිදුකළේය. ඉන් අනතුරුව සැලසුම් කරන ලද ව්‍යාපෘතිය අදියරයන් තුනකට බෙදන ලදී. එහි අරමුණ වූයේ සන්ක්‍රාන්තික යුක්තිය පිළිබඳ මහජනතාවගේ දැනුම්වත්වීම වැඩිකිරීම හා ඔවුන්ගේ සහයෝගය වැඩිකර ගැනීමය. මෙහි අදියර 1 යටතේ මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ ව්‍යුහය සංවර්ධණය කිරීම සඳහාත්, රැස්කරන ලද තොරතුරු ආරක්ෂාකාරී ස්ථානයක ගබඩා කිරීම පිළිබඳ එකඟත්වයට එළඹීම සඳහාත් සම්මුඛ සාකච්ඡා පිළිබඳ ක්‍රියා පටිපාටිය පැහැදිලි කර ගැනීම සඳහාත්  දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධාන එකතු කරන ලදී. පළවෙනි අදියරයේ ආරම්භයේදී සන්ධානයේ හවල්කාර සංවිධාන දැනට පවතින ලේඛණගත කිරීමේ  ප්‍රයත්නයන් පිළිබඳවත් එය මුහුණපාන අභියෝග පිළිබඳවත් සන්ක්‍රාන්තික යුක්තිය පිළිබඳ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳවත් දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් කිහිප දෙනෙක් සමඟ අදහස් විමසීමක් සිදුකරන ලදී.[1] මෙම තොරතුරු දකුණු සූඩාන් හවුල්කරුවන්ගේ අවශ්‍යතා හා අරමුණුවලට මනා ලෙස ආමන්ත්‍රණය කරන ආකාරයෙන් වැඩමුළු හා පුහුණු වැඩසටහන් සකස්කර ගැනීමට සන්ධානයේ හවුල්කරුවන්ට උපකාරී විය. දෙවෙනි අදියරයේ සන්ධානයේ හවුල්කරුවන් මානව හිමිකම් උල්ලංඝනයවීම් ලේඛණගත කිරීම සඳහාවූ මෙම මුලපිරීමේ ධාරිතාව ගොඩනැගූහ; පළවෙනි අදියරයේ ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම සමඟ වැඩ කළහ; ස්වයං රැකවරණය හා සම්මුඛ සාකච්ඡාවට ලක්කරන පුද්ගලයන්ගේ මනෝ සමාජයීය අවශ්‍යතා පිළිබඳ ලේඛණගත කරන පුද්ගලයන් පුහුණු කළහ; මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ තෝරාගත් සාමාජිකයන් සඳහා කාම්බෝජයේ පවත්වන ලද අදහස් හුවමාරු කිරීමේ වැඩසටහන් වැනි ප්‍රජා සත්‍යය පැවසීමේ හා සංහිඳිහා මුලපිරීම් සංවර්ධනය කිරීම සඳහා මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමට සහාය දැක්වූහ. අදියර තුනේ ක්‍රියාකාරකම් මගින් ලේඛණගතකරණ පුද්ගලයන් ලේඛණගත කිරීමේ ප්‍රයත්නයන්වලට සහාය ලබාදෙන පුහුණුකරුවන් වශයෙන් පුහුණු කිරීම මගින් මෙම මුලපිරීමට සහාය දක්වන ලදී. තවද මනෝ සමාජයීය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම, දකුණු සූඩානයේ සන්ක්‍රාන්තික යුක්තිය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ලේඛණගත කිරීම පාවිච්චි කිරීම පිළිබඳ සාකච්ඡාවලට පහසුකම් සැලසීම වැනි දේවල්ද මෙම අදියරයේ සිදුකරන ලදී.

## මානව හිමිකම් ලේඛණගත කිරීම මුලපිරීම (HRDI) සඳහා සන්ධානය ලබාදෙන සහයෝගය

මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමට, සහයෝගය ලබාදීම සඳහාවූ සන්ධානයේ ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක් හා සාකච්ඡාවක් බොහෝ තොරතුරු ලබාදෙයි. එයට හේතුව ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් මානව හිමිකම් ලේඛණගත කිරීමේ ක්‍රියාකාරකම් අවශ්‍යවන ක්ෂණික වෙනස්වන එය

අනෙකුත් අඛණ්ඩව සිදුවන බහු ජනවාර්ගික ගැටුම්වලට අදාළ වීම වේ. මෙය (HRDI) සාමාජිකයන් විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් පුහුණු හා පශ්චාත් සම්මුඛ සාකච්ඡා සමීක්ෂණ දුසිමක පමණ ප්‍රතිපෝෂණ පදනම් කරගෙන මෙම ඇගයීම සිදුකර ඇත. මෙම ඇගයීමට ව්‍යාපෘතියේ සාර්ථකත්වයන් හා පාඩම් පදනම් කර ගත් නිර්දේශද ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු දීර්ඝකාලීන අරමුණු වශයෙන් පවතින හේතුවෙන් හා අදවන තෙක් සන්ක්‍රාන්තික යුක්ති පියවරයන් ක්‍රියාත්මක කර නොමැති හේතුවෙන් දකුණු සූඩානයේ සන්ක්‍රාන්තික යුක්තිය කෙරෙහි මෙම ව්‍යාපෘතියේ පුළුල් බලපෑම තවමත් අපැහැදිලිව පවතී.

## මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ලේඛණගත කිරීම සඳහා ප්‍රාදේහීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් යුත් සන්ධානයක් ස්ථාපිත කිරීම

GIJTR සන්ධානයේ හවුල්කරුවන් දකුණු සූඩානයේ ලේඛණගත කරන අයගේ ක්‍රියාකාරකම් මූලික කරගෙන ප්‍රාදේශීය ප්‍රජාව විසින් මෙහෙයවන ව්‍යාපෘතියක් සාර්ථකව ස්ථාපිත කර ඇත. මෙහෙයුම් කමිටුව හා මහලේකම් කාර්යාලය එම මුලපිරීමට නායකත්වයදී මානව හිමිකම් ලේඛණගත කිරීමේ මාර්ග සිතියමකට මඟ පෙන්වීම සඳහා පහසුකම් සැලසිය යුතු බව මුලින්ම මුලපිරීම විසින් තීරණය කරන ලදී.[2] සන්ධානයේ හවුල්කරුවන් හා දකුණු සූඩාන් ජනරජයේ ක්‍රියාත්මක එක්සත් ජාතීන්ගේ දූත පිරිස දකුණු සූඩාන් මානව හිමිකම් කොමිසම යන පාර්ශ්ව සමඟ සාකච්ඡා කර මෙම මාර්ග සිතියම HRDI විසින් 2016 සංවර්ධන කරන ලදී. ඔවුන්ගේ ලේඛණගත කිරීමේ ප්‍රයත්නයන් ඒකරාශි කිරීමටත්, ධාරිතාව හා සම්බන්ධීකරණ ඒකරාශි කිරීමටත් රාමුවක් ලෙස මෙය සංවර්ධනය කරන ලදී. HRDI සියලුම සාමාජිකයන් සූඩාන් වැසියන් වන නිසා සමස්ථ ලේඛණගත කිරීමේ ක්‍රියාවලිය - මූලිකව ප්‍රකාශන රැස්කිරීමේ සිට මධ්‍යම දත්ත පද්ධතියක ඒවා ගබඩා කිරීම දක්වා වූ ක්‍රියාවලිය - ප්‍රාදේශීය ප්‍රජාවට අයිති විය.දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධාන සම්පත් බෙදා හදා ගැනීමටත්, ලේඛණගත කිරීමේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීමටත්, ඔවුන්ගේ අධිවාචන ක්‍රියාකාරකම් ඉහළ නැංවීමටත් තමන්ගේ ධාරිතාව වැඩි කර ගත්හ. මෙම ප්‍රවේශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා තමන්ගේ ප්‍රයත්නයන් HRDI ප්‍රයත්නයන් සමඟ සම්බන්ධ කර ගැනීම සඳහා උනන්දුවක් දැක්වූ අනෙකුත් ජාත්‍යන්තර ක්‍රියාධරයන්ගේ ගෞරවයට පාත්‍ර විය. තව දකුණු සූඩානයේ සන්ක්‍රාන්තික යුක්තිය වැඩිදියුණු කිරීම සඳහා තමන් විසින් රැස්කර තිබෙන ලේඛණ පාවිච්චි කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ප්‍රධාන අධිවාචන ඉලක්ක කණ්ඩායම් සමඟ සම්බන්ධු විය.

> *“ මානව හිමිකම් ලේඛණග කිරීමේ මුලපිරීම සඳහා පහසුකරණය කරන ලද රැස්වීම් අප අතර විශ්වාසයක් ගොඩනැගීමට උපකාරී වී ඇත. කෙසේවෙතත්, බොහෝ අවස්ථාවල මතුවන ප්‍රශ්න වන්නේ දකුණු සූඩානයේ සිවිල් සමාජ අතර පවතින අවිශ්වාස හා සම්බන්ධ ගැටලු වේ. “*
>
> -HRDI සාමාජික සංවිධානයක නියෝජිතවරයෙක්

HRDI මුලිපිරීම බිහිවීමට පෙර ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන තමන්ගේ ලේඛණගත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කළේ නැත. ඒ වෙනුවට එම සංවිධාන ස්වාධීනව කටයුතු කළහ; දකුණු සූඩානයේ සිවිල් සමා සංවිධාන අතර පැවැති සැලකිය යුතු ප්‍රමාණයේ අවිශ්වාසය මෙය යම් ප්‍රමාණයක හේතුවක් විය. සීමිත අරමුදල් සඳහා පවතින තරඟය හා රජය ඇතුළුවී සිවිල් සමාජ සංවිධාන හා එහි ක්‍රියාකාරකම් අධීක්ෂණයට ලක් කරන බව පවතින කනස්සල්ල හේතුවෙන් මෙම තත්ත්වය නිර්මාණයවී තිබේ. එමනිසා විශ්වාසය ගොඩනැගීම ප්‍රවර්ධනය කිරීම සඳහා සන්ධානයේ හවුල්කාර සංවිධාන දකුණු සූඩානයේ ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධානයේ නියෝජිතවරුන් එක්රැස් කළ අතර, එම කලාපයේ මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම ස්ථාපිත කිරීමට කටයුතු කළේය. මෙය සන්ධානයේ අනුග්‍රහයෙන් 2015 මැයි මස පවත්වන ලද 1 වෙනි මානව හිමිකම් ලේඛණගත කිරීමේ වැඩමුළුවෙන් ආරම්භ විය.

2015 මැයි මස පවත්වන ලද වැඩමුළුව සන්ධානය විසින් පවත්වන ලද අනෙකුත් වැඩමුළු හා සමඟ සාමූහිකව කටයුතු කිරීමේ වැදගත්කම සිවිල් සමාජ සංවිධානවලට ඒත්තු ගැන්වීය. කෙසේවෙතත් අවිශ්වාසය හා ප්‍රශ්න දිගටම පැවතිනි. උදාහරණයක් වශයෙන් බොහෝ HRDI සාමාජික සංවිධාන ලේඛණ බෙදාහදා ගැනීමට පැකිලීමක් දැක්වූ හේතුවෙන් මහලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම ප්‍රමාද විය. එම තොරතුරු පිටට ගලා යා හැකි යැයි බියෙන් ඔවුන් මෙසේ පැකිලීමක් දැක්වූහ. වැඩිවෙමින් තිබූ ප්‍රචණ්ඩ ක්‍රියා හා දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධාන කෙරෙහි රජයේ අධීක්ෂණය ඉහළ මට්ටමක පැවැති තත්ත්වය තුළ මෙවැනි ප්‍රශ්න මේ කලාපයේ ඇති විය. තවදුරටත් දැඩි ලෙස පහත වැටෙමින් තිබූ ආරක්ෂක තත්ත්වයද අරමුදල් ගස්කිරීම සඳහාවූ දකුණු සුඩාන් සිවිල් සමාජයේ හැකියාවට බාධාවක් විය. මෙම පසුබිම තුළ 2017 මැයි මාසයේ අත්දැකීම් බහුල ලේඛණගත කරන පුද්ගලයන් කණ්ඩායමක් පහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවකට සහභාගී වූහ. ලේඛණගත කිරීමේ ක්‍රියාකාරකම් සිදුකරන්නේ කෙසේද? හා යන කරුණ නව ලේඛණගතකරණ අයට ඉගැන්වීමටත් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලිපරීමේ තිරසාරභාවයට හැකියාවක් ලබාදීම සඳහාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

## ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා හවුල්කරුවන්ගේ නිපුණතාවයන් සම්බන්ධීකරණය කිරීම

සන්ක්‍රාන්තික යුක්තිය පිළිබඳ සහභාගිවන්නන්ට සමස්ථ ගෝලීය දැක්මක් ලබාදීම සඳහා ව්‍යාපෘතිය සන්ධානයේ එක් එක් හවුල්කරුවන්ලේ නිශ්චිත කුසලතා හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත්තේය. සම්පත් කාර්යක්ෂම ආකාරයෙන් පාවිච්චි කිරීම තහවුරු කිරීම සඳහා හවුල්කරුවන් පුහුණු වැඩසටහන්වල අන්තර්ගතය හා මානව හිමිකම් ලේඛණගත කිරීමට ලබාදෙන තාක්ෂණික සහාය අඛණ්ව සම්බන්ධීකරණය කළහ.

ලේඛණගත කිරීමේ ප්‍රයත්නයන්වලට මුලපිරීමේදී සන්ධානයේ හවුල්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක අත්දැකීසම් සහිතව සිටිති; කේන්ද්‍රීය හා සම්බන්ධීකරණය කරන ලද ලේඛණගත කිරීමේ දත්ත පද්ධතියන් පවත්වා ගෙන යාම; සිවිල් සමාජ සංවිධානවලින් රැස් කරන ලද ලේඛණ සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියන් සඳහා ලබාදීම; සදානුස්මරණ ක්‍රියාකාරකම්, සත්‍යය සෙවීමේ කොමිසම් සභා හා ජාත්‍යන්තර හා දෙමුහුන් අධිකරණ හා විනිශ්චය සභා පිළිබඳ නිපුණතා හා අත්දැකීම් මෙයට ඇතුළත් වේ. සන්ධානයේ හවුල්කරුවන් තමන්ගේ විවිධ වූ කුසලතා හා අත්දැකීම් පුහුණුවල ගොනු කළ අතර, මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ අවශ්‍යතා විෂයාන්තර ආකාරයෙන් ආමන්ත්‍රණය කිරීමට සඳහා ඔවුන්ට හැකියාවක් ලැබුණි. උදාහරණයක් වශයෙන් PIPLG හා PLC මූලිකත්වයෙන් පවත්වන ලද ලේඛණගත කිරීමේ පුහුණුවලදී CSVR සංවිධානය ලෙල්ඛණගත කිරීමේ මෙහෙවරවලදී පාවිච්චි කිරීම සඳහාවූ මනෝ සමාජයීය රැකවරණයන් පිළිබඳ සැසියන් පැවැත්වූහ.



දකුණු සූඩාන් ලේඛණගත කිරීමේ මුලපිරීමේ සාමාජිකයන් 2016 වසරේ GIGTR සන්ධානය විසින් සංවිධානය කරන ලද හුවමාරු වඩසටහනකදී කමබෝජියාවේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන සථානයක් වන Youth Fo Peace සංවිධානයට ගියහ.

තවද සන්ධානයේ හවුල්කරුවන් එක් එක් කෙනාගේ යෝජිත ක්‍රියාකාරකම් හා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් පිළිබඳව සක්‍රියව සම්බන්ධීකරණය කළ අතර, එකිනෙකාගෙන් ප්‍රතිපෝෂණද ලබා ගත්හ. එය ව්‍යාපෘතියේ අදාළත්වය වැඩිදියුණු කළේය. උදාහරණයක් වශයෙන් PIPLG සංවිධානය ඉරාක් හා සිරියා යන රටවල දත්ත පද්ධතීන් ස්ථාපිත කිරීම පිළිබඳව තාක්ෂණික සහාය ලබාදීමේ තමන්ගේ අත්දැකීම ප්‍රයෝජනයට ගත්තේය. මානුෂීය නීති මධ්‍යස්ථානය

තවද කලින් යුගෝස්ලෝවියාවේ දත්ත පද්ධතියක් නිර්මාණය කර පවත්වා ගෙන යාම සඳහා මානුෂීය නීති මධ්‍යස්ථානය සිය අත්දැකීම් ප්‍රයෝජනයට ගත්තේය.

### වින්දිතයන් හා සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීම සඳහා ලේඛණගතකරණ අයගේ ධාරිතාව ප්‍රාදේශීය ලේඛණගත කරන අයගේ ධාරිතාව ගොඩනැගීම

සන්ධානයේ හවුල්කරුවන් විස්තරාත්මක පුහුණු වැටසටහන් පැවැත්වීම මගින් හා වින්දිතයන් හා සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ආකාරය පිළිබඳව රඟ දැක්වීම සිදුකිරීම මගින් හා ප්‍රමිතිකරණය කරන ලද සම්මුඛ සාකච්ඡා මෙවලම සම්පූර්ණ කිරීම මගින් හා මනෝ සමාජයීය අවශ්‍යතා ඇගයීම මගින් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම ලේඛණගත කිරීමේ ධාරිතාව ගොඩනැංවීය. සන්ධානයේ හවුල්කරුවන් PILPG සංවිධානයේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය සහාය ඇතුව ලේඛණගත කරන අයට අදාළ වන පුහුණු විෂය මාලාවක් සංවර්ධනය කිරීම සඳහා මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම ඉලක්ක ප්‍රජාව සමග කලින්ම අවශ්‍ය සබඳතා පවත්වා ගෙන ගිය අතර, සන්ධානය විසින් ලබාදෙන පුහුණු වැඩසටහන් මානව හිමිකම් උල්ලංඝනයවීම් සාර්ථක ආකාරයෙන් ලේඛණගත කිරීම සඳහා ඔවුන්ට මෙවලම් ලබා දුන්නේය.

සන්ධානය විසින් පුහුණු කරන ලද ලේඛණගත කරන අය වින්දිතයන්, සාක්ෂිකරුවන් හා කතා ලේඛණගත කරන අනෙකුත් අය සම්මුඛ සාකච්ඡා කිරීම මගින් පුහුණු වැඩසටහන් රඟ දැක්වීම් හා තමන්ගේ කුසලතා වැඩිදියුණු කර ගත්හ. විශාල වශයෙන් සිදුකරන ලද ඝාතන හා ඉලක්කගත ඝාතන ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය අතුරුදහන්වීම් හා දේපල

විනාශ කිරීම් ඇතුළුව පුළුල් පරාසයේ මානව හිමිකම් උල්ලංඝනයවීම්වල වින්දිතයන් සමඟ විස්තරාත්මකව සම්මුඛ සාකච්ඡා කිරීම පැවැත්වීම සඳහාවූ තමන්ගේ හැකියාව ඔවුන් සෑහෙන ප්‍රමාණයක වැඩිදියුණු කර ගත්හ



කැමරච් යුගයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයෙක් දකුණු සූඩාන් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ සාමාජිකයන් සමඟ 2016 වසරේදී කම්බෝජියාවේ තමන්ගේ අත්දැකීම් බෙදා හදා ගනී.

රඟ දැක්වීම්වලින් පසුව ලේඛණගතකරණ අයගේ ප්‍රගතිය පිළිබඳ සන්ධානයේ හවුල්කරුවන් ඇගයීමක් කර ප්‍රතිපෝෂණය ලබා දුන් අතර, අත්දැකීම් සහිත ඉගෙන ගැනීමේ ප්‍රවේශය ක්ෂේත්‍ර වැඩවලට සූදානම්වීමේදී තමන්ට ඉමහත් ලෙස උපකාරී වන බව ලේඛණගත කරන අයට හැඟිණි.

*" ලේඛණගත කිරීම පිළිබඳ පපුහුණුවක් ලබා සිටින පුද්ගලයෙකුට උපදේශණ ලබාදීමට අවශ්‍ය කුසලතා නොමැති අවස්ථාවක එවැනි පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක් සමඟ සම්මුඛ සාකච්ඡාවට කල් කරන කොට එම පුද්ගලයා ඔහු මුහුණපාන පශ්චාත් දැඩි කම්පන තත්ත්වය නිසා හඬා වැළපීමට හෝ මතකයන් තවමත් නැවුම් ලෙස පැවතීම නිසා ඒ ගැන කතා කිරීමට කැමැත්තක් දැක්වීමට ඔහුට හැකි."*

- HRDI සාමාජික සංවිධානයක නියෝජිතවරයෙක්

සන්ධානය විසින් මෙහෙය වන ලද පුහුණු වැඩසටහනකට පසු ලේඛණගත කරන අය දකුණු සූඩානයේ විවිධ ස්ථානවල 2016 වසරේ ජූනි මාසයේදී තමන්ගේ පූරෝගාමී වැඩසටහන් පැවැත්වූහ. සන්ධානය විසින් පුහුණු කරන ලද ලේඛණගත කරන අය එක් එක් ස්ථානවල දින කිහිපයක් කතා ආකෘතියෙන් සිය ගණන් ප්‍රකාශණ රැස් කළහ. එය මින් කිසිවිටක ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන විසින් නොකරන ලද යෙකි; ඔවුන් ඒ වෙනුවට සමීක්ෂණ පාවිච්චි කර තිබුණි. මානව හිමකම් ලේඛණගත කිරීමේ මුලපිරුම අර්ධ ව්‍යුහගත සාකච්ඡාවලට අවකාශය ලබා දුන් සම්මුඛ සාකච්ඡා මෙවලමක් පාවිච්චි කළ අතර, එය නිදහසේ කතාවක් පැවසීමට අදාළ පුද්ගලයන්ට අවස්ථාව ලබා දුන්නේ. උල්ලංඝනයන්වල වර්ගයන් ඒවා සිදුවූ ස්ථානයන් හා සම්බන්දවූ අපරාධයන් සිදුකළ පුද්ගලයන්ගේ විස්තර වැනි රැස්කරන ලද තොරතුරුවල තත්ත්වයද එය තහවුරු කළේය. මෙය HRDI දත්ත පද්ධතියේ තොරතුරු පහසුවෙන් ප්‍රමිතිගත කිරීමටත් විශාල ප්‍රමාණයේ තොරතුරු විශ්ලේෂණය කිරීමටත් ලේඛණගත කරන අයට අවස්ථාවක් ලබා දුන්නේය. මෙම ක්‍රමවේදය HRDI ලේඛණගත කරන අය තොරතුරු දැන ගැනීමෙන් පසු අදාළ පුද්ගලයන් ලබාදෙන එකඟත්වය ලබා ගත යුතු බවද අපක්ෂපාති ආකාරයෙන් සම්මුඛ පැවැත්විය යුතු බවද සඳහන් කලේය. ප්‍රමිතිකරණය අධිකරණ හා අධිකරණ නොවන සන්ක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් සඳහා ලේඛණ පෝෂණය කිරීමට උපකාරී වනු ඇත.

ලේඛණගත කිරීමේ මෙහෙයුම්වලදී කතන්දර රැස් කිරීමේ දකුණු සූඩානයේ ලේධණගත කරන අය ලබා ගත් සාර්ථකත්වය - විශේෂයෙන් ජාත්‍යන්තර ලේඛණගත කරන අය විසින් මුහුණපාන ලද දුෂ්කරතාවන්ට පටහැනිව ලබාගෙන තිබූ සාර්ථකත්වය - ප්‍රජාවන්ගේ විශ්වාසය දිනා ගෙන ඇති අතර, බාහිර පුද්ගලයන් ලෙස නොසලකන ප්‍රාදේශීය ලේඛණගත කරන අයට පුහුණුව හා සහයෝගය ලබාදීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ කෙසේද දැයි යන කරුණ තීරණය කර ගැනීම සඳහා PIPLG සංවිධානය පුරෝගාමී මෙහෙයුම්වලදී රැස් කරන ලද තොරතුරු ඇගයීමට ලක් කර අතර, ලේඛණගත කරන අයට තනි තනි වශයෙන් ප්‍රතිපෝෂණය ලබා දුන්නේය. සමාලෝචන ක්‍රියාවලිය හරහා සංසදයේ හවුල්කරුවන්ද සීමිත මූල්‍ය සම්පත් තිබෙන තත්ත්වයන් තුළ තමන්ගේ සහයෝගය දිය යුතු පුද්ගලයන් ප්‍රමුඛතාගත කිරීම සඳහා විශේෂ හැකියාවන් ඇති ලේඛණගත කරන පුද්ගලයන් හඳුනා ගත්තේය. පුරෝගාමී මෙහෙයුම්වලට පසුව දකුණු සූඩානය හා එම කලාපයේ අමතර ලේඛණගත කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලදී.

සන්ධානයේ හවුල්කරුවන් ලේඛණගත කිරීමේ මෙහෙයුම්වලදී වැදගත් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය දිරිගැන්වූහ. බොහෝ වින්දිතයන් හා සාක්ෂිකරුවන් කාන්තාවන් හා ගැහැණු ළමුන් වශයෙන් සිටින නිසා ස්ත්‍රී පුරුෂ සමාජභාව පිළිබඳ සමානත්වය ස්ත්‍රී දූෂණය හා අනෙකුත් ආකාරයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයද ඇතුළුව ඔවුන් මහුණපා ඇති ප්‍රශ්න සාර්ථකව ලේඛණගත කිරීමේ කණ්ඩායම්වලට හැකියාව ලබා දුන්නේය. පුරෝගාමී මෙයෙහයුම්වල

සම්බන්ධවූ සහභාගිවන්නන් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වයේ බොහෝ වින්දිතයෝ ලේඛණගත කිරීමේ යෙදී සිටින කාන්තාවන් සමඟ තමන්ගේ අත්දැකීම බෙදා හදා ගැනීම පමණක් තමන්ට පහසු බව පැවසූ බව වාර්තා කර ඇත.

## දැඩි කම්පනය හා මනෝ සමාජයීය අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා ලේඛණගත කරන අය පුහුණු කිරීම

දකුණු සූඩානයේ ලේඛණගත කිරීමේ යෙදී සිටින බොහෝ අය මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ බහුලව සාක්ෂි පවතින වටපිටාවන්වල වැඩ කරන දැඩි කම්පනයට පත්වූ වින්දිතයන් ලෙස සිටින හෙයින් ඔවුන් නැවත වරක් කම්පනයට පත්වීමේ අවධානමේ සිටියහ. එමනිසා ලේඛණගත කරන අය හා සම්මුඛ සාකච්ඡාවය ලක් කරන අය අතර නැවත දැඩි කම්පනයක් ඇති කිරීම අවම කිරීම සඳහා ස්වයං රැකවරණය හා වින්දිතයන් කෙරෙහි සංවේදීභිවය පිළිබඳ ලේඛණගත කරන අය තුළ අවබෝධය වැඩි දියුණු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් තිබිණි. මෙය ආමන්ත්‍රණය කිරීම සඳහා CDVR සංවිධානය ස්වයං රැකවරණය, පුද්ගලයන් අදාළ ස්ථානවලට යොමු කිරීම, සවන්දීමේ කුසලතා හා අන් අයගේ කම්පනය කෙරෙහි තමන්ගේ චිත්තාවේගී පාලනය කර ගැනීම යන කරුණු පිළිබඳ ලේඛණගත කරන අයට උපදෙස් ලබා දුන්නේය. තමන් දැඩි කම්පනයට පත්වී සිටින පසුබිමක් තුළ ලේඛණගත කරන අය තමන්ගේ සම්මුඛ සාකච්ඡා කම්පනය පාලනය කර ගැනීම සඳහාවූ විධි ක්‍රම ඉගෙන ගැනීමට උනන්දුවෙන් සිටියහ.

“ මෙම පුහුණුව ආරක්ෂක පියවරයන් අවබෝධ කර ගැනීමේ මගේ හැකියාව ඇත්ත බශයෙන්ම වැඩි දියුණු කර ඇත... දකුණු සූඩානයේ ඩනා අවිනිශ්චිත හා විවිධත්වයක් පවතින ප්‍රජාවන් තුළ ලේඛණගත කිරීමේ කටයුතු සිදුකිරීමේදී ආරක්ෂක පියවරයන් අවබෝධ කර ගැනීමට එය උපකාරී වී ඇත. එය මානව හිමිකම් ලේඛණගත කිරීමේ ක්‍රියාවලිය ඉතා පහසු

ව්‍යාපෘතිය සිදුවූ අවස්ථාවේ පුද්ගලික ප්‍රජා හා ජාතික මට්ටම්වල දැඩි කම්පනය හා සුවපත් කිරීම ආමන්ත්‍රණය කරන සම්පූර්ණ ප්‍රවේශයක් අවධාරනය කිරීමට සන්ධානයේ හවුල්කරුවන් ඉදිරිපත් වූහ. මෙහි කොටසක් වශයෙන් සන්ධානය හවුල්කරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන් පුද්ගලික අත්දැකීම් බෙදා හදා ගැනීම හැඟීම්බර සිදුවීමක් විය හැකි බව යන කරුණ වින්දිතයන්ට පැහැදිළි කරදීමේ වැදගත්කම ලේඛණගත කරන අයට උගන්වනලදී. මෙය වින්දියන්ගේ විශ්වාසය දිනා ගැනීමට ඔවුන්ට උපකාරී විය. උදාහරණයක් වශයෙන් එක් ස්ථානයක ලේඛණගත කරන අය පුද්ගලයන් හමුවීමට පෙර ආගමික නායකයන් පුද්ගලික ජාතික සුවපත්වීමේ අවශ්‍යතාවය අවධාරනය කළ අතර, මෙම අරමුණු ඉටුකර ගැනීම ලේඛණගත කිරීම උපකාරී වන ආකාරය පැහැදිළි කළහ. එවැනි දේශනාවලට සවන්දීමෙන් පසු වින්දිතයන් හා සාක්ෂිකරුවන් තමන්ගේ කතන්දර පැවසීම සඳහා ලේඛණගත කිරීමේ අය වෙත ඉතා කැමැත්තෙන් පැමිණියහ. මෙම දේශණාවට පෙර ඔවුන් එසේ කිරීමට කැමැත්තක් දැක්වූයේ නැත.





දකුණු සූඩාන් සිවිල් යුද්ධයට මුහුණදී සිටින 12 දෙනෙක් සඳහා යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ගෝලීය මුලපිරීම "ශරීරය සිතියම් ගත කිරීම" පිළිබඳ සතියක පුහුණු වැඩමුළුවක් පැවැත්වීය. මෙම ක්‍රමවේදය හරහා පුද්ගලයන් තමන්ගේ ශරීරය පෙන්නුම් කරන ශරීර ප්‍රමාණයේ චිත්‍රයක ජීවිත කාලය පුරාම තමන් අත්දුටු දැඩි කම්පන පිළිබඳ අත්දැකීම් විස්තර කරයි.

### ප්‍රාදේශීය ලේඛණගත කරන අයගේ ආරක්ෂක ප්‍රශ්න සැලකිල්ලට ගැනීම හා රැස් කරන ලද කතන්දර ගබඩා කිරීම

පුළුල් ලෙස පැතිර තිබෙන ප්‍රචණ්ඩත්වය හා රජයේ අධීක්ෂණය හේතුවෙන් කුණු සූඩානයේ ප්‍රාදේශීය ලේඛණගත කිරීමේ යෙදී සිටින අයට ප්‍රකාශන හා අනෙකුත් සාක්ෂි භෞතික ලෙස රැගෙන යාම හෝ ගබඩා කිරීම ඉතා අවධානම් සහිත කාර්යයක් විය. අධීක්ෂණ කටයුතු හා රජය විසින් පුළුල් ආකාරයේ සිදුකරන සෙවීමේ ක්‍රියාකාරකම් හා ගැටුමට අදාළ සියලුම පාර්ශ්වයන් ප්‍රදේශයේ රැඳී සිටීම හේතුවෙන් ලේඛණගත කරන අය භෞතික ගබඩා කිරීම වෙනුවට ඩිජිටල් ගබඩා කිරීමේ ක්‍රමය කෙරෙහි කැමැත්තක් දැක්වූහ. එමනිසා සන්ධානයේ හවුල්කරුවන් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම ලේඛණගත කිරීමේ දත්ත පද්ධතිය අවසන් කරන තෙක් ලේඛණගත කරන අයට ආරක්ෂිත අන්තර් කාලීන ඩිජිටල් ගබඩා පහසුකම් ලබා දුන්නේය. තවද සන්ධානයේ හවුල්කරුවන් භෞතික හා ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමට සම්බන්ධ අයට පුහුණුවක් ලබා දුන්නේය.

ඊට අමතරව මධ්‍යගත කරන ලද ලේඛණ පද්ධතිය ස්ථාපිත කිරීමටත් එය පාවිච්චි කිරීම පිළිබඳ ලේඛණගත කරන අයට පුහුණුවක් ලබාදීම සඳහා සන්ධානයේ හවුල්කරුවන් විවිධ ක්ෂේත්‍රවල තමන් ලබාගෙන විශේෂ නිපුණතාවයන් සම්බන්ධීකරණය කලහ. නිදහස් විවෘත මූලාශ්‍ර දත්ත පද්ධතියක් තෝරා ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා PIPLG මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම එහි මානව හිමිකම් ලේඛණ ආරක්ෂිතව ගබඩා කිරීමට එමගින් අවස්ථාවක් ලැබුණි. මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ අවශ්‍යතාවය හා ක්‍රමවේදය ඇතුළත් දත්ත පද්ධතියක් සැලසුම් කිරීමට සහාය ලබා ගැනීම සඳහා සන්ධානය තවත් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් හඳුනා ගෙන එහි සේවාව ලබා ගත්තේය.

දත්ත පද්ධතිය 2017 අප්‍රේල් මස අවසන් කිරීමෙන් පසු සෑම සිවිල් සමාජ සංවිධානයක්ම තමන් විසින් රැස් කරන ලද තොරතුරු මධ්‍යගත කරන ලද දත්ත පද්ධතියට ඇතුළත් කරන ලදී. අනාරක්ෂිත හා අවිශ්වාසය බවතින වාතාවරණයක ලේඛණ බෙදාහදා ගැනීම පිළිබඳ ප්‍රශ්න හේතුවෙන් සෑම සිවිල් සමාජ සංවිධානයකටම තමන් අදාළ ලේඛණවලට පමණක් ප්‍රවේශවීමේ හැකියාව ලබාදෙන ලදී. අනෙකුත් සිවිල් සමාජ සංවිධානවල ලේඛණ ඔවන්ට දැක බලා ගැනීමට ඔවුන්ට නොහැකි විය. දත්ත පද්ධතිය අවසන් කරන අවස්ථාවේ සිවිල් සමාජ සංවිධාන වෙනත් ආරක්ෂිත අන්තර් ජාල ස්ථානයක තමන් විසින් රැස් කරන ලද ලේඛණ ගබඩා කරන ලදී.

මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ දත්ත පද්ධතිය රැස් කරන ලද කතන්දර පිළිබඳ විශ්ලේෂණයක් පැවැත්වීමටත් මුලපිරීමටත් අවස්ථාව ලබා දුන්නේය. මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදුවී ඇති ස්ථාන පිළිබඳ විස්තරාත්මක සිතියම් නිර්මාණය කිරීමටත් නිශ්චිත සිදුවීම් උල්ලංඝනයවීම් පිළිබඳ වර්ග හා නිශ්චිත අපරාධ සිදුකළ පුද්ගලයන් පිළිබඳ ක්ෂණිකව ගොනු කිරීමටත් මෙම මෙම විශ්ලේණය කිරීමේ කාර්යය පාවිච්චි කර ගත හැකිවිය.

### සංහිඳියාවේ ක්‍රමයක් ලෙස වාචික ඉතිහාස රැස් කිරීම හා මතකයට ඇතුළත් කිරීම

ලේඛණගත කිරීම අඅපරාධ සඳහා වගවීමේ ක්‍රියාවලීන්ට සහයෝගය ලබාදීමට අමතරව තනි පුද්ගල හා ප්‍රජා සුවපත් කිරීමට පහසුකම් සැලසීම සඳහා මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම අධිකරණ නොවන යුක්තිය පිළිබඳ ආකෘතීන්ද අගය කළේය. ඒ අනුව සන්ධානයේ හවුල්කරුවන් වාචික ඉතිහාස රැස්කිරීම සඳහා ලේඛණගත කරන අයට පුහුණුවක් ලබා දුන් අතර, මෙම වාචික ඉතිහාස බොහෝ අවස්ථාවල මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ සාක්ෂිවලට වඩා පුළුල් ලේඛණ

වශයෙන් පවතී. කතන්දර මතකයේ රඳවා ගැනීම ඉතිහාසය සංරක්ෂණය කරන අතර, විවිධ හේතු නිසා නඩු අපරාධ නඩු වශයෙන් නඩු ගොනු කර නොමැති පුද්ගලයන් තමන්ගේ සිදුවීම් පිළිබඳ විවිධ හේතු නිසා අපරාධ නඩු ගොනුකර නොමැති පුද්ගලන් සඳහා යම් ආකාරයක යුක්තියක් ලබාදිය හැකිය. එවැනි සමස්ථ ප්‍රවේශයක් දරුණු අපරාධ සිදුවීමෙන් පසු සියලුම වින්දිතයන්ට සහන සැලසීමේ අධිකරණල නොහැකියාව පිරවීමට අවශ්‍ය වේ. සදානුස්මරණ මුලපිරීම්ද සමාජයේ සියලුම කොටස් තම්ගේ කතන්දර බෙදා හදා ගැනීම හරහා වේදිකාවක් ස්ථාපිත කිරීම මගින් ප්‍රජා සංහිදියාව පෝෂණය කළ හැකිය.

තවද වාචික ඉතිහාස රැස්කිරීම සඳහාවූ සන්ධානයේ ක්‍රමවේදය කණ්ඩායම් අතර ප්‍රශ්න අවම කිරීමේ අරමුණින් ප්‍රජාව සමඟ කටයුතු කිරීම ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳව විමර්ශන පැවැත්වීම හා සම්බන්ධ විය. සන්ධානයේ හවුල්කරුවන් මෙම ප්‍රවේශය කම්බෝජියාවේ සිදුකරන මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම අත්දැකීම් හුවමාරු වැඩසටහනේදී මෙම ප්‍රවේශය ප්‍රජාව එක්කළ හැක්කේ කෙසේදැයි යන කරුණ පෙන්වා දුන්හ.  මෙම කම්බෝජියාවේ පවත්වන ලද වැඩසටහනේ සිවිල් සමාජ සංවිධාන ගැටුමට පෙර ඉතිහාසය හා සමූල ඝාතන ඉතිහාසය සදානුස්මරණය හා අධ්‍යාපන කටයුතුවලට ඒකාබද්ධ කරන්නේ කෙසේදැයි යන්න පිළිබඳ උදාහරණ ලබා දුන්හ. තවද කම්බෝජියානු සිවිල් සමාජ සංවිධාන වාචික ඉතිහාස රැස් කිරීම, ගබඩා කිරීම ලේඛණාරක්ෂක ලේඛණාගාර සංවර්ධනය කිරීම රැස් කරන ලද ලේඛණ පාවිච්චි කරන ප්‍රසිද්ධ වැඩසටහන් දුෂ්කර පළාත්වල ප්‍රජාව හා සමඟ කටයුතු කිරීම යන කරුණු සඳහාවූ යහපරිචයන්ද බෙදා හදා ගත්හ. වාචික ඉතිහාසයන් දකුණු සූඩාන ජනතාවගේ සාමූහික මතකය සඳහාවූ වැදගත් පියවරක් වශයෙන් තිබෙන නිසා ගටුමට අදාළ දුක් ගැනවිලි හා ප්‍රශ්න ඉස්මතු කිරීමට ඒවා පාවිච්චි කළ හැකිය.



ග්වාතමාලා නගරයේ ජාතික ලේඛණාගාරයේ ඩිජිටල් කිරීම සඳහා තැන්පත් කර තිබෙන ලිපි ගොනු

හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය ඉතිහාසය සදානුස්මරණය කිරීමේ තවත් මාර්ගයක් ලෙස මෙම කලාපය තුළ ශරීරයේ සිතියම්ගත කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමට අනුග්‍රහය දැක්වූයේය. මෙම වැඩමුළු CSVR සංවිධානයේ "ජීව ගංගාව" හා අභ්‍යාසය සමඟ සූඩානයේ (දැනට දකුණු සූඩාන් වශයෙන් සලකණු ලබන ප්‍රදේශයද ඇතුළුව ප්‍රචණ්ඩත්ව ක්‍රියා සිදුවූ ආකාරය පෙන්වා දුන්නේය. 1956 වසරේ සූඩානය නිදහස ලබා ගැනීමෙන් පසු සෑම දශකයක් පාසාම එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවිය.[3] ශරීරය සිතයම්ගත කිරීමේ ක්‍රියාව සුවපත්වීම හා අධිවාචනය සඳහා ඉතා වටිනා සාම්ප්‍රදායික නොවන මෙවලමක් වශයෙන් පවතින තිබෙන බව සහභාගිවන්නන් අවබෝධ කර ගත්හ. උදාහරණයක් වශයෙන් ශරීරය පිළිබඳ සිතියම් ප්‍රදර්ශනය කිරීම ප්‍රජාව අතර සංවාදයක් ගොඩනගා ශරීර සිතයම්වල තිබෙන චිත්‍ර ගැටුමේ නිල විස්තරවල ඇතුළත් නොවන සාමූහික කතන්දර හා සම්න්ධ විය හැකිය. තවද එය තෘප්තියක් හා වින්දිතයන්ට පිළිගැනීමක් ලබාදිය හැකිය. දකුණු සූඩානයේ අඛණ්ඩව සිදුවන ප්‍රචණ්ඩහා ක්‍රියා අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් සාමය යුක්තිය හා සංහිඳියාව යන ගැටලු පිළිබඳව සංවාද නිර්මාණය කිරීමේ අරමුණින් ශරීරය සිතියම් ප්‍රදර්ශනය කිරීම සඳහා වූ සැලසුම් ප්‍රමාද කරන ලදී.

## ගැටුම පිළිබඳ සියලුම කරුණු ඇතුළත් බහු දෘෂ්ඨි කෝණයෙන් යුත් කතන්දර ප්‍රවර්ධනය කිරීම

දකුණු සූඩානයේ වින්දිතයන් හා සක්ෂිකරුවන් හා සිවිල් සමාජයේ සමාජිකයන් සමඟ 2016 මාර්තු මස පවත්වන ලද සදානුස්මරණය පිළිබඳ අවශ්‍යතා ඇගයීම හරහා දකුණු සූඩානයේ වින්දිතයන් හා අපරාධය සිදුකළ පුද්ගලයන් අතර පවතින ඉර ඉතා තුනී එකක් බව සන්ධානයේ හවුල්කරුවන් දැන ගත්හ. එයට හේතුව බොහෝ අවස්ථාවල අපරාධය සිදුකළ පුද්ගලයන්ද විනද්තයන් බවට පත්වී සිටීමයි. අධ්‍යාපනය හා සංහිඳියා මුලපිරීම් ඇතුළු අධිකරණ නොවන ක්‍රියාවලීන් අපරාධය සිදුකළ පුද්ගලයන්ගේ කතාවලින් (විශේෂයෙන්) තමන් වින්දිතයන් බවට පත්වී සිටින පුද්ගලයන්ගේ කතන්දරවලින් - ප්‍රයෝජනයක් ලබා ගන්නා හෙයින් ඔවුන්ගේ කතන්දර රැස් කිරීම ඉතා සම්පූර්ණ සන්ක්‍රාන්තික යුක්තියකට දායකත්වයක් ලබා දෙයි.

කම්බෝජියාවේ සිදුවූ අත්දැකීම් හුවමාරු වැඩසටහනේදී බොහෝ HRDI සාමාජික සංවිධානවලට අයත් පුද්ගලයන් පහළ මට්ටමේ අපරාධ සිදුකළ පුද්ගලයන්ගේ කතන්දර ලේඛණගත කරන ලද කම්බෝජියාවේ සිවිල් සමාජ සංවිධාන හමුවූහ. ගැටුම පිළිබඳ විස්තරාත්මක ඉතිහාසයක් තහවුරු කර ගැනීම සඳහා මෙසේ පහල මට්ටමේ අපරාධ සිදුකළ පුද්ගලයන් කතන්දර රැස් කරන ලදී. අපරාධය සිදුකළ පුද්ගලයන්ගේ කතන්දර රැස් කිරීමේ වැදගත්කම - ගැටුමට යටින් තිබෙන සාධක මනා ලෙස අවබෝධ කර ගැනීමේ මාර්ගයක් ලෙසද- වැදගත්කම දැන ගත්හ; උදාහරණයක් වශයෙන් අපයෝජන සිදුකිරීම සඳහාවූ තනි පුද්ගලයන්ගේ අභිප්‍රේරණය පිළිබඳ දැන ගැනීමට මෙමගින් හැකිවිය. මෙය වින්දිතයන්, සාක්ෂිකරුවන් හා අපරාධ සිදුකළ පුද්ගලයන් (ඔවුන් බොහෝ දෙනෙක් තමන්ද වින්දිතයන් බව පැවසූහ) කතන්දර රැස් කිරීම කෙරෙහි මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම අවධානය යොමු

*" සූඩානයේ අඛණ්ඩව ගැටුමක් පවත්වන නමුත් එය පිළිබඳ ලන්නා දැඩි උත්සහයහන් මෙම තත්ත්වය වළක්වා ගැනීමට උපකාරී විය හැකි යයි යන කරුණ මෙම පුහුණුව මට පෙන්වා දුන්නේය. - අනාගතයේ සිදුවන අපරාධ ක්‍රියා වැළැක්වීම සඳහා එම ක්‍රියාවලිය ක්‍රමානුකූලව සිදුකළ යුතුය- මානව හිමිකම් අපයෝජනයට වින්දිතයට යුක්තිය ලබාදීමේදී රාජ්‍ය නොවන ක්‍රියාධරයන් වැඩි කාර්යභාරයක් ඉටුකළ යුතුය යන කරුණ මෙම පුහුණුව මට පෙන්වාදී ඇත".*

- HRDI සාමාජික සංවිධානයක නියෝජිතවරයෙක්

කිරීමට මෙය උපකාරී විය. විවිධ වූ - එකිනෙකට පටහැනි වූ - මතකයන් හා කතන්දර පිළිගැනීමට ලක්කරන විස්තරාත්මක වාර්තාවක් ගොඩනැගීමේ කොටසක් වශයෙන් මෙය වැදගත් වේ. කෙසේවෙතත්, ලේඛණගත කරන අය සමග කතා කිරීම සඳහා අපරාධ සිදුකළ පුද්ගලයන් පොළඹවා ගැනීම ඉතා අභියෝගාත්මක කාර්යයක් විය. එයට හේතුව අනාගත සන්ක්‍රාන්තික යුක්තිය ආකෘතිය හා එය අපරාධය සිදුකළ පුද්ගලයන් සමඟ කටයුතු කරන ආකාරය අපැහැදිළිව හා තීරණයක නොමැති තත්ත්වයක පැවතීම වේ. උදාහරණයක් වශයෙන් සන්ක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් විසින් තමන්ට එරෙහිව පාවිච්චි කළ හැකි ප්‍රකාශන කිරීමෙන් අපරාධය සිදුකළ පුද්ගලයන් වැළකී සිටිය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රැස් කරන ලද කතන්දර පහල මට්ටමේ අපරාධය සිදුකළ පුද්ගලයන්ගේ ප්‍රකාශන ඇතුළත් නොවීය. කෙසේවෙතත්, මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීම මානව හිමිකම් උල්ලංඝනයවීම්වල වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් ලෙස තමන්ව හඳුනා ගත් අපරාධ සිදුකළ පුද්ගලයන්ගේ කතන්දර රැස් කළේය.

## ලේඛණාරක්ෂණ මධ්‍යස්ථානයක් හා ප්‍රජා මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම

දකුණු සූඩානයේ විවිධ ක්‍රියාකාරකම් හරහා ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් ලේඛණාගාරයක් හා ප්‍රජා මධ්‍යස්ථානයක් හරහා වූ සම්බන්ධීකරණය කරන ලද දැක්මක් සංවර්ධනය කර ගැනීම සඳහා සන්ධානයේ හවුල්කරුවන් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමට සහාය ලබා දුන්නේය. කම්බෝජියාවේ පවත්වන ලද අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් හරහා මෙය ලබාදෙන ලදී. ශරීරය සිතියම්ගත කිරීමේ වැඩමුළුද ඇතුළුව කලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් ලේඛණාරක්ෂණ මධ්‍යස්ථානයේ හා සමාජ මධ්‍යස්ථානය සඳහාවූ මූලික පදනම වනු ඇත. සදානුසමරණ කටයුතු පිළිබඳ 2016 මාර්තු මස පවත්වන ලද අවශ්‍යතා ඇගයීමේදී වින්දිතයන් පිළිගැනීම සත්‍යය පැවසීම, ප්‍රජා සුවපත් කිරීම හා සංහිඳියා අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා තමන්ට මධ්‍යස්ථානයක් අවශය බව ප්‍රාදේශීය ප්‍රජාව පෙන්වා දුන්හ.

කම්බෝජියාවේ පවත්වන ලද අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන ලොව පුරා ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන තමන්ගේ සන්ක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම්වලදී සාර්ථක සාමූහික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කර ඇති ආකාරය පෙන්වා දුන්නේය. බංගලාදේශ සිවිල් සමාජ සංවිධානයක් වන විමුක්ති සටන් කෞතුගාරයේ ආරම්භක සාමාජිකයන්ගේ අදහස්වලට සහභාගිවන්නන් සවන් දුන්හ. සමාජ සබඳතා හා සන්ධානයන් ගොඩනැගීම සඳහා මතකය පාවිච්චි කර ආකාරය පිළිබඳ තමන්ගේ අත්දැකීම් ඔවුන් බෙදාහදා ගත්හ. කම්බෝජියානු සිවිල් සමාජ සංවිධානයක් වන ඕ කරුණා සංවිධානය වේදනාව බෙදාහදා ගන්නා අත්දැකීම් පිළිගැනීමේ ක්‍රමයක් ලෙස සීමාවන්ට ඔබ්බෙන් සංවාද සිදුකරන ආකාරය පිළිබඳ කතා කළේය. මෙම විවිධ අත්දැකීම් පිළිබඳ දැනුම දකුණු සූඩානයේ ස්ථාපිත කිරීමට යන මධ්‍යස්ථානයේ දිශානතිය පිළිබඳ සංකල්පයන් ගොඩනගා ගැනීමට මානව හිමිකම් ලේඛනගත කිරීමේ මුපිරීමට උපකාරී විය. තවද, දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධාන හා සිවිල් සමාජ ක්‍රියාධරයන්ගේ ගෝලීය ජාලය අතර පවතින දැඩි සබඳතාවය දකුණු සූඩාන් මැදිහත්වීම්වල ප්‍රාදේශීය අයිතිය පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් ලබාදිය හැකිය.

## ලේඛණවල විවිධ ආකාරයේ භාවිතයන් පිළිබඳ දැනුම්වත්වීම වැඩි කිරීම

සන්ධානයේ හවුල්කරුවන් විසින් පවත්වන ලද පුහුණු හා වැඩමුළු ලේඛණගත කිරීම හා සන්ක්‍රාන්තිය යුක්තිය සමග එය පවත්වන සබඳතාවය පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවල හැකියාව වැඩියුණු කිරීමට අවශ්‍ය සාර්ථක අධ්‍යාපන මෙවලම් විය. අපරාධවලට වගවීමට ඔබ්බෙන් මෙසේ දැනුවත් කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන් මෙම පුහුණු හා

වැඩමුළු ලේඛණගත කිරීම අධිවාචන ක්‍රියාකාරකම් හා පවත්වන සම්බන්ධය පිළිබඳ තමන්ගේ අවබෝධය වැඩිදියුණු කළ බව සහභාගිවන්නන් පවැසූහ.

කම්බෝජියාවේ පවත්වන ලද හුවමාරු වැඩසටහන තෝරා ගත් මානව හිමිකම් ලේඛණගත කිරීමේ මුලපිරීමේ සාමාජිකයන් youthfor peace වැනි කම්බෝජියානු සංවිධාන සමග සම්බන්ධ කළ නිසා විශේෂයෙන් අදාළ විය. එම සංවිධානය තමන්ගේ සදානුස්මරණ ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීම සඳහා දකුණු සූඩානයේ සිවිල් සමාජ සංවිධානවලට අදහස් ලබා ගැනීමට අවශ්‍ය සම්පත් බෙදා දුන්නේය. [4]



සිරියාවේ දැනට පවතින ගැටුම හේතුවෙන් මිලියන 12 ක් ලමණ ජනතාව- යුද්ධයට පෙර සිරියාවේ ජනගහණය අඩක් පමණ- අවතැන්වී සිටිති.

## පරිච්ඡේදය 2:

# මානව හිමිකම් උල්ලංඝනයවීම්වලින් පීඩාවට පත්වී සිටින සිරියන් වැසියන් පිළිබඳ අරමුදල් අගයීම

### සිරියාවේ තත්ත්වය

ටියුනීසියාව හා ඊජිප්තුව වැනි රටවල්වල පාලකයන්ට එරෙහිව 2011 වසරේ ඇතිවූ අරාබි වසන්තය නැගිටීමෙන් අනතුරුව සිරියාවේ සන්නද්ධ අරගලය ආරම්භ විය. තමන්ගේ රටේ පවතින ආඥාදායක පාලනයට එරෙහිව සිරියන් වැසියන්ගේ විරෝධතා ව්‍යාපාර සමඟ මෙය ආරම්භ විය. 2011 මාර්තු මාසයේ අරාබි වසන්තයට සහයෝගය දක්වමින් චිත්‍ර ඇඳීම වෙනුවෙන් පිරිමි ළමුන් 15 දෙනෙක් රැඳවුම් භාරයට ගෙන වදහිංසාවට ලක්කරන ලදී. විරෝධතා ව්‍යාපාරය අඛණ්ඩව සිදුවූ අතර, එයට ප්‍රතිචාරයක් වශයෙන් ජනාධිපති බෂාරල් අසාන් හා ඔහුගේ ආධාරකරුවන් සිය ගණන් පෙළපාලිකරුවන් ඝාතනය කිරීමෙන් හා තවත් බොහෝ සිරගත කිරීමෙන් විරෝධතා ප්‍රචණ්ඩ ක්‍රියා මගින් මැඩ පැවැත්වූහ. 2011 ජූලි මාසයෙන් හමුදාවෙන් ඉවත්වූ අය සිරියානු රජය පෙරලීමේ අරමුණෙන් කටයුතු කරන සන්නද්ධ කණ්ඩායමක් වන නිදහස් සිරියානු හමුදාව පිහිටුවා ගත්හ. ඉන්පසු එහි ප්‍රචණ්ඩත්වයේ ප්‍රමාණය සන්නද්ධ ගැටුමක ප්‍රචණ්ඩත්ව මට්ටම් දක්වා ඉහළ ගියේය. 2011 වසරේ නිදහස් සිරියානු හමුදාව ආරම්භවීමෙන් පසු ආසාද් රජයට පක්ෂව හා විරුද්ධව රාජ්‍ය සන්ධානයන් ස්ථාපිතවීමට අමතරව බොහෝ කැරලි කණ්ඩායම් සිරියාවේ සටනට සම්බන්ධ විය. මෙම සන්නද්ධ කන්ඩායම් බොහෝ අවස්ථාවල ප්‍රචණ්ඩකාරී ලෙස බලය ලබා ගැනීමේ තරඟයක යෙදී සිටියහ. ඔවුන්ගේ සන්නද්ධ අරගලය සමහර අවස්ථාවල ලෙබනනය දක්වා විහිදී ගියේය. එය ලෙබනනයේ දේශපාලනය ද්‍රවීයකරණයවීමට මඟ පෑදුවේය.

ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශ්වයන් දරුනු අපරාධ පිළිබඳ චෝදනා ඇතුළුව බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම් අඛණ්ඩවම සිදුකලහ. මෙය හේතුවෙන් සිවිල් වැසියන් දැඩි ලෙස පීජාවට පත්වූහ. සිරියානු අරාබි ජන රජය සඳහා පරීක්ෂණ පැවැත්වීම සඳහාවූ ස්වාධීන ජාත්‍යන්තර කොමිසම් සභාව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ස්ථාපිත කරන ලදී. මෙම කොමිසම් සභාව අලුත් කරන ලද හා අඛණ්ඩව ක්‍රියාත්මක කරන මැන්ඩේට් බලයක් සහිතව ක්‍රියාත්මකවූ අතර, අදිකරණ ක්‍රමයට බාහිරව සිදුකරන ලද මිනිස් ඝාතන බලහත්කාරයෙන් සිදුකරන ලද අතුරුදහන්වීම් රඳවා ගැනීම්ඝ්ඩ් වදහිංසා, ලිංගික ස්ත්‍රී පරුෂ සමාජභාව පදනම් කරගත් ප්‍රචණ්ඩ ක්‍රියාද ඇතුළුව පුළුල් පරාසයේ මානව හිමිකම් උල්ලංඝනයවීම් පෙන්වාදී ඇත. සිරියානු රජය මෙම අපයෝජන ක්‍රියාවලින් බහුතරයක් සිදුකර ඇත.

මානව හිමිකම් ලේඛණගත කිරීම සඳහා වූ රාජ්‍ය නොවන සංවිධානයක් වන මානව හිමිකම් පිළිබඳ සිරියානු අධීක්ෂණ මධ්‍යස්ථානය 2017 ජූලි මාසයේ සන්නද්ධ ගැටුමේ අවම වශයෙන් සිරියානු වැසියන් හා සටන්කාමීන් 330000 - 475000 ක් පමණ ජීවිතක්‍ෂයට පත්වී ඇති බව වාර්තා කළේය. මුළු මරණ සංඛ්‍යාවෙන් 100,000 ක් පමන සවිල් වැසියන්වූ අතර, එයට ළමයින් 18000 ක් හා කාන්තාවන් 11000 ක් ඇතුළු විය. මෙම ලක්‍ෂය රජයේ රැඳවුම් මධ්‍යස්ථානවල සිදුවූ සිවිල් පුරවැසියන්ගේ මරණ 15000 ක් පමණද ඇතුළු වේ. එයින් ළමුන් 118 දෙනෙක් හා කාන්තාවන් 57 දෙනෙක් එයට ඇතුළු විය. රැඳවුම් මධ්‍යස්ථානවල සිටි තවත් 45000 ක වදහිංසාවට ලක්කර ඝාතනය තර ඇත.[1] ඊට අමතරව දශ ලක්‍ෂයක් පමණ තුවාල ලබා ඇති අතර, මිලියන 12 ක් පමණ - යුද්ධයට පෙර රටේ ජනගහණයෙන් අඩක් පමණ - අවතැන්වී සිටිති. වසහිංසාව හා ලිංගික ප්‍රචණ්ඩත්වය පුළුල් ලෙස සිදුවී ඇති බව හොඳින් දන්වා ඇති කරුණක් බව මෙය සඳහා සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කිරීම දුෂ්කර වේ. මෙම සංඛ්‍යා දහස් ගුණයකින් ඉහළ ප්‍රමාණයක පවතින බව පමණක් මෙහි සඳහන් කළ හැකිය.

මෙම කරුණ හා සංඛ්‍යා ලේඛණ විස්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට මුහුණදීජජීවත්ව සිටින අයට - විශේෂයෙන් රැඳවුම් භාරයේ තබන ලද පුද්ගලයන්ට හා ඔවන්ගේ පවුල්වලට - මනෝ සමාජයීය හා භෞතික පුනරුත්තාපන සහායන් ලබාදීමේ හදිසි අවශ්‍යතාවය පෙන්වා දෙයි. කෙසේවෙතත්, සිරියානු වින්දිතයන් හා ජීවතුන් අතර සිටින පුද්ගලයන්ගේ - සිරියාව තුළ හෝ අනෙකුත් රටවල සරණාගතයන් වශයෙන් ජීවත්වන සිරියානු වැසියන්ගේ-නිශ්චිත මනෝ සමාජයීය අවශ්‍යතා පිළබඳ ජාත්‍යන්තර ප්‍රජාවට සීමිත දැනුමක් පමණක් තිබේ.

යුක්තිය, සත්‍යය හා සංහිඳියාව සඳහාවූ ගෝලීය මුලිපිරිමේ සන්ධානය සම්පූර් ඇගයීම් හා අදහස් විමසීම මගින් සිරියානු වැසියන් ප්‍රතිලාභ ලබාගත හැකි බව විශ්වාස කරයි, මෙය ඔවුන් මුහුණ දුන් හානි හා වගවීමේ යාන්ත්‍රණයන් පිළිබඳව ඔවුන්ගේ දැක්ම තීරණය කිරීම උපකාරී වනු ඇත. මෙවැනි ආකාරයේ සහභාගිත්ව ප්‍රවේශය විශාල වශයෙන් අදාළ වනු ඇත. එයට හේතුව සිරියානු පුරවැසියන්ගේ අදහස් සන්ක්‍රාන්තික යුක්තිය සඳහාවූ අත්තිවාරමක් ලබාදීම වේ. එය සන්ක්‍රාන්තික යුක්තිය පියවරයන්වල ප්‍රාදේශීය ප්‍රජාවගේ සත්‍යය අයිතියටද දායකත්වයක් ලබාදෙයි.

වද මෙම ක්‍රියාවලිය විශ්වසනීයත්වය හා නිත්‍යානුකූලභාවය සංවර්ධනය අතර නීතියේ ආධිපත්‍යද ස්ථාපිත කරනු ඇත.

## මානව හිමිකම් උල්ලංඝනයවීම්වලින් පීඩාවට පත්වී සිටින සිරියන් වැසියන් පිළිබඳ අරමුදල් ඇගීම

සිරියානු වින්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවතුන් අතර සිටින පුද්ගලයන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා සන්ධානය මාස 6 ක ඇගයීමක් දියත් කළේය. සන්ධානයේ හවුල්කරුවන් වූයේ හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය (ICSC), ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යයන ආයතනය (CSVR), හා මහජන නීතිය හා ප්‍රතිපත්ති කණ්ඩායම (PILPG), වේ. සන්ධානයේ හවුල්කරුවන් ප්‍රාදේශීය හවුල්කරුවන් තිදෙනෙක් සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කළහ: එම ප්‍රාදේශීය හවුල්කරුවන් වන්නේ SDA, සංඛ්‍යා ලේඛණ හා පර්යෝෂණ සඳහාවූ සිරියානු මධ්‍යස්ථානය (SCSR) හා සිරියා බ්‍රයිට් ෆිවුචර් මධ්‍යස්ථානය (SBF) වේ.[2] මෙම ව්‍යාපෘතිය මනෝ සෞඛ්‍ය හා මනෝ සමාජයීය සහාය, වෛද්‍ය, නීති පිළිබඳ අවශ්‍යතා දැන ගැනීම සඳහා සිරියානු සංවිධාන සමඟ ප්‍රධාන වශයෙන් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලින් සමන්විත විය. තුර්කිය, ජෝර්දානය හා ලේබනන් යන රටවලට පලා ගොස් සිටි හා සිරියාවේ රැඳී සිටි සිරියානු වින්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින අයට ලැබෙන මානව හිමිකම් ලේඛණගත කිරීමේ සේවාවන් පිළිබඳ සම්මුඛ සාකච්ඡාද මෙයට ඇතුළත් වේ. මෙම ඇගයීම සිරියානු සිවිල් සමාජ සංවිධානය හා එම සංවිධානවල ධාරිතාවය සිතියම්ගත කිරීමට උත්සාහයක් දැරීය; තවද දැනට ලැබෙන සේවාවන් හා යොමු කිරීමේ භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා අවස්ථා හඳුනා ගැනීමටත් මෙයින් උත්සාහයක් දරණ ලදී. මනෝ සෞඛ්‍ය හා මනෝ සමාජීය සෞඛ්‍ය සේවාවන් ලබාදෙන ආයතන හා මානව හිමිකම් ලේඛණගත කිරීමේ ආයතන වැනි විවිධ සේවා ලබාදෙන ආයතනද මෙයට ඇතුළත් විය; කලින් රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල්වල නිශ්චිත අවශ්‍යතා හඳුනා ගැනීමටද උත්සහායක් දරණ ලදී.

මෙම ව්‍යාපෘතියේ නිමැවුමක් විය හැක්කේ මානව හිමිකම් උල්ලංඝනයවීම්වලින් පීඩාවට පත්වී සිටින සිරියන් වින්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවතුකන් අතර සිටින පුද්ගලයන් සඳහා අරමුදලක් ස්ථාපිත කිරීම වේ. බොහෝ දුරට මෙම අරමුදලට එක්සත් ජනපද රජය හා අවෙකුත් ද්විපාර්ශ්වීය හවුල්කරුවන්ගේ සහයෝගය ලබා ගත හැකිය. එවැනි අරමුදලක් මානව හිමිකම් ආරක්ෂයන් වත්මන් හිටපු රැඳවියන්ගේ පවුල්ද ඇතුළුව වින්දිතයන්ට හා ප්‍රචණ්ඩත්වයට ගොදුරුවී ජීවතුන් අතර සිටින පුද්ගලයන්ට ඉක්මනින්ම වැදගත් සේවාවන් ලබාදීම සඳහා ජාත්‍යන්තර හා දේශීය සපයන්නන්ට හැකියාව ලබා දෙනු ඇත. ගැටුම සක්‍රියව සිදුවන අවස්ථාවේ මෙම යෝජිත අරමුදල නිර්මාණය කර ඒකට අවශ්‍ය ආරම්භක අරමුදල් ලබාදීම විශාල වෙනසකට තුඩු දිය හැකිය. තවද, මෙම අරමුදල ප්‍රාථමික අරමුණු 3 ක් ඉටුකර ගැනීම සඳහා මෙම අරමුදල වත්මන් හිටපු රැඳවියන්ට හා අනෙකුත් වින්දිතයන්ට හා ප්‍රචණ්ඩත්වයට ගොදුරුවී ජීවිත්ව සිටින පුද්ගලයන්ට හදිසි මනෝ සෞඛ්‍යය හා මනෝ සමාජයීය සේවාවන් හා පුනරුත්තාපන සහාය ලබාදිය හැකිය; සමහර අවස්ථාවලදී ඔවුන්ගේ

පවුල්වලටද එම සේවාවන් ලබාදිය හැකිය.[3] දෙවනුව මෙම අරමුදල සේවා සපයන සංවිධාන අතර පුද්ගලයන් යොමු කිරීම සඳහාවූ ජාලයක් සංවර්ධනය කිරීම මගින් උල්ලංඝනයවීම් ක්‍රමානුකූලව ලේඛණගත කිරීම සඳහාවූ උත්සාහයන් පුළුල් කළ හැකිය. එය වින්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට ගොදුරුවී ජීවත්ව සිටින පුද්ගලයන්ට ලේඛණගත කරන අය සමග තමන්ගේ කතන්දර බෙදා හදා ගැනීමටත් අවස්ථාව සලසනු ඇත. තුන්වනුව මෙම අරමුදල හානිපූරණ ක්‍රියාවලියක් සඳහාවූ අත්තිවාරමක් විය හැකිය. විශේෂයෙන් වත්මන් හා හිටපු රැඳවියන් හා ඔවුන්ගේ පවුල්වල දුක් වේදනාවන් හා අයිතිවාසිකම් උල්ලංඝනයවීම් පිළිගැනීම සඳහාවූ ක්‍රියාවලියක් මෙමගින් ස්ථාපිත කරනු ඇත.

කාර්යාල පර්යේෂණ හා ප්‍රාදේශීය හවුල්කරුවන්ගෙන් ලබා ගත් අදහස් පදනම් කරගෙන මෙම කණ්ඩායම මනෝ සෞඛ්‍ය සේවාවන් හා මනෝ සමාජයීය සේවාවන් වෛද්‍ය, නීති හා මානව හිමිකම් ලේඛණගත කිරීමේ සේවාවන් ලබාදෙන පුද්ගලයන් සම්මුඛ සාකච්ඡා කිරීම සඳහාවූ විස්තරාත්මක ලැයිස්තුවක් පිළියෙල කළහ. මෙම ව්‍යාපෘතිය කාර්යාල පර්යේෂණ, පසුබිම් අනුව සිදුකරන සම්මුඛ සාකච්ඡා, තොරතුරු ලබාදෙන ප්‍රධාන පුද්ගලයන් සමග පවත්වන සම්මුඛ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හා අදාළ ස්ථානවලට ගොස් නිරීක්ෂණය කිරීමද ඇතුළුව විවිධ ක්‍රමවේදයන් ව්‍යාපෘතියට ඇතුළත්වී තිබේ. මෙම කණ්ඩායම සිරියානු වැසියන් සමග පෙර වත්වන ලද මනෝ සමාජයීය ඇගයීම් හා මනෝ සමාජයීය සෞඛ්‍ය සේවාවන්වල ජාත්‍යන්තර මග පෙන්වීම් සැලකිල්ලට ගෙන සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ මගපෙන්වීමක් සංවර්ධනය කළේය.[4] මෙම ඇගයීම සිරියාවට අදාළ වීම තහවුරු කර ගැනීම පිණිස කණ්ඩායම ප්‍රාදේශීය හවුල්කරුවන් හා ගැටුම පිළිබඳ විශේෂඥයන් සමග පසුබිම විස්තර කරන සම්මුඛ සාකච්ඡා 6 ක් පැවැත්විය. අවශ්‍යතා ඇගයීම දියත් කිරීමට පෙර මෙය සිදුකරන ලදී.

ඇගයීම සිදුකරන අවස්ථාවේදී කණ්ඩායම ස්කයිප් තාක්ෂණය හරහා කණ්ඩායම් 46 ක නියෝජිතවරුන් සමග සම්මුඛ සාකච්ඡා 52 ක් පැවැත්විය. තුර්කිය (ස්ටන්භූල් ගාඩියන් ටෙප් හා එතේ පළාත) හා ජෝර්දාන් (අම්මාන්) යන ප්‍රදේශවල සිටි පුද්ගලයන් සමග 2015 නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා පුද්ගලිකව සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. බොහෝ සම්මුඛ සාකච්චා පුද්ගලිකව පවත්වන ලදී. නමුත් ලෙබනන් රටේ ජීවත්වූ පුද්ගලයන් ඇතුළුව පුද්ගලයන් 10 දෙනෙක් සමග ස්කයිප් තාක්ෂණය හරහා සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. තුර්කියේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා 4 ක් පවත්වන ලදී. (එකක් හිටපු පිරිමි රැඳවියන් සමග හා තව එකක් හිටපු කාන්තා රැඳවියන් සමගද සම්මුඛ සාකච්ඡා 2 ක් මානව හිමිකම් ලේඛණගත කිරීමේ කයෙුතුවල හා ගැටුම ආරම්භවීමෙන් පසු නීති සේවාවන් ලබාදීමේ සම්බන්ධවී සිටි සිරියානු අධිකරණයේ හිටපු සාමාජිකයන් සමග සම්මුඛ සාකච්ඡා 2 ක්ද පවත්වන ලදී). තවද මෙම කණ්ඩායම සිරියානු සරණාගතයන් බහුතරයක් ජීවත්වූ ස්ථානවූ ගාඩියන් ටෙප්, හටේ පළාතටත් අම්මාන් ප්‍රදේශයටත් ගෙස් එම ස්ථාන නරඹීය, සිරියානු වැසියන්ට ලැබෙන සේවාවන් මොනවාද? එම සේවාවන් ලබා දෙන්නේ කෙසේද? යන කරුනු තීරණය කර ගැනීම සඳහා කණ්ඩායම සංවිධාන 25 ක යටිතල පහසුකම් හා ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කළේය. 2016 ජනවාරි හා පෙබරවාරි මාසවල කණ්ඩායම තුර්කිය හා එක්සත් ජනපදය සිටින හිටපු රැඳවියන් සමග තවත් සම්මුඛ සාකච්ඡා කිහිපයක් පැවැත්විය. රැඳවියන්ගේ අවශ්‍යතා පදනම් කරගත් ඇගයීම ශක්තිමත් කිරීම සඳහා මෙය සිදුකරන ලදී. මූලික නිගමනයන් හා නිර්දේශයන් කලින් තෝරා ගන්නා ලද පුද්ගලයන් සමග සිදුකරන ලද පසු විපරම් සම්මුඛ සාකච්ඡාවලදී අවශ්‍යතා ඇගයීම තහවුරු කර ගන්නා ලදී. ගැටලු පැහැදිලි කිරීමේ හා ප්‍රතිපෝෂණ ලබාදීමේ හැකියාව මත ඔවුන් තෝරා ගන්නා ලදී.

## මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට මුහුණදී ජීවත්ව සිටින සිරියානු පුරවැසියන්ගේ අරමුදල් ඇගයීම

මානව හිමිකම් උල්ලංඝනයවී ජීවත්ව සිටින සිරියානු වැසියන්ගේ අරමුදල් ඇගයීම ඉතා වැදගත් සිද්ධි අධ්‍යයනයක් වේ. එයට හේතුව එය අඛණ්ඩව සිදුවෙන ඉහළ ප්‍රමාණයේ ගැටුම පිළිබඳ ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන සමග සාමූහිකව සිදුකරන ලද අවශ්‍යතා ඇගයීම තක්සේරු කිරීමට එය සුවිශේෂ අවස්ථාවක් ලබාදෙයි. විශේෂයෙන් සන්ධානය හා ප්‍රාදේශීය හවුල්කරුවන් විසින් භාවිතා කරන ලද සාමූහික විෂයාන්තර හා සාමූහික ප්‍රවේශය ඒවාගේම මනෝ සමාජයීය සේවාවන්, වෛද්‍ය, නීති හා මානව හිමිම් ලේඛණගත කිරීමේ සේවාවන් සම්බන්ධ කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ නවෝත්පාදන අරමුණ යන හේතු නිසා එය වටිනා දෙයක් විය. මෙම පරිච්ඡේදය මෙ ව්‍යාපෘතිය හා සිරියාවේ සන්නද්ධ ගැටුමේ වින්දිතයන් හා ගැටුමට මුහුණදී ජීවත්ව සිටින අයගේ තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීමට ලබාදිය හැකි දායකත්වයන් ඇගයීමට ලක් කරයි. මෙම ඇගයීම පදනම් කරගෙන සන්ධානය සිරියාවේ හා ගැටුම්වලින් පීඩාවට පත්වී සිටින අනෙකුත් රටවල්වල අනාගත මැදිහත්වීම් පිළිබඳ දැන ගැනීම සඳහා අවශ්‍යතා ඇගයීම් පැවැත්වීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි.

## විෂයාන්තර හා බහු විෂය ආමන්ත්‍රණය කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී කන්ඩායමක් ස්ථාපිත කිරීම

රට ඇතුළේ ක්‍රියාත්මකවූ කණ්ඩායම CSVR සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් (සමාජ සේවකයෙක්, සමාජ විද්‍යාඥයෙක් හා මානව හිමිකම් නීතිඥවරයෙක්) හා PLPIG කාර්ය මිඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් (දෙදෙනාම මානව හිමිකම් නීතිඥවරුන්) හා SDF කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් (වෛද්‍යවරයෙක් හා මනෝ විද්‍යාඥයෙක්) යන අයගෙන් සමන්විත විය. සෞඛ්‍ය, නීතිය වැනි විවිධ වූ වෘත්තීය පසුබිම් ඒකරාශි කිරීම මගින් ව්‍යාපෘතිය විෂයයාන්තර හා බහුවිෂයට අදාළ ප්‍රවේශයක් භාවිතා කළේය. කණ්ඩායම ඔවුන්ගේ වෙනස් විවිධ වෘත්තීය පසුබිම් හා සබඳතා මධ්‍යයේ වුවත් එක පැත්තකට යොමුවී තිබෙන ව්‍යාපෘතියක් පවත්වා ගෙන යාමේ වැදගත්කම අවබෝධ කර ගත්හ. මෙම තත්ත්වය තුළ කණ්ඩායමේ සාමාජිකයන් තමන්ගේ විවිධ නිපුණතා ක්ෂේත්‍ර සම්බන්ධීකරණය කළ අතර, ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා එකිනෙකාගේ ක්ෂේත්‍රවලින් හා දෘෂ්ඨි කෝණවලින් ඉගෙන ගත්හ. මෙම කණ්ඩායම ඇගයීමේ අවසානයේ තොරතුරු හුවමාරු කර ගැනීම මගින් ඉතා වටිනා පාඩම් ඉගෙන ගත් අතර, කණ්ඩායමේ සිටින තනි සාමාජිකයන් විශේෂඥ දැනුම හා බලාධිකාරය පිළිබඳ තමන් පමණක් ආදේශ නොකළ යුතුයි යන කරුණ අවධාරනය කළහ. ඒ වෙනුවට නිපුණතා සමග විවෘතභාවය පවත්වා ගෙන යාම මෙම ඇගයීම කාර්ය සාධනීය ලෙස හා කාලය හා සම්පත් මනා ලෙස භාවිතා කරන ආකාරයක ක්‍රියාත්මක කිරීම සඳහාවූ සමස්ථ ප්‍රවේශයක් ගැනීමට කණ්ඩායමට හැකියාව ලබා දුන්නේය.

*" විෂයාන්තර කන්ඩායමක නීතිඥවරුන් සමග වැඩ කිරීම ප්‍රායෝගික මට්ටමේ මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ ලේඛනගත කිරීම ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි පිළිබඳ මට දැනුමක් ලබා දුන්නේය.,. වදහිංසාවලට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන් සම්මුඛ සාකච්ඡා කිරීම සඳහාවූ ප්‍රවේශයන් නඩුවක් ගොඩනැගීම සඳහා අවහය වන තොරතුරු වර්ගයන් මොනවාද? යන කරුණු අතර තිබෙන වෙනස දැක බා ගැනීමට එය උපකාරී විය. ක්‍රියාවලිය යොමු කර ගත් මගේ ප්‍රවේශයත් එක්ක සංසන්දනය කරන විට මෙය වෙනස් දෙයක් වෙයි "*

- මනෝ සමාජයීය නිපුණතාවයෙන් යුත් කාන්තා ඇගයීම් කණ්ඩායමේ සාමාජිකාවක්




උතුරු ඇලේපෝ ප්‍රදේශයේ ජරාබෝස් නගරයේ සාමය හා නගරයේ පහසුකම් ආරක්ෂා කිරීමේ වැදගත්කම සඳහා ඉල්ලීමක් කරන බැනරයක්, නොවැම්බර් 2016.

තවද කණ්ඩායම් සාමාජිකයන් 6 දෙනෙකුගෙන් 5 දෙනෙක් කාන්තාවන් විය; SBF සංවිධානයේ වෛද්‍යවරයා පිරිමියෙක් විය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොව වෘත්තීය නිපුණතාවය සාමාජිකයන් තෝරා ගැනීමේ ප්‍රාථමික වශයෙන් සැලකිල්ලට ගන්නා ලද කරුණවූ නමුත් සිරියානු පසුබිමේ ස්ත්‍රී පුරුෂ සමාජභාව ගතිකත්වය සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාවය කන්ඩායම ඇගයීමට ලක් කළේය. SBF සංවිධානය විශේෂයෙන් ආගමට සාම්ප්‍රදායට දැඩි ලැදියාවක් දක්වන පිරිමින් සමඟ කතා කරන විට ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේගී ක්‍රමවේදයන් පාවිච්චි කිරීම පිළිබඳ කන්ඩායමට කරුනු පැහැදිළි කළේය. උදාහරණයක් වශයෙන් කාන්තාවන්, පිරිමින් සමඟ කතා කරන විට හිස්වැසුම් පාවිච්චි කළහ. කන්ඩායමේ පිරිමි සාමාජිකයා සම්මුඛ සාකච්ඡාවට ලක් කළ කාන්තාවන්ගේ අවශ්‍යතා පිළිබඳ සංවේදීවූ අතර, සම්මුඛ සාකච්ඡාවලදී ඔවුන්ගේ පහසුකම් සඳහා සමහර අවස්ථාවල ඉවත් විය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රවේශය මෙම ඇගයීමේ කාර්ය සාධන තත්ත්වයට පහසුකම් සැලසුවේය. එයට හේතු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හානි හා අවශ්‍යතා සාකච්ඡා කිරීම සඳහා කණ්ඩායමට සම්මුඛ සාකච්ඡාවලදී පිරිමි හා කාන්තාවන් දෙපිරිසම පහසුවෙන් යොදා ගත හැකිවීමය.

## ප්‍රාදේශීය නිපුණත්වය ලබා ගැනීමටත් තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීමටත් සහයෝගිතාවයෙන් කටයුතු කිරීම

ප්‍රාදේශීය ප්‍රජාවගේ හවුල්කාරත්වය හා අයිතිය පිළිබඳ සන්ධානය අවධාරනය කරන තත්ත්වය තුළ සන්ධානයේ හවුල්කරුවන් විධිමත් ක්‍රමක් තුළ ඔවුන්ගේ වැඩ කටයුතුවලට සහයෝගය දැක්වීම සඳහා ප්‍රාදේශීය හවුල්කරුවන් තිදෙනෙක් සමග එක්වී කටයුතු කළහ. ඔවුන් රට තුළ ලබා දුන් දායකත්වයන් එම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට හේතුව විය. විශේෂයෙන් එහි තිබූ බරපතල ආරක්ෂාව පිළිබඳ අභියෝගයන් හා කණ්ඩායමේ සීමිත අරමුදල් හා කුඩා ප්‍රමාණය හා සිරියාවේ හෝ සරණාගතයන්ට අනුග්‍රහය දැක්වූ අසල්වැසි රටවල්වල සමග සබඳතා නොපැවැත්වීම යන පසුබිම තුළ මෙය වැදගත් විය. ඔවුන්ගේ වැඩ අවබෝධ කර ගැනීම සඳහාත් ව්‍යාපෘතිය විවිධ අංගයන් පිළිබඳ ඔවුන්ගේ අදහස් ලබා ගැනීම සඳහාත් කණ්ඩායම එක් එක් ප්‍රාදේශීය හවුල්කරුවන් සමග වෙන් වෙන්ව රැස්වීම් පවත්වන ලදී. මෙම රැස්වීම්වලදී සන්ධානයේ හවුල්කරුවන් සිරියානු සිවිල් සමාජය විසින් මුහුණපාන ලබන අවශ්‍යතා හා අභියෝග පිළිබඳවද ඒවාගේම දේශීය ධාරිතාව හා මැදිහත්වීමේ උපාය මාර්ග පිළිබඳව සාකච්ඡා කළහ. මෙය ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ නිපුණතාවයන් තහවුරු කිරීමටත් ඔවුන්ගේ හඬවල්වලට සවන්දීම සඳහා උපකාරී විය. - අදාළ හා තිරසාර මැදිහත්වීම්වල මෙය අත්‍යවශ්‍ය අංගයක් වේ. මෙම රැස්වීම සන්ධානයේ හවුල්කරුවන් හා ප්‍රාදේශීය හවුල්කරුවන් අතර විශ්වාසය පදනම් කරගත් ආයතන සබඳතාවයක් ගොඩනැගීමට ඉවහල් විය. මෙය ප්‍රාදේශීය හවුල්කරුවන් සන්ධානය සමග සම්බන්ධවූ ප්‍රථම අවස්ථාව හෙයින් මෙය ඉතා වැදගත් විය.

මෙම ව්‍යාපෘතිය පුරාම සිරියාව පිළිබඳ උපදෙස් ලබාදීමටත් තාක්ෂණික විශේශඥයෙක් ලෙස කටයුතු කිරීම සඳහාත් සෑම ප්‍රාදේශීය හවුල්කාර සංවිධානයක්ම කාර්ය මණ්ඩලයේ ජේෂ්ඨ සාමාජිකයෙක් නම් කළේය. මෙම විශේෂඥයන් සැලසුම් කිරීමේ අදියරේදී සතියට දෙවරක් පවතින රැස්වීම්වලට සහභාගිවූ අතර, ඇගයීමේ විෂය පථය තීරණය කර ගැනීමට බෙහෙවින් උදවු කළහ. සන්ධානයේ හවුල්කරුවන් කණ්ඩායමේ ප්‍රවේශයට තමන්ගේ අදහස් ඒකාබද්ධ කළ අතර, සැලසුම් කිරීමේ අදියරේ සිටම ඵලදායි සහයෝගිතාවයක් සඳහා හැකියාව ලබා දුන්හ. ප්‍රාදේශීය හවුල්කරුවන් සමග සම්බන්ධ වීම සන්ධානයේ ඉලක්ක සංවිධාන හා සම්බන්ධ වීම සඳහා ඔවුන් තමන්ගේ නිපුණතාය ආයෝජනය කිරීම තහවුරු කිරීම මගින්ද සිදුවිය. එය ඇගයීමේ නිමැවුම්වල බලපෑම වැඩිකළ හැකිය. ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයන් පිළිබඳ සංකල්ප සකස් කිරීමේදී ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ අදහස්වලට ප්‍රමුඛතාවයක් ලබාදෙන ලදී. එයට හේතුව ඉදිරියට ඇති විය හැකි අවශ්‍යතාද ඇතුළුව පසුබිම පිළිබඳ දැනුමක් ඔවුන් සතුව තිබීම වේ. ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ අදියරයන් ක්ෂේත්‍රයට සහාය ලබාදීමේ සන්ධානයේ අවභ්‍යතාවය සම්බන්ධීකරණය කිරීම හා ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ පසුබිම පිළිබඳ නිපුණත්වය කාර්යක්ෂම ආකාරයෙන් සිදුවිය.

## අවශ්‍යතා ඇගයීම සඳහා ප්‍රාදේශීය සංවිධාන සමග හවුල්කාරත්වයෙන් කටයුතු කිරීම

ප්‍රාදේශීය හවුල්කරුවන්ට බොහෝ දෙනෙක් සිරියාවේ සන්නද්ධ ගැටුමේ වින්දිතයන් හා එයට මුහුණදී ජීවත්ව සිටන අය වශයෙන් සිටින හෙයින් ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් පසුබිම පිළිබඳ ගැඹුරු අවබෝධයක් සතුව සිටිති. තත්ත්වය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා විශ්වසනීය වත්මන් තොරතුරු ක්ෂණිකව ලබා ගැනීමේ හැකියාව යන කරුණු ඔවුන් පසුබිම් පිළිබඳ ඉතා අගනා විශේෂයන් බවට පත්කර ඇත. තවද සක්‍රිය ගැටුම හා සිරියාවෙන් පිට තිබෙන උසස් ආරක්ෂක පරිසරයන් හරහා යාමේ ඔවුන්ගේ හැකියාවද අනෙකුත් සන්දර්භයන් තුළ සම්බන්ධවීමටත් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමටත් දුෂ්කර විය හැකි ප්‍රජාවන්, වින්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී සිටින පුද්ගලයන් හමුවීමට කණ්ඩායමට අවස්ථාවක් ලබා දුන්නේය. සන්ධානයේ හවුල්කරුවන්ට සහයෝගය දැක්වීම සඳහාවූ ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ හැකියාව ව්‍යාපෘතියේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වූ අතර, ඇගයීම්වලකාර්ය සාධන තත්ත්වය හා බලපෑම වැඩිදියුණු කර ගැනීම සඳහා ප්‍රාදේශීය හවුල්කරුවන් සමග ඉතා කිට්ටුවෙන් සහයෝගිතාවයෙන් කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නේය. උදාහරණයක් වශයෙන් SBF සංවිධානය තුර්කි හා ජෝර්දාන් යන රටවල පොදු පහසුකම් සහයෝගය ලබා දුන් අතර, කණ්ඩායම කලින්ම සම්මුඛ සාකච්ඡා ඉල්ලා සිටියේය. SBF සම්මුඛ සාකච්ඡා තහවුරු කිරීමට පසුවිපරම් කටයුතුවල යෙදුනු අතර, භාෂා පරිවර්තකයන් සඳහා විධි වධාන යොදා අවභ්‍ය ලිපි ලේඛණ අරාබි බසට පරිවර්තනය කර තිබිණි. ඊට අමතරව ගාඩියන් ටෙප්

ප්‍රදේශයේ සිටි SBF සංවිධානයේ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් තුර්කියේ කණ්ඩායමේ ලබාගෙන ඇති සියලුම සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තහවුරු කර ගැනීම සඳහා දිනපතා කණ්ඩායම සමග ගියේය. SBF කාර්ය මණ්ඩලයේ සාමාජිකයා තුර්කියේ සිට ජෝර්දානයට ගමන් කිරීමට නොහැකි නිසාත් ගෙවුඩානයේ පිහිටා තිබෙන SBF කාර්යාලය හරහා එම සහයෝගය ලබාදීමට ඔහු විධි විධාන යෙදුවේය. එම කාර්යාලයෙන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් ඔවුන් අම්මාන් නගරය වෙත පැමිණි අවස්ථාවේ ඇගයීම් කණ්ඩායමට එකතු විය.



හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානයේ සිරියානු සාමාජික සංවිධාන 4 ක් - එඩම් බලාදි හා මානව හිමිකම් අධ්‍යයනය සඳහාවූ ඩමස්කස් මධ්‍යස්ථානය- 2014 වසරේ සිරයානු සරණාගතයන්ගෙන් හා අවතැන්වූ පුද්ගලයන්ගෙන් වාචික ඉතිහාස රැස් කළේය. සිරියානු ගැටුමේ පුළුල් සිවිල් වැසියන්ගේ කතන්දර සදානුස්මරණ ක්‍රියාවලීන්වල නිරවද්‍ය ලෙස නියෝජනය වීමත් ඇතුළත් කර ගැනීස තහවුරු කර ගැනීම සඳහා මෙය සිදුකෙරිණි. හෘද සාක්ෂිය පිළිබිඹු කරන ජාත්‍යන්තර සන්ධානය 2015 වසරේ මෙම පුද්ගලික විස්තරවලට තවදුරටත් පුළුල් කර පෙන්වීම සඳහා නේපාලයේ - ඇමෙරිකානු කලාකරු ලූඩිස් ෂේත්‍රා ලවා චිත්‍ර නිර්මාණය කළේය.

ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න මධ්‍යයේ වුවත් ප්‍රාදේශීය හවුල්කරුවන් සාර්ථකව අවශ්‍යතා ඇගයීම් සිදුකිරීම් සඳහා වූ තමන්ගේ හැකියාව වර්ධනය කරගෙන සිටියහ. උදාහරණයක් වශයෙන් විශේෂයෙන් ගාඩියන් ටේප් හා හටේ පළාතේ අන්තවාදීන්ගේ ප්‍රචණ්ඩකාරී ප්‍රහාරයන් හා බෝම්බ ප්‍රහාරයන් වැඩිවෙමින් පවතින තත්ත්වයන් තුළ ආරක්ෂක ගැටලු පිළිබඳ කණ්ඩායම දැනුම්වත්ව සිටියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තුර්කි හා ජෝර්දාන්වල පූර්ණ කාලීන ආරක්ෂාව ලබා ගන්නා ලෙස ව්‍යාපෘතියට අරමුදල් සපයන සංවිධාන උපදෙස් ලබා දුන්නේය. කෙසේවෙතත්, ආරක්ෂක භටයන්ගේ සේවාවන් ලබා ගැනීම වෙනුවට ප්‍රාදේශීය ප්‍රජාව සමඟ "මිශ්‍රව" කටයුතු කිරීමට පක්ෂව ප්‍රාදේශීය හවුල්කරුවන් නිර්දේශ ඉදිරිපත් කළ අතර, ආරක්ෂක අවධානම් අවම කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් හා උපාය මාර්ග ලබා දුන්හ. ඔවුන්ගේ අදහස් හා ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීමේ කැමැත්ත පදනම් කරගෙන කණ්ඩායම ආරක්ෂක භටයන් ලබා නොගන්නා බව තීරණය කළේය; ඒ වෙනුවට කණ්ඩායම අවධානම් ඇගයීම් සිදුකිරීමට ප්‍රාදේශීය හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කළ අතර, ඔවුන්ගේ මඟපෙන්වීම්වලට අමතරව ක්‍රියාත්මක විය. ප්‍රාදේශීය සංවිධානවල අධීක්ෂණය හා එම සංවිධාන සිරීම ඇගයීම සාර්ථකව අවසන් කිරීමට හැකියාව ලබාදුන් බව කණ්ඩායම විශ්වාස කරයි.

## ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ බලාපොරොත්තු පාලනය කිරීම හා ඔවුන් සම්බන්ධ කර ගැනීම

පර්යේෂකවරුන් වශයෙන් තමන්ගේ භූමිකාව පිළිබඳ තමන්ගේ කණ්ඩායම ඉතා පැහැදිළිව සිටි අතර, එම නිසා අවශ්‍යතා ඇගයීමට ඔබ්බෙන් කිසිම තහවුරුවක් ලබාදිය නොහැකි කෙටි කාලීන උපදේශකවරුන් වශයෙන් පමනක් තමන් සිටින බව පෙන්වූහ. කණ්ඩායමේ සාමාජිකයන් සම්මුඛ සාකච්ඡාවට ලක්වූ පුද්ගලයන්ගේ අමතර අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට කැමැත්තක් දැක්වූ තත්ත්වය තුළ මෙය ඔවුන්ට ඉතා දුෂ්කර කාර්යයක් විය. සන්ධානයේ හවුල්කරුවන්ගේ නියෝජිකවරුන් ඇගයීමෙන් බාහිරව සහයෝගය ලබාදීමේ තමන්ගේ නොහැකියාව ප්‍රාදේශීය හවුල්කරුවන් සමඟ සහයෝගිතාවයෙන් කටයුතු තත්ත්වයට බලපෑමක් ඇතිවිය හැකි බව කනස්සල්ලෙන් සිටියහ. තවද බොරු පොරොන්දු ලබා නොදීමෙන් ප්‍රජාවගේ බලාපොරොත්තු නිරවද්‍ය ලෙස කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාවය ඔවුන් දැනුම්වත්ව සිටියහ. පෙර අනෙකුත් සංවිධාන මෙවැනි පොරොන්දු ලබාදී තිබුණි. පර්යේෂකවරුන් ක්‍රියාකාරකවරුන් වශයෙන් එකිනෙක සමඟ තරඟ කරන භූමිකාවන් රඟපෑමේදී මුහුණපෑමට සිදුවූ දුෂ්කරතා මධ්‍යයේ වුවත් කණ්ඩායමේ සාමාජිකයන් පර්යේෂකයන් වශයෙන් තමන්ගේ සම්පූර්ණ අවධානය අදාළ කරුණ පිළිබඳ යොමු කළහ. කෙසේවෙතත් සැසිවල අවසානයේ සම්මුඛ සාකච්චාවලට ලක් කල පුද්ගලයන් තමන්ට වැදගත්වන ගැටලු පිළිබඳ ඉදිරියට කටයතු කිරීමට සහාය වීම සඳහා සම්බන්ධ විය හැකි පුද්ගලයන් පිළිබඳ විස්තර හා අනෙකුත් තොරතුරු යෝජනා කිරීම මගින් බොහෝ දුරට ක්‍රියාධරයන් ලෙස කටයුතු කළහ. වාසනාවකට මෙන් ප්‍රාදේශීය හවුල්කරුවන් කණ්ඩායමේ මැන්ඩේට් බලය අවබෝධ කරගත් අතර, ජාත්‍යන්තර සහභාගිත්වය නොමැති තත්ත්වයක් තුළ හා අවම අරමුදල් සම්පාදනය තුළ ඇගයීමේ හඳුනා ගන්නා ලද අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා මැදිහ්වීම් අඛණ්ඩව සිදුකිරීමට ක්‍රමවේදයන් සැලසුම් කිරීම පිළිබඳ උනන්දුවක් දැක්වූහ. උදාහරණයක් වශයෙන් තමන්ගේ පශ්චාත් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීමටත් දැනට ක්‍රියාත්මක වැඩසටහන් කාන්තාවන් හා ළමයින් සිරියාව තුළ හෝ සිරියාවෙන් පිට ජීවත්ව සිටින අනෙකුත් වින්දිතයන් වදහිංසාවට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන් වැනි අයට ගැලපෙන ආකාරයෙන් සකස් කර ගැනීම සඳහා අවශ්‍යතා ඇගයීම පාවිච්චි කිරීමට ඔවුන්ට හැකිවිය. ප්‍රාදේශීය හවුල්කරුවන් මනෝ සමාජයීය සෞඛ්‍ය සේවාවන් විශේෂ කන්ඩායම්වල නිශ්චිත අවශ්‍යතා අනුව සැලසුම් කල යුතු බවත්, ළමුන් සඳහාවූ ක්‍රීඩා චිකිත්සාව හෝ කණ්ඩායම් චිකිත්සා සැසිවලට පමණක් තවදුරටත් ඒවා ඇතුළත් විය යුතු බවත් ප්‍රාදේශීය හවුල්කරුවන් පිළිගත්හ.



ප්‍රචණ්ඩත්වය හා සංහිඳියා අධ්‍යයනය කේන්ද්‍රයේ සිරියා බ්‍රයිට් ෆියුචර් අම්මාන් සංවිධනය කණ්ඩයම

## වින්දිතයන්ගේ හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන්ගේ වෛද්‍ය හා මනෝ සමාජයීය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

අවශ්‍යතා ඇගයීමට සහභාගිවූ සම්මුඛ සාකච්ඡාවලට ලක්වූ පුද්ගලයන් දැනට බවතින කොන් කරන තත්ත්වය පුද්ගලයන් මනෝ සමාජයීය සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමෙන් ඔවුන් වළක්වන බව හෝ ඒවා ප්‍රමාද කරන බව සඳහන් කළහ. මනෝ චිකිත්සාවද ඇතුළුව මනෝ සමාජයීය සෞඛ්‍ය සේවාවන් යුද්ධයට පෙර සිරියාවේ පවා මනා ලෙස සංවර්ධනය නොතිබූ බව පොත්පත් හා අනෙකුත් පුද්ගලයන් මගින් දැන ගැනීමට හැකිවිය. උදාහරණයක් වශයෙන් මනෝ විද්‍යාව බොහෝ දුරට මානසික සෞඛ්‍ය ආබාධ තත්ත්වය හා බෙහෙත් ලබාදෙන ප්‍රවේශයන් පාවිච්චි කිරීම හා අනෙකුත් මැදිහත්වීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය.[5] තවත් උදාහරණයක් වශයෙන් සිරියාවේ මනෝ විද්‍යාඥයන් කිසිම ප්‍රායෝජික හෝ සායනික පුහුණුවකින් තොරව උපාධි ලබා ගනිති. එය එවැනි අත්දැකීම් අවශ්‍ය වන අනෙකුත් රටවල්වල බලපත්‍ර ලබා ගැනීමට ඔවුන් එමනිසා දුෂ්කරතාවයන්ට මුහුණ දෙති.

*" දැඩි ලෙස පීඩාවට පත්වී තිබෙන ප්‍රදේශවල ජීවත්වන ඉතා දුර්වල ජන කණ්ඩායම්වලට සහයෝලය ලබාදීම සඳහා අපට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල හා අරමුදල් සපයන්නන්ගේ සහයෝගය අවහ්‍ය වේ. නමුත් ඔවුන් එම සහයෝගය ලබා දෙන්නේ නැත. අපට සේවාවන් ලබාදීමට නොහැකිවීම සඳහා දේශපාලන බාධක හේතුවක් නොවිය යුතුයි"*

- සිරියානු පිරිමි රාජ්‍ය නොවන සංවිධාන

සම්මුඛ සාක්ෂාවට ලක් කරන පුද්ගලයන් සියලු දෙනාම විශේෂඥ මනෝ සමාජයීය මැදිහත්වීම් ප්‍රමුඛතා ෂේත්‍රයක්ව පවතින බව සඳහන් කළහ. මෙම අවශ්‍යතා පවතින නමුත් එවැනි පහසුකම් ලැබීම බොහෝ දුරට සීමාවී තිබේ. වින්දිතයන්ට හා අවි ගැටුම්වලට මුහුණදී ජීවිතව සිටින පුද්ගලයන්ට විශේෂඥ සේවාවන් ලබාදෙන සංවිධාන 3 ක් පමණක් තුර්කියේ ක්‍රියාත්මක වන බවත් (එක් සංවිධානයක් සිරියාවේ මූලිකත්වයෙන් හා කටයුතු කරන අතර, අනෙක් සංවිධානය ජාත්‍යන්තර සංවිධානයක් වේ). ජෝර්දානයේ සංවිධාන 4 ක් පමණක් කටයුතු කරන බවත්, (ජෝර්දානයේ සංවිධාන 2 හා ජාත්‍යන්තර සංවිධාන 2 ක්) ඇගයීම හඳුනා ගෙන තිබිණි. තවදුරටත් බොහෝ මානුෂික සෞඛ්‍ය වෘත්තිකයන්ට ගැටුමින් පීඩාවට පත්වී සිටින පුද්ගලයන්ගේ විශේෂයෙන් වින්දිතයන් හා වදහිංසා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන්ගේ අවභ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා උචිත පුහුණුවක් නොමැත. ජාත්‍යන්තර සංවිධාන මනෝ සමාජයීය සෞඛ්‍ය සේවාවන් වැඩසටහන්වල පවතින මෙම පරතරයන් හෝ අනෙකුත් පරතරයන් පුරවා නොමැති තත්ත්වය පිළිබඳ සම්මුඛ සාකච්ඡාවට ලක් කල පුද්ගලයන් සිය කනස්සල්ල පල කළහ. එය වෙනුවෙන් සම්මුඛ සාකච්ඡාවට ලක් කල පුද්ගලයන් මෙම සංවිධානවල කෙටි කාලීන අරමුණු තනි පුද්ගලයන්ගේ ප්‍රජාවගේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට අසමත්වී ඇති තත්ත්වය පෙන්වීම සඳහා ඔවන් උදාහරණ ඉදිරිපත් කළහ. බොහෝ අවස්ථාවල වින්දිතයගේ හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන්ට සේවාවන් ලබාදීම වෙනුවට අරමුදල් සැපයීම හෝ සංවිධානවල වෙනස වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරය තීරණය කරන්නේ කෙසේද යන කරුණද ඔවුන් පැහැදිලි කළහ.

බලාපොරොත්තු නොවූ ආකාරයට අවශ්‍යතා ඇගයීමේ නිගමනයන් අරමුදල් යෝජනා සඳහාවූ ඉලල්ලීමක් කෙරෙහි බලපෑමක් ඇ කළේය. වදහිංසා හා අනෙකුත් බරපතල මානව හිමිකම් උල්ලංඝනයවීම්වල වින්දිතයන් හා එවැනි උල්ලංගනයවීම්වලට මුහුණපා ජීවත්ව සිටින සිරියානු පුද්ගලයන්ට සහයෝගය දැක්වීම සඳහාවූ අරමමුදල් යෝජනා එක්සත් ඇමෙරිකානු පජාතන්ත්‍රවාදය සඳහාවූ කාර්යාංශය මානව හිමිකම් හා කම්කරු අංශය විසින් 2016 මාර්තු මාසයේදී ප්‍රකාශයට පත් කෙරිණි. මෙම ඉල්ලීම අවශ්‍යතා ඇගයීමේ ක්ෂණික ප්‍රතිඵලයක් පෙන්වා දුන්නේය. එම ඇගයීම වින්දිතයන්ට හා වදහිංසාවට හා පත්වී ජීවත්ව සිටින පුද්ගලයන්ට සහයෝගය දැක්වීමේ අවශ්‍යතාවය වටා අවධානය යොමුවූ තත්ත්වය පෙන්වා දෙයි.

## සේවා ලබාදීමේදී පවතින පරතර පිරවීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාව අවශ්‍යතා හඳුනා ගැනීම

වෛද්‍ය වෘත්තිකයන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාව පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය මෙන්ම එම ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන්ට හා එයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන්ට දීර්ඝකාලීන වෛද්‍ය ප්‍රතිකාර හා පුනරුත්තාපනය ලබාදීම සඳහා වෛද්‍ය වෘත්තිකයන්ට දීර්ඝකාලීන විශේෂ පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාවය කාන්තා සංවිධාන විසින් අවධාරනය කරන ලදී. උදාහරණයක් වශයෙන් පැරණි තත්ත්වය නැවත නිර්මාණය කිරීමේ ශෛල්‍ය කර්මය ඉතා දුෂ්කර එකක් වන අතර, එය සිදුවනු විට ප්‍රචණ්ඩත්වයට ගොදුරුවී ජීවත්ව සිටින පුද්ගලයන් සඳහා හඬ නගන කාන්තා සංවිධානවල හැකියාව හා නොපසුබස්නා උත්සාහය හේතුවෙන් පමණක් එය සිදුවේ. කාන්තා සංවිධාන සමඟ සාකච්ඡා කිරීම මගින් අවශ්‍යතා ඇගයීම කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ නිශ්චිත අවභ්‍යතා පිළිබඳ තොරතුරු රැස් කළේය. මෙම කාන්තාවන් හා ගැහැණු ළමුන් බොහෝ අවස්ථාවල පිරිමින් හා පිරිමි ළමයින්ට වඩා වෙනස්වූ ආකාරයෙන් යුද්ධයේ අත්දැකීම් ලබා ගනිති. ස්ත්‍රී පුරුෂ සමාජභාව පදනම් කරගත් වෛද්‍ය අභියෝග හා අවශ්‍යතා සාර්ථකව පෙන්වා දීමට එම ඇගයීමට හැකිවූ අතර, එය එය හානිපූරණ ක්‍රියාවලියට ප්‍රයෝජනවත් වනු ඇත. රැඳවුම් මධ්‍යස්ථානයද ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පුළුල් ලෙස සිදුවන පසුබිමක් තුළ කාන්තා සංවිධාන ඉලක්ක කිරීම සඳහාවූ කණ්ඩායමේ තීරණය බොහෝ සිරියානු කාන්තාවන්ට වැදගත් ලෙස අදාළ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වින්දිතයන් හා ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයන් සඳා වූ අරමුදලක් වැනි ඇගයීමේ ඕනෑම නිමැවුමක් කාන්තාවන් කෙරෙහි දැඩි බලපෑමක් කල හැකි බව සන්ධානය විශ්වස කරයි.

මනෝ සමාජයීය සෞඛ්‍ය අවශ්‍යතා පිළිබඳව සම්මුඛ සාකච්ඡාවට ලක්කළ පුද්ගලයන්ගෙන් කිහිප දෙනෙක් පමණක් පිරිමින් සඳහාවූ වෙන්වූ වැඩසටහන්වල අවශ්‍යතාවය පෙන්වා දුන්හ. එය වෙනුවට පිරිමින් සමග සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව අහිමිවීම හා පැමිණිලි කිරීමෙන් හෝ උදවු ලබා ගැනීමෙන් තොරව පිරිමින් වදහිංසාව ඉවසාගෙන සිටින බවත්, ඔවුන් වීරයන් හා කැපකරන්නන් බව සිටින බවත් සමාජයේ පවතින විශ්වාසයද ඇතුළුව ඔවුන් මුහුණපාන බලපෑම් කරුණු පමණක් පෙන්වා දුන්හ. මෙම සාධක තමන්ට මානසික සෞඛ්‍ය හෝ ශාරීරික ප්‍රශ්න තිබෙන බව පිරිමින්ගේ පිළිගැනීමේ හැකියාව තවදුරටත් සීමා කරයි. කණ්ඩායම ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුව සාකච්ඡා කළ අතර, සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලද පිරිමින් තමන්ගේම අත්දැකීම් පිළිබඳ කතා නොකළහ. ඒ වෙනුවට කාන්තාවන්ට එරෙහිව සිදුව ඇති ක්‍රියාවන් තමන් දැක ඇති බව පමණක් ඔවුන් විස්තර කළහ. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ පිරිමින්ගේ අත්දැකීම් මෙම ඇගයීම් මගින් හඳුනා ගෙන තිබුණු අතර, එය පිරිමින්ට බලපෑම් ඇති කරන සාධක හා අදාළ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට සේවා ලබාදෙන ආයතනවලට උපකාරී වනු ඇත.

### සේවා ලබාදෙන ආයතන හා මානව හිමිකම් ලේඛණගත කරන පුද්ගලයන් අතර යොමු කිරීමේ ජාලයක් සංවර්ධනය කිරීම

සේවා ලබාදෙන අය අතර පවතින සම්බන්ධීකරණය කාර්යක්ෂම සේවා බෙදා හැරීමට ප්‍රධාන බාධකයක් වශයෙන් පවතින හෙයින් පුද්ගලයන් යැවිය හැකි ස්ථාන පිළිබඳ රාමුවක් සඳහාවූ අත්තිවාරමක් යෙදීමට ව්‍යාපෘතිය අරමුණු කරගෙන සිටියේය. විශේෂයෙන් තුර්කියේ සේවාව ලබාදීම සම්බන්ධීකරණය නොවන ආකාරයෙන් සිදුවේ. උදාහරණයක් වශයෙන් ජෝර්දානයේ මනෝ සමාජයීය සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම ඇතුළුව එක්සත් ජාතීන්ගේ සේවා පද්ධතියක් ක්‍රියාත්මක වන අතර, තුර්කියේ විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නොමැත. තුර්කියේ ක්‍රියාත්මක වන සංවිධාන එකිනෙකා සමඟ සම්බන්ධීකරණය ඉතා අඩු ප්‍රමාණයක පවත්වා ගෙන යන බවත් බොහෝ අවස්ථාවල විධිමත් යොමු කිරීමේ ක්‍රියා පටිපාටීන් එහි නොමැති බවත් ඇගයීම මගින් සොයා ගන්නා ලදී. බොහෝ සේවා ලබාදෙන ආයතන එකිනෙකාගේ ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීමට දැන් පටන් ගෙන ඇති තත්ත්වයක් පවතී. රාමුවක් නිර්දේශ කිරීමට තවමත් කල්පැන නැති බව ව්‍යාපෘතියේ හවුල්කරුවන් සිතුහ. ඒ වෙනුවට සහයෝගිතාවයෙන් කටයුතු කරන සියලුම ආයතන සඳහා පැහැදිළි භූමිකාවන් හා වගකීම් නිර්වචනය කිරීමේ අවශ්‍යතාවය හා ජාලයට අයත් සියලුම ආයතනවල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් සංවර්ධනය කිරීම වැනි මූලික යෝජනා කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලදී. රැඳවියන්ගේ අව්‍යශ්‍යතා ඉටුකරන අතර ලේඛණගත කිරීමේ ප්‍රයත්නයන් හා යොමු කිරීමේ ක්‍රියාපටිපාටීන් සඳහාවූ මඟපෙන්වීමේ ප්‍රතිපත්තීන් තහවුරු කිරීම

සඳහා යොමු කිරීමේ පද්ධතිය තුළට ඇතුළත් කළ යුතු ආයකන වර්ග පිළිබඳ ඇගයීමේ කණ්ඩායම යෝජනා ඉදිරිපත් කළේය.



දමස්කස් නගරයේ සොහොන් බිමක සොහොන් කොත් වටේ වාඩිවී සිටින ළමයෙක් සැප්තැම්බර්, 2015

සාමාන්‍යයෙන් අවශ්‍යතා ඇගයීම සිරියානු සංවිධාන අතර සම්බන්ධීකරණය පවතින පරතරයන් හඳුනාගෙන ඇත; සිරියානු හා ජාත්‍යන්තර සංවිධාන අතර පවතින පරතරයත් හඳුන්වා ගෙන තිබේ. සිරියානු සංවිධාන නිතිපතා තමන්ගේ වැඩ පිලිබඳ විෂය පරිපථය ක්‍රියාකාරකම් හෝ සැලසුම් එකිනෙකා සමඟ නිතිපතා සන්නිවේදනය නොකරන බවත් තමන්ගේ ක්ෂේත්‍රයට බාහිරව ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ නොදැන සිටින බවත් එම ඇගයීමෙන් සොයා ගෙන ඇත. තවද සිරියානු සංවිධාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විධිමත් අවකාශයක් ලබා ගන්නනේ ඉතා කලාතුරකිනි; අරමුදල්සපයන අය සමඟ සෘජු සබඳතාවයක් පවත්වා ගෙන නොයයි. ජාත්‍යන්තර සංවිධාන දැනට තිබෙන සිරියානු සංවිධාන සමඟ සෘජුව තරඟ කරන වැඩසටහන් ස්ථාපිත කර ඇත. පරතරයන් පිරවීමට හෝ ප්‍රාදේහීය මුලාරම්භයන්ට සහයෝගය ලබාදීම වෙනුවට මෙය සිදුවී තිබේ. මීට අමතරව ජාතයන්තර සංවිධාන තමන් අතර ප්‍රයත්නයන් සම්බන්ධීකරණය නොමැත; හෝ විහේෂයෙන් නිශ්චිත අංශ අතර ප්‍රාදේශීය සංවිධාන සමඟ සම්බන්ධීකරණයක්සිදුකර නොමැත. උදාහරණයක් වශයෙන් ජාත්‍යන්තර මානුෂීය හා ආහාර සුරක්ෂිතතා අංශ හුදකලාවී පීඩාවට පත්වී සිටින ප්‍රජාවන් සමල' සබඳතාවන් පවත්වන ප්‍රාදේශීය සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු නොකරති. මෙම තත්ත්වය පහසුවෙන් පිවිසිය හැකි නාගරික ප්‍රදේශවලට පමනක් එවැනි සේවාවන් ලැබීමට සලස්වා ඇත. මනෝ සමාජයීය හා සෞඛ්‍ය වැඩසටහන් දැඩි ලෙස පීඩාවට පත්වී තිබෙන ප්‍රදේශවල ක්‍රියාත්මක කරන මනෝ සමාජයීය සෞඛ්‍ය වැඩසටහන් එහි ප්‍රතිඵලයක් වශයෙන් බාධකයන්ට මුහුණදී තිබේ. පැතරයන් හා අභියෝග හඳුනා ගැනීම අවශ්‍යතා ඇගයීමේ ඉතා වැදගත් දායකත්වයක් විය. එය කණ්ඩායම සේවා තත්ත්වය මනා ලෙස අවබෝධ කර ගැනීමටත් පීඩාවට පත්වී සිටින ජන කණ්ඩායමට අදාළ විසඳුම් නිර්මාණය කිරීමටත් උපකාරී වී ඇත. යොමු කිරීමේ ජාලය සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමටදායකත්වයක් ලබාදිය හැකි යැයි සන්ධානය විශ්වාස කරයි. විශේෂඥ සහාය සඳහා එක් එක් සංවිදාන ඉතා ඉක්මනින් එකනෙකාසමඟ සබඳතා ගොඩනැගීමට හැකියාව ලබාදීමෙන් එය සිදුවනු ඇත.තවද මෙම ජාලය සිරියාවේ සේවා බෙදා හැරීමේ මානව හිමිකම්ලේඛණගත කිරීමේ සම්බන්ධීකරණයද වැඩිදියුණු කළ යුතුය.

*" මනෝ සමාජයීය සහයෝගය ලබාගැනීමට ඉදිරිපත්වන පිරිමින් පිළිබඳ තිබෙන කොන් කිරීමේ තත්ත්වයක් - ඔවුන් දුර්වල පුද්ගලවන් ලෙස හෝ මානසික ප්‍රශ්න තිබෙන පුද්ගලයන් ලෙස සැලකීම - පවතී, ' මනෝ සමාජයීය' වතනය පාවිච්චි කිරීම නතර කරන ලෙස හෝ එම වචනයෙන් 'මනෝ 'කියන කොටස ඉවත් කරන ලෙස ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට අපි යෝජනා කර ඇත.,., නමුත් උචිත වචන පාවිච්චි කළ යුතු බව අප වෙත කියන ලදී. අප සතුව හොඳ යෝජනා තිබේ; නමුත් අපි විශේෂඥයන් නොවන පුද්ගලයන් ලෙස සලකන අතර, අපගේ අදහස්වලට සන්දීමක් සිදුනොවේ"*

- සිරියාවේ රාජ්‍ය නොවන සංවිධානයක පිරිමි සේවකයෙක්

## ප්‍රමාණවත් කාලය හා අරමුදල් වෙන් කිරීම

ව්‍යාපෘති හවුල්කරුවන්ගේ සංඛ්‍යාව හා මූලික අවශ්‍යතා ඇගයීමක් වශයෙන් ව්‍යාපෘති ස්වභාවය යන පසුබිම් තුළ අරමුදල් සීමිත විය. ව්‍යාපෘතිය එහි අරමුණු සාර්ථකව ඉටුකර ගැනීම සඳහා බහුවිධ හවුල්කරුවන්ගෙන් රැඳීමට සිදුවිය. එය සඳහා මානව හිමිකම් ලේඛණගත කිරීම හා මනෝ සමාජයීය සහයෝගය ඒවාගේම පසුබිම පිළිබඳ ගැඹුරු දැනුම යන කරුණු අදාළ විෂයාන්තර විශේෂඥ දැනුම අවශ්‍ය විය. පසුබිම පිළිබඳ සෑහෙන ප්‍රමාණයක විශේෂඥ දැනුම සහිතව සිටි ප්‍රාදේශීය හවුල්කරුවන්ට උපදේශක සේවා ගාස්තු අයවැයෙන් මුදලක් ලබාදෙන ලදී. කෙසේවෙතත් අවශ්‍යතා ඇගයීමේ හඳුනාගෙන ඇති පරතරයන් වැසීම සඳහා පශ්චාත ඇගයීම් මැදිහත්වීම් තිරසාර ලෙස පවත්වා ගෙන යාමට දේශීය හවුල්කරුවන්ට හැකියාව ලබාදීම පිණිස තවදුරටත් මුදල් අවශ්‍ය වේ.

සක්‍රිය ලෙස ගැටුම් සිදුවන ප්‍රදේශවල හා විවිධ රටවල්වල සිටින සරණාගත ප්‍රජාවන් සමඟ වැඩ කිරීම හේතුවෙන් ගමනාගමනය සඳහා අමතර කාලය අවශ්‍ය විය. ජෝර්දානයේ කණ්ඩායමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ අතර, එමනිසා අම්මාන් නගරයෙන් පිට සිරියානු වැයනි සමඟ කතා කිරීමට නොහැකි විය. සතාරී සරණාගත කඳවුරු වැනි ප්‍රදේශවල ඇගයීම සිදුකරන අවස්ථාවේ අම්මාන් නගරයෙන් පිට තිබූ සතාරී සරණාගත කඳවුරේ 80000 කකට වැඩි සරණාගතයන් රැඳී සිටියේය.පුද්ගලයන් පිළිබඳ ඇගයීමේ නිගමනයන් ස්ථම්බුල් ගාඩියන් ටෙප් හා තුර්කියේ හටේ පළාතේ හා ජෝර්දානයේ අම්මාන් නගරයේ තිබෙන සිරියන් වැසියන්ගේ අත්දැකීම් පමණක් ඇතුළත්වූ බව ව්‍යාපෘති හවුලුකරුවන් දැන සිටි හෙයින් ඔවුන් තමන්ගේ ක්ෂේත්‍ර ඔවුන් ස්කයිප්කාකෂාණය හරහා සිදුකළ සම්මුඛ සාකච්ඡා හරහා තමන්ගේ ක්ෂේත්‍ර වැඩට අමතර කොටසක් එකතු කළහ. කෙසේවෙතත් විශ්ලේෂණය හා ඇගයීම සරණාගතයන් කුමන ස්ථානයක ජීවත් වුනත් ඔවුන්ගේ පොදු අවශ්‍යතා ලේඛනගත කළේය.

අවසානයේදී නැවත කරුනු පැහැදිලි කිරීමේ හා ද්විතීක දැඩි කම්පනය වළක්වා ආමන්ත්‍රණය කර සම්මුඛ සාකච්ඡා අවස්ථාවේදී පාලනය කිරීේ කුසලතා පාවිච්චි කිරීමේ තමන්ගේ ධාරිතාව අවධාරණය කිරීමට කණ්ඩායමේ සාමාජිකයන්ට ප්‍රමාණවත් කාලයක් නොලැබිණි.[6] සම්පූර්ණයෙන් දීර්ඝ සම්මුඛ සාකච්ඡා කාල සටහන හේතුවෙන් හා කරුණු ගොනු කිරීමට හා සංක්ෂිත කිරීමට ලැබුණු සීමිත කාලය හේතුවෙන් කණ්ඩායමේ සාමාජිකයන් විවිධ මට්ටම්වල දැඩි කම්පනයෙන් පසු ආතතිය හා තෙහෙට්ටුව වැනි දේවල්වලට මුහුණ දුන්හ.

කන්ඩායමේ සාමාජිකයන් විශේෂයෙන් ක්ෂේත්‍ර වැඩ කටයුතුවල යෙදී සිටින අවස්ථාවේ හා ඉන් පසු තමන්ගේම මනෝ සමාජයීය අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් විය යුතුය. ඒ අනුව ඔවුන්ට පශ්චාත් සම්මුඛ සාකච්ඡා මනෝ සමාජයීය සහයෝගය ලබාදීම අවශ්‍ය වේ. මෙය තමන්ගේ දෛනික වැඩ කටයුතු නිතිපතා ප්‍රාථමික හෝ ද්විතීක දැඩි කම්පනයන්ට මුහුණදිය හැකි ප්‍රාදේශීය හවුල්කරුවන්ට මෙය විශේෂයෙන් වැදගත් වේ. උදාහරණයක් වශයෙන් සමහර ප්‍රාදේශීය හවුල්කරුවන් කරුණු විස්තර කරදීමට වැඩි වේලාවක් වෙන්කර තිබුනේ නම් එයින් ප්‍රයෝජනයක් ලබා ගැනීමට හැකිවේ යැයි පැහැදිලි වේ. සමස්ථයක් වශයෙන් මනෝ සමාජයීය සහයෝගය නොමැතිවීම තනි පුද්ගලයන්ගේ සුවපත්වීම පිළිබඳ සෘණාත්මක තත්ත්වයන්ට දැයකත්වයක් ලබාදිය හැකිය. තනි පුද්ගලයන් සුවපත් කිරීම තිරසාර සන්ක්‍රාන්තික යුක්ති මැදිහත්වීමේ අංගයක් වේ.

*" මට ප්‍රවෘත්ති හෝ සමාජ මාධ්‍ය වීඩියෝ දැක බලා ගැනීමට නොහැකි විය. - සෑම බෝම්බ පිපිරීමක්මඛ සිදුවන අවස්ථාවේ මා හමුවූ මිනිසුන්ගේ ,ගැහැණුන්ගේ හා ළමුන්ගේ මුහුණ දෙස මා බැලුවෙමි "*

- මානව හිමිකඟ් හා නීතිය පිළිබඳ විහේෂඥ දැනුමකින් යුත් කාන්‍ා ඇගයීමේ කණ්ඩායමේ සාමාජිකාවක්



සිරියාව හා මැදපෙරදිග හා උතුරු අප්‍රිකා කලාපය පුරා සිරගෙවල් සෝදිසි ස්ථාන හා පෙර වදහිසා පමුණුවනු ලැබූ ස්ථාන විනාශ කිරීමේ තර්ජනයට මුහුණපා තිබේ, මෙම රැල්ල වළක්වා ගැනීම සඳහා ICSC සන්ධානය 2016-2017 කාල වකවානුවේ කලාපයේ මානව හිමිකම් උල්ලංඝනයවී තිබෙන ස්ථාන හඳුනා ගන්නා ඩිජිටල් සිතියමක් නිර්මාණය කිරීම සඳහා රටවල් 7 කින් හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන එක්රැස් කළේය,
කොළඹ දී 2017 අගෝස්තු මස පී අයි ජේ ටී ආර් සන්ධානයේ අනුග්‍රහයෙන් පවත්වන ලද ශරීරය සිතියම්ගත කිරීමේ වැඩමුළුවේදී තමන්ගේ කතන්දරය සටහන් කරන කාන්තාව


සිරියාව හා මැදපෙරදිග හා උතුරු අප්‍රිකා කලාපය පුරා සිරගෙවල් සෝදිසි ස්ථාන හා පෙර වදහිංසා පමුණුවනු ලැබූ ස්ථාන විනාශ කිරීමේ තර්ජනයට මුහුණපා තිබේ. මෙම රැල්ල වළක්වා ගැනීම සඳහා ICSC සන්ධානය 2016-2017 වකවානුවේ කලාපයේ මානව හිමිකම් උල්ලංඝනයවී තිබෙන ස්ථාන හඳුනා ගන්නා ඩිජිටල් සිතියමක් නිර්මාණය කිරීම සඳහා රටවල් 7 කින් හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථාන එක්රැස් කළේය.

# පරිච්ඡේදය 3 : ශ්‍රී ලංකාවේ ශක්තිය, යුක්තිය හා සංහිඳියාව සඳහා ප්‍රාදේශීය ධාරිතාව ගොඩනැගීම

ශ්‍රී ලංකාවේ තත්ත්වය

1948 වසරේ නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ සිංහල ජනවාර්ගික ජාතිකවාදය හිස එස වූ අතර, පීඩාකාරී අණපනත් හා ප්‍රචණ්ඩ ක්‍රියා හරහා දමිළ සුළු ජාතික ප්‍රජාවන්ට එරෙහිව වෙනස් කොට සැලකීම ද ආරම්භ විය. දශක කිහිපයක් සිදු වූ වෙනස් කොට සැලකීම හා දමිළ ප්‍රජාවට එරෙහිව මුක්තිය සතුව සිදු කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පසුව රජය හා එල්ටීටීඊ සංවිධානය අතර අභ්‍යාන්තර සන්නද්ධ අරගලයක් ආරම්භ විය. වෙනම රාජ්‍යයක් පිහිටුවීම හා දමිළ ජනතාව වෙනුවෙන් විශාල වශයෙන් ස්වයං නිර්ණය අයිතිය ලබාගැනීම විමුක්ති කොටි සංවිධානයේ අරමුණ විය. මෙම සන්නද්ධ අරගලය 1983 ජුලි මාසයේ ආරම්භ වූ අතර එය 2009 මැයි මාසයේ අවසන් විය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජය සිරකරුවන් අල්ලා නොගන්නා හමුදා ක්‍රියාන්විතයක් හරහා විමුක්ති කොටි සංවිධානය පරාජයට පත් කළේය. 2008 ජනවාරි මාසයේ සිට 2009 මැයි මාසය දක්වා මෙම ගැටුම දැඩි ලෙස සිදු වූ අතර, මානව හිමිකම් උල්ලංඝනය වීම් ද සිදු විය. රජය හා විමුක්ති කොටි සංවිධානය විසින් සිදු කරන ලදැයි කියන ඉතා බරපතළ අපරාධ ක්‍රියාවන් ද මෙයට ඇතුළත් විය. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ 40,000 ක් පමණ දමිළ සිවිල් පුරවැසියන් අතුරුදහන් විය; හෝ ඝාතනයට ලක් විය. තවත් 300,000 ක් පමණ ජනතාව අභ්‍යාන්තරව අවතැන් වූහ.

පුළුල් ලෙස විවේචනයට ලක්කරන ලද රජයේ උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ විමර්ශනය ද ඇතුළුව සන්නද්ධ අරගලය අවසන් වීමෙන් පසු වසර 5 ක් (අපරාධ සිදු කළ පුද්ගලයන්) දඬුවමින් මිදී සිටීමේ නිදහස රටේ පැවතීය. රාජපක්ෂ මහතා පරදවා 2015 ජනවාරි මාසයේ මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා වශයෙන් ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව මෙම තත්ත්වය වෙනස් වූ අතර, ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර සබඳතා සඳහා නැවතත් දොර විවෘත විය. උදාහරණයක් වශයෙන් 2015 ඔක්තොබර් මාසයේ දී "ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" සඳහා වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 30/1 යෝජනාව ශ්‍රී ලංකාවේ සම අනුග්‍රහයෙන් සම්මත කරගන්නා ලදී. මෙම යෝජනාව මගින් දැඩි පීඩාකාරී 1978 වර්ෂයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ කිසිදු චෝදනාවකින් තොරව රැඳවුම් භාරයේ තබාගෙන සිටින සිය ගණන් දමිළ රඳවියන් නිදහස් කිරීමට පොරොන්දු වන ලදී; උතුරු හා නැගෙනහිර පළාත්වල හමුදාව විසින් අත්පත් කරගෙන තිබෙන ඉඩම් යළි ලබාදීමටත්, අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයක් ද ඇතුළුව විශ්වසනීය වගවීම හා සංහිඳියා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමටත් ශ්‍රී ලංකා රජය එකඟ විය.



කොළඹ දී 2017 අගෝස්තු මස යුක්තිය, සත්‍යය හා සංහිඳියාව සඳහා මුලපිරීමේ (GIJTR) අනුග්‍රහයෙන් පවත්වන ලද ශරීරය සිතියම්ගත කිරීමේ වැඩමුළුවේදී තමන්ගේ කතන්දරය සටහන් කරන කාන්තාව.

යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් පිළිබඳ මහජන අදහස් ලබාගැනීම සඳහා මහජන අදහස් විමසීමේ කාර්ය සාධන බලකාය අග්‍රාමාත්‍යවරයා විසින් 2016 ජනවාරි මාසයේ පිහිටුවන ලදී. අවාසනාවකට මෙන් තම බැඳීම් ඉටු කිරීම කැපවීම් පිළිබඳ රජයේ ප්‍රගතිය ඉතා කළකිරීමට තුඩු දෙන ආකාරයෙන් මන්දගාමීව සිදු වී ඇති

අතර, දේශපාලන කැමැත්තක් නොමැති පසුබිමක් තුළ, නවෝත්පාදන සංක්‍රාන්තික යුක්ති විසඳුම් අවශ්‍ය වී ඇත.

**සන්ධානයේ ශ්‍රී ලංකා ව්‍යාපෘතිය පිළිබඳ පොදු දැක්ම**

මෙම පසුබිම තුළ හා ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ඉදිරි ක්‍රියාවලිය බලාපොරොත්තුවෙන් යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ගෝලීය මුලපිරීම් සන්ධානය ශ්‍රී ලංකාව සඳහා ව්‍යාපෘතියක් සංවර්ධනය කළේය. රජයේ මූලිකත්වයෙන් සිදු කරන ජාතික අදහස් විමසීමේ ක්‍රියාවලියට සහාය ලබාදීම සඳහාත්, ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවලට තාක්ෂණික සහාය ලබාදීම සඳහාත්, සංක්‍රාන්ත්‍රික යුක්ති ක්‍රියාවලීන්වල යෙදීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවල හා රජයේ ක්‍රියාධරයන්ගේ ධාරිතාව ගොඩනැඟීම සඳහාත් මෙම ව්‍යාපෘතිය සංවර්ධනය කරන ලදී. සියලුදෙනා ඇතුළත් සාමය කරගෙන ගොඩනැඟීම, සංක්‍රාන්තික යුක්තිය හා ශ්‍රී ලංකාවේ සංහිඳියා ප්‍රයත්නයන් පෝෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. එම ප්‍රයත්නයන් පොදු අවශ්‍යතා හා අනාගතය සඳහා වූ දැක්ම සඳහා සම්මුතියක් ගොඩ නඟා ගැනීමට විවිධත්වයෙන් යුත් ඒකරාශි කරයි. පුළුල් අවශ්‍යතා ඇගයීමක් හා සිවිල් සමාජ හා රජයේ ක්‍රියාධරයන් සඳහා පවත්වන ලද ධාරිතාව ගොඩනැඟීමේ වැඩමුළු මෙම ව්‍යාපෘතියට ඇතුළත් විය. සිවිල් සමාජ සංවිධාන සඳහා පවත්වන ලද වැඩමුළු හේතුවෙන් අවසානයේ දී ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් යුත් සත්‍යය හා සංහිඳියා සංසඳයක් පිහිටුවා ගන්නා ලදී. මෙම සත්‍යය හා සංහිඳියා සංසදය සංක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්වල ප්‍රාදේශීය ප්‍රජාවගේ හා සිවිල් සමාජ සංවිධානවල සහභාගීත්වයට පහසුකම් සැලසීය. කොළඹ පදනම් කරගෙන ක්‍රියාත්මක වන සංවිධාන සම්ප්‍රදායික වශයෙන් මෙවැනි මැදිහත්වීම්වල ප්‍රධාන භූමිකාව රඟපා තිබෙන පසුබිමක් තුළ, මෙය විසින් පැහැදිලි අවශ්‍යතාවයක් ආමන්ත්‍රණය කරන ලදී. සන්ධානයේ ක්‍රමවේදය අනුව මෙම ව්‍යාපෘතිය පසුබිමට අදාළ ප්‍රාදේශීය ප්‍රජාවට අයිති බහුවිධ ප්‍රවේශයකින් සහිතව ක්‍රියාත්මක කරන ලදී. විවිධ අනන්‍යතා සහිත පුද්ගලයන් අර්ථාන්විතව එහි සම්බන්ධ කරගැනීම සඳහාත් සංහිඳියාව කරා ඉදිරි ගමනක් යාම සඳහාත් එසේ කරන ලදී.

අවශ්‍යතා පිළිබඳ ඇගයීම

2015 ඔක්තෝබර් මාසයේ සිට 2016 මාර්තු මස දක්වා සන්ධානයේ හවුල්කාර සංවිධාන ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සඳහා වූ ආයතනය (ISD) හා විලුදු - Herstories ආයතනය සමඟ ඒකාබද්ධව අවශ්‍යතා ඇගයීමක් සිදු කරන ලදී. සන්ධානයේ හවුල්කාර ආයතන වශයෙන් මෙයට සහභාගී වූ ආයතන වන්නේ හෘදසාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යන්තර සන්ධානය (ICSC), ගෞතමාලා විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම (FAFG), හා අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසන් සභාව (ICMP) වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස, ආගම හා ජන වාර්ගිකත්වය මත නියෝජනය ලබාදීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, දේශීය හවුල්කාර ආයතන මගින් මේ සඳහා උතුර, නැගෙනහිර හා දකුණ යන ප්‍රදේශවලින් සහභාගීවන්නන් හඳුනාගන්නා ලදී. මෙම ඇගයීමට පුද්ගලයන් තිස් තුන් දෙනෙක් සමඟ පවත්වන ලද සාකච්ඡා හා ඉලක්ක කණ්ඩායම් සාකච්ජා හයක් ඇතුළත් විය; එක් එක් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවලට පුද්ගලයන් 10-15 පමණ ඇතුළත් විය; තවද මෙම ඇගයීමේ කොටසක් වශයෙන් විවිධ ජනවාර්ගික, ආගමික හා දේශපාලන පසුබිම්වලට අයත් ඒවාගේම වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් සාමාජිකයන්ගෙන් සමන්විත ප්‍රාදේශීය ප්‍රජා සාමාජිකයන් 114 ක් සම්බන්ධ කරගෙන සහභාගීත්ව පර්යේෂණ වැඩමුළු තුනක් ද පවත්වන ලදී.



“යුද්ධය අවසන් වු වේලාවේ මම සතුටට පත්වුනෙමි” කිලිනෝච්චි ප්‍රදේශයේ පස්දරු මවක් වන 34 වියැති මෙම කාන්තාව පවසයි. ශ්‍රී ලංකාවේ උතුර, දකුණ හා නැගෙනහිර ප්‍රදේශවල මව්වරුන්ගේ පුද්ගලික කතාන්දර 285 එක්රැස් කරන ලද (Hestories ලේඛන සංරක්ෂණ) ව්‍යාපෘතියක ඇගේ කතාව ඇතුළු වේ.

මහජන අදහස් විමසීම් හා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා කොළඹ හා උතුරු නැගෙනහිර (යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් හා වව්නියා) ප්‍රදේශවල පවත්වනු ලද අතර, සහභාගීත්ව පර්යේෂණ වැඩමුළු වවුනියාව (උතුර) ත්‍රිකුණාමලය (නැගෙනහිර) හා මොණරාගල (දකුණ) යන ප්‍රදේශයන්හි පවත්වන ලදී. සහභාගීත්ව පර්යේෂණ වැඩමුළු විශේෂයෙන් සංක්‍රාන්තික යුක්තිය හා ශ්‍රී ලංකාවේ ක්‍රියාවලිය පිළිබඳ ඉතා සීමිත අවබෝධයක් සහිත සිටින දැඩි ලෙසින්ම පීඩාවට පත්ව සිටින පුද්ගලයන් ඉලක්ක කරගෙන නිර්මාණය කරන ලදී. ඒ අතර ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන,වින්දිතයන්ගේ කණ්ඩායම්, අතුරුදහන්වු හෝ බලාහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් භාරයේ සිට මෑතකදී නිදහස් කරන ලද පුද්ගලයන් හා රජයේ නිළධාරීන් වැනි කණ්ඩායම් සමඟ සාකච්ඡා හා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී. ඊට අමතරව ව්‍යාපෘතියේ හවුල්කරුවන් උතුරේ විශේෂයෙන් මුලතිව් හා කිලිනොච්චි ප්‍රදේශ ආසන්නව රජයේ මුලිකත්වයෙන් ස්ථාපිත කර ඇති අනුස්මරණ ස්ථානවලට ද ගියහ. රජය විසින් උතුර, දකුණ හා නැගෙනහිර යන ප්‍රදේශවල යුද්ධය පිළිබඳ ඉදිරිපත් කරන වෘත්තාන්තය නිසි ලෙස අවබෝධ කරගැනීම සඳහා මෙම චාරිකා සිදු කරන ලදී. අවසානයේ දී ව්‍යාපෘතියේ හවුල්කරුවන් යුද්ධයෙන් අවතැන් වු දමිළ ජනතාව රජය විසින් නැවත පදිංචිකර ඇති යාපනයට පිටින් පිහිටි නීලවාන් හා කෝනාපුලම් කඳවුරුවලට ද ගියහ. අභ්‍යාන්තරව අවතැන් වී සිටින පුද්ගලයන්ගේ අවශ්‍යතා ඇගයීම සඳහා මෙම චාරිකාව සිදු කරන ලදී.

විශේෂයෙන් කොළඹින් පිට ප්‍රදේශවල සංක්‍රාන්තික යුක්තියට අදාළ දැනුම හා කුසලතා ඉතා අඩු මට්ටමක පවතින බව මෙම අවශ්‍යතා ඇගයීම විසින් පෙන්නුම් කරන ලදී; රටපුරා ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම, වගවීම පිළිබඳ උතුරු නැගෙනහිර හා දකුණ යන ප්‍රදේශවල ප්‍රතිවිරුද්ධ මතයන් පැවතීම, උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සාමය ගොඩනැගීම, වගවීම හා සමාජ හා දේශපාලන අවකාශයන් නැවත ගොඩනැගීම සඳහා වු අවශ්‍යතා යන කරුණු ද මෙම ඇගයීම මඟින් පෙන්වා දෙන ලදී. විශේෂයෙන් මෙම අවශ්‍යතා ඇගයීම 2016 වසරේ නොවැම්බර් මාසයේ ප්‍රකාශයට පත් කරන ලද රජයේ මුලිකත්වයෙන් ක්‍රියාත්මක වු මහජන අදහස් විමසීමේ කාර්ය සාධන බලකායේ බොහෝ නිගමයන් පිළිබිඹු කළේය.

## ප්‍රාදේශීය ප්‍රජාවගේ නායකත්වයෙන් යුත්, සියලුම කණ්ඩායම් ඇතුළත් කරගන්නා වැඩසටහන් මුහුණපාන සිවිල් සමාජ අභියෝග

කොළඹ පදනම් කරගෙන ක්‍රියාත්මක වන සංවිධාන උතුරේ සංවිධාන හා ජාත්‍යාන්තර ප්‍රජාව අතර තැරැව්කරුවන් වශයෙන් කටයුතු කරන බව උතුරු ප්‍රදේශයේ දමිළ ජනතාව කණස්සල්ල පළ කළහ. අරමුදල් ලබාගැනීමේ දී ඔවුන් තැරැව්කරුවන් වශයෙන් කටයුතු කරන බවත්, උතුරේ දී සිදු කරන

මැදිහත්වීම්වල දී ප්‍රාදේශීය ප්‍රජාවගේ අයිතිය වළක්වන බවත් ඔවුන් සඳහන් කළහ. ඒ වගේම මොණරාගල වැඩමුළුවට සහභාගී වූ සිංහල සහභාගීවන්නන් සිවිල් සමාජ සංවිධාන උතුර හා නැගෙනහිර ප්‍රදේශ කෙරෙහි පමණක් අවධානය යොමු කරන බවත්, දකුණේ ජනතාව යුද්ධය හේතුවෙන් අඳාළුව දුර්වල තත්ත්වයට පත්වී සිටින බවත්, වින්දිතයන් බවට පත්වී සිටින බවත් හඳුනාගැනීමට එම සංවිධාන අපොහොසත් වී ඇති බවත් අදහස් දැක්වූහ.

**වගවීම**

වැඩමුළුවලට සහභාගී වූ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ බොහෝ දමිළ සහභාගීවන්නන් සමාවක් ලබානොදී පුද්ගලයන් වගවීමට ලක්කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළහ. විශ්වසනීය සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහන්, ජාත්‍යාන්තර විනිසුරුවන්, අභිචෝදකයන්, විමර්ෂණ නිළධාරීන් හා කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වය යන කරුණු ද ඔවුන් අවධාරණය කළහ. කෙසේවෙතත් වැඩමුළුවලට සහභාගී වූ දකුණේ සිංහල සහභාගීවන්නන් විශේෂයෙන් ජාත්‍යාන්තර මට්ටමේ අපරාධ නඩු පැවරීමේ ක්‍රියාවලීන් හා සත්‍යය සෙවීමේ කොමිෂන් සභා පිළිබඳ සැක පළ කළහ. එවැනි ක්‍රියාවලීන් සිංහල ජනතාව බහුතරයක් විසින් රණවිරුවන් ලෙස ගරු කරන ලබන පුද්ගලයන් ඉලක්ක කරගත හැකි බව ඔවුන් සඳහන් කළහ. එය වෙනුවට ජාත්‍යාන්තර සම්බන්ධතාවයෙන් තොරව වගවීම පිළිබඳ රජයට කටයුතු කළ හැකි බව ඔවුන් විශ්වාස කළහ. උතුරේ සිදු කරන සාකච්ඡාවලදී බලය බෙදීමේ ගිවිසුමක් හා ආයතනික සංශෝධන ද ඇතුළුව දේශපාලන විසඳුමක අවශ්‍යතා කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. උතුරු නැගෙනහිර ප්‍රදේශ පුරා ජීවත්වන දමිළ ප්‍රජාව රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු බවත් හැකි ඉක්මණින් සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් කළ යුතු බවත්, අදහස් පළ කළහ. උතුරෙන් සහභාගී වූ සියලුම පුද්ගලයන් හමුදාව ඉවත් කිරීම හා ආරක්ෂක අංශ ප්‍රතිශංස්කරණවල අවශ්‍යතාවය ද අවධාරණය කළහ.

**පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම හා සදානුස්මරණ ක්‍රියාකාරකම්**

සන්නද්ධ අරගලය ආරම්භ වූ කාලවකවානුවේ සිට ශ්‍රී ලංකාව ලෝකයේම ඉහළම ප්‍රමාණයේ අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ සිදුවීම් වාර්තා වූ රටක් විය. විශාල වශයෙන් රජය විසින් අතුරුදහන් කිරීම් සිදු කරන ලද බොහෝ කාලවකවානු තිබූ අතර, විශේෂයෙන් සන්නද්ධ ගැටුම් පසුබිම තුළ දමිළ අය මෙවැනි සිදුවීම්වලට ගොදුරු වූහ. නමුත් 1970 ගණන්වල හා 1980 ගණන්වල සිදු වූ ජනතා විමුක්ති පෙරමුණේ කැරලිවලදී සිංහල අය ද මෙවැනි අතුරුදහන්වීම්වලට ගොදුරු වූහ. ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ සංඛ්‍යාව 40,000 ඉක්මවන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය තක්සේරු කර ඇත. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාව (හෝ පරණගම කොමිෂන් සභාව) ජනාධිපති රාජපක්ෂ මහතා විසින් ස්ථාපිත කරන ලද අතර, එය 1990-2009 කාල වකවානුව ආවරණය කළේය. මෙම කොමිෂන් සභාවට සිවිල් පුරවැසියන්ගෙන් පැමිණිලි 18,249 ක් ලැබී තිබූ අතර,

> *"මාගේ පුතාට සිදු වුණේ කුමක්දැයි දැනගැනීමට මට අවශ්‍යයි. මම අවසන් කොමිෂන් සභාවට ගිය අතර, එහි සත්‍යය දැනගත හැකි යැයි බලාපොරොත්තු වුනෙමි; නමුත් කිසිදෙයක් සිදුනොවීය."*
>
> - සහභාගීත්ව පර්යේෂණ වැඩමුළුවකට සහභාගී වූ දමිළ මවක්

ආරක්ෂක හමුදාවන්ගෙන් තවත් පැමිණිලි 5000 ක් පමණ ලැබී තිබුණි. කෙසේවෙතත්, පරණගම කොමිෂන් සභාව වැනි යාන්ත්‍රණයන් අසාර්ථක යාන්ත්‍රණයන් බව සලකන ලදී. මෙය පිළිබඳ දේශපාලන කැමැත්ත අඩු වශයෙන් පැවති බව ද සලකන ලදී.

උදාහරණයක් වශයෙන් අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ බොහෝ පවුල්වලට කිසිම තොරතුරක් ලැබී නොමැත; තව ද ඔවුන් විමර්ශන පවත්වන ස්ථානවල

හිරිහැරවලට ලක් වී ඇති අතර, මරණ සහතික භාරගැනීමට ඔවුන් වෙත බල කරන ලදී. පරණගම කොමිෂන් සභාවේ ප්‍රශ්න සංහිඳියාවට උචිත තත්ත්වයක් නිර්මාණය කිරීමට වඩා සංහිඳියාවට හානි සිදු කරන ඒවා වු බව සමහර අය විශ්වාස කරති. අතුරුදහන් වු පුද්ගලයන්ගේ ගැටළුව ආමන්ත්‍රණය කිරීම පිළිබඳ රජයේ කැමැත්ත කෙරෙහි ඉතිරිව තිබු විශ්වාසය ද එය නැති කළ බව කියනු ලැබේ. පහත විස්තර කර ඇති සන්ධානයේ හවුල්කාර සංවිධානවල පර්යේෂණ මඟින් මෙම කරුණ සනාථ කර ඇත.

## අතුරුදහන් වු හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ ප්‍රධාන නිගමනයන්

ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම (FAFG) හා අතුරුදහන් වු පුද්ගලයන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම (ICMP) විසින් 2015 වසරේ සිට 2016 වසර දක්වා ශ්‍රී ලංකාවේ අතුරුදහන් වු හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ විස්තාරාත්මක අවශ්‍යතා ඇගයීමක් සිදු කළේය. මෙම ඇගයීමට උතුරු නැගෙනහිර හා කොළඹ දී පාර්ශ්වකරුවන් සමග පවත්වන ලද රැස්වීම් 35 ක් හා අදහස් විමසීම් සාකච්ඡාවන් ද, අතුරුදහන් වු හා බලහත්කරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ඥාතීන් 30 දෙනෙකු සමග පවත්වන ලද කණ්ඩායම් සාකච්ඡාවන් ද, අතුරුදහන් වු හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා හා ප්‍රමුඛතාවයන් ආමන්ත්‍රණය කරන්නේ කෙසේදැයි සිවිල් සමාජ සංවිධාන හා පවුල් නියෝජිතවරුන් සමග පවත්වන ලද වටමේස සාකච්ඡා දෙකක් ද ඇතුළත් විය. සත්‍යය හා වගවීමේ ක්‍රියාවලින් සංවර්ධනය කිරීමේ දී වින්දිතයන්ගේ හඬවල්වලට ප්‍රධාන තැනක් ලබාදීම තහවුරු කරගැනීම මෙම සාකච්ඡාවන්වල අරමුණ විය.

ජාතික මට්ටමේ අතුරුදහන්වීම් පිළිබඳ විමර්ශන පැවැත්වීම සඳහා පවතින සීමිත දැනුම හා විද්‍යාත්මක සාක්ෂි පාවිච්චි කිරීම සීමිත ආකාරයෙන් පවතින තත්ත්වය මෙම ඇගයීම මඟින් පෙන්වාදෙන ලදී. ඒවගේම අතුරුදහන් වු හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් සිටින ස්ථාන හා ඔවුන්ට සිදු වු දේ පිළිබඳ අපක්ෂපාතී විද්‍යාත්මක හා සමස්ථ ආකාරයේ විමර්ශන පැවැත්වීමට අවශ්‍ය යටිතල පහසුකම් නොමැති තත්ත්වය ද මෙයින් හෙළිදරව් කරන ලදී. වත්මන් ජාතික පද්ධතිය තමන්ගේ රාජකාරීන් තුළට මෙවැනි දේවල් ඇතුළත් කර ගැනීමට ව්‍යුහයක් හා ධාරිතාවයක් නොමැති තත්ත්වයක පවතී. දිස්ත්‍රික් මට්ටමෙන් කටයුතු කරන බොහෝ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට සම්පත් හිඟයක් පවතියි. ඊට අමතරව මෙවැනි සිදුවීම්වල දී පවුල්වලට සහයෝගය ලබාදීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවලට ප්‍රමාණවත් ආකාරයෙන් පුහුණු කිරීම් ලබා දී නොමැත. විශේෂයෙන් අතුරුදහන් වු සිදුවීම්වල කාලරාමුවේ පසුබිම තුළ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද සිදුවීම් පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කරන්නේ කෙසේ දැයි විවිධ ජනවාර්ගික, ආගමික හා දේශපාලන කණ්ඩායම් අතර පවතින දේශපාලන ආරවුල් මෙම අභියෝගයන් තවදුරටත් සංකීර්ණ කර ඇත.

මෙහි එක් වැදගත් නිගමනයක් වන්නේ මෙවැනි පසුබිම් සහිත අනෙකුත් රටවල් සමග අත්දැකීම් බෙදාහදා ගැනීමේ අවශ්‍යතාවය වේ. රජයේ හා සිවිල් සමාජ ක්‍රියාධරයන්ගේ විද්‍යාත්මක විමර්ශන පැවැත්වීමේ ධාරිතාව ප්‍රාදේශීය මට්ටමේ ගොඩනැගීමට මෙය අවශ්‍ය වේ. ඊට අමතරව ප්‍රාදේශීය ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන හා පුද්ගලයන් අතුරුදහන් වු ගැටළුව පිළිබඳ වැඩ කරන රාජ්‍ය ආයතන අතර අධිවාචනය, සංවාදය, ජාලගත වීම හා පොදුවේ දැනුවත් කිරීමේ කටයුතුවල අවශ්‍යතාවයක් ද පවතී.

ජාත්‍යන්තර සංවිධානවලට අමතරව, විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන හා ක්‍රිස්ත්‍රියානි දේවස්ථාන අතුරුදහන් වු සිදුවීම් පිළිබඳ සක්‍රියව ලේඛණගත කිරීම් සිදු කර ඇත. නමුත් මෙම සිවිල් සමාජ කටයුතු බොහෝමයක් සම්බන්ධීකරණය වී නොමැත. මෙවැනි ලේඛණ ගොනුකර තබන මධ්‍යම දත්ත පද්ධතියක් හෝ ලේඛණාරක්ෂක මධ්‍යස්ථානයක් නොමැත. අන් අය සමග තොරතුරු බෙදාහදා ගැනීමට සිවිල් සමාජ සංවිධාන අකැමැත්තක් දැක්වීම ද මෙයට හේතුවක් වේ. අවිශ්වාසය හා රජයේ අධීක්ෂණය පිළිබඳ පවතින සැකය මෙයට හේතු වේ. තව ද විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ[2] පවතින එවැනි අධීක්ෂණ හේතුවෙන් දමිළ පවුල්වලට අහිමි වී සිටින තමන්ගේ සාමාජිකයන් පිළිබඳව ප්‍රසිද්ධියේ ශෝකය පළ කිරීමට ද නොහැකි තත්ත්වයක් පවතී. සිංහල ජනතාවට සොල්දාදුවන් ප්‍රසිද්ධියේ සිහි කිරීමට අවස්ථාව ලබා දී තිබෙන විට දමිළ ප්‍රජාවට එවැනි සිහි කිරීම් සිදු කිරීමට අවස්ථාවක් නොලැබීම පිළිබඳ බොහෝ දමිළ සහභාගීවන්නන් සිය කළකිරීම පළ කළහ.



සත්‍යය හා සංහිඳියා සංසදය 2016 නොවැම්බර් මාසයේ කොළඹ දී ආරම්භ කළ අවස්ථාවේ දී එම අවස්ථාවට සහභාගී වු කාන්තාවක්

**සංහිඳියාව**

උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් සහභාගී වු අය සංහිඳියාව සඳහා දායකත්වයක් ලබාදීමට සියලුම ශ්‍රී ලංකාවාසීන්ට -සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාවට- හැකියාවක් ලබාදීමේ වැදගත්කම අවධාරණය කළහ.[3] උදාහරණයක් වශයෙන් දමිළ ජනතාව ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස නැවත ඒකාබද්ධ කිරීම, දමිළ භාෂාව ජාතික භාෂාවක් ලෙස රජය පිළිගැනීම මත සිදු විය යුතු බව බොහෝ අය කියා සිටියහ. තව ද උතුරු නැගෙනහිර සහභාගීවන්නන් විශේෂයෙන් බෞද්ධ හා දමිළ අන්තවාදීන් විසින් මුස්ලිම් ජනතාව ඉලක්ක කරගෙන සිදු කරන අධික ප්‍රචණ්ඩ ක්‍රියා පසුබිම තුළ අන්තර් ආගමික සබඳතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය ද පෙන්වා දුන්හ. ඒවගේම ක්‍රිස්ත්‍රියානි ප්‍රජාවට එරෙහිව බෞද්ධ අන්තවාදීන් විසින් ද ප්‍රචණ්ඩත්වය සිදු කරනු ලැබේ. මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා අවම වශයෙන් 2014 වසරේ සිට සිදු වී ඇත. මුස්ලිම් හා දමිළ සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් පවසන ආකාරයට, විශේෂයෙන් මුස්ලිම් ප්‍රජාව සාමය ගොඩනැගීමේ හා සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් වලින් බැහැර කර ඇති තත්ත්වයක් තුළ ආගම් අතර පවතින ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම අභියෝගාත්මක වේ.

**ධාරිතාව ගොඩනැංවීමේ වැඩමුළු**

අවශ්‍යතා ඇගයීමෙන් ලබාගත් ප්‍රධාන නිගමනයන් පදනම් කරගෙන ව්‍යාපෘතියේ හවුල්කරුවන් ප්‍රාදේශීයේ සිවිල් සංවිධාන හා රජයේ නිලධාරීන් සම්බන්ධ කරගෙන ප්‍රාදේශීය වැඩමුළු මාලාවක් පැවැත් වුහ. සංක්‍රාන්තික යුක්තියේ තාක්ෂණික අංශ පිළිබඳ දැනුම්වත් කිරීමටත්, අනෙකුත් රටවල්වලින් උගත් පාඩම් බෙදා හදා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ පසුබිමට අදාළ කරගත හැකි උපාය මාර්ග හඳුනා ගැනීමටත් සඳහාත් මෙම වැඩමුළු පවත්වන ලදී. 2016 ජූලි මාසයේ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ දින තුනක වැඩමුළු තුනක් පවත්වන ලදී. කොළඹ, යාපනය (උතුර) හා මඩකලපුව (නැගෙනහිර) යන ප්‍රදේශවල මෙම වැඩමුළු පවත්වන ලද අතර, සිවිල් සමාජ සංවිධානවල සහභාගීවන්නන් 75 දෙනෙක් මෙම වැඩමුළුවලට සහභාගී වුහ. විශේෂයෙන් මඩකලපුව හා කොළඹ පවත්වන ලද වැඩමුළුවලට විවිධ ජනවාර්ගික හා ආගමික පසුබිම් වලින් යුත් සහභාගීවන්නන් සහභාගී වුහ. සිවිල් සමාජ සංවිධානවල ධාරිතාව ගොඩනැගීමේ වැඩමුළුවල අවසන් දිනයේ දී

ප්‍රාදේශීය වැඩමුළු තුනටම සහභාගී වූ සහභාගීවන්නන් උතුර, නැගෙනහිර හා දකුණ යන කලාප සඳහා ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටු තුනක් ස්ථාපිත කිරීම සඳහා එක් එක් ප්‍රදේශවලින් සාමාජිකයින් 10 දෙනෙක් නම් කළහ. මෙම කමිටුවට පුද්ගලයන් නිර්දේශ කිරීමේ දී සහභාගීවන්නන් විසින් ස්ත්‍රී පුරුෂ සාමාජභාව සමානත්වය හා දිස්ත්‍රික් මට්ටමේ නියෝජනය යන කරුණු සැලකිල්ලක් දක්වන ලදී.



ශ්‍රී ලංකාවේ මහනුවර සිට ක්‍රියාත්මක වන හෘද සාක්ෂිය පිලිබිඹු කරන මධ්‍යස්ථානයක් වන සමාජ සංවර්ධන ආයතනය සෑම වසරක්ම දහස් ගණන් පුද්ගලයන් හමු වේ. සමානාත්මතාවය, යුක්තිය, නිදහස, සාමය හා සහයෝගීතාවය පදනම් කර ගනිමින් සමාජ වෙනස සඳහා ක්‍රියාත්මකවීම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රජාවන්ගේ හැකියාව ශක්තිමත් කිරීමේ මෙහෙවරක් යටතේ මෙය සිදු වේ. මෙම ආයතනය 2016 වසරේ හෘද සාක්ෂිය පිලිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යාන්තර සන්ධානයේ සහයෝගය ඇතිව ආන්තික වැවිලි ප්‍රජාවක් වන උඩරට දමිළ ජනතාවගේ වාචික ඉතිහාස රැස් කිරීමේ ක්‍රියාකාරකමක් සිදු කළේය. මෙම ප්‍රජාව රටේ ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබාදෙන නමුත්, 1948 නිදහසෙන් පසු ඔවුන්ගේ පුරවැසිභාවය අහිමි කරන ලද අතර, ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පැවති කාලවකවානුවේ දී (1983-2009) ඔවුන් දැඩි ලෙස හිරිහැරවලට මුහුණ දුන්හ.



2017 අගෝස්තු මාසයේ කොළඹ දී පවත්වන ලද ශරීරය සිතියම්ගත කිරීමේ වැඩමුළුවකට සහභාගී වන කාන්තාවක්.

ව්‍යාපෘතියේ හවුල්කාර සංවිධාන සංහිඳියා යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කිරීම සඳහා වූ රජයේ මහලේකම් කාර්යාලය සමග සම්බන්ධ වී 2016 සැප්තැම්බර් මාසයේ දී රජයේ නිලධාරීන් සඳහා දෙදින වැඩමුළු දෙකක් පැවැත් වූහ. එක වැඩමුළුවකට පළාත් මට්ටමේ නිලධාරීන් 25 දෙනෙක් පමණ සහභාගී වූ අතර, දෙවැනි වැඩමුළුවට ඉහළ තනතුරු දරණ රජයේ නිලධාරීන් 20 දෙනෙක් - ජාතික මට්ටමේ ඉහළ තනතුරු දරණ නිලධාරීන් හෝ මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලය වැනි ආයතනවල සේවය කරන නිලධාරීන් සහභාගී වූහ.

මෙම සියලුම වැඩමුළුවල දී ගෞතමාලා, පේරූ, රුවන්ඩා, සියාරා ලියොන්, දකුණු ඇමරිකා හා පෙර යුගෝස්ලාවියා යන රටවල්වල ක්‍රියාත්මක වූ සංක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්වල පාඩම් බෙදා හදා ගන්නා ලදී. පහසුකරණය කරන ලද සංවාද හරහා සහභාගීවන්නන් බහුවිධ ප්‍රවේශයන් සැලකිල්ලට ගත් අතර, ඒවා ශ්‍රී ලංකාවට අදාළ කරගත හැකි ආකාරය පිළිබඳව ද සැලකිල්ලට ගත්හ. සියලු වැඩමුළු දමිළ හා සිංහල භාෂාවලින් ලබාදෙන ලද සමගාමී භාෂා පරිවර්තනයන් සහිතව ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන ලදී.

**සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංසදය (TRF)**

ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටු තුනේ නියෝජිතයන් විසින් 2016 සැප්තැම්බර් මාසයේ දී සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංසදය වන ජාතික ක්‍රියාකාරී කණ්ඩායමේ පළවෙනි රැස්වීම කොළඹ දී කැඳවන ලදී. සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංසදය සිංහල, බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, දමිළ හා මුස්ලිම් යන ජන කණ්ඩායම් ඇතුළුව ප්‍රධාන ජන වාර්ගික හා ආගමික කණ්ඩායම් වලින් සැදුම්ලත් සහභාගීවන්නන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටු තුන මගින් ඔවුන් නම් කරන ලදී. මෙම සංසදය සන්ධානයේ හවුල්කාර සංවිධානවල සහයෝගයෙන් සමාජ සංවර්ධන ආයතනය මගින් කළමණාකරනය කරනු ලබන අතර, සහභාගීවන්නන් 20 දෙනෙකුගෙන් 11 දෙනෙකුගෙන් සමන්විත විධායක කමිටුවක මූලිකත්වයෙන් එය ක්‍රියාත්මක වේ. ව්‍යාපෘති හවුල්කාර සංවිධාන සත්‍යය හා සංහිඳියා සංසදයේ නියෝජිතයන් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය තහවුරු කිරීමේ අරමුණ සහිතව කටයුතු කළ නමුත්, අවාසනාවකට මෙන් තමන්ගේ පවුලේ යුතුකම් හා වගකීම් හේතුවෙන් තමන්ට මෙම සංසදයේ සක්‍රීයව සහභාගී වීමට නොහැකි බව බොහෝ කාන්තාවන් කියා සිටියහ.

ප්‍රජා සහභාගීත්වය වැඩි කරගැනීම සඳහාත්, ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් යුත් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහාත් උපාය මාර්ග සැලසුම් කර ගැනීම සඳහාත්, මෙම කණ්ඩායම එම මාසය තුළ දී රැස්වීමක් පවත්වීය. උතුර නැගෙනහිර හා දකුණ යන ප්‍රදේශවල පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන ලද විවිධ ආකාරයේ ගැටලු සැලකිල්ලට ගනිමින් සත්‍යය හා සංහිඳියා සංසදය ප්‍රකාශනයක් නිර්මාණය කළේය. එම ප්‍රකාශනය අධිවාචන කණ්ඩායමක් වශයෙන් ඔවුන්ගේ ව්‍යුහය පැහැදිලි කළේය. එහි අරමුණ වන්නේ රජය විසින් හා සිවිල් සමාජ සංවිධාන විසින් මෙහෙයවන ලද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රාදේශීය ප්‍රජාවගේ දැනුම්වත් වීම වැඩි කිරීම වේ; ජාතික සමගි හා සංහිඳියා කාර්යාලය (ONUR) සංහිඳියා යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කිරීම සඳහා වූ මහලේකම් කාර්යාලය වැනි රජයේ ක්‍රියාවලීන් හා යාන්ත්‍රණයන් සමග ප්‍රාදේශීය ප්‍රජාවගේ අදහස් හුවමාරු කර ගැනීම හා ජාතික මට්ටමේ ක්‍රියාවලියේ දී ප්‍රාදේශීය සහභාගීත්වයට පහසුකම් සැලසීම ද මෙහි අරමුණ වේ. මෙම ප්‍රකාශණය විවිධ ප්‍රාදේශීය අවශ්‍යතා ද සැලකිල්ලට ගන්නා අතර, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංසදය ප්‍රාදේශීය අවශ්‍යතා නියෝජනය කරන ජාතික මණ්ඩපයක් ලෙස හඳුන්වා දෙයි.



සත්‍ය හා සංහිඳියා සංසදයේ සාමාජිකයෙක් 2016 නොවැම්බර් මාසයේ දී ප්‍රාදේශීය ප්‍රජාවන් අතර අත්පත්‍රිකා බෙදා දෙයි.

සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංසදය 2016 සැප්තැම්බර් මස පිහිටුවීමෙන් පසු එහි නියෝජිතවරුන් ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයන් හා ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුවටට සහභාගී වූ අය හමු වූ අතර, මෙම සංසදය හා එහි ක්‍රියාකාරකම් හඳුන්වාදීම සඳහා ප්‍රජා මට්ටමේ රැස්වීම් ද කැඳවා ඇත. 2017 මාර්තු මාසය වනවිට යාපනය (උතුර), මඩකලපුව (නැගෙනහිර) හා මහනුවර (දකුණ) යන ප්‍රදේශවල නියමු ප්‍රාදේශීය කාර්යාල තුනක් පිහිටුවා තිබුණි. 2017 ඔක්තෝම්බර් මාසය වනවිට රටපුරා තවත් එවැනි ප්‍රාදේශීය කාර්යාල හයක් ස්ථාපිත කිරීමටත්, පුළුල් ලෙස ක්ෂේත්‍ර කටයුතු තහවුරු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 14 දෙනෙකුට සහයෝගය ලබාදීමටත් මෙම සංසදය සැලසුම් කර ඇත.[4] සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ජාතික සංසදයේ කාන්තාවන්ගේ නියෝජනය සීමිත මට්ටමක පවතින නිසා ව්‍යපෘතියේ හවුල්කාර සංවිධාන ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් වශයෙන් හා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් වශයෙන් වැඩි වශයෙන් කාන්තාවන් බඳවා ගැනීමට උත්සාහයක් දරයි. සංසදයේ අනාගත ක්‍රියාකාරකම් මෙම සංසදයේ සම්බන්ධීකාරකවරුන්ට හා ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අමතර සිවිල් සමාජ සංවිධාන ධාරිතාව ගොඩනැගීමේ සහයෝගය හා තාක්ෂණික සහාය ලබාදෙනු ඇත. එවිට ඔවුන්ට ප්‍රජාවන් සමඟ තමන් කරන වැඩ ශක්තිමත් කරගැනීමටත්, ඒවගේම බිම් මට්ටමේ වගවීමේ හා සංහිඳියා උත්සාහයන්ට දායකත්වයක් ලබාදීමටත් හැකියාව ලැබෙනු ඇත.

**සන්ධානයේ ශ්‍රී ලංකා ව්‍යපෘතිය ඇගයීමට ලක් කිරීම**

ශ්‍රී ලංකාව ඉතා වටිනා සිද්ධි අධ්‍යායනයක් වීම සඳහා බොහෝ හේතු තිබේ. ශ්‍රී ලංකාව, යුද්ධය අවසන් වීමෙන් පසු විශාල ප්‍රමාණයේ මානව හිමිකම් උල්ලංඝණයවීම් හා ආරක්ෂාව පිළිබඳ ගැටලුවලට මුහුණ දී ඇති පශ්චාත් ගැටුම් රටක් සඳහා වූ උදාහරණයක් වේ. ප්‍රචණ්ඩත්වය පරම්පරා කිහිපයක් ව්‍යාප්තව තිබූ නිසාත්, තවමත් දේශපාලන විසඳුමක් ලැබී නැති නිසාත් අවිශ්වාසය පැතිරී තිබෙන අතර දැඩි කෝපය හා අසරණකම් පිළිබඳ හැඟීමක් දමිළ ප්‍රජාව තුළ පවතී. රජයේ මුලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය මගින් සිවිල් සමාජයේ විශ්වාසය දිනා ගැනීමට නොහැකි වී ඇති පසුබිමක හෝ සංහිඳියාව ප්‍රවර්ධනය කළ නොහැකි තත්ත්වයක් සම්මුතිය ගොඩනැගීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක් ශ්‍රී ලංකාව තුළ සිදු කරන අනාගත මැදිහත්වීම්වලට තොරතුරු ලබාදිය හැකිය. තවදුරටත් එය දීර්ඝ

කාලීනව ජනවාර්ගික ප්‍රශ්න හා දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීමට අවශ්‍යතාවයක් පවතින අනෙකුත් රටවල්වලට ප්‍රයෝජනවත් පාඩම් හා නිර්දේශ ද ලබාදිය හැකිය.

**සියලු දෙනාම ඇතුළත් වන ආකාරයේ අවශ්‍යතා ඇගයීමක් කිරීම මගින් සංක්‍රාන්තික යුක්තියේ පුළුල් අදාළත්වය තහවුරු කරගැනීම**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ යෝජනා අංක 30/1 සම්මත කරගැනීමෙන් පසු, ව්‍යාපෘතියේ හවුල්කාර සංවිධාන විසින් අවශ්‍යතා ඇගයීමක් සිදු කරන ලදී. මෙම ඇගයීමේ විෂය පථය හා ප්‍රමාණය හේතුවෙන් -මෙයට විවිධ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා, විවිධ පසුබිම් සහිත පුද්ගලයන් සමග පවත්වන ලද සහභාගීව පර්යේෂණ වැඩමුළු ද ඇතුලත් විය- සන්ධානයේ හවුල්කාර සංවිධාන පසුබිම පිළිබඳවත්, විවිධ පාර්ශවකරුවන්ගේ අදහස් පිළිබඳවත්, රටපුරා යුද්ධය හේතුවෙන් ජනතාව ලබාගෙන ඇති විවිධ අත්දැකීම් පිළිබඳවත් පුළුල් දැනුමක් ලබාගැනීමට සංධානයේ හවුල්කාර සංවිධානවලට හැකි විය.

ව්‍යාපෘති හවුල්කරුවන් හා ප්‍රාදේශීය ප්‍රජාවේ සාමාජිකයන් අතර විශ්වාසය ගොඩනැගීමේ දී මෙම ඇගයීම සාමාන්‍යයෙන් සාර්ථකත්වයට පත් වී ඇත. ව්‍යාපෘති හවුල්කරුවන් හා ප්‍රජා සාමාජිකයන් බොහෝ දෙනා සන්ධානයේ ක්‍රියාකාරකම්වල අඛණ්ඩව සහභාගී වී ඇත. තව ද මෙම ඇගයීම සංක්‍රාන්තික යුක්තියට සම්බන්ධ වී සිටින පුළුල් පරාසයක පාර්ශවකරුවන් හඳුනාගෙන ඇති අතර, වැඩසටහන් අතර පවතින පරතරයන් හා උතුරු නැගෙනහිර හා කොළඹ ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධානවල ධාරිතාවන් ද හඳුනාගෙන ඇත. තවද උතුරු ප්‍රදේශයේ කාන්තාවන් පමණක් සහභාගී වන ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීම මගින් හා එම ප්‍රශ්න ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රධාන ප්‍රවාහයට ඇතුළත් කිරීම මගින් ව්‍යාපෘති හවුල්කරුවන්ට සත්‍යය, යුක්තිය හා සංහිඳියාව පිළිබඳ පිරිමින්ගේ හා කාන්තාවන්ගේ වෙනස් වු අවශ්‍යතා අවබෝධ කරගැනීමට හැකියාවක් ලැබිණ.

මෙම ක්‍රියාවලිය හරහා ව්‍යාපෘති හවුල්කරුවන් සංක්‍රාන්තික යුක්ති සඳහා තනි පුද්ගලයන්ගේ හා ප්‍රජාවන්ගේ බහුවිධ අවශ්‍යතා හා බලාපොරොත්තු පිළිබඳව ද ගැඹුරු අවබෝධයක් ලබාගත්හ. උදාහරණයක් වශයෙන් දකුණේ කටයුතු කිරීම මගින් සංහිඳියාව ළගා කරගැනීම සඳහා සිංහල ජනතාව මෙය පිළිගැනීම හා මෙයට සහභාගීවීමේ අවශ්‍යතාවය අවබෝධ කරගැනීමට ව්‍යාපෘති හවුල්කරුවන්ට හැකි විය. හවුල්කරුවන් ඉන්පසු ජනවර්ගය කුමක් වුවත් සහභාගීවීමෙන් ලබාගත හැකි දීර්ඝ කාලීන හා අන්‍යෝන්‍ය ප්‍රතිලාභයන් පෙන්වා දුන්හ. සංහිඳියාව "දමිළ ප්‍රශ්නය" කෙරෙහි පමණක් අවධානය යොමු නොකළ යුතු බවත්, සියලුම ජන වාර්ගික කණ්ඩායම් එයට ඇතුළත් විය යුතු බවත් දමිළ තරුණයෙක් සඳහන් කළේය. සියලු දෙනාම ඇතුළත් කරගැනීමේ සන්ධානයේ ප්‍රවේශය සංක්‍රාන්තික යුක්තිය මුලු රටටම අදාළ වන ගැටළුවක් ලෙස ඉදිරිපත් කළේය. එය ක්‍රියාවලියේ සහභාගීත්වය හා සංහිඳියා ප්‍රයත්නයන් කෙරෙහි පුළුල් වශයෙන් බලපෑමක් කරනු ඇත.

ඇගයීම පුළුල්ව සිදු කළ නිසාත්, නිසි කාලයේ දී සිදු කළ නිසාත්, එය සංක්‍රාන්තික යුක්තිය හා අදාළ දේශපාලන තීරණ ක්ෂණිකව සංවර්ධනය වෙමින් පවතින පසුබිමක් තුළ, ඊට උචිත ආකාරයෙන් වැඩසටහන් සැලසුම් කිරීමට ව්‍යාපෘති හවුල්කරුවන් එය මාර්ග සිතියමක් ලෙස පාවිච්චි කිරීමට හැකියාවක් ලබාගත්හ.

> *"ඔබ සංහිඳියාව පිළිබඳ කතා කරනවිට දකුණේ ජනතාව සමග කතාකළ යුතුයි. ඔවුන් අප ගැන බිය නොවිය යුතුයි."*
>
> - වවුනියා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වු දමිළ පිරිමි සහභාගීවන්නෙක්

### සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ක්‍රමවේදයන් ඒකාබද්ධ කිරීම

දෙදින සහභාගීත්ව අවශ්‍යතා ඇගයීමේ වැඩමුළු මගින් සංක්‍රාන්තික යුක්තිය හා සංහිඳියාව පිළිබඳ තමන්ගේ අදහස් පිළිබඳ නැවත සිතා බැලීමටත්, ඒවා බෙදා හදාගැනීමටත් සහභාගීවන්නන්ට හැකියාවක් ලබා දෙන ලදී. වැඩමුළුවේ ක්‍රමවේදය තොරතුරු හුවමාරු කරගැනීම හා අන්‍යෝන්‍ය ඉගෙනීම කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, එය සංක්‍රාන්තික යුක්ති පිළිබඳ අවශ්‍ය කරුණු ලබාදීමට සාර්ථක ක්‍රමයක් විය. තව ද අදාළ සාකච්ඡාවල අර්ථාන්විත සහභාගීත්වයක් ලබාගැනීමට ද එමගින් හැකි විය. සහභාගීවන්නන් සංක්‍රාන්තික යුක්ති සංකල්ප හා ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු කිරීමට අමතරව - නේපාලයේ තත්ත්වය උදාහරණයක් වශයෙන් පෙන්වා අතුරුදහන් වු හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ආමන්ත්‍රණය නොකරන ප්‍රශ්න පිළිබඳ ශ්‍රී ලංකාවේ එහි සමාන තත්ත්වයන් සාකච්ජා කිරීම මගින්- ව්‍යාපෘති හවුල්කරුවන් අතීතය පිළිබඳ සංවාදයක් ගොඩනැගීම සඳහා Herstories සංරක්ෂණ ලේඛන ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමය භාවිතා කළහ.[6] ප්‍රදර්ශනයට පෙර මෙහෙයවන ලද සංවාදයක් සිදු වු අතර, එමගින් කෝපය, බිය, අවිශ්වාසය හා සහකම්පනය වැනි හැඟිම්බර ප්‍රතිචාරයන් පිළිබඳ ගැඹුරු දැනුමක් ලබාගැනීමට ව්‍යාපෘති හවුල්කරුවන්ට හැකි විය. ප්‍රදර්ශනය පිළිබඳ අන්‍යෝන්‍ය සංවාදයකින් තොරව ව්‍යාපෘති හවුල්කරුවන් ආකල්ප වෙනස්වීම පිළිබඳ හැඟිම් ප්‍රකාශනයන් පහසුවෙන් හඳුනාගැනීමට හැකි නොවනු ඇත. එය සංහිඳියාවට අවශ්‍ය වේ. අවශ්‍යතා ඇගයීම පිළිබඳ සන්ධානයේ සමස්ත විෂයයාන්තර හා සහභාගීත්ව ප්‍රවේශය සාර්ථක වු අතර, සංහිඳියාවට එරෙහි හැඟිම් බාධක තීරණය කරගැනීමේ හැකියාව ද ලබා දුන්නේය. යුද්ධය හා අනෙක් ප්‍රජාවන් පිළිබඳ එක් එක් කණ්ඩායම්වල හැඟීම් අවබෝධ කර ගැනීම, ගැටුමේ මුල් හේතු හා එය පෙළඹ වු හේතු කෙරෙහි ධනාත්මක බලපෑමක් කරන සංක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවට සහයෝගය ලබාදීමට සංධානයට හැකියාව ලබාදෙනු ඇත.




ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින ශ්‍රී ලංකාවේ කාන්තාවන් 20 දෙනෙක් සඳහා GIJTR සන්ධානය විසින් පවත්වන ලද ශරීරය සිතියම් ගත කිරීමේ වැඩමුළුවක්

## සිවිල් සමාජයේ ධාරිතාව ගොඩනැගීම පිළිබඳ සහභාගීත්ව ප්‍රවේශයක්

සිවිල් සමාජ සංවිධාන සඳහා පැවැත් වූ සියලුම වැඩමුළුවල සහභාගීවන්නන් මෙම වැඩමුළුවල සහභාගීත්ව හා රීති නොපනවන ස්වභාවය ඇගයීමට ලක් කළහ. තව ද වැඩමුළුවේ දී මතුවන අවශ්‍යතා පදනම් කරගෙන න්‍යාය පත්‍රය සංශෝධනය කිරීමේ දී ව්‍යාපෘති හවුල්කරුවන් හා විශේෂඥ-පහසුකාරකවරුන් දැක් වූ නම්‍යශීලීභාවය ද ඔවුන් අගය කළහ. උදාහරණයක් වශයෙන් යාපනයේ පැවති වැඩමුළුවේ දෙවැනි දිනයේ දී, තමන්ගේ ජීවිත අත්දැකීම්වලට අදාළ කිසිම පැහැදිලි වෙනසක්

ලගා නොකර තමන් බොහෝ සංක්‍රාන්තික යුක්ති වැඩමුළුවලට සහභාගී වී ඇති බව දමිළ සහභාගීවන්නෙක් සිය කළකිරීම පළ කළ සිටියේය. පෙර වැඩමුළු සියල්ලක්ම කිසිම ක්‍රියාකාරකමකින් තොරව කතා පමණක් පිරී වැඩමුළු වූ බව ඔහු කණස්සල්ලෙන් කියා සිටියේය. ඔහුගේ එම කළකිරීම් සහිත ප්‍රකාශයෙන් පසු පහසුකාරකවරුන් සාකච්ඡාව සඳහා සභාව විවෘත කළහ. මෙම වැඩමුළුවට සහභාගී වූ බහුතරයක් -ඔවුන් සියලුදෙනාම දමිළ අය වූහ- බොහෝ වැඩමුළුවලට සහභාගී වී තමන් තෙහෙට්ටුවට පත්වී ඇති බව තමන්ගේ හැඟීම් නැවත අවධාරණය කළහ. නමුත් මෙම වැඩමුළුව එහි සහභාගීත්ව ප්‍රවේශය හා ප්‍රතිඵල පදනම් කරගත් ප්‍රවේශය හේතුවෙන් සුවිශේෂ වූ වැඩමුළුවක් බව ඔවුන් පැවසූහ. සියලුදෙනාම මෙම වැඩමුළුවේ අඛණ්ඩව සම්බන්ධ විය යුතු බව ඉල්ලා සිටීම මගින් එක් දමිළ කාන්තාවක් මෙම හැඟීම පළ කළාය. අනාගත පරම්පරාවන්ගේ යහපත පිණිස එසේ සියලුදෙනාම සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියට සහභාගී විය යුතු බව ඇය කියා සිටියාය.

ශ්‍රී ලංකාවේ ඉතා ආන්තික කණ්ඩායම් බොහෝදුරට නිශ්ශබ්ද කර ඇත; එම නිසා සන්ධානයේ සහභාගීත්ව ප්‍රවේශය සුළු ජාතික කණ්ඩායම්වලට සංක්‍රාන්තික යුක්ති පියවරයන් පිළිබඳ තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා හඬ නැඟීමට අවස්ථාවක් ලබා දුන්නේය. මෙම ක්‍රමවේදය සහභාගීවන්නන්ගේ අවශ්‍යතා පිළිබඳ සවන්දීමට අවස්ථාව ලබාදුන් අතර ව්‍යාපෘති හවුල්කරුවන් හා සහභාගීවන්නන් අතර විශ්වාසය නැවත තහවුරු කළේය. වැඩමුළුවල සහභාගීවන්නන් පදනම් කරගත් ස්වභාවය තමන්ට එහි අයිතියක් ලබාදුන් බව එක් දමිළ සහභාගීවන්නෙක් සඳහන් කළේය. සහභාගීවන්නන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම සඳහා මෙම වැඩමුළු නම්‍යශීලි න්‍යායපත්‍රවලින් සමන්විත වූ බව ඇය පැවසුවාය. මෙය සහභාගීවන්නන්ගේ කැපවීම හා දායකත්වය පෝෂණය කළේය. මෙවැනි මැදිහත්වීම්වල තිරසාරභාවය ඇති කරගැනීමට එම මැදිහත්වීම් හා දායකත්වය ඉතා වැදගත් වේ.

තව ද වැඩමුළුවල සියලුදෙනාම ඇතුළත් කරගන්නා හා සහභාගීත්ව ස්වභාවය කණ්ඩායම් අතර අදහස් හුවමාරුවලට පහසුකම් සැලසූ අතර, සංහිඳියාවට සහයෝගය ලබාදීමේ සන්ධානයේ අරමුණ කෙරෙහි ද වැදගත් විය. මඩකලපුවේ දී හා කොළඹ දී පවත්වන ලද ධාරිතාව ගොඩනැගීමේ වැඩමුළුවල විවිධත්වය සහභාගීවන්නන් අගය කළ අතර, තමන්ගේ අත්දැකීම් හුවමාරු කරගැනීමට අවස්ථාවක් ලැබීම හා වෙන කිසිම ආකාරයෙන් තමන්ට සම්බන්ධ විය නොහැකි පුද්ගලයන්ගේ අදහස්වලට සවන්දීමට අවස්ථාව ලබාදීම ඔවුන් අගය කළහ.

## සංක්‍රාන්තික යුක්ති හා සුළු ජාතික ගැටළු පිළිබඳ රජයේ ක්‍රියාධරයන් සමඟ කටයුතු කිරීම

බොහෝ ධනාත්මක ප්‍රතිඵලයන් ලබාදුන් සිවිල් සමාජ සංවිධාන සමඟ පැවැත් වූ වැඩමුළු මෙන් නොව රජයේ සිවිල් නිලධාරීන් සඳහා-විශේෂයෙන් දිසාපතිවරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් සඳහා- පවත්වන ලද වැඩමුළු අඩු ඵලදායී මට්ටමක තිබිණි. බොහෝදුරට සියලුම සහභාගීවන්නන් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියන් පිළිබඳ තමන්ගේ අදාළ අමාත්‍යාංශ විසින් තමන් වෙත දැනුම් දී නොමැති බව පැමිණිලි කළ අතර, අමාත්‍යාංශ නියෝගයකින් තොරව සංහිඳියා යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය සඳහා වූ මහලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීමට ඔවුන් පැකිලීමක් දැක්වූහ. තව ද සිවිල් සමාජ සංවිධානවල

> *"මෙම වැඩමුළු ප්‍රාදේශීය දෘෂ්ටිකෝණයකින් තමන්ගේ යථාර්ථයන් පිළිබඳ කතා කිරීමට සිංහල හා දමිළ අයට අවස්ථාවක් ලබාදුන්නේය. තව ද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය සියලුදෙනා කෙරෙහි ඇති කරන බලපෑම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා ගැනීමට ද ඔවුන්ට හැකි විය."*
>
> - කොළඹ ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුවට සහභාගී වූ සිංහල සහභාගීවන්නෙක්- විවිධ ජන වාර්ගික හා ආගමික කණ්ඩායම්වලට අයත් අනෙකුත් බොහෝ අය ඉදිරිපත් කළ අදහස් හා හැඟීම්වලට එක්වෙමින්

සහභාගීවන්නන් කණ්ඩායම් අතර සංවාදවල යෙදීමට කැමැත්තක් දැක් වූ, අතර සිවිල් නිලධාරීන් මෙම ගැටළුව පිළිබඳ වෙනස් වූ මත දැරූහ. උදාහරණයක් වශයෙන් දකුණේ සේවය කරන සමහර නිලධාරීන් දමිළ ජනතාව පිළිබඳ වෙනස්කොට සලකන ආකාරයේ යම් අදහස් ප්‍රකාශ කර නමුත්, උතුරු නැගෙනහිර සේවය කරන සිංහල නිලධාරීන් ඉඩම් අත්පත් කරගැනීම හා පොලිස් තර්ජන පිළිබඳව දමිළ ජනතාවගේ යම් ප්‍රශ්න වැනි නිශ්චිත ගැටළු කෙරෙහි සානුකම්පිකව ප්‍රතිචාර දැක්වූහ. රාජ්‍ය නිලධාරීන්ගේ බහුතරයක් - දිසාපතිවරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් - සිංහල අය වූ නිසා තමන්ගේ අදහස් ඉදිරිපත් කරන ලෙස වැඩමුළුවලට සහභාගී වී සිටි දමිළ සහභාගීවන්න පෙළඹවීමට පහසුකාරකවරුන්ට සිදුවිය. එසේ කතා කිරීම මෙම වැඩමුළුවට බාධාවක් වී, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන්පසු පලිගැනීමේ සිදුවීම් සිදුවිය හැකි යැයි සමහර දමිළ නිලධාරීන් සිතූහ. මෙම වැඩමුළුවල ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශීය හා පළාත් නිලධාරීන් අතර ඒකඟතාවයක් ඇති නොවූ නමුත්, තවමත් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය ප්‍රාදේශීය මට්ටමේ රජයේ නිලධාරීන් පිළිගැනීම තහවුරු කරගැනීම සඳහා සම්මුතියක් ගොඩනැගීමේ අවශ්‍යතාවය පවතින බව ඔවුන් අවධාරණය කළහ. රජයේ සහයෝගය සන්ධානයේ වැඩ හා වගවීම හා සංහිඳියාවට අදාළ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් කළ හැකිය.

සහභාගීවන්නන් අතර හමුදාවේ හා පොලීසියේ උසස් නිලධාරීන් 10 දෙනෙකු ද ඇතුළුව ජාතික මට්ටමේ රජයේ නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුව ද එයින් බලාපොරොත්තු වූ සම්මුතිය ගොඩනැගීමේ අරමුණ ඉටුකර ගැනීමට ඉහත ආකාරයෙන්ම අසාර්ථක විය. කෙසේවෙතත්, මෙම වැඩමුළුව වගවීම, දේශීය නඩු පැවරීම්වල ශක්තීන් හා දුර්වලතා, අඛණ්ඩව සිදුවෙමින් පවතින අතුරුදහන්වීම් හා අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ වාර්තා හා සංක්‍රාන්තික යුක්තියේ ආරක්ෂක අංශයේ කාර්ය භාරය වැනි කරුණු විවෘතව සාකච්ඡා කිරීමට සහභාගීවන්නන්ට අවකාශයක් නිර්මාණය කළේය. උදාහරණයක් වශයෙන් (සිදුවීම්වලට) ප්‍රතිචාර දක්වන, සම්ප්‍රදායික පොලිස් ක්‍රමයක සිට ප්‍රජාවන් සඳහා වූ පොලිස් බලකායක් ලෙස පරිවර්තනය වීම සඳහා වූ තමන්ගේ පියවරයන් පොලිස් නිලධාරීන් අවධාරණය කළහ. මෙය උතුරු නැගෙනහිර අඛණ්ඩව සිදුවන පොලීසියේ හිරිහැරකිරීම් පිළිබඳ හා උතුරු නැගෙනහිර ප්‍රදේශවල දමිළ භාෂාව කතා කරන පොලිස් නිලධාරීන්ගේ අවශ්‍යතාවය පිළිබඳ අනෙකුත් වැඩමුළුවල ඉදිරිපත් කරන ලද අදහස්වලට සම්පූර්ණයෙන් පටහැනි විය. ආරක්ෂක අංශයේ බොහෝ සහභාගීවන්නන් සංක්‍රාන්තික යුක්ති ගැටළුව සමඟ නිසි ලෙස සම්බන්ධ වන ප්‍රථම අවස්ථාව මෙය විය. එම කරුණ සැලකිල්ලට ගෙන මෙම වැඩමුළුව සහභාගීවන්නන්ට අධ්‍යාපනයක් ලබාදීමේ දී සාර්ථක කාර්යභාරයක් ඉටු කළේය. මන්දයත් එම වැඩමුළුවේ අවසානයේ දී සියලුම සහභාගීවන්නන් සංක්‍රාන්තික යුක්තිය හා ශ්‍රී ලංකාවේ එහි භාවිතය පිළිබඳ මනා දැනුමක් පෙන්වූහ. තව ද මෙම වැඩමුළුව ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියේ දී විවිධ අමාත්‍යාංශවල කාර්යභාරයන් පැහැදිලි කළ අතර එම අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවය ද අවධාරණය කළේය.

සමස්ථයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියේ ආකෘතිය හා ප්‍රධාන අරමුණු පිළිබඳව සහභාගීවන්නන් අතර සම්මුතියක් ගොඩනැගීමේ දී රජයේ නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළු එතරම් සාර්ථකත්වයක් පෙන්නුම් කළේ නැත. කෙසේවෙතත්, සියලුම රජයේ නිලධාරීන් සංක්‍රාන්තික යුක්ති කර්තව්‍යයන් අවබෝධ කරගැනීම තහවුරු කිරීම සඳහා සංහිඳියා යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කිරීම සඳහා වූ මහලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් කළ යුතු වැඩ කටයුතු එම වැඩමුළුවලින් පෙන්වාදෙන ලදී. උදාහරණයක් වශයෙන් සංක්‍රාන්තික යුක්තිය අපරාධ සඳහා වගවීමට ලක් කිරීම සඳහා පමණක් ක්‍රියාත්මක වන දෙයක් බව පැවති වැරදි මතය නිවැරදි කරගැනීමට මෙම වැඩමුළු උපකාරී විය. තව ද මෙම වැඩමුළු රජයේ නිලධාරීන් අතර සත්‍යය හා සංහිඳියාව සඳහා සංසදය පිළිබඳ දැනුම්වත් භාවයන් ද වැඩි කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සංසදය දකුණේ අනුරාධපුර හා පොළොන්නරුව යන ප්‍රදේශවල ද උතුරේ වවුනියාව හා කිලිනොච්චි යන ප්‍රදේශවල ද ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් සමඟ

එලදායී ආකාරයෙන් සබඳතා ගොඩනගා ගෙන ඇත. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනටමත් තමන්ගේ කනිෂ්ඨ කාර්‍ය මණ්ඩලයට සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ අමතර පුහුණුව ලබාදෙන ලෙස සත්‍යය හා සංහිඳියා සංසදයෙන් ඉල්ලීම් කර ඇත.

**ප්‍රාදේශීය ප්‍රජාවට අයත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම**

සත්‍යය හා සංහිඳියා සංසදය ස්ථාපිත කිරීම මඟින්, විශේෂයෙන් කොළඹ හා නාගරික මධ්‍යස්ථානවලින් පිට සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරකම් හා තොරතුරු බෙදාහදා ගැනීම වැඩි වශයෙන් සම්බන්ධීකරණය කිරීම සඳහා වූ අවශ්‍යතාවයට ව්‍යාපෘති හවුල්කරුවන් සෘජුවම ප්‍රතිචාර දැක්වූහ. සත්‍යය හා සංහිඳියා සංසදයට ප්‍රාදේශීය ප්‍රජාවට අයත් ආයතනයක් වශයෙන් සංක්‍රාන්තික යුක්ති වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි අතර, ප්‍රාදේශීය ප්‍රජාවන් හා සංවිධාන හා කොළඹ සිට ක්‍රියාත්මක වන රජයේ ආයතන අතර මැදිහත්කරුවෙක් වශයෙන් ද කටයුතු කළ හැකිය. සත්‍යය හා සංහිඳියා සංසදය නිර්මාණය කිරීම විවිධ ප්‍රදේශවලට අයත් සිවිල් සමාජ සංවිධාන අතර වැඩි වශයෙන් දැනුම හුවමාරු කරගැනීමත්, සම්බන්ධීකරණය සිදුවීමත් තහවුරු කරයි. තව ද එය සම අදහස් දරන කණ්ඩායම් අතර ජාලයන් ඇති කිරීම සඳහා වූ අවස්ථාවන් ද ලබාදෙයි. සිවිල් සමාජ සංවිධානවල ධාරිතාව ගොඩනැගීමේ සියලුම වැඩමුළුවලට සහභාගී වූ සහභාගීවන්නන් ද මෙම කරුණ ඇගයීමට ලක් කළහ. අනෙකුත් සංක්‍රාන්තික යුක්ති වැඩමුළු මෙන් නොව සන්ධානයේ වැඩමුළු පිටට පෙනෙන ප්‍රතිඵලයක් ලබා දී ඇති බව ඔවුන් පැවසූහ. එම ප්‍රතිඵලය වන්නේ සත්‍යය හා සංහිඳියා සංසදය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සත්‍යය හා සංහිඳියා සංසදයට සන්ධානය විසින් ලබාදෙන සහයෝගය ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධානවල දායකත්වයන් ශක්තිමත් කළ හැකිය. තව ද එම සංසදය ප්‍රාදේශීය ප්‍රජාවට අයත් සංවිධානයක් හෙයින් එහි ප්‍රතිලාභවල තිරසාරත්වයක් ද පවතී.

*"වින්දිතයන් හා ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන සංක්‍රාන්තික යුක්ති ගැටළු පිළිබඳ වැඩ කළ යුතුය. කොළඹ සිට ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන උතුරේ ගැටළුවලින් හා ජාත්‍යාන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ පවත්වන තමන්ගේ සබඳතා මඟින් (කොළඹින් පිට ජීවත්වන ප්‍රජාවන්ගේ පිහිටෙන්) ලබා ගනිති."*

- වවුනියාව ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ පිරිමි සහභාගීවන්නෙක්

සත්‍යය හා සංහිඳියාව සංසදයේ නියෝජිතයන් විවිධ වූ ජන වාර්ගික හා ආගමික කණ්ඩායම්වලට අයත් පුද්ගලයන් වන අතර, තමන්ගේ ප්‍රජාවන් තුළ වැඩි වශයෙන් ගරුත්වයක් ලබා සිටින අය වේ. මෙම සංසදය දැනටමත් දිසාපතිවරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති අතර, සංසදයටත්, එහි ක්‍රියාකාරකම්වලටත් සහයෝගය ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ පළාත් බලධාරීන්ට ඒත්තු ගන්වා ඇත. මෙම සංසදයට සන්ධානය අඛණ්ඩව ලබාදෙන තාක්ෂණික හා මූල්‍ය සහාය කුසලතාවයන් ලබාදීම ප්‍රවර්ධනය කරන අතර, ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියට සම්බන්ධ වීම සඳහා වූ ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධානවල හැකියාව ද තිරසාරව පවත්වාගෙන යයි. අවසන් වශයෙන් සත්‍යය හා සංහිඳියා සංසදයේ ක්‍රියාකාරකම් ප්‍රාදේශීය මට්ටමේ සංක්‍රාන්තික යුක්ති වැඩසටහන් අඛණ්ඩව සිදුවීම තහවුරු කරගැනීමට උපකාරී වේ. ජාතික මට්ටමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීමේ හා ප්‍රගතියක් අත්පත් කරගැනීමේ දී රජය පැත්තෙන් ප්‍රමාදයන් පවතින නමුත් මෙය සිදු වේ.

උමාම් සංවිධානය 1975-1990 කාල වකවානුවේ සිදු වූ ලේඛනානයේ සිවිල් යුද්ධයේ අතීතය සංරක්‍ෂණය කිරීමේ කාර්‍යයට ලේඛනගත කිරීමෙන් හා පර්යේෂණ මඟින් සහයෝගය ලබාදෙයි. එම සංවිධානය පුළුල් පරාසයේ ඓතිහාසික සාක්ෂි හා කාලාත්මක භාණ්ඩ රැස්කර, සංරක්ෂණය කර, ප්‍රසිද්ධව ඒවා ප්‍රවර්ධනය කිරීම මඟින් මෙම කාර්‍යයේ යෙදී සිටියි

# පරිච්ඡේදය 4 :

# මැදපෙරදිග හා උතුරු ආප්‍රිකාවේ සංක්‍රාන්තික යුක්ති අධ්‍යාන පර්ෂදය

මැදපෙරදිග හා උතුරු ආප්‍රිකා කලාපයේ තත්ත්වය

මැදිපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ රාජ්‍යයන් ප්‍රචණ්ඩකාරී හෝ ආඥාදායක පාලන කාල පරිච්ඡේදවලින් පසුව තමන්ගේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් බලාපොරොත්තුවෙන් සිටී. ඒවා ආරම්භ කිරීමට හෝ අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන අවස්ථාවේ එම කලාපයේ ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩි අවස්ථා දක්නට ලැබේ.[1] එවැනි ප්‍රයත්නයන්වල බලපෑම හා තිරසාරභාවය තහවුරු කරගැනීම සඳහා වින්දිතයන් හා සිවිල් සමාජ සංවිධාන ද ඇතුළුව ප්‍රාදේශීය පාර්ශ්වකරුවන් ප්‍රාදේශීය අවශ්‍යතා, සංස්කෘතීන් ඇතුලුව එම තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්විය හැකි සංක්‍රාන්තික යුක්ති පියවරයන් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විය යුතුයි. කෙසේවෙතත්, මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ අදවෙනතෙක් සිදුවන බොහෝ සංක්‍රාන්තික යුක්ති වැඩසටහන් ජාතික මට්ටමේ ප්‍රයත්නයන් හා සාම්ප්‍රදායික ක්‍රියාධරයන් කෙරෙහි අවධානය යොමු කර ඇත.[2] ජාත්‍යාන්තර මානව හිමිකම් නීතිය හා ජාත්‍යාන්තර මානුෂීය නීතිය සමාලෝචනයට ලක්කිරීමට අමතරව, මෙම පුහුණු වැඩසටහන් රාජ්‍යය විසින් මෙහෙයවන ලද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම් ආවරණය කර ඇත. එනම් අපරාධ සඳහා නඩු පැවරීම්, සත්‍යය සෙවීමේ කොමිෂන් සභා හා හානිපූර්ණ වැනි දේවල් ඒවා සැලකිල්ලට ගෙන ඇත. කෙසේවෙතත්, ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සම්බන්ධ වීම වෙනුවට, ඔවුන් ජාත්‍යාන්තර නිපුණතාවයන් ආනයනය කිරීමේ ප්‍රවණතාවයක් දක්වති. ජාතික හා කලාපීය අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාව සාමුහිකව කටයුතු කිරීමේ හැකියාව මෙය අහිමි කරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ ප්‍රාදේශීය ක්‍රියාධරයන් -විශේෂයෙන් සාම්ප්‍රදායික නොවන ක්‍රියාධරයන්- සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. තව ද ප්‍රජාව විසින් මෙහෙයවන ලද ව්‍යාපෘති සැලසුම් කරන්නේ කෙසේද, ඒවා යථාර්ථයක් බවට පත් කරගන්නේ කෙසේද යන කරුණු පිළිබඳව ද ඔවුන්ට පුහුණුවක් ලබාදිය යුතුව ඇත.

**මැදපෙරදිග හා උතුරු අප්‍රිකා කලාපයේ සංක්‍රාන්තික යුක්ති අධ්‍යායන පර්ෂදය පිළිබඳ පොදු දැක්ම**

මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ ඉටුනොවූ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ගෝලීය මුලපිරීම් සංවිධානයේ හවුල්කාර ආයතන හතරක් විසින් - එනම් හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යාන්තර සන්ධානය (ICSC), ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යායන කේන්ද්‍රය (CSVR), ගෞතමාලා විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම (FAFG) හා පොදු ජාත්‍යාන්තර නීතිය හා ප්‍රතිපත්ති කණ්ඩායම (PILPG) -2016 ජනවාරි මාසයේ මැදපෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ සංක්‍රාන්තික යුක්ති අධ්‍යායන පර්ෂදය ආරම්භ කරන ලදී. මෙම අධ්‍යායන පර්ෂදය නඩු පැවරීම්, සත්‍යය පැවසීම, හානිපූර්ණ, ආයතනික සංශෝධන හා අනුස්මරණ කටයුතු වැනි පුළුල් පරාසයේ පියවරයන් විස්තර කිරීම මගින් වගවීම පිළිබඳ සමස්ථ ප්‍රවේශයක් ඉදිරිපත් කළේය. වින්දිතයන්ට සහන සැලසීම සඳහා හා ඔවුන්ගේ සමාජයන් සුවපත් කිරීම සඳහා මෙම පියවරයන් දියත් කරන ලදී. මෙම අධ්‍යායන පර්ෂදය විද්‍යාත්මක සාක්ෂි, අනුස්මරණ කටයුතු, මනෝ-සමාජීය සහාය, සමාජ විද්‍යාව, මානව හිමිකම් හා නීති යන ක්ෂේත්‍රවල සන්ධානයේ හවුල්කරුවන් සතුව තිබෙන විවිධ වු අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් සංක්‍රාන්තික යුක්තිය විෂයයාන්තර දෘෂ්ටිකෝණයකින් සැලකිල්ලට ගත්තේය. තව ද හවුල්කරුවන්ගේ නිපුණත්ව

ක්ෂේත්‍ර පහසුකරණය කරන ලද වැඩමුළු හා රැස්වීම්වලට ඒකාබද්ධ කරන ලදී. විෂයයාන්තර දෘෂ්ටිකෝණයක් ලබාදීමේ අරමුණින් මෙය සිදුකරන ලදී. උදාහරණයක් වශයෙන් සත්‍යය පැවසීම පිළිබඳ කරන ලද ඉදිරිපත් කිරීමක් PILPG හා CSVR සංවිධානවල පහසුකාරකවරුන් ඉදිරිපත් කරන ලද අතර, ඔවුන් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ ලේඛණගත කිරීම ගැන සාකච්ඡා කළහ. හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානයන්හි ජාත්‍යාන්තර සන්ධානයේ පහසුකාරකවරුන් පශ්චාත් ගැටුම් ඓතිහාසික පෙළපොත් සංශෝධනය ගැන කරුණු ඉදිරිපත් කළහ.

ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් අදාළ පසුබිම්වලට සංවේදීව සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම් සැලසුම් කර, එහි සහභාගීවීමේ දී බිම් මට්ටමේ හා ආන්තික ප්‍රජාවන්ගේ සම්බන්ධය ව්‍යාප්ත කිරීමත් අධ්‍යයන පර්ෂදයේ අරමුණක් විය. වින්දිතයන් හා පීඩාවට පත් වී සිටින අනෙකුත් කණ්ඩායම් ඇතුළත් කරගැනීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම තහවුරු කරගැනීම සඳහා මෙය සිදු කළ යුතුය. මෙම අරමුණ ඉටුකරගැනීම සඳහා පළමුවෙන්ම මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ සිටින සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රියාධරයන්ගේ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත. විශේෂයෙන් ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන සහභාගීත්ව ආකෘති පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කළ යුතුය.[3] එහි දෙවන අරමුණ වන්නේ ප්‍රජාව මගින් මෙහෙයවන සංක්‍රාන්තික යුක්ති ක්‍රියාධරයන්ගේ කලාපීය ජාලයක් ස්ථාපිත කර, ශක්තිමත් කිරීම වේ. ගැටුම් හෝ අනෙකුත් ආරක්ෂක තර්ජන හේතුවෙන් අවදානම් තත්ත්වයක සිටින කණ්ඩායම්වලට සහයෝගය දැක්වීමට මෙය සිදු කරනු ලැබේ. අවසන් වශයෙන්, සංක්‍රාන්තික යුක්ති විකල්පයන් තීරණය කිරීමේ දී හා ප්‍රාදේශීය අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන මූලපිරීම් සංවර්ධනය කිරීමේ දී ප්‍රජා සහභාගීත්වය වැඩි දියුණු කිරීමට අධ්‍යයන පර්ෂදය කටයුතු කර ඇත.

මෙම අධ්‍යයන පර්ෂදය 2016 ජනවාරි මාසයේ සිට 2017 අප්‍රේල් මස වනතෙක් පවත්වන ලද අතර ඇල්ජීරියාව, ඊජිප්තුව, ඉරාකය, මොරොක්කෝ, සිරියා, ටියුනිෂියා හා යේමන් යන රටවල්වල සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රියාධරයන් මෙම කාලවකවානුවේ දී හතර වරක් එක්රැස් කරන ලදී. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයෙන් සන්ධානයේ හවුල්කරුවන්ට අයදුම්පත් 125 ක් ලැබී ඇත. අධ්‍යයන පර්ෂදය වැනි පුහුණු ආයතනයක පුහුණුව ලබාගැනීම පිළිබඳ පවතින ප්‍රාදේශීය අවශ්‍යතාව හා උනන්දුව මෙය පෙන්වාදෙයි. සන්ධානයේ හවුල්කාර සංවිධාන විසින් යෝජනා කර ඇති සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘතිවල ශක්තිය හා තමන්ගේ ඉලක්ක කණ්ඩායම් සමග ඔවුන් පවත්නා සබඳතා පදනම් කරගනිමින් සන්ධානයේ හවුල්කාර සංවිධාන සහභාගීවන්නන් 24 දෙනෙක් තෝරා ගන්නා ලදී. රට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ව්‍යාපෘතියේ අරමුණ යන කරුණුවල විවිධත්වය තහවුරු කරන ආකාරයේ මෙය සිදු කරන ලදී. අධ්‍යයන පර්ෂදයෙන් සහභාගීවන්නන් 19 දෙනෙක් උපාධිය ලබාගත්හ.[4]

අධ්‍යයන පර්ෂදය ක්‍රියාත්මක වූ කාල වකවානුවේ සහභාගීවන්නන් හැඳින්වීමේ වැඩමුළුවකට සහභාගී වූ අතර, උප මාතෘකාවන් කෙරෙහි අවධානය යොමුකළ අමතර වැඩමුළු තුනකට ද සහභාගී වූහ. සෑම වැඩමුළුවකම පුළුල් පරාසයක මාතෘකා ගවේෂණය කරන ලද නමුත් සහභාගීවන්නන් පහත සඳහන් උප මාතෘකාවන් ගැඹුරින් අධ්‍යයන කිරීමට කැමැත්තක් දැක්වූහ: සත්‍යය පැවසීම, ආයතනික සංශෝධන, සංක්‍රාන්තික යුක්තියේ ආර්ථික හා සමාජ අයිතීන්. සිවිල් සමාජය හා සහභාගීවන්නන් දැනටමත් සම්බන්ධතා පවත්වාගෙන යන අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සමග කටයුතු කරන්නේ කෙසේ දැයි වැනි දේවල් පිළිබඳව ප්‍රජා මට්ටමේ ක්‍රියාකාරකම් සැලසුම් කර, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ සහභාගීවන්නන් අධ්‍යානයක් ලබා ගත්තෝය. අවශ්‍ය ඇගයීම් සිදු කිරීමටත්, අධිවාචන මූලපිරීම් හා ප්‍රතිපත්ති නිර්දේශ සංවර්ධනය කිරීමටත්, තමන්ගේ ප්‍රාදේශීය මැදිහත්වීම්වල තිරසාරභාවය සඳහා අරමුදල් රැස් කිරීමටත්, වැඩසටහන් අධීක්ෂණය කර, ඇගයීම් කිරීමටත් සහභාගීත්ව ප්‍රවේශයන් පාවිච්චි කිරීම පිළිබඳ ඔවුන්ට පුහුණුවක් ලබාදෙන ලදී. අධ්‍යයන පර්ෂදය පෙර නොවූ ආකාරයේ ව්‍යාපෘතීන් සැලසුම් කිරීමේ අංගයක් ක්‍රියාත්මක කළ අතර, එය හරහා සහභාගීවන්නන්ට තමන් තෝරා ගන්නා ලද ක්‍රියාකාරකම් සඳහා උප ප්‍රදානයන් ලබාදෙන ලදී.

සන්ධානයේ හවුල්කරුවන් සමග පවත්වන ලද වැඩමුළු හා සාකච්ඡා මගින් එම ක්‍රියාකාරකම් සැලසුම් කරන ලදී. අවසානයේ දී අධ්‍යයන පර්ෂදයේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් අරාබි භාෂාවෙන් හෝ සමගාමී භාෂා පරිවර්තන හරහා පවත්වන ලදී. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ සිදුවන බොහෝ සංක්‍රාන්තික යුක්ති පුහුණු වැඩමුළුවල සාමාන්‍යයෙන් අරාබි භාෂාව පාවිච්චි කරන්නේ නැත.



ක්වාලම්පුර්හිදී 2016 නොවැම්බර් මස පවත්වන ලද වැඩමුළුවකට සහභාගී වු සංක්‍රාන්තික යුක්ති අධ්‍යයන පර්ෂදයේ හා GIJTR සංවිධානයේ හවුල්කරුවන්.

**මැදපෙරදිග හා උතුරු අප්‍රිකා කලාපයේ සංක්‍රාන්තික යුක්ති අධ්‍යයන පර්ෂදය පිළිබඳ ඇගයීම**

මෙම අධ්‍යයන පර්ෂදය ඉතා අගනා සිද්ධි ධ්‍යායනයක් වේ. එයට හේතුව වන්නේ ප්‍රාදේශීය පාර්ශ්වකරුවන්ගේ ධාරිතාවන් වැඩි දියුණු කරගැනීම සඳහා එම පර්ෂදය පාවිච්චි කළ සමස්ථ විෂයයාන්තර ක්‍රමවේදය වේ. උදාහරණයක් වශයෙන් එම පර්ෂදය සංක්‍රාන්තික යුක්තිය මුහුණපාන බාධකවලට ප්‍රධාන ප්‍රතිචාරයන් වශයෙන් ව්‍යාපෘති යම් කාල ප්‍රමාණයක් තුල වැඩීමට සැලැස්වීම හා ජාල ගොඩනැගීම මගින් සුවිශේෂි ප්‍රවේශයක් සැලකිල්ලට ගත්තේය. අධ්‍යයන පර්ෂදයේ මෙම හා අනෙකුත් නවෝත්පාදනයන් මෙම පරිච්ජේදය පුරාවටම විස්තර කර, ඇගයීමට ලක්කර ඇත. මෙම ඇගයීම සහභාගීවන්නන් හා පහසුකාරකවරුන්ගෙන් ලබාගත් ප්‍රතිපෝෂණය ලබාගෙන සිදු කරනු ලැබේ. එම ප්‍රතිපෝෂණ පාදක කරගනිමින් කලාපය පුරාම සිදු කරන සංක්‍රාන්තික යුක්ති පුහුණු හා පොදුවේ සිදු කරන පුහුණු පිළිබඳ සන්ධානය නිර්දේශ ඉදිරිපත් කරයි.

මෙම අධ්‍යයන පර්ෂදය ඇගයීමට තවමත් කල් තිබෙන බව සන්ධානය සඳහන් කිරීමට කැමතිය. විශේෂයෙන් කලාපයේ ගැටුම් පොළඹවන ප්‍රධාන සාධක කෙරෙහි ඇති කළ හැකි බලපෑම් වැනි කරුණු දැනට ඇගයීමට ලක්කළ නොහැකිය. එයට හේතුව වන්නේ මෙම පරිච්ජේදය ලිවීමට මාස කිහිපයකට පමණක් පෙර මෙම අධ්‍යයන පර්ෂදය අවසන් වීම වේ.

**වැඩමුළු සඳහා සමස්ථ, විෂයයාන්තර ප්‍රවේශයක් ගැනීම**

මෙම අධ්‍යයන පර්ෂදය සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ සහභාගීවන්නන්ගේ දැනුම හා එය තමන්ගේ පසුබිම්වලට අදාළ කරගන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම වැඩි දියුණු කළේය.

මූලධර්මය හෝ භාවිතය කෙරෙහි අවධානය යොමු කරන ලද අනෙකුත් පුහුණු වැඩසටහන් සමඟ සංසන්දනය කරන විට, අධ්‍යායන පර්ෂදයේ ඒකාබද්ධ ප්‍රවේශය, සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ සහභාගීවන්නන් පුහුණු කිරීම සඳහාත්, එය ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදෙන අභියෝග පිළිබඳ පුහුණු කිරීම සඳහාත් ඉතාම සාර්ථක ක්‍රමවේදයක් බව සහභාගීවන්නන් සැලකූහ. මේ ආකාරයෙන් සන්ධානයේ හවුල්කාර සංවිධාන වැඩමුළු සැසිවල විවිධ ආකාරයේ සංක්‍රාන්තික යුක්ති ගැටළු ආමන්ත්‍රණය කළහ. සිද්ධි අධ්‍යායන පදනම් කරගත් මූලධර්ම විස්තර කරන ඉදිරිපත් කිරීම් මඟිනුත්, ඔවුන්ගේ යෝජිත ව්‍යාපෘති පිළිබඳව සහභාගීවන්නන්ට තනි තනියෙන් ප්‍රතිපෝෂණය ලබාදීම මඟිනුත් සන්ධානයේ හවුල්කරුවන් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ විවිධ ගැටළු ආමන්ත්‍රණය කළහ. ඊට අමතරව අධ්‍යායන පර්ෂදයේ විෂයයාන්තර ස්වභාවය හේතුවෙන් සාම්ප්‍රදායික නොවන මාතෘකා ඇතුළත් ව්‍යාපෘති නිර්මාණය කිරීමට සහභාගීවන්නන්ට හැකියාවක් ලැබුණි. සත්‍යය පැවසීමේදී විද්‍යාත්මක සාක්ෂිවල කාර්යභාරය, වින්දිතයන්ගේ මනෝ සමාජයීය අවශ්‍යතා හා ස්වංය රැකවරණය වැනි මාතෘකා එයට ඇතුළත් විය. මේ සියලුම මාතෘකා ඔවුන්ගේ තත්ත්වයන්ට දැඩි ලෙස අදාළ වූ ඒවා විය. කලාපයේ පවතින සංක්‍රාන්තික යුක්ති ගැටළුවල විවිධත්වය පසුබිම තුළ විවිධ ක්ෂේත්‍ර හා ක්‍රියාවලීන් පිළිබඳ සන්ධානයේ හවුල්කරුවන්ගේ අත්දැකීම් සහභාගීවන්නන්ගේ පුළුල් පරාසයේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට වැදගත් වූ අතර, ඒවා සහභාගීවන්නන් මනා ලෙස පිළිගත්හ. හවුල්කරුවන්ගේ කුසලතා සම්බන්ධීකරණය කිරීම හේතුවෙන් වැඩමුළුවලට ඉතා කාර්යක්ෂම ආකාරයෙන් පහසුකම් සලසන ලදී. සන්ධානයේ නිපුණත්වය පවතින විවිධ ක්ෂේත්‍ර සන්ධාන හවුල්කරුවන්ගේ කාර්ය මණ්ඩලයෙන් හා ජාලවලින් සෘජුව ලබාගැනීම මෙයට හේතුව විය. බාහිර පුහුණුකරුවන් සඳහා වූ අවශ්‍යතාවයක් නොතිබිණි.

අධ්‍යාපන පර්ෂදය විසින් ප්‍රයෝජනයට ගන්නා ලද සමස්ථ ප්‍රවේශය නිර්මාණාත්මක ව්‍යාපෘති සඳහා අදහස් පෝෂණය කළා පමණක් නොව, සහභාගීවන්නන් බාහිර අරමුදල් සඳහා වූ අයදුම්පත් පිළියෙල කිරීමටත් දිරිගැන්වීමක් ලබාදුන්නේය. උදාහරණයක් වශයෙන් අධ්‍යායන පර්ෂදයේ අවසානයෙන් පසු යේමන් රටේ සහභාගීවන්නෙක් අපරාධ සිදු කළ පුද්ගලයන් වගවීමට ලක් කිරීමේදී සදානුස්මරණයේ කාර්යභාරය පිළිබඳ තමන් අධ්‍යායන ආයතනයේ ඉගෙනගත් අදහස් පාවිච්චි කරමින් නිර්මාණය කරන ලද සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘතියකට බාහිර අරමුදල් ලබාගත්තේය.

### සංක්‍රාන්තික යුක්තියේ සාර්ථකත්වයන් හා අභියෝගයන් සන්සන්දය කිරීම

අධ්‍යායන පර්ෂදය සිය වැඩමුළුවල සංසන්දානාත්මක ක්‍රමවේදයක් පාවිච්චි කළ අතර, තමන්ගේ රටවල්වල පවතින අවශ්‍යතා පිළිබඳ ගැඹුරින් සිතා බැලීමටත්, අනෙකුත් රටවල්වල පාඩම් ඒ සඳහා යොදා ගැනීමටත් ලෙසත් සහභාගීවන්නන්ට මඟ පෙන්විය. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය ද ඇතුළත්ව සන්ධානයේ හවුල්කාර සංවිධානවල කාර්ය මණ්ඩලය හා ජාත්‍යාන්තර උපදේශකවරුන්ගෙන් සමන්විත නිපුණතා සහිත පහසුකාරකවරුන් මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය හා අනෙකුත් කලාපවලින් සිද්ධි අධ්‍යායනයක් ඉදිරිපත් කළ අතර, මෙම තොරතුරු හා සහභාගීවන්නන්ගේ රටවල්වල පසුබිම්වලට එය අදාළ කරගත හැකි ආකාරය පරීක්ෂා කිරීම සඳහා කුඩා කණ්ඩායම් වැඩ හා සාකච්ඡා මෙහෙයවූහ. සන්ධානයේ හවුල්කාර සංවිධාන සංක්‍රාන්තික යුක්තිය හා සම්බන්ධ දුෂ්කරතාවයන් පෙන්වාදීම සඳහා රඟ දැක්වීම් හා භූමිකා රංගනයන් ද පාවිච්චි කළහ. මෙම සංසන්දනයන් කලාපීය වැඩමුළු පිළිබඳ වැඩි ඇගයීමකට මගපෑදූ අතර, සහභාගීවන්නන් අතර දැනුම බෙදා හදා ගැනීමට අවස්ථාවක් උදා කළේය. ඇත්ත වශයෙන්ම අනෙකුත් රටවල්වල පසුබිම්වල ක්‍රියාත්මක වූ හවුල්කාර සංවිධානවල අත්දැකීම්වලට සවන්දීම මඟින් අධ්‍යායන පර්ෂදයෙන් තමන් බොහෝ දැනුමක් ලබාගත් බව සමහර සහභාගීවන්නන් ප්‍රකාශ කළහ. මෙම ප්‍රවේශය දකුණු ඇමරිකාවේ රටවල් හා මොරෝකෝ යන රටවල්වල සිදු වූ බලහත්කාරයෙන් පුද්ගලයන් අතුරුදහන් කරන ලද සිදුවීම් පිළිබඳ පොදු ලක්ෂණයන් හඳුනාගැනීමට සහභාගීවන්නන්ට දැනුමක් ලබාදුන්නේය. අදාළ කරගත හැකි පාඩම් ද ඔවුන්

එයින් උකහා ගත්හ. ප්‍රතිඵලයක් වශයෙන් සංක්‍රාන්තික යුක්ති පියවරයන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණපෑමට සිදුවිය හැකි අභියෝගවලට සහභාගීවන්නන් මනා ලෙස සූදානම් විය. ඒ සඳහා ඔවුන් අනෙකුත් රටවල්වලින් පාඩම් ද ලබාගත්හ.

පහසුකාරකවරුන් විසින් මෙහෙයවන ලද සැසියන් හරහා සහභාගීවන්නන් ජාතික හා අන්තර් ජාතික නඩු පැවරීම්, සත්‍යය පැවසීම්, හානිපූරණ, ආයතනික සංශෝධන, මානව හිමිකම් ලේඛනගත කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට රැගෙන ඒම යන දේවල් පිළිබඳ තමන්ගේ අත්දැකීම් බෙදාහදා ගත්හ. පහසුකාරකවරුන් මෙම සාකච්ඡා කිසිදෙයක් නිර්දේශ නොකරන ආකාරයෙන් සිදු කළහ. එනම් පහසුකාරකවරුන් නිර්දේශ ඉදිරිපත් නොකර සහභාගීවන්නන්ට දැනුම හා මෙවලම් පමණක් ලබාදුන්හ. මෙම ප්‍රවේශය පාවිච්චි කිරීම මගින් ජාතික මට්ටමේ හා කලාපීය මට්ටමේ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ නිර්මාණාත්මකව හා සාමූහිකව සිතා බැලීමටත්, විද්වත් පහසුකාරකවරුන්ගේ අදහස්වල බලපෑම්වලට ලක්නොවී තමන්ගේම නිගමනයන්ට එළඹීමටත් සහභාගීවන්නන්ට අවකාශයක් ලබාදීම අධ්‍යායන ආයතනයේ අරමුණ විය. පර්ෂදයේ සංසන්දානාත්මක ක්‍රමවේදය තමන්ගේ රටවල් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි සංකල්පයන් පිළිබඳ තමන්ගේ දැනුම පුළුල් කළ බව බොහෝ සහභාගීවන්නන් කියා සිටියහ. උදාහරණයක් වශයෙන් සහභාගීවන්නන්ගේ ව්‍යාපෘති පිළිබඳ අදහස්, නඩු පැවරීම් හෝ සත්‍යය සෙවීමේ කොමිෂන් සභා හා සම්බන්ධ අදහස්වලට ඔබ්බෙන් විහිදී ගිය අතර, සදානුස්මරණය ද එයට ඇතුළත් විය.

*" කලාපීය ක්‍රියාධරයන් සමග බොහෝ වැඩමුළුවලට සහභාගී වීම මට සංක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රයේ සිදු කර ඇති වැඩකටයුතු විශ්ලේෂණය කිරීමටත් ඇගයීමට ලක් කිරීමටත් මට වැඩි හැකියාවක් ලබා දී ඇත. තව ද සංසන්දානාත්මක යැයි සැලකිය හැකි අතීත අත්දැකීම්වලින් ද මට ප්‍රයෝජනයක් ලබාගත හැකිය. අප මෙය ආරම්භ කරන්නේ කෙසේ ද අප ආරම්භ කරන්නේ කොතනින් ද යන කරුණු පිළිබඳ වැඩි දැනුමක් ලබාගැනීමට මට අවස්ථාවක් උදා විය."*

- සිරියානු රටේ සහභාගීවන්නෙක්

මෙම අධ්‍යායන පර්ෂදයෙන් දැනුම්වත් වීමට පෙර සදානුස්මරණය සංක්‍රාන්තික යුක්තියේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සමහර සහභාගීවන්නන් සැලකුවේ නැත.

සංක්‍රාන්තික යුක්තිය තවමත් ළඳරු අවධියේ පසුවන සිරියාව හා යේමන් යන රටවල සහභාගීවන්නන් දැනුම බෙදාහදා ගැනීම ඉතා ප්‍රයෝජනවත් බව සිතූහ. මෙයට හේතුව තවමත් මූලික අදියරයේ පසුවන තමන්ගේ රටේ ක්‍රියාවලීන් සඳහා තමන්ට බලපෑමක් කිරීමට හැකියාවක් තිබෙන බව මෙම සහභාගීවන්නන් සිතීම වේ. වගවීම ලබාගැනීමේ ඉහළ අදියරයන්වල සිටින රටවල්වල සහභාගීවන්නන්ට වඩා මෙම සහභාගීවන්නන්ට මෙම අවස්ථාව ලැබේ. ඉහළ අදියරවල නව මැදිහත්වීම් කිරීම සඳහා සීමිත අවස්ථා පමණක් ලැබෙනු ඇත.

**කලාපීය අත්දැකීම් බෙදාහදා ගැනීම හා ගැටුම හා සංක්‍රාන්තිය පිළිබඳ දෘෂ්ටිකෝණයන්**

මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ විවිධ රටවල්වල සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් හා අභියෝගයන් අවබෝධ කරගැනීම, සෑම සහභාගීවන්නෙකුටම තමන්ගේ රටවල්වල ඉදිරි ගමන පිළිබඳ යම් ගැඹුරු දැනුමක් ලබාදුන්නේය. ප්‍රාදේශීය ප්‍රජාවන් විශේෂයෙන් වින්දිතයන් හා වින්දිතයන්ගේ පවුල් සාමාජිකයන් සමඟ සබඳතා පැවැත්වීමේ වටිනාකම සහභාගීවන්නන් ඉගෙනගත් අතර, නව රටක් පිළිබඳ දැක්ම ඉදිරියට රැගෙන යාමට හා සම්බන්ධීකරණය කරන ලද සාමූහික ප්‍රයත්නයන්වලට මෙම සබඳතා වැදගත් වේ. එම නිසා තමන්ගේ රටවල්වල සංක්‍රාන්තික යුක්තිය මුහුණපා හැකි බාධකයන් බලාපොරොත්තු විය හැකි තමන්ගේ හැකියාව සහභාගීවන්නන් වැඩි දියුණු කරගත්හ. කලාපය පුරාම පවතින අභියෝග සැලකිල්ලට ගෙන, ඒවා බෙදාහදා ගැනීම මඟින් මෙය සිදු කරන ලදී. තව ද එක සමාන පසුබිම්වලින් ඉගෙන ගැනීම සඳහා කලාපයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කර තමන්ගේ රටවල පවතින ගැටුම හා වගවීම යන කරුණුවල ලක්ෂණ හඳුනා ගැනීමේ වැදගත්කම අධ්‍යායන පර්ෂදය ද නැවත තහවුරු කළේය.


එකිනෙක හා සම්බන්ධ සමානකම් හඳුනාගැනීමට අමතරව, ගැටුම්වලට මුහුණපාමින් සිටින රටවල්වලට අදාළ මාතෘකා දැනට සංක්‍රාන්තික යුක්ති පියවරයන් ක්‍රියාත්මක කරන රටවල්වල සහභාගීවන්නන්ට අදාළ නොවන බවත්, ඒවගේම සංක්‍රාන්තික යුක්ති පියවරයන් ක්‍රියාත්මක කරමින් සිටින රටවල්වල මාතෘකා ගැටුම් පවතින රටවල්වලට අදාළ නොවන බවත් සමහර සහභාගීවන්නන් සිතූහ. කෙසේවෙතත්, සියලුම සහභාගීවන්නන් අදාළත්වය විවිධ ප්‍රමාණයන් සහිතව එකිනෙකාගෙන් පාඩම් ඉගෙන ගත්හ.

**ප්‍රජා මූලික කලාපීය සංක්‍රාන්තික යුක්ති ජාලයක් ස්ථාපිත කිරීම**

එකම කණ්ඩායම හතර වතාවක් එක්රැස් වූ හෙයින් මෙම අධ්‍යායන පර්ෂදය සහභාගීවන්නන් අතර සබඳතාවයක් පෝෂණය කළ අතර, එය මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාප ජාලයේ ක්‍රියාකාරකම්වල තිරසාරභාවය කෙරෙහි දීර්ඝ කාලීන බලපෑමක් ඇති කරනු ඇත. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපීය මට්ටමේ ජාලගත වීමට තමන්ට අවස්ථාවක් ලබාදීම පිළිබඳ සහභාගීවන්නන් ස්තූතිය පළකල අතර, කලාපීය සහයෝගීතාවය තමන්ගේ අධිවාචන කටයුතු ශක්තිමත් කිරීමට උපකාරීවනු ඇතැයි ඔවුන් සිතූහ. විශේෂයෙන් නිතිපතා ප්‍රාදේශීය බලධාරීන් විසින් හිරිහැරවලට ලක් වූ සහභාගීවන්නන්, කලාපීය ජාලගතවීම දැඩි ලෙස ඇගයීමට ලක්කළහ. එයට හේතුව තමන්ගේ රටේ ඔවුන් මුහුණපාන ආරක්ෂාව පිළිබඳ අවදානම් තත්ත්වයන් ප්‍රාදේශීය මට්ටමේ අන් අය සමඟ ඔවුන් සම්බන්ධ වීම වැළැක්වීම වේ. තව ද කලාපීය හා ජාත්‍යාන්තර මට්ටම්වල සහයෝගය ලබාදීම හා ලබාගැනීම පිළිබඳ ආරක්ෂක හැඟීමක් ද සහභාගීවන්නන්ට ඇති විය. සහභාගීවන්නන් කලාපීය හා ජාත්‍යාන්තර පුද්ගලයන් හා සංවිධාන සමඟ සම්බන්ධ කිරීම මඟින් පර්ෂදය ඔවුන්ගේ තත්ත්වය ඉහළ නැංවීය. එය පලිගැනීමේ ක්‍රියාකාරකම්වලින් ඔවුන්ව ආරක්ෂා කර ගැනීමට උපකාරී වනු ඇත.

*" කලාපීය අත්දැකීම් පිළිබඳ විස්තාරාත්මක හා නිශ්චිත තොරතුරු, විවිධ රටවල්වල දැනට පවතින උල්ලංඝනයවීම් රටාවන්වල පරිමාණයන් හා පසුබිම් අවබෝධ කරගැනීමට ඉතා වැදගත් වේ. මෙම අත්දැකීම් හා තොරතුරු ටියුනීෂියාවේ අනුස්මරණ ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට මට උපකාරීවනු ඇත. ඉතා වැදගත් ලෙස ඒවා ටියුනීෂියාවේ හා මේ කලාපයේ සිටින අනෙකුත් ක්‍රියාධරයන්ට මා විසින් ලබාදිය හැකි පුහුණු වැඩසටහන්වලට ද උපකාරී වනු ඇත."*

- ටියුනීෂියාවේ සහභාගීවන්නෙක්



යෙමෙන් රටේ මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු සංක්‍රාන්තික යුක්ති අධ්‍යායන පර්ෂදයේ මුලයාධාරයෙන් ක්‍රියාත්මක කරන ලද සුළු අරමුදල් ව්‍යාපෘතියකදී ගැටුමේ මූලික හේතු විශ්ලේෂණය කිරීම සඳහා ගසක් මෙවලමක් ලෙස පාවිච්චි කරන ලදී.

සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ක්‍රියාධරයන්ගේ කලාපීය ජාලය සමඟ අඛණ්ඩව සම්බන්ධ වීම කෙරෙහි සහභාගීවන්නන් උනන්දුවක් දැක්වූහ. එය හරහා දැනුම බෙදාහදා ගැනීමටත්, අනාගත ව්‍යාපෘතිවල සහයෝගයෙන් කටයුතු කිරීමටත්, අධ්‍යයන පර්ෂදය හරහා සංවර්ධනය කර ඇති සම්පත් තිරසාරව තබාගැනීමටත් ඔවුන් අදහස් කළහ. තමන්ගේ උප අරමුදල් ව්‍යාපෘති සඳහා සහභාගීවන්නන් විසින් නිර්මාණය කරන ලද විෂය මාලාව හා අධ්‍යාපන ලේඛන මෙම සම්පත් වේ. උදාහරණයක් ලෙස අධ්‍යයන පර්ෂදය අවසන් වීමෙන් පසු සහභාගීවන්නන් එකිනෙකා සමඟ අවිධිමත් ආකාරයෙන් සන්නිවේදනය පවත්වාගෙන ගොස් තිබේ. සම්පත් බෙදාහදා ගැනීම, යාවත්කාලීන කරන ලද තොරතුරු ලබාදීම, ඊමේල් හා සමාජ ජාල හරහා අදහස් හුවමාරු කරගැනීම යන කරුණු ද මෙයට ඇතුළත් වේ. විශේෂයෙන් තමන්ගේ රටවල්වල පවතින දේශීය මතයන් පිළිබඳ ඔවුන් ලිපි ගණුදෙනු කරගෙන ඇත. එවැනි මතයන් සාමාන්‍යයෙන් කලාපීය හා ජාත්‍යාන්තර ප්‍රධාන පෙළේ මාධ්‍යය විසින් ආවරණය නොකරනු ලැබේ.

**ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් සංක්‍රාන්තික යුක්ති පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීම**

අධ්‍යයන පර්ෂදය හා එහි න්‍යායපත්‍රය පිළිබඳ තමන්ට පාලනයක් තිබෙන බව බොහෝ සහභාගීවන්නන් සිතූහ. තව ද මෙම පර්ෂදය ප්‍රාදේශීය විශේෂඥයන් වශයෙන් කටයුතු කිරීමටත්, අන් අය සඳහා සම්පත්දායක වශයෙන් කටයුතු කිරීමටත්, කලාපීය සංක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් සඳහා සහයෝගය ලබාදෙන්නන් වශයෙන් කටයුතු කිරීමටත් තමන්ව සුදානම් කර ඇති බව ඔවුන් විශ්වාස කළහ. වැඩසටහන් සඳහා තමන්ගේ අයිතිය පිළිබඳ හැඟීම, දීර්ඝකාලීන ප්‍රතිලාභ හා ධනාත්මක ප්‍රතිඵල ලබාගත හැකි තත්ත්වය පෙන්වාදෙයි. සහභාගීවන්නන්ගේ සහභාගීත්වය හා අධ්‍යයන පර්ෂදයේ ආයතනික දැනුම තවදුරටත් තිරසාරව තබාගැනීම සඳහා පර්ෂදය වෙනුවෙන් අරාබි භාෂාවෙන් නිර්මාණය කර ඇති නිශ්චිත සම්පත් සහභාගීවන්නන්, සන්ධානයේ හවුල්කරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන් යන කණ්ඩායම්වලට අන්තර්ජාල පුස්තකාලයක් හරහා ලබාදෙනු ඇත. මෙම සම්පත්වලට සහභාගීවන්නන් විසින් ඉහළ පෙළේ කලාපීය සංක්‍රාන්තික යුක්ති විශේෂඥයන් සමඟ පවත්වන ලද වීඩියෝ සම්මුඛ සාකච්ඡා හතක් (එම විශේෂඥයන් සහභාගීවන්නන්ගේ රටවල්වල ජාලයන්වල කොටසක් විය) ද ඇතුළත් විය. ඉදිරියේ දී මෙම අන්තර්ජාල පුස්තකාලය අධ්‍යයන පර්ෂදයේ වැඩමුළු හා සහභාගීවන්නන්ගේ ව්‍යාපෘති හරහා ලබාගෙන ඇති දැනුම සංරක්ෂණය කිරීමටත්, බෙදා හැරීමටත් කටයුතු කරනු ඇත.

*“ සංක්‍රාන්තික යුක්තිය අවධානය යොමු කළ හැකි (යුද්ධයට සම්බන්ධ නොවන) අනෙකුත් ගැටලු ද තිබේ..... විශේෂයෙන් ආන්තික හා පහසුකම් අඩු කණ්ඩායම් සඳහා ආර්ථික හා සමාජ සහයෝගය ලබාදීමට අදාළ ගැටලු ලෙස ඒවා සඳහන් කළ හැකිය. උදාහරණයක් වශයෙන් ලොව පුරා ආර්ථික, දේශපාලනික හා සාමාජයී වශයෙන් කොන් කර ඇති ප්‍රජාවන් සිටිති. ඔවුන්ට ආර්ථික, දේශපාලන හා සමාජ සවිබල ගැන්වීම හරහා යුක්තිය ලබාදිය යුතුය.”*

- යේමන් රටේ සහභාගීවන්නෙක්



අභයන් ප්‍රදේශයෙන් අල්කයිඩා සංවිධානය ඉවත්වීමෙන් පසු ගැටුම් විශ්ලේෂණය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න පිළිබඳ අභයන් ප්‍රදේශයේ සහභාගීවන්නන් සාකච්ඡා කරති. 2016 නොවැම්බර් මාසයේ මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු සංක්‍රාන්තික යුක්ති අධ්‍යායන පර්ෂදයේ මූල්‍යාධාරයෙන් යේමන් රටේ පවත්වන ලද වැඩමුළුවක දී ඔවුන් මෙම සාකච්ඡාවේ යෙදී සිටිති.

තමන්ගේ විශේෂඥ දැනුම පාවිච්චි කරමින් බොහෝදුරට විධිමත් කලාපීය ජාලයක් ස්ථාපිත කිරීමේ හැකියාව ද සහභාගීවන්නන් ගවේෂණය කරති. මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය පුරා සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ තොරතුරු ලබාදීම සඳහාත්, හඬ නැගීම සඳහාත් මෙම ජාලය පිහිටුවීමට බලාපොරොත්තු වේ. ඉහත කී අධ්‍යායන පර්ෂදය සාර්ථක ප්‍රයත්නයක් බව සහභාගීවන්නන්, අරමුදල් සපයන්නන් හා සන්ධානයේ හවුල්කරුවන් සිතන හෙයින් එය 2017 වසරේ අග භාගයේ දී මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු ක්‍රියාධරයන්ගේ දෙවැනි කණ්ඩායමක් සඳහා අලුත් කරන ලදී. දෙවැනි අධ්‍යායන පර්ෂදය සඳහා පළවෙනි පර්ෂදයේ ඉතාම බලවත් සහභාගීවන්නන් ආරාධිත පහසුකාරකවරුන් වශයෙන්, ආරාධනා කරනවාද යන කරුණ හවුල්කරුවන් සලකා බලමින් සිටිති. අවසාන වශයෙන්, අධ්‍යායන පර්ෂදයේ න්‍යායපත්‍රය විවිධ කලාපවලට මාරුකළ හැකි එකක් බවත්, සංක්‍රාන්තික යුක්ති ගැටළුවලට අදාළ කරගත හැකි ඒකක් බවත් සන්ධානයේ හවුල්කරුවන් හා සහභාගීවන්නන් විශ්වාස කරති. ඒ අනුව සන්ධානයේ හවුල්කරුවන් හා පළවෙනි කාණ්ඩයේ අය දකුණු ආසියාව වැනි සංක්‍රාන්කිත යුක්තිය පිළිබඳ අභියෝගවලට මුහුණදෙන තවත් කලාපයක මෙවැනි අධ්‍යායන පර්ෂදයක් ස්ථාපිත කිරීම දිරිගන්වා ඇත.

### වැඩමුළුවල සෑම අදියරයකම ප්‍රජා පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම

අධ්‍යායන පර්ෂදය න්‍යාය පත්‍රය සකස් කිරීම ඇතුලුව සියලුම අදියරයන්වල දී සහභාගීවන්නන් සම්බන්ධ කර ගත්තේය. එය එම ආයතනයේ අරමුණු, ඉලක්කයන්, ක්‍රමවේදය හා විෂය මාලාව සහභාගීවන්නන්ගේ අවශ්‍යතාවලට අදාළ වීම තහවුරු කළේය. මෙම කරුණු ඔවුන්ගේ අයදුම්පත්වලින් හා සන්ධානයේ හවුල්කරුවන්ගේ අත්දැකීම්වලින් රැස් කරන ලදී. උදාහරණයක් වශයෙන් දෙවැනි හා තෙවැනි වැඩමුළුවල අවසානයේ දී ඊළඟ වැඩමුළුව සඳහා කලින් තීරණය කරන ලද මාතෘකා හතකින් සමන්විත ලැයිස්තුවකින් උප මාතෘකා දෙකක් තෝරාගන්නා ලෙස පහසුකාරකවරුන් සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටියහ. සහභාගීවන්නන්ගේ ප්‍රමුඛතා මඟින් න්‍යාය පත්‍රය සැකසීම තහවුරු කිරීම පිණිස මෙම ඉල්ලීම ඉදිරිපත් කරන ලදී. මේ ආකාරයෙන් අධ්‍යායන පර්ෂදය සහභාගීවන්නන්ගේ අවශ්‍යතා හවුල්කරුවන්ගේ නිපුණතා ක්ෂේත්‍ර සමඟ සම්බන්ධීකරණය කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩමුළු පුළුල් පරාසයේ සංක්‍රාන්තික යුක්ති ගැටළු කාර්යක්ෂම

ලෙස ආමන්ත්‍රණය කළ අතර, අදාළ ලිපි ලේඛන තමන්ගේ පසුබිම අනුව සකසා ගැනීමටත් සහභාගීවන්නන්ට අවස්ථාවක් ලබා දුන්නේය. න්‍යායපත්‍රයේ සැකසීමේ දී සහභාගීවන්නන් ඇතුළත් කරගැනීමේ අදහස් විමසීමේ ක්‍රියාවලිය මෙහි අයිතිය පිළිබඳ ගැඹුරු හැඟීමක් ඔවුන් තුළ ඇති කළේය.

තව ද මෙම වැඩමුළු මඟින් නිතිපතා අත්දැකීම් හුවමාරු කරගැනීමටත්, ආරක්ෂක උපාය මාර්ග සැලසුම් කිරීමටත් සහභාගීවන්නන්ට අවස්ථාව ලබාදීම මගින් ආරක්ෂාව පිළිබඳ ඔවුන්ගේ ප්‍රශ්න ආමන්ත්‍රණය කරන ලදී. අත්දැකීම් බෙදාහදා ගැනීම ආරක්ෂක තර්ජන පිළිබඳ සහභාගීවන්නන්ගේ අවබෝධය වැඩි කිරීමටත්, ඒවා වළක්වන්නේ කෙසේදැයි දැනුම්වත්වීමටත් ඉතාම ඵලදායී මාර්ගයක් විය. උදාහරණයක් වශයෙන් වැඩමුළුවේ සිදුවූ සංවාද හේතුවෙන් සමහර සහභාගීවන්නන් ජංගම දුරකථන සඳහා ආරක්ෂිත පණිවිඩ යැවීමේ ක්‍රමයක් වන ටෙලිග්‍රෑම් ක්‍රමය පාවිච්චි කිරීමට පටන් ගත්හ. එය කලින් ඔවුන් සිදුකළ ආකාරයට මුර වචනවලින් තොර පණිවිඩ යැවීම වෙනුවට මුරවචන සමඟ පණිවිඩ යැවීමට අවස්ථාව ලබාදුන්නේය. අනාරක්ෂිත වටපිටාවල අරමුදල් රැස් කිරීමේ දී මුහුණදීමට සිදුවන අභියෝග පිළිබඳ කරන ලද වෙනම සාකච්ඡාවක දී අරමුදල් සපයන්නන් අදාළ රට තුළ පවතින අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් තමන්ගේ සහයෝගය ඉවත් කරගැනීම පිළිබඳ සහභාගීවන්නන් තමන්ගේ කණස්සල්ල පළකර සිටියහ. අරමුදල් සපයන්නන්ට ඒත්තු ගන්වන ආකාරයේ වැඩසටහන් ආරක්ෂාකාරීව ක්‍රියාත්මක කිරීමේ තමන්ගේ හැකියාව පෙන්වාදෙන්නේ කෙසේදැයි ඔවුන් සිතා බැලූහ. මෙයට ප්‍රතිචාරයක් වශයෙන් මූල්‍යාධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන සෑම යෝජනාවකම අවදානම් පිළිබඳ ඇගයීමක් - එය අවශ්‍ය නොවුනත් - ඇතුළත් කළ යුතු බව සහභාගීවන්නෙක් නිර්දේශ කළේය. මුහුණදිය හැකි තර්ජන අවම කිරීම සඳහා සංවිධානය ක්‍රියාත්මක වී තිබෙන ආකාරය හා මූල්‍යාධාර ආරක්ෂක තත්ත්වයන් වැඩි දියුණු කරන ආකාරය පෙන්වාදීම සඳහා මෙය අවශ්‍ය වේ. මෙම යෝජනාව ඉතා වැදගත් හා අදාළ බව අනෙකුත් සහභාගීවන්නන් කල්පනා කළහ.

### ප්‍රජා පාර්ශවකරුවන් සවිබල ගැන්වීම හා සියලු දෙනාම ඇතුළත් කරගන්නා ව්‍යාපෘති සංවර්ධනය කිරීම

මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ ජීවත්වන බොහෝ දුර්වල කණ්ඩායම් -කාන්තාවන්, ළමයින් හා සරණාගතයන් වැනි කණ්ඩායම්- ගැටුම හා අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටිති. එම නිසා මෙම කලාපයේ සියලුදෙනාම ඇතුළත් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම් සඳහා දැඩි අවශ්‍යතාවයක් පවතී. ප්‍රාදේශීය ප්‍රජාවන් හා සාම්ප්‍රදායික නොවන ක්‍රියාධරයන් ප්‍රාදේශීය අවශ්‍යතා හා අවබෝධ පදනම් කරගනිමින් සියලු දෙනාම ඇතුළත් කරගන්නා සංක්‍රාන්තික යුක්තිය ශක්තිමත් කරන්නේ කෙසේදැයි යන කරුණ පිළිබඳව දැනටමත් පර්ෂදය සන්ධානයේ හවුල්කරුවන් හා පර්ෂදයේ සහභාගීවන්නන් අතර විශ්ලේෂණයන් හා ගැඹුරු සිතුවිලි ප්‍රවර්ධනය කර ඇත. ධාරිතාව ගොඩනැගීම හරහා හා ප්‍රජා මූලික ක්‍රියාකරකම් සඳහා මූල්‍ය හා නවීන තාක්ෂණ සහයෝග ලබාදීම මඟින් අවශ්‍යතා ඇගයීම් සිදු කිරීම සඳහාත්, සහභාගීත්ව ප්‍රවේශයන් පාවිච්චි කරමින් සංක්‍රාන්තික යුක්ති වැඩසටහන් සැලසුම් කිරීම සඳහාත්, පර්ෂදය සහභාගීවන්නන්ගේ හැකියාව වැඩි දියුණු කර ඇත. සියලු දෙනාම ඇතුළත් කරගන්නා භාවිතය පිළිබඳ සහභාගීවන්නන් සංවේදී කිරීමේ දී අධ්‍යයන පර්ෂදයේ කාර්ය සාධනීය තත්ත්වය මෙය පෙන්වාදෙයි. සියලු දෙනාම ඇතුළත් කරගැනීමේ අවශ්‍යතාවය සඳහා සහභාගීවන්නන් පුහුණු කිරීම ඉතා දුර්වල කණ්ඩායම් අදහස් විමසීම් හා ක්‍රියාවලීන්වල සම්බන්ධ කරගැනීම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩි වශයෙන් පසුබිමට අදාළ සංක්‍රාන්කිත යුක්ති ක්‍රියාකාරකම් නිර්මාණය වනු ඇත.

## සංක්‍රාන්තික යුක්තියේ කාන්තාවන් සහභාගී කරගැනීම

සියලු දෙනාම ඇතුළත් කරගැනීම පිළිබඳ කාන්තාවන් මුහුණදෙන සංක්‍රාන්තික යුක්ති අභියෝගයන් සඳහා කලාපීය ප්‍රතිචාරයක් නිර්මාණය කිරීමට අධ්‍යයන පර්ෂදය දායකත්වයක් ලබා දී ඇත. කලාපය පුරා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පවතින බවත්, කාන්තාවන් ආර්ථික වශයෙන් අනාරක්ෂිත තත්ත්වයක සිටින බවත් වැඩමුළුවේ සාකච්ඡා මගින් තහවුරු කරන ලදී. ගැටුම සඳහා විශේෂ අවදානය අවශ්‍ය වීම මෙයට හේතුව වේ. පහසුකාරකවරුන් මේ පිළිබඳ සංසන්දනාත්මක උදාහරණ මගින් ඉදිරිපත් කළහ. එම උදාහරණ ගැටුම සිදු වූ කාලවකවානුවේ දී කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ සංකීර්ණ හා විවිධ වූ අත්දැකීම් ඉදිරිපත් කරන ලදී. සංක්‍රාන්තික යුක්තිය මගින් ඔවුන්ගේ තත්ත්වය ආමන්ත්‍රණය කළ හැක්කේ කෙසේදැයි යන කරුණ ද එය පෙන්වා දුන්නේය. උදාහරණයක් වශයෙන් සත්‍යය පැවසීමේ මූලපිරීම්, ස්ත්‍රී පුරුෂ සමාජභාව පිළිබඳ සංවේදී සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම තහවුරු කළ හැකිය.

*"මෙම විද්‍යාපීඨය මගේ විශ්වාසයන් වෙනස්කර තිබෙනවා; [විද්‍යාපීඨය ආරම්භ වීමට පෙර] සංක්‍රාන්තික යුක්තිය හා එහි යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මා උනන්දුවෙන් සිටියා....යේමන් රටේ පවතින සංස්කෘතික හා සමාජ සුවිශේෂී තත්ත්වයන් සැලකිල්ලට නොගෙන මා එසේ උනන්දුවක් දැක්වුවා."*

- යේමන් රටේ සහභාගීවන්නෙක්

සන්ධානය ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව ඇති කිරීම කෙරෙහි කැපවීමෙන් කටයුතු කරන අතර, තෝරාගත් සහභාගීවන්නන් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය ළඟා කරගැනීම සඳහා හවුල්කාර සංවිධාන උත්සාහ දරා ඇත. ව්‍යාපෘතිය ආරම්භයේ සිට අයදුම්පත් සමාලෝචනය කරන අවධිය පුරා මෙම කරුණ සැලකිල්ලට ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පර්ෂදයේ තමන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව නිම කළ සහභාගීවන්නන් දහ නවදෙනා අතරින් අට දෙනෙක් කාන්තාවන් වූහ. තව ද කලාපයේ සංක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්වල කාන්තාවන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කරගන්නේ කෙසේ දැයි පිළිබඳ උපාය මාර්ග සැලසුම් කිරීම සඳහා පර්ෂදය සහභාගීවන්නන්ට අවස්ථාවක් ලබා දුන්නේය. කාන්තා සහභාගිත්වය වැඩි දියුණු කරගැනීම හැම කරුණකදීම පොදු තේමාවක් වූ අතර, තමන්ගේ සෑම පසුබිමකටම එය අදාළ දෙයක් බව සහභාගිවන්නන් හඳුනා ගත්හ. කාන්තා සහභාගීත්වය ස්ථාපිත කර, අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උප අරමුදල් හරහා සමහර ව්‍යාපෘතින්වලට අරමුදල් සපයන ලදී. උදාහරණයක් වශයෙන් ඉරාක් රටේ කාන්තා සහභාගිවන්නියක් මානව හිමිකම් ලේඛනගත කිරීම, පොදු නායකත්ව කුසලතා හා අන් අය ලේඛනගත කිරීමේ කටයුතුවල පුහුණු කරන ආකාරය යන කරුණු පිළිබඳ කාන්තාවන් තිස් දෙනෙක් හා පිරිමින් දහ දෙනෙකුගෙන් යුතු කණ්ඩායමකට පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත් වූවාය. මේ සියලුම දේවල් අනාගත ජාතික සංහිඳියා ක්‍රියාවලියේ පාවිච්චි කිරීම සඳහා වින්දිතයන්ගෙන් සාක්ෂි රැස් කිරීමට පුහුණුවන්නන්ට උපකාරී විය. උප අරමුදල් සපයන මෙම ව්‍යාපෘති මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘතිවල කාන්තාවන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීමට නියත වශයෙන්ම දායකවනු ඇත. එය තවත් පැත්තකින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන සිදු කරන ප්‍රචණ්ඩත්වයට අර්ථාන්විත ලෙස සහන සැලසීම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය.

**ව්‍යාපෘති වැඩීමට අවස්ථා සැලසීම හා උප අරමුදල් සැපයීම හරහා ප්‍රජා මූලික ව්‍යාපෘතිවලට සහයෝගය දැක්වීම**

පර්ෂදයේ සුවිශේෂී උප අරමුදල් සැපයීමේ අංශය හරහා ප්‍රජා අදහස් විමසීම, අවශ්‍යතා ඇගයීම් හා අනෙකුත් මැදිහත්වීම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම යන ක්‍රියාකාරකම් සඳහා සහභාගීවන්නන් කුඩා මුදල් ප්‍රමාණයන් ලබාගත්හ. මෙම අරමුදල් සැපයීම හා ඊට අදාළ සහභාගීත්ව ප්‍රවේශයන්ට ප්‍රමුඛතාවය ලබාදීම තමන්ගේ ව්‍යාපෘති ප්‍රජාවගේ අවශ්‍යතා ඉටුකරන ආකාරයේ සැලසුම් කරගැනීමට සහභාගීවන්නන්ට හැකියාවක් ලබාදුන්නේය. වින්දිතයන්, තරුණ තරුණියන්, කාන්තාවන් හා ක්‍රියාධරයන් වැනි සියලුදෙනාගේ අවශ්‍යතා එයට ඇතුළත් විය. මෙම ආකාරයෙන් උප අරමුදල් සැපයීම ඉතා දුර්වල කණ්ඩායම් ද ඇතුළුව පීඩාවට පත්ව සිටින ප්‍රජාවන්ට අදාළ වන සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරකම් නිර්මාණය කර, ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබාදුන්නේය. එවැනි ව්‍යාපෘති එම කණ්ඩායම්වල අවශ්‍යතා හා අභිලාෂයන් සාර්ථකව ඉටු කළ හැකිය. උදාහරණයක් වශයෙන් සිරියා හා ටියුනිෂියා යන රටවල මානව හිමිකම් ලේඛනගත කිරීම, ඉරාකයේ හානිපූර්ණය පිළිබඳ ජනතා අදහස් විමසීම හා මොරොක්කෝවේ සදානුස්මරණය යන ක්‍රියාකාරකම් සඳහා මෙවැනි උප අරමුදල් මගින් දායකත්වයක් ලබා දී තිබුණි. ඇල්ජීරියාව, ඊජිප්තුව, ඉරාකය, මොරොක්කෝ, සිරියා, ටියුනිෂියා හා යේමන් යන රටවල් හතක ව්‍යාපෘති දහ නවයක් ක්‍රියාත්මක කරන ලද අතර, එය මෙම කලාපයේ සංක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රය කෙරෙහි බලපෑමක් ඇති කළේය. විශේෂයෙන් මානව හිමිකම් ලේඛනගත කිරීම, හානිපූර්ණ හා සදානුස්මරණ කටයුතු කෙරෙහි එය බලපෑමක් ඇති කළේය.

ව්‍යාපෘතිය මේරීමට කාලයක් ලබාදීම සමහර සහභාගීවන්නන්ට පර්ෂදය විසින් ලබාදෙන ලද ඉතා අගනා සහයෝග මූලාශ්‍රයක් විය. එක්කෙනා විසින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා හා පහසුකාරකවරුන් විසින් තනි තනිව ලබාදෙන ලද ප්‍රතිපෝෂණ හා සහභාගිවන්නන් එකිනෙකාට ලබාදෙන ප්‍රතිපෝෂණ හේතුවෙන් තමන්ගේ තත්ත්වය පදනම් කරගෙන ව්‍යාපෘති සංවර්ධනය කිරීමේ නිදහස සහභාගීවන්නන්ට ලබාගත හැකි විය. මූල්‍යධාර සපයන අයගේ බාහිර ප්‍රමුඛතා අනුව ඔවුන් තමන්ගේ ව්‍යාපෘති සැකසීමේ අවශ්‍යතාවක් නොතිබිණි. තමන් තෝරාගෙන තිබෙන ව්‍යාපෘති ආරක්ෂාකාරීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම හා මෙවලම් තමා ලබාගෙන ඇති බව ද සහභාගීවන්නන්ට හැඟීමක් ඇති විය. අවශ්‍යතා ඇගයීම් හා ප්‍රජා අදහස් විමසීම් පිළිබඳ ලබාගෙන ඔවුන් ඇති පුහුණුව හරහා ව්‍යාපෘති සැලසුම් කිරීමේ සියලුම අංගයන් ප්‍රජා සාමාජිකයන්ගේ අදහස් හා අවශ්‍යතා මත ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සහභාගීවන්නන් අවබෝධ කරගත්හ. තව ද සන්ධානයේ හවුල්කරුවන් උප අරමුදල් සැපයීමේ සංරචකය දැඩි ලෙස අගය කළහ. එයට හේතුව එය අධ්‍යයන පර්ෂදය ක්‍රියාත්මක වූ කාලයේ රැස් කරගෙන තිබුණු දැනුම ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාවක් ලබාදීම වේ.

ටාකියෝ පළාතේ සාමූලා ඝාතන අනුස්මරණ ස්ථානයක් විවෘත කිරීමට සහභාගී වන සිසුන්

**තමන්ගේ හා සම්මුඛ සාකච්ඡාවන්ට ලක්කරන පුද්ගලයන්ගේ මනෝ-සමාජයී අවශ්‍යතා පාලනය කිරීමට ප්‍රාදේශීය ප්‍රජාවට පුහුණුවක් ලබාදීම**

මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ සිදු කරන ලද සංක්‍රාන්තික යුක්ති මැදිහත්වීම්වල දැඩි කම්පනය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව වැඩි වශයෙන් ඇතුළත් වී තිබුණේ නැත. කෙසේවෙතත්, පර්ෂදය එවැනි පුහුණුවක් ක්‍රියාත්මක කළේය. එම පුහුණුව මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ තමන්ගේ ප්‍රාථමික හා ද්විතියික අත්දැකීම් පාලනය කරගැනීමටත්, ගැටුමට අදාළ දැඩි කම්පනය පාලනය කරගැනීමටත්, අඛණ්ඩව සිදුවන හිරිහැරවලට මුහුණදීම සඳහාත් ඔවුන්ගේ හැකියාව වැඩි දියුණු කළේය. ප්‍රචණ්ඩත්වය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යයන ආයතනයේ මූලිකත්වයෙන් පවත්වන ලද ස්වයං

රැකවරණය පිළිබඳ සැසියන් හරහා දැඩි කම්පනය පිළිබඳ රෝග ලක්ෂණ අධීක්ෂණය කිරීමටත්, තමන්ව හෝ වින්දිතයන් නැවත දැඩි කම්පනයට පත් නොකර, වින්දිතයන් සම්මුඛ සාකච්ඡා කිරීමටත් අවශ්‍ය විධික්‍රමයන් සහභාගිවන්නන් ඉගෙනගත්හ. අධ්‍යායන පර්ෂදයේ සහභාගීවන්නන් වැඩ කරන ඉතා අනතුරුදායක තත්ත්වයන් හා ඔවුන් ඉහළ මට්ටම්වල ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන තත්ත්වයන් හේතුවෙන් ස්වයං රැකවරණය පිළිබඳ සැසිය තමන්ගේ මනෝ-සමාජයී අවශ්‍යතාවලට ඉතා වැදගත් ලෙස අදාළ වන ලෙස බොහෝ අය සිතූහ. මීට අමතරව ස්වයං රැකවරණයේ වැදගත්කම නැවත නැවත අවධාරණය කිරීම තමන්ට ඉතා උපකාරී වූ බව බොහෝ සහභාගීවන්නන් සැලකූහ. එයට හේතුව ඔවුන් සහභාගී වී ඇති අනෙකුත් වැඩසටහන් මනෝ-සමාජයී සහයෝගය සඳහා වූ තමන්ගේ පුද්ගලික අවශ්‍යතාවලට ප්‍රමුඛතා ලබානොදීම වේ. පර්ෂදය තමන්ගේ න්‍යාය පත්‍රය තුළට දැඩි කම්පනය පිළිබඳ සාකච්ඡා ඇතුළත් කරගැනීම මගින් සංක්‍රාන්තික යුක්තිය වින්දිතයන්ගේ දෘෂ්ටි කෝණයෙන් බැලීමට සහභාගීවන්නන්ට දැනුමක් ලබා දුන්නේය. එය එහි විෂයයාන්තර ප්‍රවේශයේ කාර්ය සාධනීය තත්ත්වය පෙන්වාදෙයි.



යේමන් රටේ GIJTR සංවිධානයේ උප අරමුදල් සැපයීම මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක සහභාගීවන්නන්, නොවැම්බර් 2016.

ටේකෝ පළාතේ සමූල ඝාතන ස්මාරකයක් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වූ සිසුන්

# පරිච්ඡේදය 5 :

# සිවිල් සමාජයේ ලේඛනගත කිරීමේ කටයුතු හා අපරාධ සඳහා වගවීම

### සිවිල් සමාජය මඟින් සිදු කරන මානව හිමිකම් ලේඛනගත කිරීම

මානව හිමිකම් ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය වින්දිතයන්ට හඬක් ලබාදෙන අතර, මහජනතාව ඉතිහාසය අවබෝධ කරගන්නා ආකාරය හැඩගස්වා, අපරාධවලට හා අපරාධ නොවන ක්‍රියාවන්වලට වගවීම ලබාගැනීමට දායකත්වයක් ලබාදෙයි. සන්නද්ධ ගැටුම් හා මානුෂීය ආර්බුද ඇතිවන ඕනෑම අවස්ථාවක සිවිල් සමාජ සංවිධාන පළමුවෙන්ම ඒවාට ප්‍රතිචාර දක්වන අතර, ඒ පිළිබඳ වටිනා ලේඛන, භෞතික හා අනෙකුත් සාක්ෂි රැස්කරති. යුධ කලාපවල සිවිල් සමාජ සංවිධාන බොහෝ අවස්ථාවල -විශේෂයෙන් රාජ්‍ය සහයෝගය නොමැති අවස්ථාවල- නිරවද්‍ය තොරතුරු සඳහා වූ එකම විශ්වසනීය මූලාශ්‍රයක් වශයෙන් කටයුතු කරති. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිවිල් සමාජ සංවිධාන අපරාධ සඳහා වගවීම ළඟා කරගැනීමේ අරමුණෙන් සාක්ෂි රැස්කර, සංරක්ෂණය කර, සාක්ෂි පිළිබඳ දැනුම්වත්භාවය වැඩි කිරීමේ හැකියාව සතුව සිටී. සිවිල් සමාජ සංවිධාන මඟින් සිදු කර ඇති ලේඛනගත කිරීම් පිළිබඳ ප්‍රයත්නයන්, අපරාධ සඳහා වගවීම, මහජන සේවාවන් ලබාදීම හා අධ්‍යාපනය හා සදානුස්මරණය යන ක්‍රියාකාරකම්වලට සහයෝගය ලබාදීමේ රාජ්‍ය, රාජ්‍ය නොවන හා රාජ්‍යය අතර ආයතනවල ක්‍රියාකාරකම් පොළඹවා ඒවාට ඌණ පුරණය කර ඇත.

### අපරාධ සඳහා වගවීම පිළිබඳ සිවිල් සමාජ සංවිධානවල ලේඛනගත කිරීමේ ඉතිහාසය හා කාර්යභාරය

අවම වශයෙන් පසුගිය ශතවර්ෂ දෙකක කාලය තුළ සිවිල් සමාජ සංවිධාන මානව හිමිකම් උල්ලංඝනයවීම් ලේඛනගත කිරීමේ දී සක්‍රියව සම්බන්ධ වී ඇත. වහල් ව්‍යාපාරය පිළිබඳ මිනිසුන්ගේ හැඟීම් වෙනස් කිරීම පිණිස අත්ලාන්තික් ප්‍රාන්තයේ සිදු වූ වහල් වෙළඳාම පිළිබඳ හිටපු වහලුන්ගෙන් හා වහල් ව්‍යාපාරයට එරෙහිව කටයුතු කළ පුද්ගලයන්ගේ සාක්ෂි පළකිරීමට සිවිල් සමාජ සංවිධාන ඉදිරිපත් වූ කාල වකවානුවේ සිට මෙය සිදු වී තිබේ.[1] නූතන ජාත්‍යාන්තර මානව හිමිකම් ව්‍යාපාරය 1960 ගණන්වල ඉස්මතු වූ නමුත්, 1990 ගණන් වනතෙක් සිවිල් සමාජ සංවිධාන අපරාධ පිළිබඳ වගවීම සඳහා ලේඛනගත කිරීම භාවිතා කර නැත.[2] මෙම ප්‍රමාදයට දඩුවමින් මිදී සිටීමේ නිදහස පැතිර තිබීමත්, දේශපාලන ස්ථාවරය, සාමය හා ආරක්ෂාව වැනි කරුණු අපරාධ යුක්තිය සඳහා වූ ඉල්ලීම්වලට වඩා අභිබවා යාම එක හේතුවක් විය.[3] ඒ අනුව මෙම කාල වකවානුවේ සිදු වූ මානව හිමිකම් පිළිබඳ වැඩ කටයුතු, අපරාධ සඳහා නඩු පැවරීම්වලට දායකත්වයක් ලබාදීම වෙනුවට, මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ දැනුවත් කිරීමටත්, ඒවා වැළැක්වීමටත්, ඒවා අවම කිරීමටත් ලේඛනගත කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.[4] සීතල යුද්ධයේ අවසානය ජාත්‍යාන්තර මට්ටමේ තනි පුද්ගලයන්ගේ අපරාධ සඳහා වූ වගවීම ඉවත් කළේය. එසේ නැත්නම් අවම කළේය. 1990 ගණන්වල ඒ අවස්ථාවට පිහිට වූ යාන්ත්‍රණ වශයෙන් ජාත්‍යාන්තර බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත වූ අවස්ථාවේ සිවිල් සමාජ සංවිධාන තමන්ගේ ලේඛනගත කිරීමේ ප්‍රයත්නයන් සමඟ අපරාධවලට වගවීම් ලබාගැනීමට සහයෝගය ලබාදීමට පටන් ගත්හ.

#### සිද්ධි අධ්‍යයනයන් පිළිබඳ සමාලෝචනය : කම්බෝඩියාව, පෙර යුගෝස්ලාවියාව හා ගෞතමාලාව

මෙම පරිච්ඡේදය 1990 ගණන්වල සිට සිවිල් සමාජ සංවිධානවලින් සිදු කරන ලද ලේඛනගත කිරීමේ කටයුතු පිළිබඳ සිද්ධි අධ්‍යයන තුනක් ඉදිරිපත් කරයි. මෙම ලේඛනගත කිරීමේ කටයුතු අදාළ රටවල

අපරාධ සඳහා වගවීම ඇති කිරීමටත්, මානව හිමිකම් ලේඛනගත කිරීම පිළිබඳ යහපරිචයන් නිර්මාණය කිරීමටත් දායකත්වයක් ලබා දී ඇත.

පළවෙනි සිද්ධි අධ්‍යායනය 1997 වර්ෂයේ විධිමත් ලෙස ආරම්භ කරන ලද කම්බෝඩියාවේ ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයේ වැඩ (DC-Cam) කටයුතු විස්තර කරයි. මෙම මධ්‍යාස්ථානය කම්බෝඩියාව සඳහා වූ අතිවිශේෂ අධිකරණයට (ECCC) සහයෝගය ලබා දී ඇත. මෙම ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය කැමරූච් පාලන ඉතිහාසය පිළිබඳ දැවන්ත ලේඛනාගාරයක් පවත්වා ගෙන යයි. එහි පිටු 900,000 ක ලේඛන, ඡායාරූප 11,000 ක් හා සම්මුඛ සාකච්ඡා 8000 ක් එක්රැස් කර තිබේ. කම්බෝඩියාව සඳහා වූ අතිවිශේෂ අධිකරණය ස්ථාපිත කිරීම සාධාරණීකරනය කිරීම සඳහා පාවිච්චි කිරීමට අමතරව, මෙම මධ්‍යාස්ථානයේ ලේඛන විමර්ශණ හා නඩු ක්‍රියාමාර්ගවලට සහයෝගය ලබාදීමටත්, හෝඩුවාවන් ලබාදීමටත්, අපරාධවලට පුද්ගලයන් වගවීමට ලක් කිරීමේ වැදගත්කම පිළිබඳ මහජනතාවට අධ්‍යාපනයක් ලබාදීමටත් පාවිච්චි කර ඇත. මෙම මධ්‍යාස්ථානයෙන් ලබාගත් පාඩම් ක්‍රමානුකූල හා ආයතනගත කරන ලද ලේඛනගත කිරීම, පාරදෘශ්‍ය භාවයට අරමුදල් ලබාදීම හා සමාජ වෙනසක් ඇති කිරීම සඳහා වූ අභිලාෂය සමඟ අපක්ෂපාතී ලේඛනගත කිරීම සමබරව පවත්වාගෙන යාම යන කරුණුවල වැදගත්කම පෙන්වා දෙයි.

දෙවැනි සිද්ධි අධ්‍යායනය පෙර යුගෝස්ලොවියාවේ අති දැවන්ත ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයක් වන මානුෂීය නීති මධ්‍යාස්ථානයේ (HLC) වැඩ කටයුතු ආවරණය කරයි. මෙම මධ්‍යාස්ථානයේ යුද කාලයේ සිදු වූ අපරාධ පිළිබඳ වින්දිතයන්ගෙන් හා සාක්ෂිකරුවන්ගෙන් ලබාගත් 30000 කට වැඩි ප්‍රකාශන තැන්පත් කර තිබේ. එහි ලේඛනගත කිරීමේ කටයුතු 1992 වසරේ ආරම්භ වූ අතර, එම ලේඛන අධිකරණයේ සාක්ෂි වශයෙන් හා සිදු වූ අපරාධවල පසුබිම් පිළිබඳ අභිචෝදකයන්ගේ අවබෝධය වැඩි කරගැනීමටත්, විමර්ශණ සඳහා හෝඩුවාවන් ලබාදීමටත් පාවිච්චි කර ඇත. පක්ෂපාතීත්වය පිළිබඳ දෝෂාභියෝගවලට මුහුණදීම සඳහා මානුෂීය නීති මධ්‍යාස්ථානය අපක්ෂපාතීව ලේඛනගත කිරීම පිළිබඳ පාඩම් බෙදාහදා ගනී. තව ද වින්දිතයන් හා සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවලට ලක්කිරීමේ දී 'හානියක් නොකරන්න' මූලධර්මය පිළිබඳ පාඩම් ද එය ලබාදෙයි.

අවසන් සිද්ධි අධ්‍යායනය ගෞතමාලවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනමේ (FAFG) ක්‍රියාකාරකම් විස්තර කරයි. ගෞතමාලාවේ අභ්‍යාන්තර සන්නද්ධ අරගලය සිදු වූ කාල වකවානුවේ සිදු කරන ලද දරුණු අපරාධ ඔප්පු කිරීම සඳහා මෙම පදනම කටයුතු කරයි. මෙම කාල වකවානුවේ සිදු කරන ලද අපරාධ පිළිබඳ සාක්ෂි සහිත විස්තර ගොනුකිරීම සඳහා මෙම පදනම 1997 වසරේ සිට විෂයයාන්තර විද්‍යාත්මක සාක්ෂි විමර්ශන පවත්වා ඇත. මෙම විද්‍යාත්මක සාක්ෂි සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන සනාථ කිරීමටත්, අපරාධ හා සම්බන්ධ කිරීමටත්, සිදුවීම්වල කාල රාමුවක් ඉදිරිපත් කිරීමටත්, චේතනාව ඔප්පු කිරීමටත් භාවිතා කර ඇත. විද්‍යාත්මක සාක්ෂි හා පුද්ගල සාක්ෂි අතර ශක්තිමත් පදනමක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය හා ඒවගේම විද්‍යාත්මක සාක්ෂි අපරාධ යුක්ති ක්‍රියාවලියක වින්දිතයන්ට හඬක් ලබාදෙන්නේ කෙසේද යන්න පිළිබඳව ද මෙම කොටස නිර්දේශ ඉදිරිපත් කරයි.



2016 දෙසැම්බර් මාසයේ කාම්බෝජියාවේ (Youth For Peace) සාමය සඳහා වූ දකුණු සුඩාන් මානව හිමිකම් ලේඛනගත කිරීම් සංවිධානයේ සාමාජිකයන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන ප්‍රචණ්ඩත්වයට මුහුණදී ජීවත්ව සිටින පුද්ගලයෙක්.

## කම්බෝඩියාවේ ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය

කාම්බෝජියාවේ කැමරූජ් පාලන යුගය පිළිබඳ පසුබිම

සාමාන්‍යයෙන් කැමරූජ් යන නමින් හඳුන්වන ලද කොමියුනිස්ට් බලවේග 1975 අප්‍රේල් මස 17 වන දින කාම්බෝජියාවේ පාලනය අල්ලාගත් අතර, ප්‍රජාතන්ත්‍රවාදී කම්බෝඩියා රාජ්‍ය ස්ථාපිත කළහ. වසර හතරක් පමණ කැමරූජ් පාලකයන් විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග හේතුවෙන් මිලියන 1.4 ක් සිට 2.2 ක් දක්වා වූ පුද්ගයන් ඝාතනයට ලක්වූහ. ත්‍රස්තවාදය, වද හිංසාව හා ඝාතන ඇතුළත් මෙම පාලන යුගයේ කුරිරු ක්‍රියාකාරකම් 1979 ජනවාරි 07 වන දින වියට්නාමයේ හමුදා ආක්‍රමණය කර අගනුවර අත්පත් කරගන්නා තෙක් අඛණ්ඩව සිදු විය. කෙසේවෙතත්, කැමරූජ් සංවිධානය ගරිල්ලා ව්‍යාපාරයක් වශයෙන් 1998 වසර තෙක් ක්‍රියාත්මක විය.

කැමරූජ් පාලන කාලයේ සිදුවූ ඇති අපරාධයන්වල ස්වභාවය තීරණය කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය 1988 නොවැම්බර් මාසයේ කාම්බෝජියාව හා තායිලන්තය යන රටවල්වලට විශේෂඥයන්ගේ කණ්ඩායමක් යැවීය. කැමරූජ් නායකයන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික සාක්ෂි හා සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශන තිබෙන බව එම විශේෂඥ කණ්ඩායම සොයා ගත්තේය. මේ සඳහා සමූල ඝාතනය හා මානව සංහතියට එරෙහි අපරාධ ක්‍රියා පිළිබඳ චෝදනා විමර්ශනය කර, නඩු පැවරීම සඳහා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අධිකරණයක් ස්ථාපිත කළ යුතු බව ඔවුන් නිර්දේශ කළහ. කෙසේවෙතත්, එක්සත් ජාතීන්ගේ සහයෝගයෙන් කටයුතු කරන දේශීය අධිකරණයක් විසින් මෙම අපරාධ ආමන්ත්‍රණය කළ හැකි බව කම්බෝඩියානු රජය විශ්වාස කළේය. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා කාම්බෝජියානු රජය 2003 වසරේ ගිවිසුමකට එළඹු අතර, එය මෙම ගැටළුව විසඳීම සඳහා කාම්බෝජියා අධිකරණයේ අතිවිශේෂ විනිශ්චය සභාවක් ස්ථාපිත කිරීමටත්, ක්‍රියාත්මක කිරීමටත් පහසුකම් සැලසීය. මෙම ගිවිසුම යටතේ කාම්බෝජියාව මෙම අතිවිශේෂ විනිශ්චය සභාව ජාතික නීතිය යටතේ ස්ථාපිත කරන අතර, එය ජාත්‍යන්තර ආකෘතියකින් කටයුතු කරන අතර, එහි කාම්බෝජියානු පුරවැසියන් හා විදේශිකයන් සම්බන්ධ වනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදී කාම්බෝජියාවේ ජ්‍යෙෂ්ඨ නායකයින්ට එරෙහිව නඩු පැවරීම සඳහාත්, 1975 අප්‍රේල් 17 වෙනි දා සිට 1979 ජනවාරි 6 වන දා තෙක් සිදු කරන ලද අපරාධ

මගින් ජාත්‍යන්තර හා ජාතික නීතිය බරපතළ ආකාරයෙන් උල්ලංඝනය කිරීමට වගකිය යුතු පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමටත් එම අධිකරණයට බලයක් පවරන ලදී.

## කාම්බෝජියාවේ ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය

කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය (DC-Cam) කම්බෝඩියාවේ නීතියේ ආධිපත්‍යය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන පිණිස කැමරූජ් පාලන යුගයේ ඉතිහාසය සටහන් කර සංරක්ෂණය කරන ප්‍රජා මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් වේ. මෙම මධ්‍යස්ථානය 1994 අප්‍රේල් මාසයේ සම්මත කරන ලද එක්සත් ඇමරිකානු ජනපදයේ නීතියක් වන කම්බෝඩියානු සමූල ඝාතන යුක්ති පණත යටතේ ආරම්භ කරන ලදී. මෙම නීතිය කම්බෝඩියානු සමූල ඝාතන විමර්ශන සඳහා වූ එක්සත් ඇමරිකානු ජනපද කාර්යාලයක් ස්ථාපිත කිරීමට මැන්ඩේටයක් ලබා දුන්නේය. එය මගින් කම්බෝඩියාවේ සමූල ඝාතන හා මානව සංහතියට එරෙහි අපරාධ ක්‍රියා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා යේල් විශ්ව විද්‍යාලයට අරමුදලක් ලබාදෙන ලදී. යේල් විශ්ව විද්‍යාලය 1995 වසරේ සිට 1996 අවසානය දක්වා එම පර්යේෂණයට හැකියාව ලබාදීම සඳහා වූ ක්ෂේත්‍ර කාර්යාලයක් වශයෙන් කම්බෝඩියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය (DC-Cam) ස්ථාපිත කළේය. මෙම මූල්‍යාධාර 1996 වසරෙන් අවසන් විය. කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය 1997 වසරේ ස්වාධීන ආයතනයක් බවට පත්විය.

මෙම මධ්‍යස්ථානය කැමරූජ් පාලන යුගයේ ඉතිහාසය ගොනුකර, විශ්ලේෂණය කර, සංරක්ෂණය කර බෙදා දීම සඳහා වූ සිදු කරන ලද පළමුවෙනි විස්වසනීය ප්‍රයත්නයක් ලෙස සලකනු ලැබේ. එය කැමරූජ් පාලනය පිළිබඳ ලෝකයේ තිබෙන විශාලතම මූලික ලේඛනවල එකතුව තබාගෙන තිබෙන අතර, කාම්බෝජියාවේ මුක්තියට එරෙහිව වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. මෙම මධ්‍යස්ථානය 2017 ජූලි මාසය වනවිට පිටු 900,000 පමණ ලේඛන, ඡායාරූප 11000 ක් හා එම තත්ත්වයට මුහුණ දී ජීවත්ව සිටින පුද්ගලයන් 8000 කින් ලබාගත් සම්මුඛ සාකච්ඡා ද රැස්කර තිබුණේය. තව ද විදේශ රජයන් සතු ලිපි ලේඛණ, සමකාලීන චිත්‍රපටි දර්ශන වැනි භාණ්ඩ ද රැස්කර තිබුණේය. එම භාණ්ඩ සියල්ලම කැමරූජ් ඉතිහාසය පිළිබඳ කරුණු ලබාදෙයි. මෙම මධ්‍යස්ථානය වාර්තා චිත්‍රපට, විද්වත් ප්‍රකාශන, නාට්‍යය පිටපත් හා අනුස්මරණ ගීත වැනි පුළුල් පරාසයේ මාධ්‍යය ද නිර්මාණය කර ඇත.

මෙම මධ්‍යස්ථානයේ ලේඛනගත කිරීමේ කටයුතු කාම්බෝජියාව සඳහා අතිවිශේෂ විනිශ්චය සභාවේ අවශ්‍යතාවය සාධාරණීයකරණ කිරීමට උපකාරී විය. එම සභාව සාක්ෂිකරුවන් හෝ සාක්ෂි භාණ්ඩ සඳහා හෝඩුවාවන් ලබාගැනීමටත්, අපරාධ ක්‍රියාවල යම් යම් පුද්ගලයන්ගේ භූමිකාව අවබෝධ කරගැනීමටත්, මෙම ලිපි ලේඛන පාවිච්චි කර ඇත. හානිපූර්ණ සඳහා වින්දිතයන්ගේ නීත්‍යානුකූල ඉල්ලීම් ආමන්ත්‍රණය කිරීම පිණිස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මෙම මධ්‍යස්ථානය වින්දිතයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතාවයටත් ප්‍රතිචාර දක්වා ඇත. විශේෂයෙන් සදානුස්මරණය හා මහජන අධ්‍යාපනය පිළිබඳ අවශ්‍යතා ඉටුකර දී ඇත. අවසන් වශයෙන් එය කාම්බෝජියාවේ අපරාධවලට වගවීමේ අවශ්‍යතාවය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර දැනුවත්භාවය වැඩි දියුණු කර ඇත.

## කාම්බෝජියානු අතිවිශේෂ විනිශ්චය සභාවට සහාය ලබාදීම සඳහා සෘජුව පාවිච්චි කරන ලද ලේඛන

කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය විසින් රැස්කරන ලද ප්‍රකාශ හා ලේඛන සාක්ෂි පදනම් කරගෙන විස්තරාත්මකව සිදු කරන ලද ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර හා කාම්බෝජියානු නීතිය යටතේ බරපතළ අපරාධ සිදු වී ඇති බව තහවුරු කිරීම මඟින් කාම්බෝජියානු විශේෂ විනිශ්චය සභාව ස්ථාපිත කිරීම සාධාරණීකරනය කිරීම සඳහා උපකාරී විය. එක්සත් ජාතීන්ගේ විශේෂඥ කණ්ඩායම 1998 වසරේ කම්බෝඩියාවේ චාරිකාවක් සිදු කළ අවස්ථාවේ මෙම මධ්‍යස්ථානය පුද්ගල ඝාතන සිදු කරන ලද දහස් ගණන් ස්ථාන පිළිබඳ විස්තර ඔවුන්ට ලබාදුන් අතර, සමූහ මිනීවළවල් හා මරණවලට හේතු තහවුරු කෙරෙන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ප්‍රකාශන ද ලබා දුන්නේය. මෙසේ බෙදාහදා ගන්නා ලද ලේඛන සෘජුව අපරාධ සිදුකළ පුද්ගලයන්ගේ හෝ අණදෙන තත්ත්වයක හෝ අධීක්ෂණ කාර්‍යභාරයක සිටි පුද්ගලයන්ගේ නිශ්චිත පුද්ගලයන්ගේ භූමිකාව පිළිබඳ පසුබිම ලබාදීම නිසා එය වැදගත් විය.

කාම්බෝජියාව සඳහා වු අතිවිශේෂ ස්ථාපිත කිරීමේ සිට කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය පුළුල් පරාසයේ ලේඛන, සාක්ෂි, චිත්‍රපට හා ඡායාරූප සැපයීම මඟින් එම අධිකරණයේ විමර්ශණවලට හා නඩු විභාගවලට සහයෝගය දක්වා ඇත. මෙම විනිශ්චය සභාව සමඟ විධිමත් ගිවිසුමකින් තොරව මෙම සියලුම දේවල් ලබාදෙන ලදී.[5] තව ද මෙම මධ්‍යස්ථානයේ පර්යේෂණ කටයුතු සාක්ෂිකරුවන් පිළිබඳ හෝඩුවාවන් හා අදාළ ලේඛන සාක්ෂි මෙම සභාවට ලබා දී ඇත. තව ද අපරාධ ක්‍රියාවල යම් පුද්ගලයන්ගේ කාර්‍යභාරයන් ද පැහැදිලි කර ඇත. මෙම අතිවිශේෂ විනිශ්චය සභාවේ විමර්ශන නිළධාරීන්, අභිචෝදකයන් හා විත්තියේ නීතිඥයන් තමන්ගේ කාර්යයක් තහවුරු කරගැනීමටත්, වැඩිදියුණු කරගැනීමට හෝ තත්ත්වය අනුව ගලපා ගැනීමට උපකාරී වීම සඳහා මෙම මධ්‍යස්ථානය ලිපි ලේඛන නිතිපතා ඉල්ලා ඇත. ඇත්ත වශයෙන්ම මෙම මධ්‍යස්ථානය විසින් ලබාදෙන ලද ලේඛන භාණ්ඩ විශේෂයෙන් මෙම විනිශ්චය සභාව අඛණ්ඩව මුහුණ දුන් සම්පත් පිළිබඳ අභියෝග මධ්‍යයේ ඉතා වැදගත් ආකාරයක සහයෝගයක් ලබා දී ඇති බව මෙම විනිශ්චය සභාව පිළිගෙන ඇත.[6] 2017 ජූලි මාස වනවිට මෙම මධ්‍යස්ථානය විශේෂයෙන් සාක්ෂි වශයෙන් ඩොලර් 3.5 මිලියන් වටිනා භාණ්ඩමය සහයෝගය ලබා දී ඇත.

## හානිපූර්ණ සඳහා වු වින්දිතයන්ගේ අයිතිවාසිකම් ඉටු කිරීම සඳහා පාවිච්චි කරන ලද ලේඛන

කාම්බෝජියාව සඳහා වු අතිවිශේෂ විනිශ්චය සභාව එහි තීන්දුවල, සිවිල් පාර්ශවකරුවන් වශයෙන් නඩුවලට සහභාගී වන වින්දිතයන් විසින් බලාපොරොත්තු වන සාමූහික හෝ සදාචාරාත්මක හානිපූර්ණ ලබාදීමේ හැකියාව යම් නිශ්චිත ව්‍යාපෘති සතුව තිබෙන බව පිළිගනී.[7] ඒ අනුව මෙම විනිශ්චය සභාව හානිපූර්ණ සඳහා කම්බෝඩියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය විසින් සිදුකර ඇති අධ්‍යාපනය හා මතකය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් පිළිගෙන ඇත. උදාහරණයක් වශයෙන් 002/01 නඩුවේ දී සිවිල් පාර්ශ්වය කරන ලද ඉල්ලීම්වලට ව්‍යාපෘති 13 ක් ද ඇතුළත් විය. මෙම ව්‍යාපෘතිවලින් 11 ක් හානිපූර්ණ ලෙස අධිකරණය විසින් පිළිගන්නා ලද අතර, ව්‍යාපෘති දෙකක් කම්බෝඩියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලදී. කැමරූජ් පාලනය පිළිබඳ මහජනතාවට අධ්‍යාපනයක් ලබාදීම සඳහා පළාත් පහක ස්ථිර ප්‍රදර්ශන ස්ථාන ස්ථාපිත කිරීම එක ව්‍යාපෘතියක අරමුණ වේ. දෙවැනි ව්‍යාපෘතිය ටුවෙල් ෆෝවෙරේ ප්‍රදේශයේ ජනතාව බලෙන් ඉවත්කිරීම හා එහි සිදු කරන ලද ඝාතන පිළිබඳ පරිච්ඡේදයක් කම්බෝඩියානු ගුරු අත්පොතට එකතු කළ යුතු බව යෝජනා කළේය. 002/01 නඩුවේ තීන්දුව ලබාදීමෙන් පසු යාවත්කාලීන කරන ලද ගුරු අත්පොතක් ඇත්ත වශයෙන්ම බෙදා හරින ලදී.[8] 002/02 නඩුවේ දී හානිපූර්ණ ලෙස කාම්බෝජියානු අතිවිශේෂ විනිශ්චය සභාව විසින් සලකනු ලබන දැනට තිබෙන ව්‍යාපෘති 23 කින් ව්‍යාපෘති 03 ක්

කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති විය. මෙම ව්‍යාපෘති ස්ථිර ප්‍රදර්ශන ස්ථාන ස්ථාපිත කිරීම ප්‍රජාතන්ත්‍රවාදී කාම්බෝජියාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ජාත්‍යන්තර වශයෙන් හා ජාතික වශයෙන් බෙදාහැරීම යන දේවල් ද ඇතුළුව ගුරු පුහුණුව හා මහජන අධ්‍යාපනය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

## අපරාධ සඳහා වගවීම පිළිබඳ දැනුම්වත් භාවය වැඩිකිරීම සඳහා පාවිච්චි කරන ලද ලේඛන

අපරාධ වගවීම පිළිබඳ දැනුම්වත් කිරීමටත්, එයට සහයෝගය ලබාදීමටත් දේශපාලන හා සමාජ වෙනසක් සිදු කිරීම සඳහා ලේඛන පාවිච්චි කළ හැක්කේ කෙසේ ද යන කරුණ කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය අවබෝධ කරගෙන සිටී. පිළිබඳ මෙම මධ්‍යාස්ථානය විධිමත් අධ්‍යාපනය කාම්බෝජියානු අධ්‍යාපන, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය සමග ඉතා කිට්ටුවෙන් කටයුතු කර ඇත. එම අමාත්‍යාංශය සියලුම ද්විතියික පාසල්වල කැමරූජ් පාලනයේ ඉතිහාසය ඉගැන්වීම සඳහා කම්බෝඩියානු ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේ විෂය මාලාව ප්‍රයෝජනයට ගනී. මෙම විෂය මාලාවට අදාළ ගුරු අත්පොතේ සමූල ඝාතනය හා බලහත්කාරයෙන් ජනතාව ඉවත්කිරීම යන පද පිළිබඳ නිර්වචනවලට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් වන අතර, ටොල් ෆෝ වරේ ප්‍රදේශයේ සිදු වූ අපරාධ පිළිබඳ අමතර සාකච්ඡා ද එයට ඇතුළත් කර තිබේ. ගුරු අත්පොතේ මෑත කාලීන මුද්‍රණ සඳහා කාම්බෝජියාව සඳහා වූ අතිවිශේෂ විනිශ්චය සභාවේ නෛතික නිගමනයන් හා තීන්දු පිළිබඳ අමතර පරිච්ඡේද ඇතුළත් කරගැනීමට මෙම මධ්‍යාස්ථානය අදහස් කරයි.

සුවපත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අපරාධවලට වගවීමේ වැදගත්කම පිළිබඳ දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහාත්, කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයේ සංරක්ෂණය කරන ලද ලේඛන පුළුල් පරාසයක කලාත්මක, සාහිත්‍ය හා අධ්‍යාපන නිර්මාණ සඳහා දායකත්වයක් ලබා දී ඇත. පුළුල් ජාත්‍යන්තර මට්ටමේ දී මෙම මධ්‍යාස්ථානය කැමරූජ් පාලනයේ දරුණු අපරාධ ගවේෂණය කිරීම සඳහා චිත්‍රපට නිෂ්පාදකවරුන්ටත්, කාම්බෝජියාව සඳහා වූ අතිවිශේෂ විනිශ්චය සභාවටත් සහාය ලබා දී ඇත. සංහිඳියාව සඳහා මෙම මධ්‍යාස්ථානය විසින් එවැනි සහායක් ලබා දී තිබේ. තව ද මෙම මධ්‍යාස්ථානය කැමරූජ් පාලන යුගයේ ඉතිහාසය පිළිබඳවත් කාම්බෝජියාව සඳහා වූ අතිවිශේෂ විනිශ්චය සභාවේ වැඩ කටයුතු පිළිබඳවත් වාර්තා, ප්‍රවෘත්ති හා අනෙකුත් විස්තර ලබාදෙන වෙබ් අඩවි කිහිපයක් ද පවත්වාගෙන යයි. මෙම වෙබ් අඩවිවල ඉතාම වැදගත් වෙබ් අඩවිය වන්නේ කාම්බෝජියාව සඳහා වූ අතිවිශේෂ විනිශ්චය සභාවේ දෛනික කටයුතු ආවරණය කරන කාම්බෝජියා අධිකරණ අධීක්ෂණ ආයතනය විසින් ඒකාබද්ධව පාලනය කරනු ලබන වෙබ් අඩවිය වේ; මෙය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ද ඇතුළුව ප්‍රසිද්ධ නඩු විභාග පිළිබඳ තොරතුරුවල සාරාංශයක් ලබාදෙන අතර, කාම්බෝජියාව සඳහා වූ අතිවිශේෂ අධිකරණය මුහුණදෙන ගැටලු ද විශ්ලේෂණය කරයි.

අවසන් වශයෙන්, කාම්බෝජියා ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය කැමරූජ් ඉතිහාසය හා කාම්බෝජියාව සඳහා වූ විනිශ්චය සභාව ඉතිහාසය පිළිබඳ මහජනතාවට තොරතුරු ලබාදෙන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදු කර ඇත. සෑම මාස තුනකට වරක්ම එය දුෂ්කර ප්‍රජාවන් වෙසෙන ප්‍රදේශවල ගම්වලට ගොස් සංසදයන් පවත්වන අතර, තමන්ගේ අත්දැකීම් පිළිබඳ සාකච්ඡා කරන ලෙස ප්‍රජා සාමාජිකයන් දිරිගන්වයි. තව ද කැමරූජ් ඉතිහාසය පිළිබඳ හා කාම්බෝජියාව සඳහා වූ අතිවිශේෂ විනිශ්චය සභාවේ පිළිබඳ මධ්‍යස්ථානය විසින් නිෂ්පාදන කරන ලද චිත්‍රපට හා ඉදිරිපත්කිරීම් නරඹන ලෙස ද ඔවුන් දිරිගන්වයි. ඊට අමතරව නඩු තීන්දු හා දඬුවම් ලබාදීම වැනි වැදගත් අවස්ථා ඇතුළු අධිකරණ මුළු රටටම සැසි සජීවීව විකාශනය කරයි. ප්‍රචණ්ඩත්වයට මුහුණ දී ජීවත්ව සිටින පුද්ගලයන්ගේ සහභාගීත්වයට හැකියාව ලබාදීම පිණිස, විනිශ්චය සභාවේ කටයුතු නාන්පෙන් නගරයේ පිහිටි අධිකරණයට එවැනි පුද්ගලයන් ප්‍රවාහනය කිරීම මඟින් මෙම මධ්‍යස්ථානය අධිකරණ සැසිවලට සහභාගී වන අවස්ථාව ඔවුන්ට ලබාදෙයි.



නාට්‍ය වැඩසටහනක් හරහා තරුණ තරුණියන් කම්බෝඩියාවේ ප්‍රචණ්ඩකාරී අතීතය ගැන ඉගෙන ගනිති.

## උගත් පාඩම් හා නිර්දේශ

**ලේඛනගත කිරීමේ යෙදෙන සංවිධාන විධිමත් හා අපක්ෂපාතී පර්යේෂණ ක්‍රමවේදයක් භාවිතා කළ යුතුය.** 002 නඩුවේ විත්ති පාර්ශ්වය කම්බෝඩියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයේ අපක්ෂපාතීත්වය පිළිබඳ සැක පළ කළ අතර, යම් යම් මුලාශ්‍රවලට ප්‍රමුඛතාව ලබාදීම වැනි තෝරාගැනීම් කිහිපයක් මෙම මධ්‍යාස්ථානය විසින් සිදුකරන ලද්දේ ඇයි දැයි යන කරුණ ගවේෂණය කිරීමට උත්සාහ දැරුවේය. (විත්ති පාර්ශ්වයට වාසි වන ආකාරයේ) චෝදනා පිළිබඳ සාක්ෂි රැස් කිරීමට වඩා (පැමිණිලි පාර්ශ්වයට වාසි වන ආකාරයේ) චෝදනා පිළිබඳ සාක්ෂි රැස් කරන ආකාරයෙන් ලේඛනගත කිරීමේ යෙදී සිටි පුද්ගලයා පක්ෂග්‍රාහීව කටයුතු කර තිබේදැයි තීරණය කරගැනීමට විත්ති පාර්ශ්වය අවශ්‍ය විය. ලේඛනගත කිරීමේ වැඩ කටයුතු ක්‍රමවේදයක් අනුව සිදුකිරීම හා ආයතනගත කිරීම යටතේ සෑම අදියරකටම විධිමත් ක්‍රමවේදයක් භාවිතා කිරීම, යම් යම් තෝරාගැනීම් සිදු කළේ ඇයි දැයි යන ප්‍රශ්නවලට උත්තර දීමට හැකිවනු ඇතැයි තමන්ගේ අත්දැකීමෙන් මෙම මධ්‍යාස්ථානය දැන සිටියේය. එය අපක්ෂපාතීත්වය පිළිබඳ කරුණු ද ආමන්ත්‍රණය කළ හැකිය.



කාම්බෝජියාවේ සහභාගිවන්නන්. මෙම සංවිධානය විශාල වශයෙන් පුද්ගලයන් ඝාතනය කරන ලද ස්ථාන සංවාද, අනුස්මරණ හා සාමය ගොඩනැගීමේ මධ්‍යස්ථාන වශයෙන් පරිවර්තනය කිරීමේ ප්‍රයත්නයක් ඇතුළුව ප්‍රජා සාම අධ්‍යයන මධ්‍යස්ථානවලට සහයෝගය ලබාදෙයි.

**ලේඛනගත කිරීමේ වැඩ කටයුතු ක්‍රමානුකූල හා ආයතනගත කරන ලද නීති රීති මඟින් මඟ පෙන්වීම් ලබාගත යුතුය.** ලේඛන අධිකරණයේ පිළිගැනීමට ලක්විය යුතු නම් ඒවා අදාළ සත්‍ය, විශ්වසනීය හා ඔප්පු කළ හැකි ලේඛන විය යුතුය.[9] උදාහරණයක් වශයෙන් 002/01 නඩුවේ විත්ති පාර්ශ්වය ලිපි ලේඛනවල සත්‍යතාවය සනාථ කිරීම හා භාරයේ තබාගැනීම නිශ්ෂය කරගැනීම සඳහා කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයට යම් නිශ්චිත රීතින් තිබේ දැයි ඇසූ අතර, එයට පිළිතුරු දුන් එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා එම මධ්‍යාස්ථානයේ ලිඛිත රීති අනුව කටයුතු කරන බව සඳහන් කළේය. සත්‍යතාවය, භාරයේ තබාගැනීම පිළිවෙළ, පිළිගත හැකි තත්ත්වය ඔප්පු කරන අනෙකුත් සාධක ද ඇතුළුව ලේඛනගත කිරීමේ වැඩ කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීම, සත්‍යය හා ප්‍රත්‍යක්ෂ විශ්වසනීයත්වයට අත්‍යවශය බව එම මධ්‍යාස්ථානය දැන ගත්තේය. ඊට අමතරව ලේඛන ආයතනගත කිරීම, අදාළ ලේඛනය ලබාගත් පුද්ගලයා සාක්ෂි ලබාදීමට පැමිණිය නොහැකි අවස්ථාවල, කාර්ය මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට ලේඛනගත කිරීමේ ක්‍රමවේදය පිළිබඳ සාක්ෂි ලබාදීමට හැකියාව ලබාදෙයි.

**ලේඛනගත කිරීමේ යෙදී සිටින සංවිධාන තමන්ට මුල්‍යාධාර සපයන පුද්ගලයන් හා හවුල්කරුවන් සමඟ පවතින සබඳතා පිළිබඳ පාරදෘශ්‍යභාවයක් පවත්වාගෙන යා යුතුය.** මුල්‍යාධාර ලැබෙන මූලාශ්‍ර හා සබඳතා, ලේඛනගත කිරීමේ ප්‍රයත්නවල ස්වාධීනත්වය කෙරෙහි බලපෑමක් කරයි. උදාහරණයක්

වශයෙන් 002 නඩුවේ විත්ති පාර්ශ්වය විශේෂයෙන් කාම්බෝජියානු රජය ද ඇතුළුව විවිධ මූලාශ්‍ර වලින් කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයට ලේඛන ලබාගත හැකි වුයේ කෙසේ ද යන්න පිළිබඳවත් ඔවුන්ගේ ලේඛනගත කිරීමේ දිශානතිය කෙරෙහි මූල්‍යාධාර බලපෑම් කරේ කෙසේ දැයි යන්න ප්‍රශ්න කළේය. මධ්‍යාස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සාක්ෂි දෙමින් ඕනෑම පුද්ගලයෙකුගෙන් ඕනෑම ස්ථානයකින් කැමරුච් පිළිබඳ ලේඛන ලබාගැනීමට ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයට කාම්බෝජියානු රජය අනුමැතිය ලබා දී ඇති බව පැවසූ අතර, ලේඛන සෙවීම පිළිබඳ සංවිධානයේ පුළුල් විෂයපථය ද පැහැදිලි කළේය.[10] තව ද විශේෂයෙන් මුදල් වෙන් කරන ලද නිශ්චිත වැඩවලට අදාළ ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානයේ පාරදෘශ්‍යභාවය, යම් යම් විමර්ශනයන් පැවැත්විය යුතුය හෝ විමර්ශනයන්වල ප්‍රතිඵල ඉදිරිපත් කළ යුතු යැයි යන කොන්දේසි මත එයට මුදල් ලබා දී ඇති බවට කරන ලද චෝදනා ජයගැනීමට උපකාරී විය.

**ලේඛනගත කිරීමේ ප්‍රයත්නයන්, දේශපාලන හා සමාජ වෙනසක් සඳහා වූ ඔවුන්ගේ කාර්යභාරය සමඟ අපක්ෂපාතීව කටයුතු කිරීමේ තත්ත්වය අතර සමබරතාවයක් තිබිය යුතුයි.** විශ්වසනීය ලේඛනගත කිරීමේ කටයුතු සඳහා දේශපාලන හා නෛතික න්‍යායපත්‍රවලින් ස්වාධීනව සිටීම අවශ්‍ය වේ; කෙසේවෙතත්, දේශපාලන හා සමාජ වෙනස සඳහා ලේඛනගත කිරීමේ කාර්‍යයභාරය අධ්‍යාපන මෙවලමක් වශයෙන් මෙය පිළිබඳ ප්‍රශ්න මතු වේ. කාම්බෝජියානු ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය මෙම තත්ත්වය පැහැදිලිව අවබෝධ කරගෙන සිටී. එයට හේතුව කම්බෝඩියානු අතිවිශේෂ විනිශ්චය සභාවට අපරාධ පිළිබඳ සාක්ෂි ලබාදීම හා මහජනතාවට අධ්‍යාපනයක් ලබාදීම යන කාර්යභාරය ඉටුකිරීම වේ. ලේඛනගත කිරීම අපරාධ සඳහා වූ සාක්ෂි වැනි සෘජු ප්‍රතිඵල පමණක් නොව, අධ්‍යාපනය හා සදානුස්මරණය වැනි වක්‍ර ප්‍රතිඵල ද ලබාදිය හැකිය යන කරුණ එය දැන සිටියි. ආයතනයක් තමන්ගේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පැහැදිලිව අවධාරණය කර ලේඛනගත කිරීම විවිධ අරමුණු සහිත උත්සාහයක් වන බව පැහැදිලිව තමන්ගේ මතය ඉදිරිපත් කරන තාක්කල් මෙම ද්විත්ව කාර්යභාරය එකිනෙක සමඟ තරඟ වදින බව මෙම මධ්‍යස්ථානය නොසිතයි.

## පෙර යුගෝස්ලාවියාවේ මානුෂීය නීති මධ්‍යාස්ථානයේ ලේඛනගත කිරීමේ කටයුතු

### පෙර යුගෝස්ලාවියාවේ සිදු වූ සන්නද්ධ අරගලවල පසුබිම

1990 ගණන්වල පෙර යුගෝස්ලොවියාවේ සිදු වූ සන්නද්ධ අරගල හේතුවෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතළ ලෙස උල්ලංඝනය වූ අතර, ජාත්‍යාන්තර මානුෂීය නීතිය ඉතා දැඩි ලෙස උල්ලංඝනය විය. එම ගැටුමෙන් අහිමි වූ මිනිස් ජීවිත 130,000 ක් වන අතර, එයින් බොහෝ දෙනෙකු දරුණු අපරාධ මගින් ඝාතනයට ලක් වූ සිවිල් පුරවැසියන් වූහ.[11] මෙම තත්ත්වයට නෛතික සහන ලබාදීමට දේශීය ආයතනවලට නොහැකි වූ හෝ කැමැත්තක් නොවූ හේතුවෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය 1993 වර්ෂයේ පෙර යුගෝස්ලාවියාව සඳහා වූ ජාත්‍යාන්තර අපරාධ විනිශ්චය සභාව ස්ථාපිත කළේය. අපරාධ සිදු කළ පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීම සඳහා මෙම විනිශ්චය සභාව පත්කරන ලදී. මෙම විනිශ්චය සභාවේ කටයුතු අවසන් වී ඇති බව 2004 වසරේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය දැන් වූ අතර, නඩු පැවරීම සඳහා වූ අධිකරණ පද්ධතිය වශයෙන් දේශීය අධිකරණ ජාත්‍යාන්තර විනිශ්චය සභාවේ නඩු භාරගත යුතු බව ඉල්ලා සිටියේය.

### මානුෂීය නීති මධ්‍යාස්ථානය (HLC)

මානුෂීය නීති මධ්‍යාස්ථානය 1992 වසරේ සන්නද්ධ අරගලය ආරම්භ වූ අවස්ථාවේ උල්ලංඝනයවීම් අධීක්ෂණය කර, ලේඛනගත කිරීම සඳහා සර්බියානු ක්‍රියාධරයෙක් විසින් ස්ථාපිත කරන ලද ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් යුත් මුලපිරීමක් වේ. මෙම මධ්‍යාස්ථානය පසුගිය කාලය පුරා පෙර යුගෝස්ලාවියාවේ ක්‍රියාත්මක වූ විශාලතම ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය වශයෙන් පත් වී සිටි අතර, 1990 ගණන්වල පටන් සිදු වූ දරුණු අපරාධ ක්‍රියාවල සංරක්ෂණය කරන ලද ලේඛන වෘත්තීමය

වශයෙන් කළමණාකරනය කළේය. මෙම මධ්‍යාස්ථානයේ පෙර යුගෝස්ලාවියාව සඳහා වු ජාත්‍යාන්තර විනිශ්චය සභාවේ නඩු කටයුතුවල හඬපට සහ වීඩියෝ පට 95% කට වඩා මෙම මධ්‍යස්ථානයේ ලේඛනාගාරය සතුව තිබේ. එසේ නැත්නම් ඒවා අන්තර්ජාලය හරහා ලබාගත නොහැක. තව ද වින්දිතයන් හා සාක්ෂිකරුවන් විසින් ලබාදෙන ලද 30,000 ක් පමණ ප්‍රකාශන ද මෙම ලේඛනාගාරය සතුව තිබේ. යුද සමයේ නිකුත් කරන ලද පුවත්පත්, අධිකරණ ලේඛන, අනෙකුත් වර්ගයේ ලේඛන ද ඇතුළු මාධ්‍යය ලේඛණාගාරයක් ද මෙහි තිබේ.[13] මෙම මධ්‍යාස්ථානය 2005 වසරේ සිට කොසෝවා මානුෂීය නීති මධ්‍යාස්ථානය හා කුරේෂියාවේ පිහිටි ලේඛනගත කිරීමේ මධ්‍යාස්ථානය සමඟ එකතු වී එහි මිනිස් හානි පිළිබඳ ව්‍යාපෘතිය සඳහා ගැටුමට අදාළ මරණ හා අතුරුදහන්වීම් පිළිබඳ පර්යේෂණ පවත්වා ඇත. මෙම ව්‍යාපෘතිවල අරමුණ වන්නේ 1990 ගණන්වල සිදු වු සන්නද්ධ අරගලවල වින්දිතයන් - ඔවුන්ගේ ජන වාර්ගය, ආගම, ලිංගය, වයස, ආබාධිත තත්ත්වය හෝ සන්නද්ධ කණ්ඩායමේ සාමාජිකයෙක් ද නැත්නම් සිවිල් වැසියෙක් ද යන කරුණු නොතකා - විස්තරාත්මක නිවැරදි ලේඛනයක් නිර්මාණය කිරීම වේ.

මානුෂීය නීති මධ්‍යාස්ථානය ලබාගෙන තිබෙන අතිවිශිෂ්ඨ කීර්තිය නිසා බොහෝ වින්දිතයන් සාක්ෂිකරුවන් හා බොස්නියා, කුරේෂියා හා කෝසෝවා යන ප්‍රදේශවල අපරාධවලට සම්බන්ධ වු පුද්ගලයන් පවා මෙම සංවිධානය හරහා සාක්ෂි ලබාදීමට ඉදිරිපත් වී සිටිති. උදාහරණයක් වශයෙන් 2004 නොවැම්බර් මාසයේ ස්කොර්පියන් පොලිස් ඒකකයේ සාමාජිකයෙක් සරභරනිකා ප්‍රදේශයේ තරුණ පිරිමින් හා පිරිමි ළමයින්ගේ කණ්ඩායමකට මරණ දඬුවම් ලබාදුන් සිද්ධියේ එකම වීඩියෝ පටය ලබාදුන්නේය. මෙම වීඩියෝ පටය ස්කොර්පියන් සාමාජිකයන් 4 දෙනෙකුට එරෙහි වු ඉතා වැදගත් සාක්ෂියක් විය; කුරෝෂියාවේ තවත් ස්කොර්පියන් සාමාජියෙකුට විරුද්ධව සාක්ෂියක් ලෙස ද එය පාවිච්චි කළ හැකි විය. ඉහළ පෙළේ දේශපාලන, හමුදා හා පොලිස් නිලධාරීන්ට එරෙහිව පෙර යුගෝස්ලොවියාවේ ජාත්‍යාන්තර විනිශ්චය සභාව විසින් පවත්වන ලද නඩු හයක ඒවා පාවිච්චි කිරීමට හැකි විය.[15] තව ද මෙම වීඩියෝ පටය මාස දෙකක කාලය තුළ පන්සීය වතාවකට වඩා සර්බියාවේ හා ජාත්‍යාන්තර වශයෙන් පෙන්වන ලදී. දැනුම්වත් කිරීමේ කාර්යයභාරයක් එය විසින් ඉටුකරන ලදී.

අපරාධවල පසුබිම පිළිබඳ තමන්ගේ අවබෝධය වැඩි දියුණු කරගැනීම සඳහාත්, වින්දිතයන්, සාක්ෂිකරුවන් හෝ සාක්ෂි හඳුනාගැනීම ඇතුළු හෝඩුවාවන් ලබාගැනීම සඳහාත්, මෙම මධ්‍යස්ථානයේ ලේඛන අභිචෝදකයන් විසින් ප්‍රයෝජනයට ගෙන ඇත. යුගෝස්ලාවියාව පිළිබඳ ජාත්‍යාන්තර අධිකරණය විසින් හා යුද අපරාධ නඩු පැවරීම සඳහා වු සර්බියා කාර්යාලය විසින් මෙම ලේඛන භාවිතා කර ඇත; තව ද දේශීය අධිකරණවල සාක්ෂි වශයෙන් ද ඒවා ප්‍රයෝජනයට ගෙන ඇත. යුධ අපරාධ නඩු පැවරීම සඳහා වු සර්බියා කාර්යාලය බොහෝ නඩු සම්බන්ධව අදාළ තොරතුරු රැස්කර ගැනීම සඳහා සහාය ලබාගැනීමට මෙම මධ්‍යාස්ථානය හා සම්බන්ධ වී ඇත.

දරුණු අපරාධ පිළිබඳ දැනුම්වත් වීම වැඩි කිරීම සඳහාත්, වගවීම වෙනුවෙන් හඬ නැගීම සඳහාත් මානුෂීය නීති මධ්‍යාස්ථානය තමන්ගේ ලේඛන පාවිච්චි කර ඇත. අපරාධවලට පුද්ගලයන් වගවීමට ලක්කිරීම සඳහා මෙම මධ්‍යාස්ථානය වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් නියෝජනය කර ඇති අතර, හානිපූර්ණ පිළිබඳ නඩු කටයුතුවල දී ඔවුන්ගේ නීත්‍යානුකූල ඉල්ලීම්වලට සහාය ලබාදීමට එහි ලේඛන පාවිච්චි කර ඇත. තව ද මෙම මධ්‍යස්ථානය වාර්තා ප්‍රකාශයට පත් කර ඇති අතර, චිත්‍රපට ද නිෂ්පාදනය කර ඇත. කිසියම් අපරාධයක් සිදු කළ පුද්ගලයන් තවමත් වගවීමට ලක්නොකර ඇති දරුණු අපරාධ පිළිබඳ තොරතුරු ඇතුළත් වෙබ් අඩවි ද එය පවත්වාගෙන යයි. නඩු පැවරීම සඳහා අවශ්‍ය දේශපාලන කැමැත්ත වැඩි දියුණු කරගැනීමේ බලාපොරොත්තුවෙන් මේවා සිදු කරනු ලැබේ. සදානුස්මරණ මුලපිරීම් සඳහා සමුහ මිනී වළක් අසල ස්ථානයේ ස්මාරකයක් ඉදිකිරීම සඳහා මෙම මධ්‍යාස්ථානය හඬ නගා ඇත.

**නඩු පැවරීම සඳහා සෘජුව සහාය දීමට පාවිච්චි කර ඇති ලේඛන**

මානුෂීය නීති මධ්‍යාස්ථානයේ පර්යේෂණ කණ්ඩායම දරුණු අපරාධ ක්‍රියාවලට සම්බන්ධ බොහෝ ලිපි ලේඛන විශ්ලේෂණය කරයි. එම මධ්‍යාස්ථානයේ ලේඛනාගාරයෙන් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන හා යුගෝස්ලාවියාව සඳහා වූ ජාත්‍යාන්තර අධිකරණයේ කලාපයේ දේශීය යුද අපරාධ අධිකරණවල ලේඛනාගාර, ලිපි ලේඛන, ප්‍රවෘත්ති මාධ්‍ය වාර්තා, අනෙකුත් සිවිල් සමාජ සංවිධාන හෝ වින්දිතයන් කණ්ඩායම්වල ලිපි ලේඛන හා අන්තර්ජාලයේ තිබෙන පොත්පත් හා තොරතුරු මෙයට ඇතුළත් වේ. තව ද මෙම කණ්ඩායම වින්දිතයන්, සාක්ෂිකරුවන් හා අපරාධ සිදුකළ පුද්ගලයන් හඳුනාගෙන, ඔවුන්ගේ ප්‍රකාශන ලබා ගනියි.

හමුදාව, පොලීසිය හා අනෙකුත් ලේඛන ද ඇතුළුව ප්‍රකාශන විශ්ලේෂණය කිරීමෙන් පසු, මානුෂීය නීති මධ්‍යාස්ථානය අපරාධ (සිදු වූ වටපිටාවන්) නැවත නිර්මාණය කරන අතර අපරාධය සිදු කළ පුද්ගලයන් හඳුනා ගනියි. මෙම මධ්‍යාස්ථානය මෙම කරුණු අපරාධ, පැමිණිලි හා විශ්ලේෂණ ඇතුළත් ලිපි ගොනු ලෙස ප්‍රකාශයට පත් කර, යුද අපරාධ සඳහා නඩු පැවරීමේ කාර්යාලයට ඉදිරිපත් කරයි. අපරාධ හා අපරාධ සිදු කළ පුද්ගලයින් කෙරෙහි අභිචෝදකයන්ගේ අවධානය යොමු කිරීම මෙහි අරමුණ වේ. මෙම මධ්‍යාස්ථානය විසින් කරන ලද සම්මුඛ සාකච්ඡා නඩු පැවරීම සඳහා ප්‍රධාන වින්දිතයන් හා සාක්ෂිකරුවන් හඳුනා ගැනීමට උපකාරී වී ඇත.

මානුෂීය නීති සංවිධානයේ නීති කණ්ඩායම 2008 වසරේ සිට යුද අපරාධ සඳහා නඩු පවරන කාර්යාලය වෙත අපරාධ පැමිණිලි 15 ක් ඉදිරිපත් කර ඇත. මෙම පැමිණිලිවලට අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා නඩු පැවරීමට අවශ්‍ය ප්‍රමාණවත් සාක්ෂි ඇතුළත් වේ. 2017 අප්‍රේල් මස වනවිට මෙම අපරාධ පැමිණිලිවලින් 5 ක් පිළිබඳ නඩු පවරා ඇති අතර, තවත් 6 ක් පූර්ව අදියරේ හෝ විමර්ශන අදියරේ තිබුණි.[17]

මානුෂීය නීති මධ්‍යාස්ථානය 2011 වසරේ සිට බොස්නියා, ක්‍රොඒෂියා හා කොසෝවා යන ප්‍රදේශවල දඬුවමින් මිදීමේ නිදහස සහිතව සිදු කරන ලද අපරාධ ක්‍රියා සෘජුව හෝ වක්‍රව පාලනය කළ ඒකක සේර්බියානු පිළිබඳ ලිපි ගොනු රැස්කර ඇත. මෙම ලිපිගොනු 1990 ගණන්වල සන්නද්ධ අරගලවලදී දරුණු අපරාධවල සම්බන්ධ වී සිටි හමුදා හා පොලිස් ඒකක මෙහෙයුම් විශ්ලේෂණය කරයි. තව ද මෙම අපරාධ සිදු කිරීමෙන් පසු එම අපරාධකරුවන් පිළිබඳ තොරතුරු ද ඇතුළත් වේ. ඔවුන්ගේ වත්මන් තත්ත්වය වැනි කරුණු එයට ඇතුළත් වේ. දැනට රජයේ තනතුරු දරණ පුද්ගලයන් කෙරෙහි මෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ; සිදුවීම්වල කරුණු විස්තර ද ඇතුළත් වේ; අදාළ ලේඛනවල හා අපරාධ සිදු කළ පුද්ගලයන්ගේ අපරාධ භූමිකාව, සාක්ෂි හා මූලාශ්‍රවල ලැයිස්තුව, ආරම්භ කළ යුතු අපරාධ නඩු කටයුතු සඳහා යෝජනා- එනම් අපරාධය වර්ගීකරණය කරන්නේ කෙසේ ද, අමතර සාක්ෂි රැස් කරන්නේ කෙසේ ද යන කරුණු පිළිබඳ යෝජනා මෙම ලිපිගොනුවල ඇතුළත් වේ.[18]

යුද අපරාධ නඩු පැවරීමේ කාර්යාලය මගින් විමර්ශන හා නඩු පැවරීම් සිදු කිරීමට දිරිගැන්වීම පිණිස මානුෂීය නීති මධ්‍යාස්ථානය අද වනතෙක් මෙවැනි ලිපිගොනු 7 ක් ප්‍රකාශයට පත් කොට ඇත. ඇත්ත වශයෙන්ම එක ලිපිගොන්නක් මෙම කාර්යාලය මගින් දැනට සිදු කරමින් පවතින නඩුවක් ගොනු කිරීමට උපකාරී වූ අතර, අනෙකුත් ලිපිගොනු දෙකක විස්තර කර ඇති අපරාධ දැනට මෙම කාර්යාලයේ පූර්ව විමර්ශන අදියරයේ පවතී. ඊට අමතරව යුගෝස්ලෝවියානු හමුදාවේ 125 වෙනි බල ඇණිය පිළිබඳ ලිපි ගොනුව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව යුද අපරාධ සඳහා නඩු පවරන කාර්යාලය ඉහළ තනතුරක් දරණ සර්බියානු නිලධාරියෙකුට එරෙහිව එහි පළමු විමර්ශනය පැවැත්වීම සඳහා අණ ලබා දී ඇත.[19]



1995 වසරේ සර්භරනිකා සමූල ඝාතනයේ වර්ෂ පූරණයේ දී සෑම වසරකම හෘද සාක්ෂිය පිළිබිඹු කරන ස්ථානවල ජාත්‍යාන්තර සන්ධානයේ සාමාජිකයෙක් වන සර්භරනිකා-පොටෝකාරි අනුස්මරණ මධ්‍යස්ථානය සමූල ඝාතනයේ අලුතෙන් හඳුනාගන්නා ලද වින්දිතයන් භූමිදානය කරයි. මෙම සමූල ඝාතනයේ දී 8000 කට වැඩි බොස්නියානු මුස්ලිම් පිරිමින් හා තරුණ පිරිමි ළමයින් ඝාතනයට ලක් වූහ.

## වින්දිතයන්ගේ නියෝජනය හා සර්බියානු අධිකරණවල නඩු පැවරීම

මානුෂීය නීති මධ්‍යස්ථානය වින්දිතයන් සඳහා නීති නියෝජනය ලබාදෙන අතර, දැනටමත් විවිධ යුද අපරාධ පිළිබඳ සර්බියානු අධිකරණවල විභාග වන නඩුවල 1200 කට වැඩි වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් සඳහා නීතිඥවරුන් ලබා දී ඇත.[20] 2016 වසරේ පමණක් මෙම මධ්‍යස්ථානය බෙල්ග්‍රේඩ් මහාධිකරණයේ යුද අපරාධ දෙපාර්තමේන්තුව ඉදිරියේ වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් වෙනුවෙන් නඩු 8 ක් සඳහා පෙනී සිට ඇත. මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරන මෙවැනි මැදිහත්වීම් දරුණු අපරාධ සිදු කර ඇති පුද්ගලයන්ට එරෙහිව විමර්ශන පැවැත්වීමට හා නඩු පැවරීමට යුද අපරාධ නඩු පැවරීමේ කාර්යාලය පොළඹවා ඇත. උදාහරණයක් වශයෙන් චෝර්නික් නඩුවේ දී ප්‍රධාන නඩු විභාගය සිදුවෙන අවස්ථාවේ මෙම මධ්‍යස්ථානයේ නීතිඥවරුන් විසින් සිදු කරන ලද කරුණු දැක්වීම් යුද අපරාධයක් සඳහා විමර්ශනයක් පැවැත්වීමට යුද අපරාධ සඳහා නඩු පැවරීමේ කාර්යාලය පොළඹවා ඇති අතර, එය ඝාතනය කරන ලද 700 කට අධික පුද්ගලයන් සඳහා යුක්තිය ලබාගැනීමට අවස්ථාවක් වනු ඇත.

තව ද මානුෂීය නීති මධ්‍යස්ථානය 2014 වසරේ මානව හිමිකම් පිළිබඳ යුරෝපීයානු අධිකරණයේ වින්දිතයන් හා ඔවුන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටියේය. යුද අපරාධ පිළිබඳ කාර්යක්ෂම හා ස්වාධීන විමර්ශන පැවැත්වීමේ රජයේ බැඳීම අවධාරණය කරමින් මෙසේ මෙම මධ්‍යස්ථානය පෙනී සිට ඇත. සර්බියානු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින සියලුම යුද අපරාධ නඩුවල - මානුෂීය නීති මධ්‍යස්ථානය වින්දිතයන් සඳහා නීති නියෝජනය ලබානොදෙන නඩු ද ඇතුළුව - මෙම මධ්‍යස්ථානය එම නඩු අධීක්ෂණය කර, ඒවා පිළිබඳ විස්තර මහජනතාවට දන්වයි.

## යුද අපරාධ සඳහා නඩු පවරන කාර්යාලය වෙත ලබාදෙන අනිකුත් ආකාරයේ සහාය

අපරාධ සඳහා විමර්ශන පවත්වා නඩු පවරන ලෙස යුද අපරාධ සඳහා නඩු පවරන කාර්යාලය වෙත සෘජුව පෙළඹවීම් කිරීමට අමතරව, මානුෂීය නීති මධ්‍යස්ථානය අදාළ ප්‍රශ්නයට සම්බන්ධ ලිපිලේඛන ලබාදීම මඟිනුත්, අදාළ සාක්ෂිකරුවන් හඳුනාගෙන සාක්ෂි ලබාදෙන ලෙස ඔවුන්ව දිරි ගැන්වීම මඟිනුත්, සර්බියානු ආයතන පිළිබඳ අවිශ්වාසයෙන් සිටින හෝ සර්බියාවට ගමන් කිරීමට බියෙන් සිටින සාක්ෂිකරුවන්ට ගමනාගමන හා අනෙකුත් පහසුකම් ලබාදීම මඟින් දැනට පවතින නඩුවලට ද සහයෝගය ලබාදෙයි. යුද අපරාධ සඳහා නඩු පවරන කාර්යාලය සමඟ මානුෂීය නීති මධ්‍යස්ථානය සක්‍රියව හා වක්‍රව පවත්වන සබඳතා ධාරිතාව හා දේශපාලන කැමැත්ත පිළිබඳ මෙම කාර්යාලය මුහුණපාන අභියෝග හේතුවෙන් ඉතා වැදගත් වේ.

## ග්වාතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම (FAFG)

### ග්වාතමාලාවේ අභ්‍යාන්තර සන්නද්ධ අරගලයේ පසුබිම

ග්වාතමාලාව 1960-1996 කාල වකවානුවේ අභ්‍යාන්තර සන්නද්ධ අරගලයකට මුහුණදුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් 40,000 ක් ද ඇතුළුව 20,0000 ක් පමණ පුද්ගලයන් වින්දිතයන් බවට පත් වූහ. තව ද ලක්ෂ 10 ක් පමණ පුද්ගලයන් අවතැන් වූහ.[21] එක්සත් ජාතීන්ගේ සංවිධානය 1996 වසරේ රජය හා ගරිල්ලා සංවිධානයක් වන ග්වාතමාලා ජාතික විප්ලවකාරී සන්ධානය (URNG) සමග ගිවිසුමක් සඳහා මැදිහත් වී කටයුතු කළේය. එම ගිවිසුම මගින් අනෙකුත් පියවරයන් අතර, ඓතිහාසය පැහැදිලි කරගැනීමේ කොමිෂන් සභාව (CEH) ස්ථාපිත කරන ලදී. එම කොමිෂන් සභාව ඝාතන 626 ක් ලේඛණගත කළ අතර, අවම වශයෙන් ගම්මාන 400 සම්පූර්ණයෙන් විනාශ කර ඇති බව තීරණය කළේය. කොමිෂන් සභාව අනුව, අපයෝජනවල 93% ක් රජයේ හමුදාවලින් සිදු කර තිබු අතර, වින්දිතයන්ගෙන් 80% ක් ඓතිහාසික වශයෙන් එරටේ කොන් කරන ලද මායා කණ්ඩායම්වලින් එකක් වන ගෝත්‍රයට අයත් පුද්ගලයන් වූහ. කඳුකර ප්‍රදේශවල හමුදාව විසින් සිදු කරන ලද “පොළොවට ගිනි තැබීමේ” ව්‍යාපාරය මගින් ඔවුන්ගේ ජීවිත හා ඉඩම් විනාශ කරන ලදී. 1981 වසරේ සිට 1983 වසර දක්වා රජය රටේ කලාප 4 ක මායා ගෝත්‍රික කණ්ඩායම්වලට එරෙහිව “සමූල ඝාතන ක්‍රියාවන්” සිදු කර ඇති බව කොමිෂන් සභාව නිගමනය කළේය.[22] අධිකරණ අංශයේ කොටස් කිහිපයක් වැඩිදුරටත් බල ගැන්වීම හා ස්වාධීනත්වය ලබාගැනීමෙන් හා විද්‍යාත්මක විමර්ශනවල සහයෝගය හේතුවෙන් මෑතක දී එරටේ දඬුවමින් මිදී අපරාධ සිදු කරන තත්ත්වය අවසන් වීමට පටන් ගත්තේය.

> *“අස්ථි ඉතා අනර්ඝ සාක්ෂි වේ.... ඒවා කිසිදිනක බොරු කියන්නේ නැත; කිසිදිනෙක අමතක කරන්නේ නැත.”*
>
> - ක්‍රලයිඩ් ස්නෝ **

විද්‍යාත්මක සාක්ෂි සාක්ෂිකරුවන් විසින් සාක්ෂි තහවුරු කිරීමට උපකාරී වූ අතර, ඉක්සිල් ප්‍රදේශයේ සමූල ඝාතන අපරාධ හා මානව සංහතියට එරෙහි අපරාධ පිළිබඳ සාධක ඔප්පු කිරීමට ද උපකාරී විය. අපරාධවල ප්‍රවණතා පිළිබඳ සිදුකළ විශ්ලේෂණය වින්දිතයන්ගේ ජනගහන ලක්ෂණ හා අපරාධය සිදු කළ පුද්ගලයන් විසින් භාවිතා කරන කරන ලද උපාය මාර්ගවල ක්‍රමානුකූල ස්වභාවය හා ප්‍රචණ්ඩත්ව වර්ග එළි කළේය. උදහරණයක් වශයෙන් මගින් ඇස්වසන රෙදි මුකවාඩම්, වළලුකර හා මැණික් කටු වටේ ලණු පාවිච්චි කිරීම, ඒ වගේම කාන්තාවන්, ළමයින් හා වයෝවෘද්ධ පුද්ගලයන් ඉලක්ක කර ඝාතන සිදු කිරීම යන දේවල් භෞතික සාක්ෂි පෙන්වා දෙන ලදී. එක්සිල් ජන කණ්ඩායම රාජ්‍යයේ සතුරා ලෙස හඳුනාගෙන තිබූ හමුදා සැලසුම් ද ඇතුළුව ලේඛන සාක්ෂි ගෞතමාලා විද්‍යාත්මක සාක්ෂි පදනමේ නිගමයන් ඔප්පු කළේය.[27] අවසන් වශයෙන් FAFG වෙතින් ලබාගත් විද්‍යාත්මක සාක්ෂි හා ලේඛන සාක්ෂි අධිකරණය විශ්වාසය කළේය. "ඉක්සිල් ජන කණ්ඩායමට එරෙහිව සිදු කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියා එසැණින් සිදු කළ ක්‍රියා නොව කලින් සංවර්ධනය කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම මගින් සිදු වූ බව ඔප්පු වන බවත්, එය නිශ්චිත ජනවාර්ගික කණ්ඩායමක් විනාශ කිරීමේ අරමුණින් යුතු රජයේ ප්‍රතිපත්තියේ කොටසක් බව ඔප්පු වන බවත්" තහවුරු කරන ලදී.[28] කෙසේවෙතත්, දැඩි දේශපාලන බලපෑම හේතුවෙන් මෙම තීන්දුව ලබා දී දින 10 කින් පසු ව්‍යවස්ථා අධිකරණය මෙම නඩුවේ කොටසක් නැවත විභාගය විය යුතු බව නියෝග කළ අතර, මැයි 10 වෙනි දින ලබාදෙන ලද තීන්දුව අහෝසි කළේය.[29] කෙසේවෙතත්, ඉක්සිල් සමූල ඝාතන නඩුව දේශීය අධිකරණ විසින් ලබාගන්නා ලද ප්‍රගතිය ඉතා බලවත් ලෙස පෙන්වා දුන් අතර, මානව හිමිකම් නඩු පැවරීම සඳහා විද්‍යාත්මක සාක්ෂියේ දායකත්වය ද පෙන්නුම් කළේය.

### වින්දිතයන් නියෝජනය කිරීමටත්, සාක්ෂි තහවුරු කිරීමටත් පාවිච්චි කරන ලද විද්‍යාත්මක සාක්ෂි

මෙම පසුබිම තුළ රජයේ අභිචෝදක කාර්යාලය, මානව හිමිකම් සංවිධාන හා FAFG පදනම විශේෂයෙන් නඩු පවරන මෙවලමක් වශයෙන් විද්‍යාත්මක සාක්ෂිවල ඉහළ ධාරිතාව හා අවබෝධයක අවශ්‍යතාවය පිළිගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් FAFG පදනම 2015 වසරේ විද්‍යාත්මක භෞතික සාක්ෂි පිළිබඳ අන්තර් ආයතන ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කළේය. මෙම ක්‍රියාකාරී කණ්ඩායම නඩුවලට විද්‍යාත්මක සාක්ෂි ඇතුළත් කරන ආකාරය පිළිබඳවත් සාක්ෂිකරුවන් ඉදිරිපත් කරන සාක්ෂි, විද්‍යාත්මක සාක්ෂි හා ලේඛන සාක්ෂි අතර පවතින සබඳතාවය පිළිබඳවත් අභිචෝදකයන් හා මානව හිමිකම් නීතිඥයන්ට පුහුණුව ලබාදුන්නේය. *Sepur Zarco* නඩුව හා CREOMPAZ නඩුව, විද්‍යාත්මක සාක්ෂි පාවිච්චි කිරීමේ අභිචෝදකයන්ගේ හැකියාව කෙරෙහි ක්‍රියාකාරී කණ්ඩායමේ ධනාත්මක බලපෑම පෙන්වාදෙයි.

***Sepur Zarco* නඩුව.** 2016 පෙබරවාරි 26 වෙනි දින *Sepur Zarco* නඩුවේ ගෞතමාලා ඉහළ අවදානම් අධිකරණයේ A විනිශ්චය සභාව මායා කුවේකි ගෝත්‍රයට අයත් කාන්තාවන් 15 දෙනෙකුට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩත්වය, ලිංගික වහල්භාවය හා ගෘහස්ථ වහල්භාවය ඇතුළත් මානව සංහතියට එරෙහි අපරාධ ක්‍රියා සිදු කිරීම පිළිබඳවත්, ඔවුන්ගේ ඥාතීන් ඝාතනය කිරීම හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳවත් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් දෙදෙනෙකුට දඬුවම් නියම කළේය. විශේෂයෙන් වතාවට ලිංගික වහල්භාවය හා ගෘහස්ථ වහල්භාවය පිළිබඳ දේශීය අධිකරණයකින් දඬුවම් පමුණු වන ලද පළවෙනි අවස්ථාව විය. ගෞතමාලාවේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා අපරාධවලට එරෙහිව පවරන ලද පළවෙනි නඩුව ද විය.

ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම (FAFG) මෙම නඩුවේ දී ඉතා වැදගත් විද්‍යාත්මක සාක්ෂි ඉදිරිපත් කළේය. ජීවතුන් අතර සිටින පුද්ගලයන්ගෙන් හා වින්දිතයන්ගේ පවුල්වලින් ලබාගත් සාක්ෂි පදනම් කරගෙන, මෙම පදනම සමූහ මිනීවළවල් තිබෙන දුසිමකට වැඩි ස්ථාන සොයාගෙන, ඒවාවල තිබූ මිනී ගොඩගත්තේය. *Sepur Zarco* ප්‍රදේශයෙන් හා ටිනාජාස් හමුදා කඳවුරුවලින් අවම වශයෙන් 51 දෙනෙකුගේ මිනී ගොඩගන්නා ලදී. ගෞතමාලාවේ පළවෙනි වතාවට

මළ සිරුරුවල කොටස් විවෘත උසාවියේ ඉදිරිපත් කරන ලද අතර, භෞතික සාක්ෂි පරීක්ෂා කර බැලීමට විනිසුරුවන්ටත්, අභිචෝදකයන්ටත්, විත්තියේ නීතිඥයන්ටත් අවස්ථාව ලබාදෙන ලදී.[30] මළ සිරුරවල කොටස් එලෙස ප්‍රදර්ශනය කිරීම විද්‍යාත්මක සාක්ෂිවලට මානුෂික මුහුණුවරක් ලබාදුන් ඉතා හැඟීම්බර දෘෂ්ටිමය තත්ත්වයක් ද නිර්මාණය කළේය. ඊට අමතරව FAFG පදනම විසින් හඳුනාගන්නා ලද පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් කෙනෙක් කුවේචි ගෝත්‍රික කාන්තාවකගේ සැමියා වූ අතර, විද්‍යාත්මක සාක්ෂි ඔහු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ ඇය විසින් ලබාදෙන ලද සාක්ෂිය තහවුරු කළේය.

***CREOMPAZ නඩුව*** - 2016 ජනවාරි 06 වෙනි දින ලතින් ඇමරිකාවේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ අතිවිශාල සිදුවීම ලෙස ගෞතමාලාවි නීතිපතිවරයා විසින් සඳහන් කරන ලද සිදුවීමකට සම්බන්ධ වූ බව පවසමින් හමුදාවේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 14 දෙනෙක් අත්අඩංගුවට ගන්නා ලදී. මෙම නඩුව ප්‍රාථමික වශයෙන් FAFG පදනම හමුදා කලාප 21 දී සිදු කරන ලද විද්‍යාත්මක විමර්ශන පදනම් කරගෙන ගොනු කරන ලද්දක් වුයේය. මෙම විමර්ශනයේ දී පුද්ගලයන් 85 දෙනෙකුගේ මෘත දේහ ගොඩගන්නා ලද අතර, අවම වශයෙන් පුද්ගලයන් 565 දෙනෙක් වළලා තිබූ සමූහ මිනී වළවල් ද සොයා ගන්නා ලදී. එම 565 දෙනාගෙන් 94 දෙනෙක් ළමයින් විය. ශරීරයේ කොටස්වල ජානමය සාම්පලයන් ඔවුන්ගේ ඥාතීන්ගේ ජානමය සාම්පලයන් සමඟ සංසඳය කිරීම මගින් FAFG පදනම 2017 ජුනි මාසය වනවිට ක්‍රොම්පාස් ස්ථානයෙන් ගොඩගන්නා ලද වින්දිතයන්ගෙන් 145 ක් හඳුනා ගත්තේය.[31] සාක්ෂිකරුවන් හා පවුල් විසින් ලබාදෙන ලද තොරතුරුවල සඳහන් අතුරුදහන්වීම් සිදු වූ ස්ථාන හා වේලාවල් පිළිබඳ පදනම විසින් සිදු කරන ලද විශ්ලේෂණය, එක් ජන කණ්ඩායමකට එරෙහිව උපාය මාර්ගිකව භීෂණය මුදවා හැරීම හා අපරාධවල කාලරාමුව ස්ථාපිත කළේය. 1981 හා 1987 වසර අතර හමුදා කලාප 21 දී සිදුකරන ලද ඝාතන, වදහිංසා හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිදුවීම්වලට අණ ලබාදුන් හෝ ඒවා මෙහෙයවීම සඳහා අත්අඩංගුවට ගත් පුද්ගලයන් 8 දෙනෙකුට එරෙහිව දඬුවම් ලබාදීමට මෙම තොරතුරු ඉතා වැදගත් විය.



FAFG පදනම 2017 ජුනි වනතෙක් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් විමර්ශන 1850 ක් පවත්වා ඇති අතර, ඒ යටතේ 8000 ට වැඩි මිනිස් සිරුරේ කොටස් ලබාගෙන, විශ්ලේෂණය කරන ලදී.

## වින්දිතයන්ගේ සහභාගීත්වයට හැකියාව ලබාදීම සඳහා පාවිච්චි කරන ලද විද්‍යාත්මක සාක්ෂි

සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හා විද්‍යාත්මක සාක්ෂි එකිනෙක සනාථ කරන අන්‍යෝන්‍ය සබඳතාවයක් ඇති සාක්ෂි වේ. උදාහරණයක් වශයෙන් බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි, සාක්ෂිකරුවන් විසින් ලබාදෙන ලද සාක්ෂි මගින් අධිකරණයෙන් ඇතුළත හා අධිකරණයෙන් පිට තහවුරු කර ඇත. ඒ වාගේම FAFG පදනම බොහෝ අවස්ථාවල මිනීවළවල් තිබෙන ස්ථාන හොයා ගැනීමටත්, වින්දිතයන් හඳුනා ගැනීමටත්, ඔවුන්ගේ මරණ සිදු වූ පසුබිම් අවබෝධ කරගැනීමටත් සාක්ෂිකරුවන්ගෙන් හා වින්දිතයන්ගේ පවුල්වලින් තොරතුරු ලබාගනී.[33] මෙම පදනම මෙවැනි තොරතුරු ලේඛනගත කර, එහි විශේෂඥ වාර්තාවල කොටසක් වශයෙන් ඒවා ඉදිරිපත් කරයි. විද්‍යාත්මක සාක්ෂි හා සාක්ෂිකරුවන්ගේ සාක්ෂි

වැදගත් නඩු කිහිපයක නඩුව ඔප්පු කිරීමේ තමන්ගේ වගකීම ඉටු කිරීමට නඩු අභිචෝදක පාර්ශ්වයට හැකියාව ලබා දී ඇත.



FAFG සංවිධානය මිනී වළවල් තිබෙන ස්ථාන සොයා ගැනීමටත්, වින්දිතයන් හඳුනා ගැනීමටත් ඔවුන්ගේ මරණ සිදුවූ වටපිටාව අවබෝධ කර ගැනීමටත් බොහෝ අවස්ථාවල විද්‍යාත්මක සාක්ෂිවලට අමතරව සාක්ෂිකරුවන් ගෙන් හා වින්දිතයන්ගේ පවුල්වලින් තොරතුරු ලබා ගනී.



ධූවෙල් ස්ලෙං සමූල ඝාතන කෞතුකාගාරය කැමරූච් පාලනය විසින් 1975 - 1979 කාල වකවානුවේ ආරක්ෂක "සිරගෙය 21" ලෙස පාවිච්චි කරන ලද පරණ උසස් පාසලක් වේ. මෙම ස්ථානයේ පුද්ගලයන් 17,000 ක් පමණ සිරගත කරන ලදී; ඔවුන්ගෙන් 12 දෙනෙක් පමණක් ජීවතුන් අතර සිටියි. Tuol Sleng ගොඩනැගිලි කැමරූච් කණ්ඩායම පළවාහරින අවස්ථාවේ පැවතුණු ඒ ආකාරයේම සංරක්ෂණය කර ඇත.

# පරිච්ඡේදය 6:

# කොලොම්බියාවේ අතුරුදහන් වූ හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරන පුද්ගලයන්: ඇගයීමේ වාර්තාවේ සාරාංශය

## කොලොම්බියාවේ තත්ත්වය

කොලොම්බියානු රජය හා විවිධ ග්‍රාමීය ගරිල්ලා කණ්ඩායම් අතර 1940 ගණන්වල සිට දිග්ගැස්සී ගිය අභ්‍යාන්තර සන්නද්ධ අරගලය අවසන් කිරීම සඳහා ගන්නා ලද බොහෝ උත්සාහයන් අසාර්ථක විය. එහි ක්‍රියාත්මක වූ ගරිල්ලා කණ්ඩායම් වලින් විශාලතම කණ්ඩායම වූ කොලොම්බියා විප්ලවකාරී සන්නද්ධ හමුදාව (FARC) හා රජය 2016 වසර අවසානයේ දී සාර්ථකව සාම ගිවිසුමක එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රධාන වශයෙන් විස්තරාත්මක කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්තිය, දේශපාලන සහභාගීත්වය, නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රශ්නය හා වින්දිතයන්ගේ අයිතීන් හා ආදේශයන් ආමන්ත්‍රණයන් කිරීම සඳහා වූ සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් වැනි දෙවල් ආමන්ත්‍රණය කළේය. නව සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය 2005 වසරේ ක්‍රියාත්මක කරන ලද අතීත ක්‍රියාවලියේ වැරදි නැවතත් සිදු නොකරනු ඇතැයි කොලොම්බියානු ජනතාව දැඩි ලෙස විශ්වාස කළහ. උදාහරණයක් වශයෙන් 2005 ක්‍රියාවලිය (මහජනතාවට තවමත් නොලැබී තිබෙන ඉතා කාලාතුරකින් සනාථ කරගන්නා ලද) කටඋත්තර හුවමාරු කර ගැනීම සඳහා, විසුරුවා හරින ලද සන්නද්ධ කණ්ඩායම්වල සිටි සටන්කාමීන් ද අඩු දඬුවම් ලබාදෙන ලදී.

කොලොම්බියාවේ අපරාධ සිදුකරන විවිධ පුද්ගලයන් 1970 ගණන්වල සිට ප්‍රජාවන් තමන්ගේ පාලනයට නතු කරගෙන තිබූ අතර, බලහත්කාරයෙන් පුද්ගලයන් අතුරුදහන් කිරීම හරහා විරුද්ධ මත මැඩපවත්වා ඇත. අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරන ලද පුද්ගලයන් අතර ප්‍රජා නායකයන්, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයන් හා සන්නද්ධ කණ්ඩායම්වලට විරෝධය දැක් වූ අනෙකුත් සාමාන්‍ය පුරවැසියන් ඇතුළු විය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සිදුවීම්වලින් පසුව සාමාන්‍යයෙන් ඝාතන, අධිකරණ ක්‍රමයට බාහිරව සිදු කරන මිනීමැරුම්, ලිංගික ප්‍රචණ්ඩත්වය හා බලහත්කාරයෙන් අවතැන් කිරීම වැනි මානව හිමිකම් උල්ලංඝනයවීම් සිදු වේ. හෝ එවැනි සිදුවීම්වලින් පසු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිදුවීම් සිදු වේ. ඓතිහාසික මතකය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයේ අදහස අනුව, දක්ෂිණාංශික සන්නද්ධ කණ්ඩායම් බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන්වීම්වලින් බොහෝමයක් සිදු කර ඇත. (බොහෝ අවස්ථාවල රජයේ සහභාගීත්වයෙන් හෝ එකඟත්වය මත මේවා සිදු කරන ලදී.) කොලොම්බියාවේ විප්ලවකාරී සන්නද්ධ බලකාය (FARC) හා අනෙකුත් වාමාංශික ගරිල්ලා කණ්ඩායම් පුද්ගලයන් පැහැර ගැනීම් සිදුවීම් බොහෝමයක් සිදු කර ඇත. එම සිදුවීම් ද බොහෝ අවස්ථාවල බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ලෙස වර්ගීකරණය කරන ලදී. හමුදාව ද සැලකිය යුතු සංඛ්‍යාවක බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සිදුවීම් සිදු කර තිබුණි.




බොගෝටා ප්‍රධාන චතුරස්‍රයේ 2010 අගෝස්තු මාසයේ අතුරුදහන් වු අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ දිනයේ දී අතුරුදහන් වු තමන්ගේ ආදරණීය නෑදෑ හිතවතුන්ට ප්‍රණාම දක්වන ඥාතීන්.

වින්දිතයන් පිළිබඳ රජයේ ලේඛනයේ අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන පුද්ගලයන් 47,000 ක් හා එම පුද්ගලයන්ගේ ඥාතීන් 120,000 ක් ලියාපදිංචි වී ඇති බව රජය 2016 ඔක්තොම්බර් මාසයේ වාර්තා කළේය. කෙසේවෙතත්, වින්දිතයන්ගේ කණ්ඩායම් හා සිවිල් සමාජ සංවිධාන තව බොහෝ සිදුවීම් මෙම ලේඛනයේ ලියාපදිංචි වී නොමැති බව පවසති. උදාහරණයක් වශයෙන් 2010 වසරේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධ කෘත කිරීමට පෙර සිදු වී ඇති එවැනි අතුරුදහන් කිරීම් සිද්ධීන් පිළිබඳ දත්ත රැස්කිරීම පිළිබඳ අභියෝග පවතී. තව ද රජයේ විවිධ ලේඛන නොගැළපෙන සංඛ්‍යා ඇතුළත් කර වාර්තා කර ඇත. ඇත්ත වශයෙන්ම 2017 ජූනි මාසය වනවිට අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ එක්රැස් කරන ලද නිල වාර්තා නොතිබුණි. එය බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද සිදුවීම්වල ප්‍රමාණය, ප්‍රවණතාවයන් හා බලපෑම් තීරණය කරගැනීමේ හා එය පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයන් සීමා කරයි. තව ද බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද සිදුවීම්වල ප්‍රවණතාවයන් හා භාවිතයන් පිළිබඳ දත්ත පදනම් කරගෙන ක්‍රමානුකූල ප්‍රවේශයක් සඳහා රජය ශක්තිමත් ආකාරයෙන් කටයුතු කර නොමැත.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිද්ධීන් වින්දිතයන්ගේ පවුල්වලට අඛණ්ඩව දැඩි පීඩාවන් ඇති කර තිබෙන අතර මෙවැනි සිදුවීම් පිළිබඳ අර්ථාන්විත විමර්ශයන් පවත්වා ඔවුන්ගේ ඥාතීන්ට තොරතුරු ලබාදීම පිළිබඳ රජය අඛණ්ඩව අසාර්ථක වන තත්ත්වය මෙය තවදුරටත් තීව්‍ර කර ඇත. අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල් සංවිධානාත්මක අපරාධ කල්ලි හා වාමාංශික ගරිල්ලා කණ්ඩායම්වලින් ලැබෙන තර්ජන ද ඇතුලුව අනෙකුත් බාධකවලට ද මුහුණ දී සිටිති. මෙම කණ්ඩායම් සමහර ප්‍රදේශවල තවමත් සක්‍රීයව ක්‍රියාත්මක වේ. හමුදාව හා සන්නද්ධ කණ්ඩායම් පවුල් තමන්ගේ නිවෙස්වලින් බලහත්කාරයෙන් අවතැන් කර ඇත. මෙම සාධක හේතුවෙන් හා අධිකරණ පද්ධතිය පිළිබඳ පවතින අවිශ්වාසය, කොන් කිරීම, පළිගැනීම් පිළිබඳ බිය ඇතුලු අනෙකුත් සාධක හේතුවෙන් ප්‍රාදේශීය බලධාරීන් සමඟ විධිමත් පැමිණිලි ගොනු කිරීමට පවුල් පැකිලීමක් දක්වා ඇත.[1] මෙය බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිදුවීම්වල ප්‍රමාණය හා ප්‍රවණතාවයන් අවබෝධ කරගැනීමේ ප්‍රයත්නයන්ට තවදුරටත් බාධාවන් ඇති කරයි.

**අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ සන්ධානයේ ඇගයීම.**

2016 නොවැම්බර් 24 වෙනිදා රජය හා FARC සංවිධානය අවසන් සාම ගිවිසුමකට එළඹූ අතර වසර 50 කට පසු කොලොම්බියාවේ සිදු වූ සන්නද්ධ අරගලය ඒ සමගම අවසන් විය. සතියකට පසු එම ගිවිසුම කොන්ග්‍රස් සභාව විසින් සම්මත කරන ලදී. ඉන් අනතුරුව සත්‍යය, යුක්තිය, හානිපූර්ණය හා නැවත ඇති නොවීම සඳහා වූ විස්තරාත්මක පද්ධතියක් 2017 අප්‍රේල් මාසයේ ව්‍යවස්ථා තත්ත්වයන් සමඟ නිර්මාණය කරන ලදී. මෙම පද්ධතිය සත්‍යය පැහැදිලි කරගැනීම සඳහා වූ කොමිෂන් සභාව, සහජීවනය හා නැවත ඇති නොවීම හෝ සත්‍යය පැහැදිලි කිරීමේ කොමිෂන් සභාව වැනි සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ නව යාන්ත්‍රණයන් ස්ථාපිත කරනු ලැබීය; සන්නද්ධ අරගලයේ පසුබිම තුළ හා එම අරගලයේ හේතුවෙන් අතුරුදහන් වී ඇති බව සළකන පුද්ගලයන් සෙවීම සඳහා ඒකකයක් ද ස්ථාපිත කරන ලදී; තව ද ඉන්පසුව රජය සත්‍යය පැහැදිලි කරගැනීමේ කොමිෂන් සභාව (2017 598 නියමය) හා සේවීමේ ඒකකය (2017 589 නියමය) ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියා පිළිවෙත් ඇතුලු නීති රීති රජය විසින් නිකුත් කරන ලදී. 2017 ජූනි මාසයේ මෙය ලියන අවස්ථාවේ නව යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුන්වා දී ඇති නීති රීතිවල ව්‍යවස්ථානුකූලභාවය ව්‍යවස්ථා අධිකරණය තවමත් පරීක්ෂා කරමින් සිටී. ඊට අමතරව සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්, විශේෂ අධිකරණය සඳහා වූ විනිසුරුන් හා සෙවීමේ ඒකකයේ අධ්‍යක්ෂකවරයා යන අය පත්කිරීමේ ක්‍රියාවලියේ විශේෂ කමිටුවක් යෙදී සිටී.

බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද සිදුවීම් ආමන්ත්‍රණය කිරීම් හා කණ්ඩායම් ඝාතන සඳහා වගකීම ස්ථාපිත කිරීම කොලොම්බියාවේ සංක්‍රාන්තික යුක්තිය හා සංහිඳියාව මුහුණපාන ඉතා වැදගත් ප්‍රශ්නවලින් එකක් වේ. කණ්ඩායම් ඝාතනවල දී එක සිදුවීමක දී බොහෝ පුද්ගලයන් ඝාතනයට ලක් වු අතර ප්‍රධාන ආයතන හා ක්‍රියාධරයන් ක්‍රමානුකූලව ඝාතනයට ලක් කරන ලදී. නව සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් 2000 මුල් කාලයේ සිට දැනට පවතින යාන්ත්‍රණයන්ට මුණපුරණය කරයි. මෙම පසුබිම තුළ යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ ගෝලීය සංසදය 2016 අගෝස්තු සාම ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන් සංක්‍රාන්තික යුක්තිය සඳහා වු බලාපොරොත්තු හා අවස්ථා අවබෝධ කරගැනීම සඳහා ඇගයීමක් සිදු කළේය. 2016 අගෝස්තු සාම ගිවිසුම 2016 නොවැම්බර් මාසයේ එළඹෙන ලද අවසන් ගිවිසුමට පෙර සංශෝධනය කරන ලදී. හෘද සාක්ෂිය පිළිබිඹු කරන ජාත්‍යාන්තර ස්ථානවල සන්ධානය, නීතියේ නිසි ක්‍රියාවලිය පිළිබඳ පදනම (DPLF) හා ගෞතමාලාවේ විද්‍යාත්මක සාක්ෂි මානව විද්‍යා පදනම යන සංවිධාන නියෝජන කළ විෂයාන්තර කණ්ඩායම 2016 ජුනි මස හා අගෝස්තු මස අතර කාල වකවානුවේ මෙම ඇගයීම සිදු කළේය. කණ්ඩායම කොලොම්බියාවේ දින 10 ක් ගතකළ අතර බුගෝටා නගරයට හා දැඩි ලෙස පීඩාවට පත්ව තිබූ නගර දෙකක ද චාරිකාවේ යෙදුණේය. ඇන්ටුකුවා දෙපාර්තමේන්තුවේ අගනුවර වන මැඩලෙන් නගරය රටේ ඉහළම ප්‍රමාණයේ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද සිදුවීම් වාර්තා කරන ලද නගරය විය. ලොස් ලානෝස් ප්‍රදේශයේ මධ්‍යම නගරයක් වන විලාවී සෙන්සෝ නගරයේ සොහොන් කොත්වල මිනිස් ශරීරයේ කොටස් සොයා ගැනීම සඳහා රජයේ මෑතකදී සෙවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළේය. මෙම කණ්ඩායම රජයේ නිලධාරීන්, වින්දිතයන්ගේ කණ්ඩායම්, සිවිල් සමාජ සංවිධාන හා ජාත්‍යාන්තර ප්‍රජාවගේ නියෝජිතයන් වැනි පාර්ශවකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා 80 ක් පමණ සිදු කළේය.[2] අතුරුදහන් වු පුද්ගලයන් සෙවීම, ශරීරයේ කොටස් හඳුනාගැනීම හා පවුල්වලට ලබාදීම යන දේවල්වල සිදු වී ඇති වෙනස්කම් හා අභියෝග පිළිබඳ අතුරුදහන් වු හා අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල් සමඟ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ද පැවැත් වුහ. අවසානයේ දී මෙම කණ්ඩායම සදානුස්මරණ ප්‍රයත්නයන් හා අතුරුදහන් වු බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ගැටළු පිළිබඳ දැනුවත් කිරීම වැඩි කිරීමේ හැකියාව ද ඇගයීමට ලක් කළේය. සන්ධානය එහි නිගමයන් පදනම් කරගෙන කොලොම්බියා රජය එක්සත් ඇමරිකානු ජනපදය වැනි අරමුදල් සපයන රටවල් හා සිවිල් සමාජ ද ඇතුලු පුළුල් පරාසයේ පාර්ශයකරුවන් වෙත නිර්දේශ ඉදිරිපත් කළේය.



2013 අගෝස්තු මාසයේ බුගෝටාවේ බෝලොවියා චතුරස්‍රයේ අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ දිනය සමරන ලද අවස්ථාවේ පවත්වන ලද ප්‍රදර්ශනයක්

**අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ගැටළුව ආමන්ත්‍රණය කිරීමේ දී වත්මන් සාමාන්‍යය අධිකරණ බලය හා සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන්වල පවතින අභියෝගයන්** අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා පසුගිය දශක දෙක කාලය තුළ කොලොම්බියාව ශක්තිමත් නීති පද්ධතියක් සංවර්ධනය කර ඇත. කෙසේ වෙතත් බලහත්කාරයෙන් අතුරුදහන් කළ සිදුවීම්වල ප්‍රමාණය හා රටතුළ ඇති වී තිබෙන දෙපිළකට බෙදීමේ තත්ත්වය නීති ක්‍රියාත්මක කිරීමේ දී දැඩි දුෂ්කරතාවයන් නිර්මාණය කර ඇත. ඊට අමතරව මෑත වසරවල දී අතුරුදහන්වීමේ ප්‍රතිශතය සෑහෙන ප්‍රමාණයකට අඩු වී ඇති නමුත් අලුත් සිදුවීම්වල සංඛ්‍යාව දැනට තිබෙන සිදුවීම් විසඳීමේ මන්දගාමී තත්ත්වය අභිබවා යයි. රජයේ ආයතන අතර සම්බන්ධීකරණය නොමැති වීම, විශාල ප්‍රමාණයේ සිදුවීම් ආමන්ත්‍රණය කිරීමට සිදු වීම හා අතුරුදහන් වූ බලහත්කරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ නඩුවලට වඩා වත්මන් අපරාධ නඩුවලට බොහෝ අවස්ථාවල ප්‍රමුඛතාවය ලබාදීම වැනි කරුණු මෙයට බාධක වශයෙන් පවතී. උදාහරණයක් වශයෙන් පසුගිය වසර 5 තුළ විවෘත කරන ලද බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද සිදුවීම්වල නඩු 2% ක් පමණක් සාමාන්‍ය අධිකරණ බලයේ යාන්ත්‍රණයන් යටතේ නඩු විභාගයට අරගෙන ඇත.

**දැනට පවතින සාමාන්‍ය අධිකරණ බලය සහිත යාන්ත්‍රණවල අභියෝගයන්**

2000 වසරේ අංක 589 දරණ නීතිය අතුරුදහන් වූ පුද්ගලයන් සෙවීම සඳහා වූ ජාතික කොමිෂන් සභාව හෝ සෙවීමේ කොමිෂන් සභාව නිර්මාණය කළේය. බලහත්කාරයෙන් අතුරුදහන් වූ සිදුවීම් පිළිබඳ විමර්ශනවලට සහයෝගය ලබාදීම සඳහාත් ඒවා ප්‍රවර්ධනය කිරීම සඳහාත් අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් සෙවීම සඳහා සැලසුම් නිර්මාණය කිරීම, ඇගයීම හා ක්‍රියාත්මක කිරීම සඳහාත් මෙම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. අලුතෙන් ස්ථාපිත කරන ලද සෙවීමේ ඒකකය වෙනම ඒකකයක් වේ. කෙසේ වෙතත් එහි සීමිත අයවැය හා ව්‍යුහය හේතුවෙන් සාර්ථක සෙවීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකියාවක් පවතී. මෙය අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල්, වින්දිතයන්ගේ කණ්ඩායම් හා සිවිල් සමාජ සංවිධාන අතර දැඩි කළකිරීමක් ඇති කර ඇත. එය වෙනුවට සෙවීමේ කොමිෂන් සභාව නීතිපති කාර්යාලය ඔම්බොස්මන්ඩ් කාර්යාලය ජාතික සොලිසිඩර් කාර්යාලය සන්නද්ධ හමුදා

පොලීසිය වැනි රජයේ ආයතනවලට නීති මෙවලම් හා ක්‍රියා පිළිබඳ යෝජනා කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නමුත් සෙවීමේ කොමිෂන් සභාව සැලසුම් අධීක්ෂණය කිරීමේ කාර්‍යයන්වල නොයෙදේ. ඊට අමතරව නීතිපති කාර්යාලය සාමාන්‍යය භාවිතයේ දී සෙවීමේ කොමිෂන් සභාවෙන් ලැබෙන සෘජු ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් විමර්ශන ආරම්භ කරන්නේ නැත. එසේ කිරීමට එයට නෛතික බැඳීමක් තිබෙන නමුත් එසේ නොකරයි. තව ද නීතිපති කාර්යාලය නඩු ප්‍රමුඛතාගත කිරීම පිළිබඳ අඛණ්ඩව වෙනස්වන ඔවුන්ගේ කාර්‍යය පටිපාටිය අනුව කටයුතු කරයි. සෙවීමේ කොමිෂන් සභාවෙන් නිර්දේශ කරන ලද නඩු පිළිබඳ අවධානය යොමු නොකරයි.

බොහෝදුරට ප්‍රයෝජනවත් විය හැකි රජයේ මෙවලමක් වන්නේ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජාතික ලේඛනය වේ. එය 2005 වසරේ ස්ථාපිත කරන ලදී.2007 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද එහි ප්‍රධාන සෙවීමේ දත්ත පද්ධතිය - අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජාල තොරතුරු පද්ධතිය - වාර්තා කරන ලද අතුරුදහන්වීම් සිදුවීම් පිළිබඳ තොරතුරු හා සසඳා බලනු ලැබේ. නීති, වෛද්‍යය හා විද්‍යාත්මක සාක්ෂි පිළිබඳ ජාතික ආයතනය විසින් රැස් කරන ලද හඳුනා නොගන්නා ලද පුද්ගලයන් පිළිබඳ දත්ත සසඳා බලයි. අවාසානාවකට මෙන් 2010 වසරේ අංක 1008 දරණ නීතිය යටතේ නෛතික බැඳීමක් තිබෙන නමුත් රජයේ ආයතන කිහිපයක් පමණක් අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජාලගත තොරතුරු පද්ධතියේ තිබෙන වාර්තා යාවත්කාලීන කරයි. ඇත්ත වශයෙන් මෙම ජාල පද්ධතිය මුහුණපාන ප්‍රධාන අභියෝගයක් වන්නේ තොරතුරු නිතිපතා යාවත්කාලීන කිරීමටත් සහතික කිරීමටත් අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ සිදුවීම් පද්ධතියට නිසි ලෙස ඇතුල් කිරීමටත් තුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ඥාතීන්ගෙන් ලබාගත් ජීව විද්‍යාත්මක සාම්පලයන් රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම මගින් අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ජානමය දත්ත බැංකුව පුළුල් කිරීමට අවශ්‍ය මානව හා මුල්‍යය සම්පත් ප්‍රමාණවත් ලෙස නොලැබේ.

## සන්නද්ධ කණ්ඩායම් විසුරුවා හැරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු රජයේ තහවුරු නොකරයි.

2005 වසරේ අංක 975 දරණ යුක්තිය හා සාමය පිළිබඳ නීතිය සන්නද්ධ කණ්ඩායම්වල සිටින සටන්කාමීන් විසුරුවා හැරීමට සහයෝගය දැක්වීම සඳහා හඳුන්වාදෙන ලදී. මෙම නීතිය යටතේ අපරාධ සිදුකරන පුද්ගලයන් මිනීවළවල් තිබෙන ස්ථාන පෙන්වාදීම හා වින්දිතයන්ගේ පවුල්වලට හානිපූර්ණ ලබාදීම වෙනුවට සෑහෙන ප්‍රමාණයක අඩු කරන ලද දඬුවම් ලබාගැනීමේ අයිතිය සතුව සිටිති. විශාල ප්‍රමාණයේ භාණ්ඩ හා සීමිත සම්පත් හේතුවෙන් අභිචෝදකයන් එවැනි භාණ්ඩ සනාථ නොකර එහි සාමාන්‍යය වටිනාකම සැලකිල්ලට ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෘත දේහයන් ලබානොගෙන විශාල ප්‍රමාණයේ මිනීවළවල් ගොඩදමා ඇත. තොරතුරු සනාථ කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව අසමත් වීම අතුරුදහන් වූ අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල්වලටත්, ප්‍රජාවන්ටත්, සිවිල් සමාජ සංවිධානවලටත් බලහත්කාරයෙන් අතුරුදහන් කරන සිදුවීම් ආමන්ත්‍රණය කිරීම සඳහා රජය සතුව දේශපාලන කැමැත්තක් නොමැති බව විශ්වාස කිරීමට සිදු වී ඇත.

## මෘතදේහ කොටස් ආපසු ලබාගැනීම හා හඳුනාගැනීම සඳහා විද්‍යාත්මක විමර්ශන මන්දගාමී ලෙස සිදු කරනු ලැබේ.

සාම ගිවිසුම යටතේ නව සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීමට පෙර විද්‍යාත්මක සාක්ෂි ආයතනය, නීතිපති කාර්යාලයේ තාක්ෂණික විමර්ශන ඒකකය හා නීතිමය පොලිස් හා ජාතික පොලිස් විමර්ශන අධ්‍යක්ෂක කාර්යාලය යන ආයතන මෘතදේහ නැවත ගොඩගැනීමට නීත්‍යානුකූලව හැකියාව ලබා සිටි එකම ආයතනය විය. මිනිස් ශරීරයේ කොටස් හඳුනාගැනීමට උපකාරීවීම සඳහා 2010 වසරේ විද්‍යාත්මක සාක්ෂි ආයතනය ජානමය දත්ත බැංකුවක් ස්ථාපිත කළේය. හඳුනානොගත් මෘතදේහවල ඩීඑන්ඒ ලබාගෙන ඒවා අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ඥාතීන්ගේ ඩීඑන්ඒ සමග සංසදනය කිරීම සඳහා මෙය ස්ථාපිත කරන ලදී. විද්‍යාත්මක

සාක්ෂි ආයතනය හා නීතිපති කාර්යාලය ජාත්‍යාන්තර අරමුදල් ලබාදෙන ආයතනවල සහයෝගයෙන් විශේෂ රසායනාගාර කිහිපයක් ස්ථාපිත කළේය. එම රසායනාගාර 2016 ජූනි මාසය වනවිට අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් 107 දෙනෙක් හඳුනා ගත්තේය. විද්‍යාත්මක සාක්ෂි ආයතනය 2015 වසරේ අපරාධ සිදු කළ පුද්ගලයන් බොහෝ අවස්ථාවල මෘතදේහ දමාගොස් ඇති සොහොන් බිම්වල මිනිස් ශරීරයේ කොටස් ආපසු ලබාගැනීමටත් ඒවා හඳුනා ගැනීමටත් සැලැස්මක් ක්‍රියාත්මක කළේය. 2016 ඔක්තොම්බර් මාසය වනවිට එම සොහොන් බිම්වලින් ගොඩගන්නා ලද ශරීර කොටස් 381 න් 14 ක් පමණ හඳුනාගෙන තිබිණි.

### අධීක්ෂණ හා ඇගයීමේ ප්‍රයත්නයන් ඒකාකාරී ලෙස හෝ ස්වාධීනව සිදු නොවේ.

සෑම රජයේ ආයතනයක්ම "අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්" පිළිබඳ වෙන වෙන නිර්වචන භාවිතා කරයි. එය වැරදි සංඛ්‍යා ලේඛණ නිර්මාණය කර ඇති අතර අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් ගණනය කිරීම සඳහා වූ ප්‍රයත්නයන් නිරවද්‍යය ලෙස අධීක්ෂණය කිරීමටත් ඇගයීමටත් ආසීරු වූ තත්ත්වයක් නිර්මාණය කර ඇත. නීතිය මඟින් සෙවීමේ කොමිෂන් සභාව අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ ප්‍රශ්නයේ ප්‍රගතිය ඇගයීම සඳහා වගකීම් සතුව සිටියි. නමුත් එම කොමිෂන් සභාව පරිපාලන වශයෙන් හා මූල්‍යය වශයෙන් අධීක්ෂණය හා ඇගයීම් සඳහා මැන්ඩේට් බලය ලබාගෙන තිබෙන ආයතන මත රඳා පවතියි. ඊට අමතරව රජයේ ආයතන රජයේ සහභාගීත්වය සහිත හෝ රහිත හෝ රජයේ සම්බන්ධ සහිතව සිදු කර ඇති අතුරුදහන්වීම් සිදුවීම් අතර නෛතික නිර්වචනයක් නොමැති හේතුවෙන් රජයේ ආයතන අතුරුදහන් වූ සිදුවීම් විවිධ ආකාරයෙන් වර්ගීකරණය කරයි. "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම" යන වචනයේ නෛතික නිර්වචනය කොලොම්බියාවේ අඩුපාඩු සහිතව පවතින තත්ත්වය රාජ්‍යයේ වගකීම අධීක්ෂණය කිරීම සඳහා තවත් අභියෝගයක් එල්ල කරයි. එය බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව විසින් විවේචනයට ලක් වී ඇත.




අතුරුදහන් වු හා අතුරුදහන් කරන පුද්ගලයන් වෙනුවෙන් වෙන්කර ඇති ගැලරියක් 2010 වසරේ සාමය ප්‍රවර්ධනයේ කිරීමේ ප්‍රදර්ශනයක් පවත්වයි.

## වර්ගීකරණය කර තිබෙන තොරතුරු ලබාගැනීම සඳහා වු නීති පරස්පර විරෝධී වේ.

තොරතුරු ලබාගැනීම සඳහා දැනට නීති රීති දෙකක් තිබේ; නමුත් ඒවා එක්තරා මට්ටමකට පරස්පර විරෝධී වේ. 2013 වසරේ අංක 1621 නීතිය (බුද්ධි හා බුද්ධි පනත) ආරක්ෂක නියෝජිත ආයතනය විසින් නිර්මාණය කරනු ලබන සියලු තොරතුරු වර්ගීකරණය කරනු ලබන අතර අවම වශයෙන් වසර 30 කට සීමා කර තිබේ. 2014 වසරේ අංක 1712 නීතිය (පාරදෘශ්‍යභාවය හා ජාතික ප්‍රසිද්ධ තොරතුරුවලට පිවිසීමේ අයිතිය පිළිබඳ පණත) සියලු තොරතුරු නිශ්චිත වශයෙන් වර්ගීකරණය කර තිබෙන ලිපිගොනු හැර ප්‍රසිද්ධියේ ලබාදිය යුතු බව සඳහන් කරයි. මෙම නීතිය ද මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට සම්බන්ධ නඩුවල හෝ මානව සංහතියට එරෙහි අපරාධ පිළිබඳ නඩුවලට අදාළ ලේඛන වර්ගීකරණය කළ නොහැකි බව සඳහන් කරයි.

## රජයේ වින්දිතයන්ගේ කණ්ඩායම් හෝ සිවිල් සමාජ සංවිධාන සමඟ කටයුතු නොකරයි.

අතුරුදහන් වු බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල් හා සහාය කණ්ඩායම් මෙම අයගේ නඩු විසඳීම සඳහා රජයේ ආයතන අසාර්ථක වී සිටීම පමණක් නොව එම ආයතන මෙම පවුල්වලට හිරිහැර කිරීම ද හේතු කොටගෙන තමන්ගේ අවිශ්වාසය පළකර ඇත. පවුල්වල ප්‍රයත්නයන් තවදුරටත් සංකීර්ණ කරන කාරණයක් වන්නේ කොලොම්බියාවේ සංකීර්ණ අධිකරණ පද්ධතිය හරහා කටයුතු කිරීම වේ. බොහෝ පවුල්වලට නීතිඥයෙකුගේ නියෝජනය ලබාගැනීමට ආර්ථික ශක්තිය නොමැති හෙයින් හා එය ඔම්බුඩ්ස්මන් කාර්යාලය වැනි රජයේ ආයතනවලින් ලබානොදෙන හෙයින් යුක්තියට පිවිසීම සඳහා වු බාධක ඉහළ මට්ටමක පවතී.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය වසරවල බොහෝ වින්දිතයන්ගේ කණ්ඩායම් හා විශේෂිත සිවිල් සමාජ සංවිධාන අතුරුදහන් වු බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් සොයා හඳුනා ගැනීමට අදාළ වැදගත් ක්ෂේත්‍රවල නිපුණතා දැනුමක් ළඟා කරගෙන තිබේ. මෙයට මනෝ සාමාජීය සහාය, විද්‍යාත්මක සාක්ෂි විධික්‍රම, අධිකරණ කුසලතා, ලේඛනාරක්ෂක පර්යේෂණ හා සදානුස්මරණ යන කරුණු ද ඇතුළත් වේ. සිවිල් සමාජ සංවිධාන රජය නොසපයන හෝ ප්‍රමාණවත් ආකාරයෙන් නොසපයන සේවාවල් සැපයීම මඟින් පරතරයන් පුරවති. සමහර පවුල් රජයේ ආයතන පිළිබඳ තමන්ට තිබෙන අවිශ්වාසය හේතුවෙන් විශේෂඥ දැනුමක් ඇති සිවිල් සමාජ සංවිධාන හරහා බලධාරීන් සමඟ කටයුතු කිරීමට කැමැත්තක් දක්වති. උදාහරණයක් වශයෙන් බොහෝ වින්දිතයන්ගේ

කණ්ඩායම් විවිධ මනෝ සමාජීය විධික්‍රම පිළිබඳ දැනුවත් වී සිටින අතර එය පිළිබඳ ඊට අදාළ උචිත ක්‍රමවේදයන් පිළිබඳ වින්දිතයන්ගේ සම්පූර්ණ සහාය හා හානිපූරණ ලබාදීමේ ඒකකයට හා සමාජ ආරක්ෂණ හා මහජන සෞඛ්‍යය ආමාත්‍යාංශයට පහසුවෙන් උපදෙස් දිය හැකි තත්ත්වයක සිටී. කෙසේ වෙතත් එම ආයතන මගින් ස්ථාපිත කර ඇති ක්‍රියා පටිපාටීන් වලට මැදිහත් වීමට ඔවුන්ට අවසර නොදෙනු ලැබේ.

අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ විමර්ශන එය ඔප්පු කිරීමේ වගකීම පවුල්වලට ලබාදෙන හෙයින් දැඩි ලෙස අවශ්‍යය වන සහාය සිවිල් සමාජ සංවිධානවලට ද ලබාදිය හැකිය. රජයේ ක්‍රියාකාරීකම්වල ප්‍රගතියක් නොමැති හෙයින් පවුල් සම කාලීන විමර්ශන පැවැත්වීමේ හා අභිචෝදකයන්ට සාක්ෂි ලබාදීමේ කටයුතු භාරගෙන ඇත. කෙසේ වෙතත් අභිචෝදකයන් තුන්වැනි පාර්ශවයේ විශේෂඥයන් වශයෙන් සිවිල් සමාජ සංවිධාන පිළිගැනීමට මැළිකමක් දක්වති. මිනිස් ශරීරයේ කොටස් තිබෙන ස්ථාන පිළිබඳ සිවිල් සමාජය ලබා දී ඇති තොරතුරු ඔවුන් අවතක්සේරු කර හෝ නොසලකා හැර ඇත. එවැනි කරුණු අභිචෝදකයන් නෛතික වශයෙන් සැලකිල්ලට ගත යුතු නැත. මෙය සම්මතයක් වශයෙන් රජයේ නිලධාරීන් පුරවැසියන්ගේ අධීක්ෂණය කාලාතුරකින් පිළිගෙන ඇතැයි යැයි අනෙකුත් ඇගයීම්වලින් කර තිබෙන නිගමන ඔප්පු කරයි.

වගවීමට අමතරව වින්දිතයන්ගේ කණ්ඩායම් හා සිවිල් සමාජ සංවිධාන අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ කරුණුවල දී වැඩි වශයෙන් පාරදෘශ්‍යයභාවය ඉල්ලා සිටී. එවැනි තත්ත්වයක් තුළ අතුරුදහන් වූ බලහත්කාරයෙන් අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ගණනය කිරීමේ දී ආයතනවල ක්‍රියා සාධනය පුරවැසියන් විසින් අධීක්ෂණය කිරීම වැඩි දියුණු කරගැනීම සඳහා යාන්ත්‍රණයක් නිර්මාණය කළ යුතු බව ඔවුන් හඬ නගා ඇත. පුරවැසියන්ගේ අධීක්ෂණය ලබාදීම සඳහා වින්දිතයන්ගේ කණ්ඩායම හා සිවිල් සමාජ සංවිධානවල ධාරිතාව හා විශේෂඥ දැනුම ගොඩනැගීමට ජාත්‍යාන්තර ආධාර අත්‍යවශ්‍ය වේ. නමුත් මෙම මූල්‍යාධාර පසුගිය වසරවල අඩු වී තිබේ. මෙවැනි බොහෝ සංවිධානවල නියෝජිතවරුන් තවදුරටත් සිදු කරන කප්පාදුවන් පිළිබඳ කනස්සල්ල පළ කළහ. අරමුදල් සපයන ආයතන සිවිල් සමාජ සංවිධානවල් වෙනුවෙන් රජයේ ආයතනවල ධාරිතා ගොඩනැගීම සඳහා වැඩි වශයෙන් අරමුදල් ලබාදීම මෙයට හේතුව වේ.

### අපරාධ කල්ලි හා විසුරුවා හරින ලද සන්නද්ධ කණ්ඩායම්වල සටන්කාමීන්

### ප්‍රජා නායකයන්ගේ හා මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාවට තර්ජන එල්ල කරති.

විශේෂයෙන් විසුරුවා නොකර ඇති සන්නද්ධ කණ්ඩායම් වන BACRIM වැනි කණ්ඩායම්වලින් ලැබෙන රුදු තර්ජනවලට පසුව තමන්ගේ සෙවීමේ කටයුතු නතර කිරීමට බලකර ඇත. මෙම කණ්ඩායම් කොලොම්බියාවේ බොහෝ ප්‍රදේශවල තවදුරටත් ක්‍රියාත්මක වේ. ඔවුන් BACRIM සංවිධානයේ අපරාධ සඳහා යුක්තිය ඉල්ලා සිටින මානව හිමිකම් ආරක්ෂකයන්ට හා අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුලේ සාමාජිකයන්ට තර්ජන එල්ල කර ඇත. තව ද අඛණ්ඩව සිදුවන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ සිදුවීම්වලින් බොහෝමයක් ඔවුන් අඛණ්ඩව සිදු කරමින් සිටිති. ඊට අමතරව විසුරුවා හැර ඇති සන්නද්ධ කණ්ඩායම්වල බොහෝ සටන්කාමීන් ඉතා ඉක්මණින් තමන්ගේ දඬුවම් කාලය අවසන් කරනු ඇත. ඔවුන් මුදවා හැරීම ප්‍රජාවන්, වින්දිතයන් හා මානව හිමිකම් ආරක්ෂකයන්ට වැදගත් ප්‍රශ්නයක් වනු ඇත. එයට හේතුව සන්නද්ධ කණ්ඩායම්වල හිටපු

මෙම සටන්කාමීන් අඩු දඬුවම් ලබාදීම සඳහා වගකීම පිළිගැනීමට සිදුව තිබුණි. නමුත් එවැනි ක්‍රියා නැවත සිදු නොවීම පිළිබඳ තහවුරුවක් ඔවුන් විසින් ලබාදිය යුතු නැත. සමහර සටන්කාමීන් තමන්ගේ අපරාධ සාධරණීකරණය කිරීමට පවා උත්සාහා දරා ඇත.

මෙම අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා කොලොම්බියානු රජය 2009 වසරේ මානව හිමිකම් ආරක්ෂකයන්ට තහවුරුවන් ලබාදෙන ජාතික ක්‍රියාකාරී කමිටුව ස්ථාපිත කළේය. මෙය මානව ආරක්ෂකයන්ට ශාරීරික ආරක්ෂාව ලබාදෙන විශේෂ ක්‍රියාකාරී කණ්ඩායමක් වන අතර මෙයට රජයේ හා සිවිල් සමාජයේ සාමාජිකයන් සම්බන්ධ වී සිටිති. දැනට එවැනි ආරක්ෂක ක්‍රමයකින් 3500 ක් පමණ මානව හිමිකම් ආරක්ෂකයින් ප්‍රතිලාභ ලබති. සාම ගිවිසුම ගැටුමෙන් පීඩාවට පත් වී තිබෙන ප්‍රදේශවල ආරක්ෂාව සඳහා විස්තරාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන ඇතුලු වී තිබෙන නමුත් මෙවැනි ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක කරුණක් වේ. කොලොම්බියාවේ සමාජය දෙපිළට බෙදී පවතින තත්ත්වය හා (රජයේ නිලධාරීන්ගේ අනුමැතිය සහිතව) මානව හිමිකම් ආරක්ෂකයන් කොන්කර තිබීම මෙයට හේතුව වේ. BACRIM සංවිධානය මෙම මානව හිමිකම් ආරක්ෂකයන් වාමාංශික ගරිල්ලා කණ්ඩායම්වල ආධාරකරුවන් ලෙස සලකති. 2016 ජනවාරි මස සිට 2017 ජුනි මාසය දක්වා 180 ක් පමණ ප්‍රජා නායකයන් ඝාතනයට ලක් වී ඇත. සාම ගිවිසුම හේතුවෙන් ගරිල්ලා කණ්ඩායම් ඉවත්ව සිටි ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් මෙම ඝාතන සිදු වී තිබේ.



2012 අගෝස්තු මාසයේ අතුරුදහන් වූ හා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ දිනයේ දී බෝකුටා නගරයේ ලෝපී චතුරස්‍රය

### වින්දිතයන් සෑහීමට පත්කිරීම හා සදානුස්මරණය මුහුණපාන අභියෝග්

සදානුස්මරණ ක්‍රියාකාරකම් වින්දිතයන් සෑහීමට පත්වීම හා නැවත සිදු නොවීම තහවුරු කිරීමේ එහි හැකියාව හරහා මානව හිමිකම් පිළිබඳ පශ්චාත් ගැටුම් සංස්කෘතියක් පෝෂණය කළ හැකිය. ඒ අනුව අපරාධ සිදුකළ පුද්ගලයන් අඩු දඬුවම් ලබාගැනීම සඳහා නැවත සිදු නොවීම තහවුරු කිරීම අවශ්‍යය නැති තත්ත්වය පිළිබඳ අතුරුදහන් වූ සහ අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුලේ සාමාජිකයන් කනස්සල්ල පළ කර ඇත. අඩු දඬුවම් ලබාගැනීම සඳහා නැවත ඇති නොවීම තහවුරු කිරීම පූර්ව කොන්දේසියක් වශයෙන් නියම කිරීමට අමතරව මෙවැනි වගකීම් පීඩාවට පත් වී සිටින සමාජය පුරා - සමහර අවස්ථාවන් වල මහජනතාව වෙත- පුළුල් කළ යුතු බව පවුල් ඉල්ලා සිටිති.

අතීතයේ දී වින්දිතයන්ගේ කණ්ඩායම් හා සිවිල් සමාජ සංවිධාන පමණක් සදානුස්මරණ ක්‍රියාකාරකම්වල යෙදුණාහ. නමුත් පසුගිය දශකය තුළ දී රජය අනුස්මරණ හා අදාළ ආයතන කිහිපයක් නිර්මාණය කර ඇත. උදාහරණයක් වශයෙන් ඓතිහාසික මතකය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ වැදගත් පර්යේෂණ ප්‍රකාශ කිරීම, මතකය හා මානව හිමිකම් පිළිබඳ ජාතික ලේඛණාගාරය සංවර්ධනය කිරීම හා ප්‍රජා මට්ටමේ සදානුස්මරණ ක්‍රියාකාරකම්වලට අඛණ්ඩව සහයෝගය ලබාදීම මඟින් සත්‍යය පැවසීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත. මහනගර මට්ටමේ බුගෝටා මතකය, සාමය හා සංහිඳියා මධ්‍යස්ථානය හා මෙඩලීන් නගරයේ මතක නිවස කෞතුකාගාරය සුළු ප්‍රමාණයේ මෙවැනිම කාර්යභාරයක් ඉටු කරති. කෙසේ වෙතත් මෙම සදානුස්මරණ ක්‍රියාකාරකම්වල තිරසාරභාවය වියදම් කප්පාදුවේ සිට පරිපාලන කමිටුවල හෝ අධ්‍යක්ෂක මණ්ඩලවල වින්දිතයන්ගේ සීමිත නියෝජනය දක්වා වූ විවිධ අභියෝග හේතුවෙන් අපැහැදිලිව පවතී. මෙය ලතින් ඇමරිකාවේ අනෙකුත් රටවල්වල ක්‍රියාත්මක වන යහපරිචයන් ද සම්පූර්ණ පටහැනි තත්ත්වයක් වේ.

අනෙකුත් සදානුස්මරණ ප්‍රයත්නයන් මානව හිමිකම් උල්ලංඝනයවීම් හා කොලොම්බියාව කෙරෙහි එහි බලපෑම පිළිබඳ දැනුවත් වීම වැඩි කරගැනීම සඳහා පාසල්වල පාවිච්චි කිරීමට අවශ්‍යය අධ්‍යාපන ලේඛන නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමුකර ඇත. අවාසානාවකට මෙන් මෙම අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම එක් එක් පාසල්වල ප්‍රතිපත්ති මත රඳා පවතියි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම වැඩසටහන්වල ක්‍රියාත්මකවීම් ඉතා දුර්වල ආකාරයක පැවතී ඇත.

### අතුරුදහන් වූ අතුරුදහන් කරන පුද්ගලයන්ගේ ගැටලු ආමන්ත්‍රණය කිරීමේ දී ජාත්‍යාන්තර ප්‍රජාවගේ භූමිකාව

කොලොම්බියා රජය සිය මානව හිමිකම් පිළිබඳ බැඳීම් ඉටු කිරීමට වගවීමට ලක්කිරීමේ හැකියාව ජාත්‍යාන්තර ප්‍රජාවට තිබේ. ජාත්‍යාන්තර ප්‍රජාව අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන් ගණනය කිරීම සඳහා වූ කොලොම්බියාවේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට වැදගත් දායකත්වයන් ලබා දී ඇත. උදාහරණයක් වශයෙන් ජාත්‍යාන්තර ආධාර හේතුවෙන් විද්‍යාත්මක සාක්ෂි ආයතනය හා නීතිපති කාර්යාලය තමන්ගේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩි දියුණු කරගෙන ඇත. UARIV, ඔම්බුඩ්ස්මන් කාර්යාලය හා ඓතිහාසික මතකය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය වැනි ආයතන ද ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන් මඟින් ප්‍රතිලාභ ලබාගෙන තිබේ. USA සංවිධානයේ වින්දිතයන් ශක්තිමත් කිරීමේ වැඩසටහන (VISP) හා ජර්මන් සහයෝගීතා සංවිධානය (GIZ) එවැනි වැඩසටහන්, කොලොම්බියානු සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන් කටුයතු කිරීම සඳහා වූ Swedish-Norwegian අරමුදල එවැනි වැඩසටහන් වේ. කොලොම්බියාව සඳහා වූ දූත පිරිස හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සංක්‍රාන්තික යුක්ති අරමුදල ද මෙයට ඇතුළත් වේ. අවසානයේ මානව හිමිකම් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලයේ ජාතික මට්ටමේ අඛණ්ඩව ලැබෙන ආධාර, අන්තර්බ්‍රිතානු මානව හිමිකම් පද්ධතියෙන් ලැබෙන ආධාර

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවෙන් ලැබෙන ආධාර හා අනෙක් බොහෝ රජයන්වලින් ලැබෙන ආධාර ජාත්‍යාන්තර නීතින් හා අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන් පිළිබඳ ප්‍රමිතීන්වලට අනුකූල වීමට කොලොම්බියාවේ හැකියාව වර්ධනය කර ඇත. මෙම ජාත්‍යාන්තර සහයෝගය පවුල්වලට සහායදීමේ හා අතුරුදහන් වූ පුද්ගලයන් ගණනය කිරීමේ ක්‍රියාවලියේ දී පුරවැසියන්ගේ අධීක්ෂණය ලබාදීමේ සිවිල් සමාජ සංවිධානවල ප්‍රයත්නයන් ශක්තිමත් කර ඇත.

විශාල වශයෙන් සිදුකරන මූල්‍යය හා පහසුකම් සඳහා වූ ආයෝජන අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන් සෙවීම හා හඳුනාගැනීම පිළිබඳ යාන්ත්‍රණයන් ග්‍රාමීය ප්‍රදේශ ද ඇතුලුව රටපුරා ප්‍රමාණවත් ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම තහවුරු කරනු ඇත. කෙසේ වෙතත් කොලොම්බියාවේ සිටින ජාත්‍යාන්තර ප්‍රජාවේ නියෝජිතවරුන් මානව හිමිකම් වැඩසටහන්වලට ප්‍රමුඛතාවයක් දැක්වීම කෙරෙහි කොලොම්බියානු රජය අසමත් වී තිබෙන තත්ත්වය පිළිබඳව කළකිරීමට පත් වී සිටිති. විශේෂයෙන් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා තානාපති කාර්යාල කිහිපයක නිලධාරීන් පශ්චාත් ගැටුම් මානව හිමිකම් හා ආරක්ෂාව පිළිබඳ අමාත්‍යය උපදේශකවරයා අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන් ගණනය කිරීමේ වැඩසටහන්වලට අවධානය යොමු නොකර හමුදා විසුරුවා හැරීම, සටන්කාමීන් සමාජයට නැවත ඒකාබද්ධ කිරීම හා ග්‍රාමීය සංවර්ධනය වැනි වැඩසටහන්වලට හදිසි ප්‍රමුඛතාවයක් ලබා දී තිබෙන තත්ත්වය පිළිබඳ කණගාටුව පළ කළ ඇත.

## සාම ගිවිසුමේ දී නව සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණවල හැකියාව

රජයේ නිලධාරීන්, වින්දිතයන්ගේ කණ්ඩායම්, සිවිල් සමාජ සංවිධාන හා ජාත්‍යාන්තර ප්‍රජාවගේ සාමාජිකයන් සත්‍යය පැහැදිලි කිරීමේ කොමිෂන් සභාව (CEV), සොයා ගැනීමේ ඒකකය (UBPD), හා සාමය සඳහා වූ විශේෂ අධිකරණ බලය (JEP) වැනි නව සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් පිළිබඳ ඉහළ බලාපොරොත්තු පළකළ ඇත. නව ක්‍රියාවලිය අතුරුදහන් වූ අතුරුදහන් කරන ලද පුද්ගලයන් හා අනෙකුත් මානව හිමිකම් ගැටලු පිළිබඳව සොයා බැලීමටත් සත්‍යය පැවසීමටත් වගවීමටත් ශක්තිමත් යාන්ත්‍රණයන් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලබා දුන්නේය.

සත්‍යය පැහැදිලි කිරීමේ කොමිෂන් සබාව ක්‍රියාත්මක කිරීම අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල්වලටත් ඝාතනයට ලක් වූ පුද්ගලයන්ගේ පවුල්වලටත් ජීවත්ව සිටින අයගේ පවුල්වලටත් ඉහළ ප්‍රමුඛතාවක් විය. මෙයට හේතුව මෙම කොමිෂන් සභාවේ වැඩකටයුතු වින්දිතයන්ට සෑහීමක් ලබාදෙන පළමු පියවරක් වන අතර අපරාධ සිදු කළ පුද්ගලයන්ගෙන් එය පිළිබඳ ප්‍රශ්න කිරීමටත් අවස්ථාවක් ලබාදීම වේ. තව ද එය බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම්, ඝාතන හා අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් ද ඒවගේම උල්ලංඝනයවීම් පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාදෙන අතර අතුරුදහන් වූ පුද්ගලයන්ගේ තනි පුද්ගල සිදුවීම් පැහැදිලි කිරීම මගින් තවදුරටත් විමර්ශන පැවැත්වීමට හැකියාවක් ලබාදෙයි. විශේෂයෙන් සත්‍යය පැහැදිලි කිරීමේ කොමිෂන් සභාව හා සොයාගැනීමේ ඒකකය සොබාවෙන් අධිකරණ පද්ධතියට බාහිරව සිටින නිසා එම සංවවිධානවල නිගමයන් හා රැස් කරන ලද තොරතුරු -විද්‍යාත්මක සාක්ෂි පිළිබඳ වාර්තා හා භෞතික සාක්ෂි හැර- නඩු කටයුත්තක දී පාවිච්චි කළ නොහැකිය. කෙසේ වෙතත් අතුරුදහන් වූ හා අතුරුදහන් කරන ලද පුද්ගලයන්ගේ පවුල් හා අනෙකුත් වින්දිතයන්ගේ පවුල් සත්‍යය පැහැදිලි කිරීමේ කොමිෂන් සභාවේ හා සෙවීමේ ඒකකයේ නිගමයන් පදනම් කරගෙන නීති කටයුතුවලට අවතීර්ණ විය හැකිය.



බොගෝටා අනුස්මරණය, සාමය හා සංහිඳියාව කේන්ද්‍රයේ 215 සැප්තැම්බර් මස පවත්වන ලද අතුරුදහන්වූ, අතුරුදහන් කරන ලද පුද්ගලයන් හා අධිකරණ පටිපාටියට බාහිරව සිදුකරන ලද ඝාතන පිළිබඳ ප්‍රදර්ශනයක්



රුවන්ඩා කිගාඩි සාමූල ඝාතන අනුස්මරණ ස්ථානයේ ගැඹුරු කල්පනාවක යෙදී සිටින කාන්තාවක්, ජූනි 2017

# පරිච්ඡේදය 7:

# සන්ධානයේ වැඩසටහන් ඇගයීම තුළින් ලබාගත් පාඩම්

මෙම පරිච්ඡේද හා අත්පොත සමස්ථයක් වශයෙන් විවිධ පසුබිම් හා සංක්‍රාන්තික යුක්ති ක්‍රමවේදයන් පදනම් කරගත් පාඩම් හා නිර්දේශ ඉදිරිපත් කරයි. සෑම ව්‍යාපෘතියක්ම සංක්‍රාන්තික යුක්තියේ ප්‍රාථමික නියෝජිතවරුන් වශයෙන් ප්‍රාදේශීය ප්‍රජාව සමග සම්බන්ධ වූ අතර සම්පූර්ණ හා තිරසාර සංක්‍රාන්තික යුක්ති වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ව බලසතු කළේය. මෙම ආකාරයට මෙම ව්‍යාපෘති ප්‍රාදේශීය ප්‍රජාවට අයත් ඒවා වූ අතර සියලු දෙනාම ඒවාට ඇතුළු කරගන්නා ලදී. තව ද එම ව්‍යාපෘති නිශ්චිත පසුබිමට අදාළව සකස් කරන ලද අතර සාර්ථක සංක්‍රාන්තික යුක්තිය මුහුණපාන ප්‍රධාන බාධක කිහිපයක් එමගින් ආමන්ත්‍රණය කරන ලදී.

ලොවපුරා යුක්තිය, සත්‍යය හා සංහිඳියාව පිළිබඳ සන්ධානයේ හවුල්කරුවන් ප්‍රාදේශීය හවුල්කරුවන් හා ව්‍යාපෘතියට සහභාගීවන්නන් අන්තර්ගතය හා ක්‍රමවේදය ඇතුළුව සන්ධානයේ වැඩසටහන් අදාළ ඒවා බවත් කාර්‍යය සාධනීය වැඩසටහන් බවත් කාර්‍යක්ෂම වැඩසටහන් බවත් බොහෝදුරට සිතූහ. තව ද ධාරිතා ගොඩනැගීම සඳහා සන්ධානයේ සුවිශේෂී විෂයාන්තර ප්‍රවේශය පීඩාවට පත් වූ ප්‍රජාවන්ගේ අතට පාලනය ලබාදීම මගින් ව්‍යාපෘතිවල බලපෑම හා තිරසාරභාවය වැඩිදුරටත් වැඩි දියුණු කළ බව ද ඔවුන් විශ්වාස කළහ. සන්ධානයේ විෂයාන්තර ප්‍රවේශය බහුවිධ ජාත්‍යාන්තර හා දේශීය හවුල්කරුවන් අතර සම්බන්ධීකරණයක් ඇති කරයි. කෙසේ වෙතත් සන්ධානය ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා සිතාමතා වැඩකරන නොමැති කාරණාව මෙහි සඳහන් කළ යුතුය. එම නිසා සන්ධානයේ සියලුම කණ්ඩායම් ඇතුළත් අදහස් විමසීම්,පුහුණු වැඩසටහන්, වැඩමුළු හා අනෙකුත් ක්‍රියාකාරකම් සමාජ ආර්ථික හා ස්ත්‍රී පුරුෂ සමාජභාව පදනම් කරගත් හානි වැනි ව්‍යුහාත්මක අපයෝජනයන් සමහර වේලාවල නැවත නිර්මාණය කර පුළුල් පරාසයේ අවශ්‍යතා ක්‍රියාකාරම් ඉදිරිපත් කළේය. එම නිසා ව්‍යාපෘතිය මෙතෙක් "අතිවිශේෂ" ශාරීරික ප්‍රචණ්ඩත්වය කෙරෙහි අවධානය යොමු කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉලක්ක රටවල්වල ව්‍යුහාත්මක මුක්තිය කෙරෙහි ඕනෑම බලපෑමක් ව්‍යාපෘතියේ වක්‍ර ප්‍රතිඵලයක් විය. මෙය එහි වැඩසටහන්වල පරතරයක් ලෙස සන්ධානය පිළිගන්නා අතර සියලුම ආකෘතියේ මුක්තීන් අවසන් කිරීමේ අරමුණ මනාලෙස ඒකාබද්ධ කිරීම සඳහා ඉදිරියේ දී නවෝත්පාදන ක්‍රමයන් සොයාගන්නා ඇත.

දකුණු සුඩානය, සිරියාව, ශ්‍රී ලංකාව හා මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපවල එහි වැඩසටහන් ඇගයීම් කිරීම තුළින් සන්ධානය ප්‍රාදේශීය ප්‍රජාවගේ අයිතිය, සියලුදෙනාම ඇතුළත් කරගැනීම හා පසුබිම අනුව ප්‍රචාර දැක්වීම තහවුරු කිරීම සඳහා උපකාරී විය හැකි මැදිහත්වීම් හා උපාය මාර්ග වර්ගයන් පිළිබඳ සාක්ෂි පදනම් කරගත් යෝජනා ඉදිරිපත් කිරීමට සන්ධානයට හැකි විය. පහත පෙන්වා දෙන පාඩම් එක් එක් ඇගයීමේ පරිච්ඡේදයේ අවසානයේ ලබා දී තිබෙන එකිනෙකට සම්බන්ධ බොහෝ නිර්දේශවලින් ලබාගෙන තිබෙන අතර ගෝලීය මට්ටමේ සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘතීන්වලට එහි අදාළත්වය හේතුවෙන් ඒවා තෝරාගෙන ඇත. මෙම පාඩම් යම් දෙයක් නියම කරන දෙයක් හෝ සාර්ථකත්වය සඳහා තහවුරුවක් ලබාදෙන පාඩම් නොවේ. කෙසේ වෙතත් ඒවා ව්‍යාපෘතිවල අදාළත්වය, කාර්‍යය සාධනීයත්වය, බලපෑම, තිරසාරභාවය, කාර්‍යක්ෂමතාවය හා ව්‍යාපෘති සම්බන්ධීකරණය යන කරුණු සඳහා මග පෙන්වීම් ලබාදෙන අතර මුක්තිය අවසන් කිරීම සඳහා නව මෝඩලයන් පිළිබඳ සිතා බැලීමට දායකත්වයක් ලබාදෙයි.

## සංක්‍රාන්තික යුක්ති ප්‍රවේශයන් සඳහා පාඩම්

**සංක්‍රාන්තික යුක්ති වැඩසටහන් සමස්ථ වැඩසටහන් විය යුතු අතර විවිධ පියවරයන්, ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන් එම වැඩසටහන්වලට සම්බන්ධ විය යුතුය.** සංක්‍රාන්තික යුක්තිය යනු මුක්තිය සඳහා තිබෙන බහුවිධ අංගයන්ගෙන් සමන්විත විසඳුමක් වන අතර එය අපරාධ සඳහා නඩු පැවරීම හා සත්‍යය පැවසීමේ මුලාරම්භයට වඩා තව දේවල් එයට ඇතුළත් වේ. දකුණු සුඩාන්, සිරියාව, ශ්‍රී ලංකාව හා මැදපෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ පාර්ශවකරුවන් සමඟ සන්ධානය සිදු කළ වැඩ කටයුතු සංක්‍රාන්තික යුක්තියේ සමස්ථ ස්වභාවය අවධාරණය කළේය. විවිධ අංශවල විශේෂඥ දැනුමක් සහිත තිබෙන සංවිධාන අතර සාමූහික ක්‍රියාකාරකම් ඇතුළුව විෂයාන්තර ප්‍රවේශයකින් කටයුතු කිරීම සමස්ථ හා තිරසාර සංක්‍රාන්තික යුක්තියකට මඟපාදයි. සංක්‍රාන්තික විසඳුම් පිළිබඳ සෑම කෙනෙකුටම ගැළපෙන එක ප්‍රමාණයක් නොමැති කාරණාව ප්‍රාදේශීය ක්‍රියාධරයන් අවබෝධ කරගන්නා විට තමන්ගේ අරමුණු ඉටුකරගැනීම සඳහා විවිධ පියවරයන්, ක්‍රියාවලීයන් හා ප්‍රවේශයන්වල අවශ්‍යතාව ඔවුන් මනාලෙස අගය කරති.

**සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති විවිධ විෂයන් ඇතුළු ප්‍රවේශයකින් යුතුව ක්‍රියාත්මක කළ යුතුය.** ස්වභාවයෙන් සන්ධානය විවිධ ක්ෂේත්‍ර ඇතුළත් සංවිධානයක් වන අතර පුළුල් පරාසයක සංක්‍රාන්තික යුක්තියට සම්බන්ධ නීතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මානව හිමිකම් ලේඛණගත කිරීම අධිවාචන හා වින්දිතයන්ට මනෝ සාමාජීය සහාය දීම, විද්‍යාත්මක සාක්ෂි විශ්ලේෂණය හා සිවිල් සමාජයේ සංවිධාන ධාරිතාව ගොඩනැඟීම වැනි සංක්‍රාන්තික යුක්තියට සම්බන්ධ පුළුල් පරාසයක විෂයන් පිළිබඳව නිපුණතාවයෙන් යුත් සංවිධාන 9 කින් සමන්විත වේ.



කෝට් ඩී ඉල්වෙයාර් ප්‍රදේශයේ 2017 අගෝස්තු මාසයේ අවශ්‍යතා ඇගයීම සිදු කළ කාලවකවානුවේ මහ මාර්ග දර්ශනයක්

මෙම සංවිධාන සත්‍යය, අනුස්මරණය, හානිපූර්ණය හා සංහිඳියාව වැනි විවිධ සංක්‍රාන්තික යුක්ති මුලපිරීම් පිළිබඳ අත්දැකීම් සතුව ද කටයුතු කරති. විෂයාන්තර පුහුණු හා ක්‍රියාකාරකම් ප්‍රාදේශීය සහභාගීවන්නන්ට සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ සමස්ථ දෘෂ්ටිකෝණයක් ලබාදෙන අතර විවිධ අත්දැකීම් ක්ෂේත්‍ර සහිත වකු හවුල්කරුවන් සම්බන්ධ කිරීමේ කරුණ ව්‍යාපෘතීය සැලකිල්ලට ගත යුතුය.

**සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති සහභාගීත්ව ප්‍රවේශයක් ගත යුතු අතර සෑම අදියරයකදීම තීරණ ගන්නා අය වශයෙන් ප්‍රාදේශීය ක්‍රියාධරයන් සම්බන්ධ කර ගත යුතුය.** දකුණු සුඩානයේ ලේඛනගත කිරීමේ දී සිටින අය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් හා වැඩමුළු අදහස් විමසීමේ දී ඔවුන් ඉදිරිපත් කර අවශ්‍යතා හා අරමුණු අනුව සකස් කර තිබිණි. මැද පෙරදිග හා උතුරු ආප්‍රිකා කලාපයේ පුහුණු වැඩසටහනේ දී න්‍යායපත්‍රය සහභාගීවන්නන්ට අයිති එකක් විය. සිරියාවේ සියලුම කණ්ඩායම් ඇතුළත් සංක්‍රාන්තික යුක්තිය සඳහා අත්තිවාරමක් ඉදිකිරීම පිණිස සන්ධානය විස්තරාත්මක අවශ්‍යතා ඇගයීම් හා අදහස් විමසීම් ප්‍රයෝජනයට ගත්තේය. ශ්‍රී ලංකාවේ සන්ධානය නව වෙනස්කම් හඳුනාගැනීම සඳහා ක්‍රියාවලියේ ඉලක්කවල ආයෝජනය ශක්තිමත් කිරීම සඳහාත් සන්ධානය මුල් අවශ්‍යතා ඇගයීමට සම්බන්ධ වූ සහභාගීවන්නන් නැවත හමුවිය. සහභාගීත්ව ප්‍රවේශයන් පීඩාවට පත් වී සිටින විවිධ ප්‍රජාවන් තමන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් හඳුනාගැනීම ආමන්ත්‍රණය කිරීම සඳහා ඔවුන් ඉතා සමීපව සම්බන්ධ කරගැනීමේ හැකියාවට අවශ්‍යය වේ. තව ද ඔවුන් ප්‍රාථමික සම්පතක් වශයෙන් ප්‍රාදේශීය විශේෂඥ දැනුම ස්ථාපිත කළ අතර නවෝත්පාදන ප්‍රාදේශීය ප්‍රජාවට අයත් හා නිශ්චිත පසුබිමට ගැළපෙන සංක්‍රාන්තික යුක්ති මැදිහත්වීම් නිර්මාණය කිරීම සඳහා ඔවුන් දිරිගැන්වූහ.

**සංක්‍රාන්තික යුක්ති ක්‍රමවේදයන් අදාළ පසුබිමට සම්බන්ධ විය යුතු අතර විවිධත්වයෙන් යුතුව තිබිය යුතුය.** සන්ධානයේ වැඩසටහන් පසුබිමට අදාළ සාම්ප්‍රදායික සහභාගීත්ව හා සාම්ප්‍රදායික නොවන ක්‍රමවේදයන් ඇතුළත් විය. සහභාගීත්ව ක්‍රමවේදයන් සියලුම ව්‍යාපෘති හතරේම කොටසක් විය. දකුණු සුඩානය, සිරියාව, ශ්‍රී ලංකාව හා මැදපෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ ව්‍යාපෘතිවල සාම්ප්‍රදායික වැඩමුළු පාවිච්චි කරන ලදී. ශ්‍රී ලංකාවේ ඇගයීම්වල සාකච්ඡා පෙළඹවීම සඳහා සන්ධානයේ සංරක්ෂණය කරන ලද ලේඛන පිළිබඳ ප්‍රදර්ශන පාවිච්චි කළේය. දකුණු සුඩානයේ එය ශරීරය සිතියම්ගත කිරීම හා ගැටුමේ අත්දැකීම් පිළිබඳ අනෙකුත් දෘශ්‍යය ඉදිරිපත් කිරීම් භාවිතා කළේය. මෙම සියලුම ප්‍රවේශයන් තත්ත්වයේ නිශ්චිත අවශ්‍යතා හා පසුබිමට අනුව නිර්මාණය විය. මෙම විධි ක්‍රමය සියුම් අත්දැකීම් හඳුනාගැනීමටත් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයේ දීර්ඝ කාලීන ගැටලු විශ්ලේෂණය කිරීමටත් වැදගත් විය.

## සංක්‍රාන්තික යුක්තියේ ප්‍රාදේශීය අයිතිය පිළිබඳ පාඩම්

**සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් සිදු කරන මුලපිරීම් ස්ථාපිත කිරීමේ අරමුණ සහිත ක්‍රියාත්මක කළ යුතුය.** දකුණු සුඩානයේ ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් යුත් මානව හිමිකම් ලේඛනගත කිරීමේ මුලපිරීමක් ස්ථාපිත කිරීමටත් සිරියාවේ සේවා ලබාගෙන සංවිධාන හා මානව හිමිකම් ලේඛනගත කරන අය අතර යොමු කිරීමේ ජාලයක් ස්ථාපිත කිරීමටත් ශ්‍රී ලංකාවේ සත්‍යය හා සංහිඳියා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමටත් මැද පෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපය පුරා ප්‍රාදේශීය ජාල ස්ථාපිත කිරීමටත් දායකත්වයක් ලබාදුන්නේය. ප්‍රජාවන් තමන්ගේ අදාළ පසුබිම් අනුව එවැනි මුලපිරීම් සඳහා තමන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රකාශ කර ඇත. එවැනි මුලපිරීම් ප්‍රාදේශීය ජනතාවගේ නිපුණතා මත ස්ථාපිත කර ඇති හෙයින් ඒවා වෙනස්කම්වලට හා මතුවෙමින් පවතින අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට හා අනුගතවීමට උචිත ආකාරයෙන් නිර්මාණය වී තිබේ.

**සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති සියලුම කණ්ඩායම් ඇතුළත් කරගත යුතුය.** ඇතුළත් කරගැනීම සන්ධානයේ වැඩසටහනේ ජන වාර්ගික, ආගමික හා ස්ත්‍රී පුරුෂ සමාජභාව අනුව පුළුල් වශයෙන් පවතී. ශ්‍රී ලංකාවේ සිදු කරන ලද විස්තරාත්මක අවශ්‍යතා ඇගයීම් ප්‍රධාන ජන වාර්ගික හා ආගමික

කණ්ඩායම් ඉලක්ක කරගෙන සිදු කරන ලදී. - වැඩි වශයෙන් පීඩාවට පත් වු කණ්ඩායම ඉලක්ක කරගෙන එය සිදු නොකෙරිණ. මැද පෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් ඉතා දුර්වල කණ්ඩායම් වලට ප්‍රමුඛත්වයක් ලබාදෙන සියලුදෙනාම ඇතුළත් කරගන්නා සංක්‍රාන්තික යුක්තිය අවශ්‍යතාවය පිළිබඳ සහභාගීවන්නන් සංවේදී කරන ලදී. දකුණු සුඩානයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව අනුව සිදු වී ඇති හානි හා අවශ්‍යතා සැලකිල්ලට ගෙන ලේඛනගත කිරීමේ ක්‍රියාකාරකම් ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවයට හා කාන්තා ලේඛනගත කරන අය ඇතුළත් කරගැනීමට ප්‍රමුඛතාවයක් ලබා දුන්නේය. ඊට අමතරව සන්ධානය සිරියාවේ හිටපු පිරිමි හා කාන්තා රැඳවියන් සඳහා වෙන වෙනම ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පැවැත් වු අතර කාන්තා සංවිධාන සමඟ ද කතා කළේය. කණ්ඩායම් අතර පවතින ගැටුම් නිර්මාණය කරන හේතු වශයෙන් පවතින ස්ථානවල හා කණ්ඩායම් හා ස්ත්‍රී පුරුෂ සමාජය පදනම් කරගත් ඉලක්කයන් පවතින ස්ථානයන්වල ඇතුළත් කරගැනීම ඉතා වැදගත් වේ.

**සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති ප්‍රාදේශීය විශේෂඥයන් සමඟ සබඳතා ගොඩනඟා හවුල් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඔවුන්ට සහයෝගය ලබාදිය යුතුය.** ශ්‍රී ලංකා හා සිරියාවේ ව්‍යාපෘතියේ සන්ධානයේ ප්‍රාදේශීය හවුල්කරුවන් වෙත රැඳී සිටියේය. තව ද මානව හිමිකම් ලේඛනගත කිරීම සඳහා දකුණු සුඩාන් හවුල්කරුවන්ගේ ධාරිතාවය ගොඩනැගූ අතර තමන්ගේම ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මැද පෙරදිග ශා උතුරු ආප්‍රිකානු කලාපයේ ක්‍රියාධරයන්ට මඟ පෙන්වීම ලබා දුන්නේය. සෑම ව්‍යාපෘතියකම සන්ධානය සහයෝගීතාවයෙන් කටයුතු කළ ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ පසුබිම පිළිබඳ නිපුණතා දැනුමෙන් ප්‍රතිලාභ ලබා ගත්තේය. ප්‍රාදේශීය හවුල්කරුවන් සමඟ විශ්වාසය පදනම් කරගත් සබඳතා පෝෂණය කිරීම පීඩාවට පත් වී සිටින ප්‍රජාව වෙත පහසුවෙන් පිවිසීමට හැකියාව ලබාදෙන අතර ක්ෂේත්‍රයේ තියෙන අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ද ලබාදෙයි. ඒ අතර ප්‍රාදේශීය හවුල්කරුවන් සංක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන්වල තමන්ගේ සහභාගීත්වය තවදුරටත් වැඩි දියුණු කරගැනීම සඳහා තමන්ගේ තාක්ෂණික දැනුම හා කුසලතා වැඩි කරගනිති.

## වින්දිතයන්ගේ සහභාගීත්වයට හැකියාව ලබාදීම සඳහා පාවිච්චි කරන ලද විද්‍යාත්මක සාක්ෂි

සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හා විද්‍යාත්මක සාක්ෂි එකිනෙක සනාථ කරන අනෙන්‍යය සබඳතාවයක් ඇති සාක්ෂි වේ. උදාහරණයක් වශයෙන් බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන් කිරීම් සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි සාක්ෂිකරුවන් විසින් ලබාදෙන ලද සාක්ෂි මගින් අධිකරණයෙන් ඇතුළත හා අධිකරණයෙන් පිට තහවුරු කර ඇත. ඒ වාගේම FAFG පදනම බොහෝ අවස්ථාවල මිනිවළවල් තිබෙන ස්ථාන හොයා ගැනීමටත් වින්දිතයන් හඳුනා ගැනීමටත් ඔවුන්ගේ මරණ සිදු වු පසුබිම් අවබෝධ කරගැනීමටත් සාක්ෂිකරුවන්ගෙන් හා වින්දිතයන්ගේ පවුල්වලින් ලැබෙන තොරතුරු මත රඳා සිටී.[33] මෙම පදනම මෙවැනි තොරතුරු ලේඛනගත කර එහි විශේෂඥ වාර්තාවල කොටසක් වශයෙන් ඉදිරිපත් කරයි. විද්‍යාත්මක සාක්ෂි හා සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වැදගත් නඩු කිහිපයක නඩුව ඔප්පු කිරීමේ තමන්ගේ වගකීම ඉටු කිරීමට නඩු පවරන පාර්ශවයට හැකියාව ලබා දී ඇත.



ගිනියාවේ 2017 මැයි මාසයේ GIJTR සංවිධානය විසින් පවත්වන ලද ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩමුළුවට සහභාගී වූ සහභාගීවන්නන්

## පුහුණු ප්‍රවේශයන් හා නිමැයුම් පිළිබඳ පාඩම්

**සංක්‍රාන්තික යුක්ති පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලිකත්වයෙන් යුත් මුලපිරීම් ස්ථාපිත කිරීම සඳහා වූ උප අරමුදල් ලබාදීමේ සිට දැක බලා ගත හැකි නිමැයුම් ඇතුළත් කළ යුතුය.** සන්ධානය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන අනෙකුත් වැඩසටහන් මෙන් නොව පැහැදිලි නිමැයුම් සහිත ක්‍රියාකාරකම් පදනම් කරගත් ව්‍යාපෘති සඳහා කීර්ති නාමයක් දිනාගෙන සිටී. මැද පෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ සන්ධානය ප්‍රාදේශීය ක්‍රියාධරයන් පසුබිම පිළිබඳ තමන්ගේ නිපුණතාවය හා අලුතින් ලබාගෙන තිබෙන සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ දැනුම හා කුසලතා පදනම් කරගෙන ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා උප අරමුදල් ලබාදුන්නේය. තවත් උදාහරණයක් වශයෙන් සන්ධානය සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට පහසුකම් සැලසීම ශ්‍රී ලංකාවේ වැඩමුළු පිළිබඳ තෙහෙට්ටුවට ප්‍රතිචාර දැක්වීය. සහභාගීත්වයට හැකියාව හා බලසතු කිරීම ලබාදෙන පැහැදිලිව කරන නිමැයුම් මුල් සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘතියේ ප්‍රතිලාභ පවත්වාගෙන යාමට උපකාරී වේ. උප අරමුදල් ප්‍රාදේශීය ක්‍රියාධරයන් අරමුදල් සපයන්නන්ගෙන් මුදල් ලබාගැනීමේ දී දුෂ්කරතාවලට මුහුණ දෙන අවස්ථාවල විශේෂයෙන් ඉතා වටිනාකමින් යුක්ත වේ. උප අරමුදල් ලැබෙන ව්‍යාපෘති අරමුදල් සපයන් අයගේ ලැදියාවන්ගෙන් සීමා නොවී ප්‍රජා අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකළ හැකිය.

**සංක්‍රාන්තික යුක්ති පුහුණු වැඩසටහන් යම්දෙයක් නිශ්චිතව නියම නොකළ යුතුය.** සන්ධානය බාහිර මතයන් බලෙන් පැටවීමෙන් තොරව විවිධ සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් හා ක්‍රියාවලියන් පිළිබඳ දැනුම බෙදා ගැනීම ප්‍රවර්ධනය කළේය. විශේෂයෙන් ජාත්‍යාන්තර විශේෂඥයන්ගේ මූලිකත්වයෙන් පවත්වනු ලබන නියමයන් ඉදිරිපත් කරන වැඩමුළු හා පුහුණු වැඩසටහන් බොහෝ අවස්ථාවල ප්‍රාදේශීය නවෝත්පාදනයන් නැති කිරීම මෙයට හේතු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සන්ධානය සිරියාවේ සේවා ලබාදෙන සංවිධාන අතර සම්බන්ධීකරණය පිළිබඳ නිශ්චිත නිර්දේශ කිරීම පිළිබඳ පැකිලීමකින් කටයුතු කළේය. ශ්‍රී ලංකාවේ නියම නොකරන ප්‍රවේශය ප්‍රාදේශීය නවෝත්පාදනවලට අවකාශයක් ලබාදෙන්නේය. නියම නොකරන ප්‍රවේශයක් "විශේෂඥ" මතයන්වලින් තමන් සීමාවන බව හැඟීමකින් තොරව ප්‍රාදේශීය ක්‍රියාධරයන්ට ව්‍යාපෘති නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවයන් ලබාදෙයි.

**සංක්‍රාන්තික යුක්ති පුහුණු වැඩසටහන් සන්සන්දනාත්මක සිද්ධිධ්‍යානයන් හා වත්මන් තත්ත්වයට එහි අදාළත්වය ඇතුළත් කරගත යුතුය.** ශ්‍රී ලංකාවේ පවත්වන ලද ධාරිතාව ගොඩනැඟීමේ වැඩමුළුවේ දී අනෙකුත් රටවල්වල අත්දැකීම් බෙදා හදාගන්නා ලදී. මැද පෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාප පුහුණු වැඩසටහන් තමන්ගේ රටට තවත් රටක සංක්‍රාන්තික යුක්ති අත්දැකීම අදාළ කරගැනීම අවබෝධ කරගැනීම සඳහා ප්‍රාදේශීය ක්‍රියාධරයන්ට සහාය වන සන්සන්දනාත්මක ප්‍රවේශයක් භාවිතා කළේය. දකුණු සුඩානයෙන් තෝරාගත් ලේඛනගතකරන්නන් ලොවපුරා ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධානවලින් ඉගෙනගැනීම සඳහා දැනුම හුවමාරු කිරීමේ වැඩසටහනක සහභාගී විය. මේ සඳහා ප්‍රාදේශීය ප්‍රජාවට අධ්‍යාපනයක් ලබා දී ඔවුන්ගේ ධාරිතාවය සංවර්ධනය කිරීමේ අරමුණු සහිත වැඩසටහන් සංක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රයේ ජාත්‍යාන්තරකරණයවීමේ ප්‍රශ්නය ආමන්ත්‍රණය කරයි. අනෙකුත් රටවල්වල පාඩම් බෙදා හදාගැනීම විශේෂයෙන් සංක්‍රාන්තික යුක්තිය තවමත් ළදරු අවධියේ පවතින හෝ මුල් ආරම්භක අදියරයන්වල පවතින රටවල්වල සිටින ප්‍රාදේශීය ක්‍රියාධරයන්ට ප්‍රයෝජනවත් විය හැකිය. ගෝලීය දැනුම හුවමාරු කරගැනීම ඉගෙන ගන්නා ප්‍රජාවක් ගොඩනඟන අතර ප්‍රජා හා ජාතික මට්ටම්වලට ඔබ්බෙන් ජාලගත වීමේ අවස්ථා ද ලබාදෙයි.

**සංක්‍රාන්තික යුක්ති පුහුණු වැඩසටහන් විවිධ කුසලතා පිළිබඳ ප්‍රාදේශීය ක්‍රියාධරයන්ගේ ධාරිතාව ගොඩනැඟිය යුතුය.** සන්ධානයේ වැඩසටහන් හරහා දකුණු සුඩානයේ ලේඛනගත කරන අය හා මැද පෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ ක්‍රියාධරයන් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ හා දැඩි කම්පනය කළමණාකරණය කිරීමේ කුසලතා ලබාගත්හ. සන්ධානය ශ්‍රී ලංකාවේ පීඩාවට පත් වූ ප්‍රජාවන්, සිවිල්

සමාජය හා රජයේ නිලධාරීන් වෙනුවෙන් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ප්‍රයෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළේය. දකුණු සුඩානයේ හා මැද පෙරදිග හා උතුරු ආප්‍රිකානු කලාපයේ ආරක්ෂක තර්ජන අවම කරගන්නේ කෙසේදැයි ව්‍යාපෘතිවලට සහභාගීවන්නන් ඉගෙන ගත්හ. ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් උදාහරණයක් වශයෙන් මනෝ සමාජීය සහාය හා දැඩි කම්පනය කළමණාකරනය කිරීම ආරක්ෂක අවදානම් ඇගයීමට ලක් කර ඒවා අවම කිරීම හා විද්‍යාත්මක සාක්ෂි යන කරුණු පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ඇතුළත් කළ යුතුය. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ද ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්වල ප්‍රාදේශීය අයිතිය තහවුරු කරන අතර එය තවදුරටත් පුළුල් කිරීමට තිබෙන තිරසාර මාර්ගයක් වේ.

**සමස්ථ හා තිරසාර සංක්‍රාන්තික යුක්තිය ලඟා කරගැනීම සඳහා වු ඉදිරි ගමන**

සංක්‍රාන්තික යුක්තිය ඇගයීමේ ක්ෂේත්‍රය තවමත් සන්සන්දනාත්මකව තරුණ අවධියේ පසුවන අතර එයට නවෝත්පාදනය හා අත්දැකීම් පදනම් කරගත් පර්යේෂණයේ වර්ධනය අවශ්‍ය වේ. එහි නිමැයුම් පාදක අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමය පාවිච්චි කරමින් සමහර පියවරයන්, ක්‍රියාවලීන් හා ප්‍රවේශයන් සාර්ථක වුණේ යැයි යන කරුණ අවබෝධ කරගැනීමට සන්ධානය උත්සාහ දැරීය. ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතිවල සාර්ථකත්වයට දායකත්වය ලබාදුන් අංගයන් කුමක්දැයි යන තීරණය කරගැනීම ද මෙයට ඇතුළත් විය. එහි ඇගයීම් සංක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයන් ප්‍රජා හා ජාතික මට්ටමේ වැඩසටහන්වල බලපෑම වැඩිදියුණු කරන්නේ කෙසේද ලොවපුරා වගවීම වැඩි කරන්නේ කෙසේදැයි යන කරුණු ලබාදෙයි. බොහෝ පාඩම් විවෘත කිරීමට අමතරව මෙම අත්පොත සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති ඇගයීම් කිරීමේ අවශ්‍යතාවය හා එහි සම්බන්ධ දුෂ්කරතාවයන් පෙන්වාදෙයි. මෙම අත්පොත බොහෝ පාඩම් ලබාදීමට අමතරව සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘති ඇගයීමට ලක්කිරීමේ අවශ්‍යතාවය හා එය හා සම්බන්ධ දුෂ්කරතාවයන් ද පෙන්වාදෙයි.

සංක්‍රාන්තික යුක්තිය ඇගයීමට ලක්කිරීම දීර්ඝකාලීන ක්‍රියාවලියක් වශයෙන් පවතින නිසා සන්ධානය බොහෝදුරට නව ප්‍රයත්නයක් වේ. ඇගයීම් මගින් සන්ධානයේ විෂයාන්තර ප්‍රවේශයේ කෙටි කාලීන බලපෑම් හා එය කෙටි කාලීන අරමුණු හා ඉලක්කයන් කෙතරම්දුරට ලඟාකරගෙන තිබේදැයි යන කරුණු පමණක් නිර්ණය කරගැනීමට හැකි විය. කෙසේ වෙතත් මෑතකදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති පිළිබඳ මෙම ඇගයීම් සන්ධානයේ වෙනස පිළිබඳ මූලධර්මයට සහායවීම සඳහා සාක්ෂි ලබාදීමට ආරම්භ කර ඇත. තව ද අනාගතයේ මුහුණදීමට සිදුවන අභියෝග ද එය හඳුනාගැනීමට ආරම්භ කර ඇත. සන්ධානයේ මෙම ඇගයීම්වලින් අනතුරුව -සාමාන්‍යය වශයෙන් සංක්‍රාන්තික යුක්ති ක්ෂේත්‍රය ගැඹුරු ලෙස මුල්බැසගෙන තිබෙන ව්‍යුහාත්මක ගැටුම හා මුක්තිය පරාජය කිරීම සඳහා මුහුණපෑමට සිදුවන බාධක පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගෙන ඇත. එය විශාල ප්‍රමාණයේ දේශපාලන කැමැත්ත අවශ්‍යය කරන දෙයක් වේ. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ සන්ධානයේ සමස්ථ ප්‍රවේශය අපරාධවලට නඩු පැවරීම හෝ වෙනත් යම් යාන්ත්‍රණයකට ප්‍රමුඛතාවයක් ලබානොදෙයි. එය බෙදී සිටින පසුබිම තුළ වුවත් සමස්ථ සමාජය සමගම සම්බන්ධ වී කටයුතු කිරීමේ සාර්ථකත්වයක් ලබාගෙන තිබේ. කෙසේ වෙතත් රජයේ ක්‍රියාධරයන් අතර දේශපාලන කැමැත්ත ගොඩනැගීම අභියෝගාත්මක කරුණක් විය. දීර්ඝ කාලීනව සංක්‍රාන්තික යුක්ති ක්‍රියාධරයන් ප්‍රවේශයන් අයිතිය හා වැඩසටහන්වල නිමැයුම් තීරණගන්නා අය වෙත රැගෙන යන්නේ කෙසේ දැයි යන්න කරුණ අඛණ්ඩව කල්පනා කළ යුතුය. ගැටුමට මූලික වු හේතු හා එය පොළඹවන ලද සාධක පිළිබඳ සංක්‍රාන්තික යුක්තියේ දීර්ඝ කාලීන බලපෑම් පිළිබඳ සාක්ෂි රැස් කිරීම සඳහා දීර්ඝ කාලීන ඇගයීම් අවශ්‍යය වේ. ඒවා බොහෝ අවස්ථාවල ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට හා සම්බන්ධ වේ.

ව්‍යාපෘතිවල සෑම අදියරන්වලදීම ඉතා වටිනා පාඩම් ඉගෙන ගත හැකිය. එය අන්තර් කාලීන අඛණ්ඩ හා දීර්ඝකාලීන ඇගයීම්වල වැදගත්කම අවධාරණය කරයි. අඛණ්ඩ ඉගෙනීම සඳහා කැපවීමෙන් සිටින සන්ධානය එහි ව්‍යාපෘති තිරසාර හා වගවීම හා සංහිඳියාව පිළිබඳ පුළුල් ලෙස බලපෑමක් කරන තත්ත්වය තහවුරු කරගැනීම සඳහා අනාගත ඇගයීම් සිදු කරනු ඇත. ඇගයීම් සංක්‍රාන්තික

යුක්තියේ ඉලක්ක ලඟා කරගැනීම පිණිස පාවිච්චි කළ යුතු ක්‍රියාවලිය කුමක් ද යන්න - යාන්ත්‍රණයන්වල වර්ගයන් පමණක් නොව- සොයා ගැනීමට ඇගයීම් ඉතා වැදගත් මාර්ගයක් වේ. තිරසාර සාමය හා සංහිඳියා ක්‍රියාවලීන් ද මෙයට ඇතුළත් වේ. සංක්‍රාන්තික යුක්ති ක්‍රියාධරණයන් පාඩම් හුවමාරු කරගැනීම හරහා ප්‍රජාවක් ගොඩනැගීම සංක්‍රාන්තික යුක්ති ව්‍යාපෘතිවල බලපෑම හා සම්බන්ධීකරණය වැඩි දියුණු කරගැනීම සඳහා දැනුම හුවමාරු කරගැනීමේ පළවෙනි පියවර වේ. යහපැවැත්මේ හා ප්‍රාදේශීය අයිතිය තහවුරු කිරීමට සහාය වන මග පෙන්වීම් සංවර්ධනය කිරීමේ දී ප්‍රජාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තිරසාර මැදිහත්වීම් ද මෙයට අදාළ වේ. මෙම අත්පොතේ ඇතුළත් පාඩම් - හා අඛණ්ඩ ඇගයීම් මගින් ඉගෙනගන්නා අනාගත පාඩම් ද - සිවිල් සමාජයටත් ක්‍රියාධරයන්ටත් ප්‍රතිපත්ති සම්පාදකයන්ටත් අරමුදල් සපයන්නන්ටත් අනෙකුත් පාර්ශවකරුවන්ටත් තමන්ගේ නිශ්චිත පසුබිම්වලට අදාළ කරගත හැකි නව මෝඩලයන් සැලකිල්ලට ගැනීමටත් එය පිළිබඳ වාද කිරීමටත් ඒවා අනුගත කරගැනීමටත් අවස්ථාවක් ලබාදෙයි. සංක්‍රාන්තික යුක්ති ක්‍රියාධරයන් මෙහි විස්තර කර ඇති ගෝලීය ඉගෙනගැනීමේ ප්‍රජාව වර්ධනය කරගැනීමටත් යුක්තිය, සත්‍යය හා සංහිඳියාව ප්‍රවර්ධනය කරගැනීමටත් තමන්ගේ ව්‍යාපෘති ඇගයීමට ලක්කරනු ඇතැයි සන්ධානය තවදුරටත් බලාපොරොත්තු වෙයි.